**325 වන කාණ්ඩය - 03 වන කලාපය**
**தொகுதி 325 - இல. 03**
**Volume 325 -  No. 03**

**2026 පෙබරවාරි 06 වන සිකුරාදා**
**2026 பெப்ருவரி 06, வெள்ளிக்கிழமை**
**Friday, 06th February, 2026**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY  DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
- පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය [තීරුව 395]
- පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 404]

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 405]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 407-435]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මුහුණ දෙන ගැටලු [තීරුව 435]
- 1990දී මඩකලපුව, කුරුක්කල්මඩම්හිදී ඝාතනය කරන ලද මුස්ලිම් වන්දනාකරුවන් වෙනුවෙන් යුක්තිය ඉටු කිරීම [තීරුව 437]

**එක්සත් රාජධානිය විසින් ශ්‍රී ලාංකිකයින් කිහිපදෙනෙකුට එරෙහිව පනවන ලද සංචාරක තහනම:**
- විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 440]

**වරප්‍රසාද යෝජනා:**
- 2026.01.11 දින "ඉරිදා ලංකාදීප" පුවත් වාර්තාව [තීරුව 446]

**මහජන ආරක්ෂක ආඥාපනත:**
- යෝජනා සම්මතය [තීරු 446-586]

**අත්‍යවශ්‍ය මහජන සේවා පනත:**
- යෝජනා සම්මතය [තීරුව 586]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 587-602]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
- பாராளுமன்ற ஓய்வூதியம் (நீக்குதல்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு [ப: 395]
- இருப்பாட்சியாளர்களைப் பாதுகாத்தல் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 404]

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப: 405]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 407-435]

**தனி அறிவித்தல் மூல வினா:**
- நுண், சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில்முயற்சிகள் எதிர்கொள்ளும் சிக்கல்கள் [ப: 435]
- 1990இல் மட்டக்களப்பு, குருக்கள்மடத்தில் கொல்லப்பட்ட முஸ்லிம் யாத்திரிகர்கள் சார்பில் நீதியைப் பெற்றுக்கொடுத்தல் [ப: 437]

**ஐக்கிய இராச்சியத்தால் இலங்கையர்கள் சிலருக்கு எதிராக விதிக்கப்பட்ட சுற்றுலாத் தடை:**
- வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரினது கூற்று [ப: 440]

**சிறப்புரிமைப் பிரேரணைகள்:**
- 2026.01.11ஆம் திகதிய "இரிதா லங்காதீப" செய்தி அறிக்கை [ப: 446]

**பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டம்:**
- தீர்மானம் [ப: 446- 586]

**அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்:**
- தீர்மானம் [ப: 586]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 587-602]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
- Parliamentary Pensions (Repeal) Bill: Determination of the Supreme Court [Col. 395]
- Protection of Occupants Bill: Petition to the Supreme Court [Col. 404]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 405]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 407-435]

QUESTION BY PRIVATE NOTICE:
- Issues Faced by Micro, Small and Medium-sized Enterprises [Col. 435]
- Justice for Muslim Pilgrims Killed in Kurukkalmadam, Batticaloa in 1990 [Col. 437]

TRAVEL BANS IMPOSED ON SOME SRI LANKANS BY THE UNITED KINGDOM:
- Statement by Minister of Foreign Affairs, Foreign Employment and Tourism [Col. 440]

PRIVILEGE MOTIONS:
- News Report in “Irida Lankadeepa” of 11.01.2026 [Col. 446]

PUBLIC SECURITY ORDINANCE:
- Resolution [Cols. 446-586]

ESSENTIAL PUBLIC SERVICES ACT:
- Resolution [Col. 586]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 587-602]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 පෙබරවාරි 06වන සිකුරාදා***
*2026 பெப்ருவரி 06, வெள்ளிக்கிழமை*
*Friday, 06th February, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
### பாராளுமன்ற ஓய்வூதியம் (நீக்குதல்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
### PARLIAMENTARY PENSIONS (REPEAL) BILL: DETERMINATION OF THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to inform Parliament that I have received the Determination of the Supreme Court in respect of the Bill titled "Parliamentary Pensions (Repeal)", which was challenged in the Supreme Court in terms of Article 121 (1) of the Constitution.

The Supreme Court has determined that no provision in the Bill is inconsistent with any provision of the Constitution and the Bill can be enacted by Parliament with a simple majority.

I order that the Determination of the Supreme Court be printed in the Official Report of today's Proceedings.

***ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය:***
*உயர் நீதிமன்றத் தீர்ப்பு:*
*Determination of the Supreme Court:*

**IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**"PARLIAMENTARY PENSIONS (REPEAL) BILL"**

**SC/SD/01/2026**

Petitioners : Adikari Mudiyanselage Piyasoma Upali
Midella, Deegalla
Kuliyapitiya.

Matarage Upali Sarath Danstan Amarasiri
"Sinhagiri",
Aluth Ihala,
Mapalagama (Central).

Respondent : Hon. Attorney General
Attorney General's Department,
Colombo 12.

Counsel : Dr. Wijayadasa Rajapaksha, PC with Dasun Nagashena, Shabeer Huzair instructed by Sanath Wijewardena Associates for the Petitioners.

Viveka Siriwardane, ASG with Yuresha de Silva, DSG, Fazly Razik, DSG and Navodi de Zoysa, SC for the Respondent.

**SC/SD/02/2026**

Petitioners : Marakkala Manage Premasiri
'Sagara',
Kottagoda.

Yapa Mudiyanselage Egodaha gedara Nawarathne Banda
No. 1/19,
Wepathana,
Gomagoda.

Bolognalage Nishantha Deepal Gunasekara
No. 380C, Koskolawatte,
Malwala,
Rathnapura.

Saman Siri Herath
148/1,
Parani Mawatha,
Maikkulama,
Chilaw.

Respondent : Hon. Attorney General
Attorney General's Department,
Colombo 12.

Counsel : Dr. Wijayadasa Rajapaksha, PC with Dasun Nagashena, Shabeer Huzair instructed by Sanath Wijewardena Associates for the Petitioners.

Viveka Siriwardane, ASG with Yuresha de Silva, DSG, Fazly Razik, DSG and Navodi de Zoysa, SC for the Respondent.

**SC/SD/03/2026**

Petitioner : Don Ranjith Nanda Kumarage
"Sirikumara",
Wakwella,
Galle.

Respondent : Hon. Attorney General
Attorney General's Department,
Colombo 12.

Counsel : Eraj de Silva, PC with Daminda Wijayarathne, Janagan Sundaramorthi N.K. Ashokbharan, Saman Ekanayake, Zul Luthufi, Naveed Amhed, Sanjana Mapatuna, Tharini Ratwatte and Parami Gunawardane instructed by Vidanapathirana Associates for the Petitioner.

Viveka Siriwardane, ASG with Yuresha de Silva, DSG, Fazly Razik, DSG and Navodi de Zoysa, SC for the Respondent.

**SC/SD/04/2026**

Petitioner : Edward Gunasekara
No. 55,
Negombo Road,
Katuwellagama.

Respondent : Hon. Attorney General
Attorney General's Department,
Colombo 12.

Counsel : Tharaka Nanayakkara instructed by R.M.S.P. Rathnayaka for the Petitioner.

Viveka Siriwardane, ASG with Yuresha de Silva, DSG, Fazly Razik, DSG and Navodi de Zoysa, SC for the Respondent.

**SC/SD/05/2026**

Petitioner : Achala Suranga Mabotuwana
Jagodage
No. 377/4,
Rathnarama Road,
Hokandara South.

Respondent : Hon. Attorney General
Attorney General's Department,
Colombo 12.

Counsel : Chandima Weerakkody for the Petitioner.

Viveka Siriwardane, ASG with Yuresha de Silva, DSG, Fazly Razik, DSG and Navodi de Zoysa, SC for the Respondent.

**BEFORE:** **P. PADMAN SURASENA, CJ**
**ACHALA WENGAPPULI, J**
**ARJUNA OBEYSEKERE, J**

The Bench assembled for hearing the Petitions on 22-01-2026.

Court, at the outset, with the concurrence of the learned Counsel for all the parties consolidated all the Applications bearing numbers SC/SD/01/2026, SC/SD/02/2026, SC/SD/03/2026, SC/SD/04/2026 and SC/SD/05/2026. Thereafter, the Court proceeded to hear the submissions of all Counsel who appeared for the Petitioners in all these cases and the submissions of the learned Additional Solicitor General and then concluded the hearing.

The Bill titled "Parliamentary Pensions (Repeal) Act, No. ... of 2026" (hereinafter sometimes referred to as the Bill) was published in the Gazette on 29-12-2025 and was placed on the Order Paper of Parliament on 07-01-2026.

The above-mentioned Petitioners have filed these five Petitions invoking the jurisdiction vested in this Court by virtue of Article 121 read with Articles 120 and 123 of the Constitution challenging the constitutionality of this Bill. The Petitioners have prayed for a determination from this Court under Article 123 of the Constitution.

The Bill contains four clauses, and the Petitioners in all these Petitions have challenged the Bill as a whole. The marginal notes of the four clauses of the Bill are as follows:

- Clause 1 - Short title
- Clause 2 - Repeal of the Law, No. 1 of 1977
- Clause 3 - Avoidance of doubt
- Clause 4 - Sinhala text to prevail in case of inconsistency

The Petitioners have prayed for a determination and declaration that one or more of Clauses 1 to 4 of the said Bill is/are inconsistent with one or more of the Articles 1, 3, 4, 10, 11, 12(1), 12(2), 13(5), 14, 68, 83 and 84 of the Constitution. It is on that basis that the Petitioners have sought to argue before us that the provisions in Section 83 of the Constitution shall apply to this Bill and therefore the Bill shall only become law if the number of votes cast in favour thereof amounts to not less than two-thirds of the whole number of Members (including those not present), and is approved by the People at a Referendum and a certificate is endorsed thereon by the President in accordance with Article 80.

The contents of the Bill are very short and hence for convenience, let us reproduce below, all the four clauses of this Bill in their entirety.

Long Title

*"AN ACT TO REPEAL THE PARLIAMENTARY PENSIONS LAW, NO. 1 OF 1977"*

Clause 1

*"This Act may be cited as the Parliamentary Pensions (Repeal) Act, No. of 2026."*

Clause 2

*"The Parliamentary Pensions Law, No. 1 of 1977 is hereby repealed."*

Clause 3

*"For the avoidance of doubt, it is hereby declared that any person who is entitled to receive a pension in terms of the provisions of the Parliamentary Pension Law, No. 1 of 1977, section 9 of Act, No. 1 of 1982 or section 9 of Act, No. 47 of 1990, and is in receipt of a pension under the aforesaid provisions preceding the date of commencement of this Act, shall, on and after the date of commencement of this Act, cease to receive such pension."*

Clause 4

*"In the event of any inconsistency between the Sinhala and Tamil texts of this Act, the Sinhala text shall prevail."*

Let us now turn to the arguments put forward by the Petitioners.

In the course of the submissions, the thrust launched by the learned Counsel for all the Petitioners revolved around the argument that they have a legitimate expectation to continue to draw the pensions which they have been hitherto drawing. Thereafter they sought to link this to independence of the Members of Parliament, sovereignty and even to torture and thereby sought to argue that the Bill also violates Articles 3, 11 and 12(1) of the Constitution.

The main purpose of this Bill is to repeal the Parliamentary Pensions Law, No. 01 of 1977 which had established a non-contributory pension scheme for the grant of pensions to persons who have ceased to be Members of Legislature.

Although it originally sought to provide for pensions only to persons who have ceased to be Members of Legislature, it must be noted that the amendments subsequently brought by Parliament have made considerably large extensions of this benefit in the following ways:

I. Amendment Act No. 50 of 1979 has extended the scope of the 1977 Law by including appointed members of the Ceylon (State Council) Order in Council and House of Representatives which was previously limited to elected members.

II. Then amendment Act No. 1 of 1982, extended the scope of the 1977 Law (previously limited to the Members of Legislature) to the widows/widowers of the Members of Legislature upon the death of the Members of Legislature.

III. Then amendment Act No. 33 of 1985 introduced a separate scheme of pension entitlement for persons who have held certain offices in the legislature as specified in the newly introduced Schedule by this amendment Act. The said additional entitlement also varied depending on the period of service. As per amended Section 4 of the Law, the pension is now calculated on the basic salary of the office holder as opposed to the standard pension rate of members of legislation. Additionally, this amendment Act introduces a new section (S. 7C), which entitles persons receiving pensions under this Law to a payment of all such allowances as are currently paid to public officers on their pensions. This is in addition to the pension entitlement under the Law.

IV. Then amendment Act No. 47 of 1990 further expanded the scope of the Parliamentary Pensions Law (previously limited to the Members of Legislature and extended to their widows/widowers by Amendment Act No. 1 of 1982) to include the children of Members of Legislature. Such children must be below the age of twenty-one years and are entitled to the pension upon the death of the Member of Legislature and where the spouse has predeceased the Member of Legislature OR upon death or remarriage of the spouse subsequent to the death of the Member of Legislature. Children include adopted children and further the age limit of twenty-one years may be extended in the case where a Medical Board determines the child is incapable of earning his livelihood due to physical or mental disability.

This legislative history demonstrates that the Parliamentary Pensions Law has evolved far beyond its original scope. What began as a limited and symbolic benefit has, over time, become a wide-ranging, non-contributory entitlement extending to multiple categories of persons, including family members, thereby imposing a growing financial burden on the State.

There is no dispute that all persons who have ceased to be Members of Legislature along with many others who have been brought in by subsequent Amendments, by virtue of the afore-mentioned provisions, continue to enjoy those benefits as at now. Thus, it is on the basis that the Bill will stop those persons who have hitherto benefitted from the provisions in the Law No. 01 of 1977 as amended, that the Petitioners sought to argue that this Bill, which will stop whatever they receive, is against their legitimate expectation to continue to receive all those benefits forever.

At the outset, we must mention here that if the legitimate expectation is a general ground which will operate as a bar for the Parliament to enact laws, then it will not be possible for the Parliament to enact any law to abolish, modify or change any hitherto existed system. Such impossibility would extend to both procedural and substantive laws. Thus, the concept of legitimate expectation as a general rule cannot operate as a bar to the enactment of law. It is necessary that the laws of any country must change based on the current requirements of its citizens. If legitimate expectation is allowed to restrict legislative or policy reform, it would undermine the ability of the Country to adapt laws to the subsequent changes taking place in the society, be that in its social, economic or policy needs. For instance, the fact that some persons have structured their lives according to a particular scheme of taxes imposed at that particular time, would not necessarily mean that such persons who have hitherto not been liable to pay taxes under that scheme at that time must continue to remain excepted from tax. In such a situation, there is no sense in saying that they must be allowed to continue to enjoy that benefit for ever on the basis that prior non-liability to pay taxes has created for them, a legitimate expectation that they will never ever have to pay taxes irrespective of any change in the country or its economy.

The Petitioners sought to argue that the Government has arbitrarily brought this piece of legislation to punish its opponents. However, as pointed out by the learned Additional Solicitor General, we observe that the impugned legislative initiative is not arbitrary but is rooted in a clear electoral mandate conferred upon the present Government by the people at the Presidential Election and the General Election. The Additional Solicitor General submitted that the abolition of pension entitlements granted to Members of Parliament and their families was an express and clear unequivocal commitment the present Government has given to the people. We observe that the Cabinet Memorandum dated 16th June 2025 presented by the Hon. Minister of Justice and National Integration has recorded that fact under the heading 'Background' in the following way:

*"1. Background*

*1.1 The Government invited all Sri Lankans aspiring to a thriving nation and a beautiful life to join in with the people's government in implementing the proposed activities outlined in the government manifesto.*

*1.2 Accordingly, under the policy of a dignified life - a strong country, the peoples mandate was given to abolish pension rights given to Members of the Parliament and their families.*

*1.3 The original intent of the Parliamentary Pensions Law would have been to offer modest benefits to the elected political representatives in gratitude for the services rendered similar to practices worldwide. Unfortunately, time to time these legal provisions have been misinterpreted, misused, and further amended to offer a host of benefits not only to the elected political representatives but to their families, as well*

*1.4 Given the above, after discussing with relevant agencies a model draft bill marked as Annex I has been drafted in order to repeal the Parliamentary Pensions Law, No. 1 o 1977."*

Thus, it is clear that the people of this country have given a mandate to the present Government to repeal the Parliamentary Pensions Law No. 1 of 1977. It is on that mandate from the people, that the executive acting through the Cabinet of Ministers has placed this Bill before the Parliament, which contains the peoples' representatives, to enable them to decide on it. We therefore reject the submissions made by the learned

counsel for the Petitioners that the Government has brought this piece of legislation arbitrarily to punish those who oppose the Government

The Petitioners also sought to argue that this piece of legislation violates Article 3 of the Constitution. As we have stated before, it is the people who have given this mandate. Article 3 of the Constitution states thus: *"In the Republic of Sri Lanka sovereignty is in the People and is inalienable..."*

According to Article 4 of the Constitution, the People can exercise and enjoy their Sovereignty which consists of their legislative power, through Parliament which consists of the representatives they have elected. They can also exercise their executive power through the President they have elected. Therefore, we see no merit in the submissions made by the learned Counsel for the Petitioners that this piece of legislation violates Article 3 of the Constitution. We reject the said submission.

Since the learned Counsel for the Petitioners sought to argue that the Constitution has guaranteed pensions for the Members of Parliament we carefully went through the relevant provisions in the Constitution. Having gone through the provisions of the Constitution, we observe that it has never been the intention of the Constitution to provide to those who have been covered by the Parliamentary Pensions Law, No. 01 of 1977, such benefits. We observe that whenever the Constitution has thought it fit to confer such benefits to any person whose maintenance of independence needs to be taken care of, it has specifically enacted such provisions. Article 36(2) and Article 108 of the Constitution would stand as examples.

Let us now turn to another recent Determination this Court has made. In the Special Determination of this Court on the Presidents' Entitlements (Repeal) Bill,[1] this Court did not agree with the submission of the Petitioners in that case that the benefits which the Presidents' Entitlements Act No. 04 of 1986 has given to former Presidents is something envisaged by Article 36(2) of the Constitution. The excerpt relevant in that regard taken from the said Determination is reproduced below:

> *"Therefore, we are unable to accept the argument advanced by the learned Counsel for the Petitioners that Parliament enacted Act No. 04 of 1986 as mandated by Article 36(2) of the Constitution to introduce pension entitlements to holders of the office of the President. We hold that the benefits which Act No. 04 of 1986 has given to former Presidents is not something envisaged by any provision of the Constitution. In other words, the framers of the Constitution has never even thought nor had they wanted to confer any such benefit on a person who holds office as President. As has already been mentioned above, it is only those three items, i.e. salary, allowances and pension, that the framers of the Constitution had wanted to confer on any person who holds office as President. It is only those three items, i.e. salary, allowances and pension, that the framers of the Constitution had wanted to jealously guard against any attempt to take away the said items by any subsequent amendment, repeal or replacement."*

As has been cited in SC/SD/23-28/2025, let us at this stage produce below what this Court had held in *Senarath and others* v *Chandrika Bandaranaike Kumaratunga and others*.[2] It is as follows:

> *"It has to be noted that the Presidents' Entitlement Act No. 04 of 1986 is a unique piece of legislation which grants entitlements only to former Presidents and their widows. Intrinsically it is an exception to the concept of equality before the law, since no other holder of public office is granted such benefits. It appears that there is no similar legal provision in any other country.*
>
> *The provisions of this Act being an exception in itself to equality before the law, have to be strictly interpreted and applied ..."*

We have already held that it has never been the intention of the Constitution to provide to those who have been covered by the Parliamentary Pensions Law, No. 01 of 1977, such benefits. The very purpose of the impugned Bill is to stop whatever the benefits the Petitioners and others receive up until now, under the Parliamentary Pensions Law, No. 01 of 1977 which had established a non-contributory pension scheme for the grant of pensions to persons who have ceased to be Members of Legislature. It is not disputed that one needs to earn a pension. How one could earn it must be in accordance with the Minutes on Pensions.

We observe that Section 2 of Ordinance No. 2 of 1947 has made the Minutes on Pensions a part of the written law of Ceylon from 1901.

According to Section 2 of the Minutes on Pensions, every Public Servant holding a permanent office in the service of Ceylon which has been declared to be pensionable by a notification published in the government gazette may be awarded in a pension.

Thus, for any person to be eligible to draw a pension after his retirement from a particular post, it is necessary and a pre-requisite that such permanent post must have been declared as a pensionable post by a notification in the Government Gazette published under the Minutes on Pensions. We observe that the Members of Legislature are not persons who hold permanent posts as public servants and therefore they cannot be entitled to pension benefits under the existing law with regard to the payment of pensions in this country. Thus, the above analysis of law with regard to the pensions show clearly that the benefits created and conferred on the Petitioners and the others who derive such benefits under the Parliamentary Pensions Law, No. 01 of 1977, is an exception to the concept of equality before the law. What the impugned Bill seeks to achieve is to remove the said exception to the concept of equality before the law.

We are convinced that it is that exceptional conferment, that the Parliament by the Bill impugned by the Petitioners in these instant cases, has sought to abolish. As the Constitution has not envisaged in any Article, the conferment of the benefits such as benefits under the Parliamentary Pensions Law, No. 01 of 1977, the impugned Bill which seeks to repeal the Law, No. 01 of 1977 cannot be inconsistent with any provision of the Constitution.

Let us again turn to the Special Determination of this Court on the Presidents' Entitlements (Repeal) Bill,[3], We observe that the Petitioners of that case (in SC/SD/23-28/2025) challenged the Bill titled "AN ACT TO REPEAL THE PRESIDENTS' ENTITLEMENTS ACT, NO. 4 OF 1986."

The provisions of the said Bill are reproduced below in their entirety:

> **Long Title**
>
> *AN ACT TO REPEAL THE PRESIDENTS' ENTITLEMENTS ACT, NO. 4 OF 1986.*
>
> **Clause 2**
>
> *"The Presidents' Entitlements Act, No. 4 of 1986 (hereinafter referred to as the "repealed Act") is hereby repealed."*

---

[1] SC/SD/23/2025 - SC/SD/28/2025

[2] [2007] 1 Sri LR 59 at page 77

[3] SC/SD/23/2025 - SC/SD/28/2025

**Clause 3**

*"For the avoidance of doubt, it is hereby declared that-*

*(a) any residence provided to, or monthly allowance paid to, a former President or the widow of a former President in terms of the provisions of section 2 of the repealed Act;*

*(b) monthly secretarial allowance paid to, and official transport and such other facilities provided to, a former President or the widow of a former President in terms of the provisions of section 3 of the repealed Act; and*

*(c) monthly pension paid to the widow of a former President in terms of the provisions of section 4 of the repealed Act, preceding the date of commencement of this Act, shall no longer be provided with or paid to, on and after the date of commencement of this Act."*

**Clause 4**

*"In the event of any inconsistency between the Sinhala and Tamil texts of this Act, the Sinhala text shall prevail."*

In the said case (in SC/SD/23-28/2025) the Petitioners sought to advance the following arguments before this Court:

i. The people have chosen to confer on the President the privileges set out therein as it is the President who is expected to exercise their Executive power.

ii. Exercise of Executive power of people is part of the people's sovereignty in terms of Article 3 of the Constitution.

iii. In the above circumstances, it is the people's sovereignty that had required the Parliament to confer upon the President the privileges set out in Act No. 04 of 1986.

iv. Therefore, repealing such privileges which the people have chosen to confer upon the President is a violation of their sovereignty.

v. Therefore, the Bill, as it seeks to repeal the provisions of law in Article 36(2) is inconsistent with Article 3 of the Constitution.

However, this Court in that determination did not accept the afore-said line of arguments.

We observe that the jurisdiction conferred on this Court by Article 120 of the Constitution is a jurisdiction to determine any question as to whether any Bill or any provision thereof is inconsistent with the Constitution. Article 123 of the Constitution requires this Court to state in its determination whether the Bill or any provision thereof is inconsistent with the Constitution.

For the foregoing reasons, we are unable to accept the argument advanced by the learned Counsel for the Petitioners that it was the intention of the Constitution to introduce pension entitlements to the Members of Legislature. We hold that the benefits which the Parliamentary Pensions Law, No. 01 of 1977 has given is not something envisaged by any provision of the Constitution. In other words, the framers of the Constitution have never even thought nor had they wanted to confer any such benefit on any such person.

In view of the above conclusion, we are of the view that it is neither relevant nor necessary to deal with the other arguments advanced by the Petitioners: i.e., the arguments that the proposed enactment of the impugned Bill would violate Article 1, 10, 11 and 12 also.

For the above reasons, we hold that no provision in the Bill titled "Parliamentary Pensions (Repeal) Act No. ... of 2026" which was published in the Gazette on 29-12-2025 and was placed on the Order Paper of Parliament on 07-01-2026, is inconsistent with any provision of the Constitution. We are of the view that the Bill titled "Parliamentary Pensions (Repeal) Act No. ... of 2026" can be enacted by Parliament with a simple majority.

We place on record our appreciation of the assistance given by the learned Counsel who appeared for the Petitioners, the learned Additional Solicitor-General who represented the Attorney-General, in these proceedings.

P. PADMAN SURASENA
CHIEF JUSTICE

ACHALA WENGAPPULI
JUDGE OF THE SUPREME COURT

ARJUNA OBEYESEKERE
JUDGE OF THE SUPREME COURT

## II

## පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්

## இருப்பாட்சியாளர்களைப் பாதுகாத்தல் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு

## PROTECTION OF OCCUPANTS BILL: PETITION TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 පෙබරවාරි 03 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සම් හතරට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක් 2026 පෙබරවාරි 05වැනි දින මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

## III

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම

## பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்

## MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2026 පෙබරවාරි 06 සිකුරාදා, එනම් අද දින අපර භාග 4.00ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගී වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියෝග ඉදිරිපත් කරමි.

(i) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 44, 123, 124, 125, 126, 126ආ, 128, 132, 132අ සහ 231 වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 නොවැම්බර් 17 දිනැති අංක 2463/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(ii) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 126 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 දෙසැම්බර් 17 දිනැති අංක 2467/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

මෙම නියෝග ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

Hon. Speaker, on behalf of the Chairman of the Ministerial Consultative Committee on Finance, Planning and Economic Development, I present the Report of the Ministerial Consultative Committee on Finance, Planning and Economic Development on -

(i) Annual Report of the Institute of Policy Studies of Sri Lanka for the year 2023; and

(ii) Annual Performance Report of the Inland Revenue Department for the year 2023,

which were referred to the Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජේ.සී. අලවතුවල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කටුවන, තල්වත්ත, "ජයමිණි" යන ලිපිනයෙහි පදිංචි එච්.ඩබ්ලිව්. සමන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) වලස්මුල්ල, රාජපුරගොඩ යන ලිපිනයෙහි පදිංචි ආර්.පී. මල්හාමි මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) තිස්සමහාරාම, යෝධකණ්ඩිය, උද්දකන්දර පාර, අංක 198 යන ලිපිනයෙහි පදිංචි රොෂාන් පුෂ්පකුමාර වීරකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කඹුරුපිටිය, ගතාර - බටහිර, "සුනිල් සෙවණ" අංක 187 යන ලිපිනයෙහි පදිංචි එච්.ජී. අමාලි තාරකා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) ගන්දර, දෙල්ගල්ල, නුරුව යන ලිපිනයෙහි පදිංචි පී.කේ. රුවන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) නාකුළුගමුව, දියඇල, "විජය" යන ලිපිනයෙහි පදිංචි ආර්. ශ්‍රීමාලි විජයංගා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) බුත්පිටිය, මල්වතුහිරිපිටිය, අංක 206/2 යන ලිපිනයෙහි පදිංචි ඒ.ආර්.එම්.එච්.බී. රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) රාගම, කුරුකුලාව, ශාන්ත සෙබස්තියන් මාවත, අංක 244/4/4 යන ලිපිනයෙහි පදිංචි අශෝක උපසේන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) කැලණිය, දළුගම, නුවර පාර, අංක 325 සී යන ලිපිනයෙහි පදිංචි එන්.එච්. කරන්දෙණිය මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ එකතු කරන ලද අළු අළෙවිය: ආදායම
### நுரைச்சோலை நிலக்கரி மின் உற்பத்தி நிலையத்தில் சேகரிக்கப்படும் சாம்பல் விற்பனை: வருமானம்
### SALE OF ASH COLLECTED AT NOROCHCHOLAI COAL POWER PLANT: REVENUE

679/2025

**1.**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නොරොච්චෝලේ ගල්අඟුරු බලාගාරයේ දහනයෙන් පසු එකතු වන අළු විකිණීමෙන් 2015 වර්ෂයේ සිට මේ දක්වා උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අළු විකිණීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iii) එලෙස උපයන ලද ආදායමෙන් එම බලාගාරය අවට පදිංචිවී සිටින පාරිසරික ගැටලුවලට මුහුණ දී සිටින ජනතාවගේ සුබසාධනය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நுரைச்சோலை நிலக்கரி மின் உற்பத்தி நிலையத்தில், நிலக்கரி எரியூட்டப்பட்ட பின்னர் சேரும் சாம்பல் விற்பனை மூலம் 2015ஆம் ஆண்டிலிருந்து இதுவரை ஈட்டப்பட்டுள்ள வருமானம் ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி சாம்பல் விற்பனையின்போது பின்பற்றப்பட்டுள்ள வழிமுறை யாதென்பதையும்

(iii) அவ்வாறு ஈட்டியுள்ள வருமானத்திலிருந்து இந்த மின் உற்பத்தி நிலையத்தின் சுற்றயலில் வசிக்கின்ற அத்துடன் சூழல்சார் பிரச்சினைகளை எதிர்கொண்டுள்ள மக்களின் நலனோம்புகைக்காகச் செலவிடப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House the -

(i) income generated from selling the ash collecting after combustion of coal at the Norochcholai Coal Power Plant in each of the years from 2015 to the present, separately;

(ii) method that was followed in the sale of ash; and

(iii) amount allocated from the revenue so generated for the welfare of the local residents who are settled in the vicinity of the power plant and affected by environmental problems?

(b) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2015 සිට 2024 වර්ෂය දක්වා සැහැල්ලු අළු - fly ash - විකිණීමෙන් ලද ආදායම පහත පරිදි වේ.

| වර්ෂය | සැහැල්ලු අළු විකිණීමෙන් ලද ආදායම (ශ්‍රී ලංකා රුපියල්) |
|---|---|
| 2015 | 336,151,356.00 |
| 2016 | 390,092,156.00 |
| 2017 | 284,633,238.67 |
| 2018 | 658,717,991.49 |
| 2019 | 622,966,408.99 |
| 2020 | 699,123,525.92 |
| 2021 | 786,916,554.36 |
| 2022 | 669,449,275.85 |
| 2023 | 1,149,179,830.07 |
| 2024 | 2,297,592,886.56 |
| **එකතුව** | **7,894,823,223.91** |

(ii) සැහැල්ලු අළු විකිණීම ජාතික තරගකාරී ලංසු තැබීමේ - NCB - පටිපාටිය අනුගමනය කරමින් සිදු කරනු ලබන අතර, එම ටෙන්ඩරයන්හි විස්තර පහත පරිදි වේ.

| කාල සීමාව | විස්තරය |
|---|---|
| **2011 - 2015** | නොරොච්චෝලේ විදුලි බලාගාරය ආරම්භයේ දී පළමු බලාගාරයෙන් නිකුත් වන සැහැල්ලු අළු විකිණීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද ටෙන්ඩරය අනුව 2011 සිට වර්ෂ පහක් කටයුතු සිදු කර ඇත. |
| **2015 - 2018** | වර්ෂ තුනක් සඳහා දෙවන හා තුන්වන බලාගාර ඒකක සැහැල්ලු අළු විකිණීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද දෙවන ටෙන්ඩරය 2015 වර්ෂයේ සිට ආරම්භ කර ඇත. |
| **2018 - 2023** | වර්ෂ පහක් සඳහා බලාගාර ඒකක තුනේම සැහැල්ලු අළු විකිණීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද තෙවන ටෙන්ඩරය 2018 පෙබරවාරි මාසයේ සිට ආරම්භ කර ඇත. |
| **2023 - 2024** | සමස්ත ඒකක තුනේම සැහැල්ලු අළු විකිණීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද සිව්වන ටෙන්ඩරය 2023 ජූලි මාසයේ සිට 2024 සැප්තැම්බර් මාසය දක්වා වූ කාල සීමාව සඳහා ක්‍රියාත්මක වී ඇත. |
| **2024 - 2027** | සමස්ත බලාගාර ඒකක සැහැල්ලු අළු විකිණීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද පස්වන ටෙන්ඩරය 2024 ඔක්තෝබර් මාසයේ සිට 2027 සැප්තැම්බර් මාසය දක්වා වසර තුනක කාල සීමාවක් සඳහා ක්‍රියාත්මක වේ. |

[ගරු කුමාර ජයකොඩි මහතා]

(iii) 2015 සිට 2024 වර්ෂය දක්වා සැහැල්ලු අළු විකිණීමෙන් ලද ආදායමෙන් ආයතනික සමාජ වගකීම - CSR - සඳහා දරන ලද වියදම් පහත පරිදි වේ;

| වර්ෂය | ආයතනික සමාජ වගකීම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය (ශ්‍රී ලංකා රුපියල්) |
|---|---|
| 2015 | - |
| 2016 | 12,526,000.00 |
| 2017 | - |
| 2018 | 2,891,690.50 |
| 2019 | 3,534,973.60 |
| 2020 | 4,552,732.80 |
| 2021 | 19,546,811.16 |
| 2022 | 7,010,556.66 |
| 2023 | 2,188,968.25 |
| 2024 | 39,646,625.04 |
| **එකතුව** | **91,898,358.01** |

විශේෂයෙන්ම 2024දී වැඩි මුදලක් වෙන් කර තිබෙනවා. ඒ ප්‍රමාණය රුපියල් මිලියන 39ක්.

(ආ) අදාළ නොවේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න පෙර මට අවස්ථාවක් දෙනවාද, පොඩි පැහැදිලි කර ගැනීමකට?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඒ පැහැදිලි කර ගැනීම අතුරු ප්‍රශ්නය තුළම කරන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

එතකොට, ඔබතුමා එච්චර වස වෙලා. හොඳයි, බොහොම හොඳයි.

ගරු කථානායකතුමනි, රුපියල් බිලියන 7ක, 8ක වාගේ ආදායමක් මේ අළු - ash - විකුණා ලබාගෙන තිබෙනවා. හැබැයි, මේකෙන් මේ ප්‍රදේශයේ ජනතාවගේ සුබසාධනය සඳහා සහ අනෙකුත් වැඩසටහන්වලට වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 91යි. ගරු කථානායකතුමනි, ඒක කොච්චර අසාධාරණද කියලා ඔබතුමාට තේරෙන්නේ නැහැ. මොකද, ඔබතුමා ඉන්නේ ඔය පුටුවේ නිසා. හැබැයි, ඒ ප්‍රදේශයේ ජනතාවට ඒක විශාල අසාධාරණයක්. මොකද, ඒ ප්‍රදේශයේ ජනතාව තමයි මේ පරිසර හානියට මුහුණ දීලා ඉන්න කණ්ඩායම. එක පැත්තකින් ධීවර ජනතාව; අනික් පැත්තෙන් විශේෂයෙන්ම ගොවි ජනතාව; ඒ වාගේම ඒ ගෙවල්වල ජීවත් වන ජනතාව. මොකද, ඒ ජනතාවට රෙද්දක් වේළාගන්න වැලකට දාන්න බැහැ. රෙද්දක් වැලකට දාලා වේළා ගත්තාට පස්සේ අන්තිමට ඒ හෝදපු රෙද්ද නැවත හෝදන්න වෙනවා. මොකද, ඒකේ අළු. ඒ ප්‍රදේශයේ තිබෙන්නේ එවැනි තත්ත්වයක්. ඒකටත් මෙතෙක් විසඳුමක් දීලා නැහැ. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා තවම අවුරුද්දයි. හැබැයි, ඊට පෙරත් ඔය ප්‍රශ්නය තිබුණා.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි. එවැනි තත්ත්වයක් තිබෙනකොට අලුතෙන් බාල ගල් අඟුරු ගෙනැල්ලා දැන් විශාල ප්‍රශ්නයකුත් ඇති වෙලා තිබෙනවා. ඒ ගල් අඟුරු දහනය කරද්දී සියයට 16කට වඩා අළු ආවොත්, ඒක පරිසරයට බරපතළ ප්‍රශ්නයක් වනවා. එක පැත්තකින් පාරිසරික ප්‍රශ්නවලට මුහුණ දීලා ජනතාව දුක් විඳිනකොට නැවත වතාවක් ජනතාවට ඊට වඩා හානියක් වෙන විධියට, පරිසරයට හානියක් වෙන විධියට, අළු නිෂ්පාදනය වෙන විධියට බාල ගල් අඟුරු දහනය කරනවා නම්, ඒක විශාල ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා අපි විශේෂ ඉල්ලීමක් කරනවා සහ ප්‍රශ්නයක් හැටියට මෙය අහනවා. මේ ගල් අඟුරු දහනය කිරීම සම්බන්ධව පරිසර වාර්තාවක් මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි. "උත්තරීතර" කියන එක ඉදිරි කාලයේදී වැරදි වෙයිද දන්නේ නැහැ, මේ පාර්ලිමේන්තුව ගැන එළියේ යන කථා බහත් එක්ක. හැබැයි, අපට බලපත්‍රයක්, එහෙම නැත්නම් පරිසර වාර්තාවක් අවශ්‍යයි, මේ දහනය කරන අළු සම්බන්ධයෙන්. විශේෂයෙන්ම මේ අළු සමාජයට හිතකරද, අහිතකරද කියන ප්‍රශ්නය විසඳා ගන්න අවශ්‍යයි. ඒ නිසා පරිසර වාර්තාවක් අවශ්‍යයි. ඒක ලබා දෙනවාද කියන එක තමයි පළමුවැනි අතුරු ප්‍රශ්නය හැටියට මම අහන්නේ.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු මන්ත්‍රීතුමනි, පරිසර වාර්තාවක් ලබා දීම පරිසර අමාත්‍යාංශය හෝ ඒ අදාළ අංශ විසින් සිදු කළ යුතුයි. ඔබතුමාගේ පැහැදිලි කිරීම ගත්තොත්, ඔබතුමා බොහොම අත්දැකීම් බහුලව ඇඳුම්වලට ඇති වන ප්‍රශ්නයත් එක්කම ඒ ගැන කථා කළා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව තිබුණු 2015, 2017 කියන වසර දෙකේ ශත පහක්වත් මේ වෙනුවෙන් වියදම් කරලා නැහැ. මම හිතන විධියට ඒ කාලයේ ඇඳුම් අඳින්නේ නැතුව ඇති. මොකද, 2015දීත් ශත පහක්වත් මේ වෙනුවෙන් වියදම් කරලා නැහැ. 2017දීත් ශත පහක්වත් වියදම් කරලා නැහැ. ඉස්සෙල්ලා තමන් කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා බැලුවා නම් හොඳයි. මොකද, අපි ආරම්භ කරපු වසරේම රුපියල් මිලියන 39ක් ඒ වෙනුවෙන් වියදම් කර තිබෙනවා. ඒක තමයි ඉතිහාසයේ ඒ වෙනුවෙන් වෙන් කළ වැඩිම මුදල. අපි කිසිම විටක පැකිළෙන්නේ නැහැ, අවශ්‍ය සමාජ සුබසාධනය වෙනුවෙන් කටයුතු කරන්න. ඒක fly ash ද, වෙන දෙයක් ද කියන එක අපේ ආණ්ඩුවට අදාළ නැහැ.

ඒ වාගේම ඔය fly ash ප්‍රතිශතය වැඩි වීම පිළිබඳව කථා කළොත්, ඔය කියන තරම් ඒවා එළියට යන්නේ නැහැ. Fly ash කිව්වාම මිනිස්සු හිතන්නේ fly වෙලා ඒවා එළියට එනවා කියලා. මේක චිමිනිය ඇතුළේ බැඳෙන එකක්. ඊට පස්සේ hammer system එකකින් තමයි ඒක කඩලා පල්ලෙහාට ගන්නේ. එහෙම ගත්ත ගමන්ම ඒවා එළියට යන්නේ නැහැ. මොකද, මේකට ඉල්ලුම්කරුවෝ ඕනෑ තරම් ඉන්නවා. අපේ මාර්ග සංවර්ධන අධිකාරියත් පෝලිමේ ඉන්නවා, මේ අළු මිලදී ගන්න. ඒ නිසා මේවා එළියට විමෝචනය වෙන්නේ නැහැ. මේවා එළියට යන ඒවා නොවෙයි. *[බාධා කිරීමක්]* ඒ නිසා මම හිතනවා, ඒක ප්‍රශ්නයක් වෙන්නේ නැහැ කියලා. *[බාධා කිරීමක්]* පරිසර අමාත්‍යාංශය සහ ඒ අදාළ අංශවලින් අපට යම් නිර්දේශයක් දුන්නොත් අපි ඒ අනුව කටයුතු කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නයත් මම අහනවා. ගරු ඇමතිතුමනි, ඇඳුම් ඇඳගෙන ඉන්නවාද, ඇඳුම් ගලවාගෙන ඉන්නවාද කියන එක දැන් රටටම හෙළි වී ගෙන යනවා. ඒක වෙන ප්‍රශ්නයක්. හැබැයි, එතැන අළු වැටෙනවාද, නැද්ද කියලා තමුන්නාන්සේ දන්නේ නැහැ. මොකද, තමුන්නාන්සේ එතැනට ඇඳුම් ඇඳගෙන යනවාද, නැද්ද කියන්න මම දන්නේ නැහැ. එතැන අළු වැටෙන විධිය ගැන ඒ ජනතාවගෙන් ගිහිල්ලා ඇහුවොත් ඒ අය තමුන්නාන්සේට හොඳ එකෙන්ම කියයි. මොකද, ඒ ප්‍රදේශයේ ජනතාව දන්නවා, කථා කරන විධිය. ඒ නිසා අළු වැටෙනවාද, නැද්ද කියන එක ගැන කථා කරන්න එන්න එපා. බොරු පණ්ඩිතකම් කියන්නත් එපා. අනෙක, 2015, 2016 වසරවල කථාවක් නොවෙයි මම ඇහුවේ, සම්පූර්ණ කාලය ගැන. ඒ සියලු දෙයටම ඇඟිල්ල දික් කරලා තමයි මම ඒ ප්‍රශ්නය ඇහුවේ. තමුන්නාන්සේලාට මම කිව්වා, අවුරුද්දක් කියලා. නිකම් උද්ධච්ච විධියට උත්තර දෙන්න එපා. උත්තර දෙන්න හරි විධියට, දැන් මේ පරිසරය හදන විධිය ගැන.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම දැන් බාල ගල් අඟුරුවල ප්‍රශ්නයක් තිබෙනවා. මම මේ කථා කරන්නේ අළු - ash - සම්බන්ධව. මේ අළු නිසා පරිසරයට විශාල හානියක් වෙනවා, මෙතුමා එහෙම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ කිව්වාට. පරිසර ඇමතිවරයා මෙතැනදී මේ ගැන නැඟිටලා කියන්න ඕනෑ. ඒක පරිසර ඇමතිවරයාට භාරව තිබෙන කාර්යයක්. ඒ ගැන මට වඩා හොඳට පරිසර ඇමතිවරයා මේ ඇමතිතුමාගෙන් අහන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
අහන්න ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විනාඩි දෙකයි ප්‍රශ්නයකට තිබෙන්නේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ප්‍රශ්නය අහන්න ඕනෑ හරි විධියට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විනාඩි දෙකයි තිබෙන්නේ ප්‍රශ්නයකට.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඔබතුමා මොකක්ද කියන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්නයක් පැන නැඟීමට විනාඩි දෙකයි දෙන්න පුළුවන් වන්නේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

විනාඩි දෙකට වඩා ගත වුණොත් හිරේ දානවාද, මොනවා හරි කරනවාද? හරි, කමක් නැහැ. මම අහන්නේ ජනතාවට දැනට විශාල වශයෙන් බලපාන ප්‍රශ්නයක් ගැන. ගල් අඟුරු ගෙනෙද්දී ඒවා බාල ගල් අඟුරු නිසා නතර කරන්න සිද්ධ වුණා කියලා අපි හිතමු. හැබැයි, නැවත වතාවක් එහෙනම් ගල් අඟුරු ගෙනෙන්න ඕනෑ. අප්‍රේල් වෙන්න ඉස්සෙල්ලා ඒවා ගෙනැල්ලා බාලා ඉවර කළේ නැත්නම් මේ රටට විදුලිය ලැබෙන්නේ නැහැ.

ඊළඟ කාරණය මේකයි. විශේෂයෙන් ගල් අඟුරු එහෙන් නැවට පටවනකොට සහ නැවෙන් බානකොට කියන අවස්ථා දෙකේදීම වාර්තා දෙකක් ගන්නවා. ඒවා පරීක්ෂා කරලා හොඳද, නරකද කියලා බලනවා. මම තවමත් පාර්ලිමේන්තුව උත්තරීතරයි කියනවා. හැබැයි, ඒ කරපු පරීක්ෂණවල වාර්තා මේ උත්තරීතරයි කියන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන්ද කියන එකයි මම අහන්නේ. ඒ වාර්තා සභාගත කරන්න පුළුවන්ද?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
පුළුවන්.

## කොළඹ මහ නගර සභා බලප්‍රදේශයේ පාසල්: ගුරු හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු

## கொழும்பு மாநகர சபைப் பிரதேசப் பாடசாலைகள்: ஆசிரியர் மற்றும் கல்விசாரா பணியாளர் வெற்றிடங்கள்

## SCHOOLS WITHIN COLOMBO MUNICIPAL COUNCIL AREA: TEACHERS AND NON-ACADEMIC STAFF VACANCIES

811/2025

**2. ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ මහ නගර සභා බලප්‍රදේශයේ ඇති, මධ්‍යම රජයට සහ පළාත් සභාවට අයත් පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) මේ වනවිට එම පාසල්වල පවතින ගුරු හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් අධ්‍යාපන කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) කොළඹ මහ නගර සභා බලප්‍රදේශයේ ඇති පාසල් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு மாநகர சபை ஆளுகைப் பிரதேசத்தில் அமைந்துள்ள, மத்திய அரசாங்கத்திற்கும் மாகாண சபைக்கும் உரித்தான பாடசாலை களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(ii) மேற்படி பாடசாலைகளின் பெயர்கள் யாவை;

(iii) இன்றளவில் அந்தப் பாடசாலைகளில் காணப்படும் ஆசிரியர் வெற்றிடங்கள் மற்றும் கல்விசாரா பணியாளர்களின் வெற்றிடங்கள் ஒவ்வொரு கல்வி வலயத்துக்கும் ஏற்ப வெவ்வேறாக யாது;

(iv) கொழும்பு மாநகர சபை ஆளுகைப் பிரதேசத்தில் அமைந்துள்ள பாடசாலைகளை அபிவிருத்தி செய்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of schools in the Colombo Municipal Council area, separately as schools which are governed under the Central Government and those governed under the Provincial Ccouncil;

(ii) names of the aforesaid schools;

(iii) number of vacancies existing for teachers and non-academic staff in the said schools at present, as per each educational zone, separately; and

(iv) measures taken to develop the schools in the Colombo Municipal Council area?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| කලාපය | ජාතික | පළාත් | මුළු එකතුව |
|---|---|---|---|
| කොළඹ | 21 | 101 | 122 |

(ii) කොළඹ කලාපයේ ඇති ජාතික පාසල්වල නම් පහත ඇමුණුම 01 මඟින්ද, කොළඹ කලාපයේ ඇති පළාත් සභා පාසල්වල නම් ඇමුණුම 02 මඟින් ද ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 01

කොළඹ කලාපය ජාතික පාසල් 21 යි

| Seq. No. | census No | School Name |
|---|---|---|
| 1 | 23 | KOTAHENA M.M.V. |
| 2 | 45 | COLOMBO ROYAL COLLEGE |
| 3 | 46 | COLOMBO ANANDA COLLEGE |
| 4 | 47 | COLOMBO NALANDA COLLEGE |
| 5 | 48 | COLOMBO THURSTAN COLLEGE |
| 6 | 50 | COLOMBO ANANDA B.V. |
| 7 | 51 | COLOMBO GOTHAMI B.V. |
| 8 | 60 | COLOMBO D.S.SENANAYAKE COLLEGE |
| 9 | 66 | COLOMBO DEVI B.V. |
| 10 | 74 | COLOMBO SIRIMAVO BANDARANAYAKE BALIKA VIDYALAYA |
| 11 | 77 | COLOMBO ISIPATHANA COLLEGE |
| 12 | 78 | COLOMBO LUMBINI VIDYALAYA |
| 13 | 79 | COLOMBO MAHANAMA COLLEGE |
| 14 | 80 | MILAGIRIYA ST. PAUL'S GIRL'S SCHOOL |
| 15 | 81 | COLOMBO VISAKHA V. |
| 16 | 204 | HAMEED AL-HUSSEINIE COLLEGE |
| 17 | 210 | VIVEKANANDA NATIONAL SCHOOL |
| 18 | 236 | BAMBALAPITIYA MUSLIM LADIES COLLEGE |
| 19 | 237 | BAMBALAPITIYA HINDU COLLEGE |
| 20 | 241 | BAMBALAPITIYA RAMANATHAN HINDU LADIES COLLEGE |
| 21 | 453 | DEFENCE SERVICES COLLEGE |

ඇමුණුම 02

**කොළඹ කලාපය පළාත් පාසල් 101 යි**

| Seq. No. | census No | School Name |
|---|---|---|
| 1 | 1 | MODARA DE LA SALLE COLLEGE |
| 2 | 2 | MODARA ANANDA M.M.V. |
| 3 | 3 | MODARA ST. ANTHONY'S B.M.V. |
| 4 | 4 | KOTAHENA KUMARA V. |
| 5 | 5 | ST. JOHN'S M.V. |
| 6 | 6 | KOTAHENA ST. LUCIA'S COLLEGE |
| 7 | 7 | KOTAHENA CATHEDRAL BOYS COLLEGE |
| 8 | 8 | KOTAHENA PRESIDENT'S COLLEGE |
| 9 | 10 | MODARA SRI MEDHANANDA V. |
| 10 | 11 | MODARA ST. JOHN'S VIDYALAYA |
| 11 | 12 | MATTAKKULIYA AVE MARIA V. |
| 12 | 13 | SRI SANGHABODHI M.V. |
| 13 | 14 | BLOEMENDHAL SINHALA V. |
| 14 | 16 | KOTAHENA SRI GUNANANDA V. |
| 15 | 17 | THOTAWATTA METHODIST VIDYALAYA |
| 16 | 18 | KOTAHENA ROMAN CATHOLIC B.V. |
| 17 | 19 | MODARA ST. JAME'S P.V. |
| 18 | 20 | MAHAWATTA ST. ANTHONY'S SINHALA V. |
| 19 | 21 | MADAMPITIYA ST. ANTHONY'S B.P.V. |
| 20 | 22 | AGAMETHI VIDYALAYA |
| 21 | 24 | SRI SANGARAJA M.M.V. |
| 22 | 25 | MAHABODHI M.V. |
| 23 | 26 | DEMATAGODA RAJASINGHE M.V. |
| 24 | 27 | MIHINDU MAWATHA SINHALA M.V. |
| 25 | 28 | SIRI SARIPUTHTHA M.V. |
| 26 | 29 | VIJAYABA M.V. |
| 27 | 30 | GRANDPASS ST. JOSEPH'S B.M.V. |
| 28 | 31 | GRANDPASS ST. JOSEPH'S BOYS VIDYALAYA |
| 29 | 32 | WOLFENDHAL B.M.V. |
| 30 | 33 | DEMATAGODA ST. ANTHONY'S B.M.V. |
| 31 | 34 | CLIFTON B.V. |
| 32 | 35 | HOLY ROSARY R.C.SINHALA V. |
| 33 | 36 | VIHARAMAHA DEVI B.V. |
| 34 | 37 | HEMAMALI B.V. |
| 35 | 38 | ST. MARY'S VIDYALAYA |
| 36 | 39 | HARWARD VIDYALAYA |
| 37 | 40 | JAYANTHI VIDYALAYA |
| 38 | 41 | KOTAHENA SINHALA K.V. |
| 39 | 42 | A.E.GUNASINGHA V. |
| 40 | 43 | ST. SEBASTIAN SINHALA V. |
| 41 | 44 | SIR BARON JAYATHILAKA V. |
| 42 | 49 | DEMATAGODA ST. MATHEWS COLLEGE |
| 43 | 52 | DEMATAGODA ST. JOHN'S COLLEGE |
| 44 | 53 | SEEVALI M.M.V. |
| 45 | 54 | SUSAMAYAWARDHANA M.V. |
| 46 | 55 | ANURUDDHA B.V. |
| 47 | 56 | MAHINDA VIDYALAYA |
| 48 | 57 | COLOMBO YASODARA B.V. |
| 49 | 58 | PRESBYTEERIAN GIRL'S SCHOOL |

| Seq. No. | census No | School Name |
|---|---|---|
| 50 | 59 | RATHNAWALI B.M.V. |
| 51 | 61 | ALL SAINTS' B.M.V. |
| 52 | 62 | VELUWANA COLLEGE |
| 53 | 63 | SRI SANGHAMITHTHA B.V. |
| 54 | 64 | COLOMBO ASOKA V. |
| 55 | 65 | C.W.W.KANNANGARA V. |
| 56 | 67 | NARAHENPITA SUJATHA B.V. |
| 57 | 68 | ARETHUSA V. |
| 58 | 70 | MAHAMATHYA V. |
| 59 | 71 | SRI SADDHARMODAYA M.V. |
| 60 | 72 | S.W.R.D. BANDARANAYAKE VIDYALAYA |
| 61 | 73 | THIMBIRIGASYAYA VIDYATHILAKA V. |
| 62 | 76 | DUDLEY SENANAYAKA V. |
| 63 | 82 | ST. ANTHONY'S B.M.V. |
| 64 | 83 | WELLAWATTA ST. CLARE'S B.M.V. |
| 65 | 84 | BAMBALAPITIYA LINDSEY B.V. |
| 66 | 87 | ST. MARY'S B.M.V. |
| 67 | 88 | ST. MICHAEL'S COLLEGE |
| 68 | 90 | ST. MARY'S SINHALA MIXED VIDYALAYA |
| 69 | 201 | AL-HIDHAYA V. |
| 70 | 202 | MARYAM BALIKA VIDYALAYA |
| 71 | 203 | AL-NASSER VIDYALAYA |
| 72 | 205 | DHARUSSALAAM M.V. |
| 73 | 206 | T.B.JAYAH ZAHIRA V. |
| 74 | 207 | FATHIMA MUSLIM LADIES COLLEGE |
| 75 | 208 | DEMATAGODA KHAIRIYA B.V. |
| 76 | 209 | ST. SEBASTIAN T.M.V. |
| 77 | 211 | AL-HIKMA V. |
| 78 | 212 | MARADANA HINDU VIDYALAYA |
| 79 | 213 | ST. ANNE'S TAMIL BALIKA MAHA VIDYALAYA, COLOMBO 13 |
| 80 | 214 | ST. ANTHONY'S ROMAN CATHOLIC BOYS M.V. |
| 81 | 215 | KANAPATHY HINDU LADIES M.V. |
| 82 | 216 | HOLY ROSARY TAMIL V. |
| 83 | 218 | COLOMBO CENTRAL HINDU M.V. |
| 84 | 219 | DR. BADIUDDIN MAHMUD COLLEGE |
| 85 | 220 | SIR RAZIK FAREED MUSLIM V. |
| 86 | 221 | HAMZA MUSLIM V. |
| 87 | 222 | KALAIMAGAL TAMIL V. |
| 88 | 223 | ST. ANTHONY'S TAMIL M.V. |
| 89 | 224 | KOTAHENA GOOD SHEPHERD B.M.V. |
| 90 | 225 | MUTWAL HINDU COLLEGE |
| 91 | 226 | KOTAHENA METHODIST TAMIL V. |
| 92 | 229 | AL-HAKEEM VIDYALAYA |
| 93 | 230 | VIPULANANTHA TAMIL M.V. |
| 94 | 231 | AL-HIJRA MUSLIM V. |
| 95 | 232 | DR. THANINAYAGAM TAMIL V. |
| 96 | 234 | KUMARAUTHAYAM TAMIL V. |
| 97 | 235 | COLOMBO 06 RAMAKRISHNA VIDYALAYA |
| 98 | 238 | COLOMBO 03 AL-AMEEN VIDYALAYA |
| 99 | 239 | COLOMBO 04 ST. MARY'S TAMIL V. |
| 100 | 240 | KOLLUPITIYA METHODIST GOVERNMENT TAMIL V. |
| 101 | 465 | MODARA ANANDA P.V. |

(iii) මේ වනවිට ජාතික පාසල් ගුරු පුරප්පාඩු 665ක්ද, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඒකාබද්ධ සේවයට අයත් පුරප්පාඩු 132ක්ද, ඒකාබද්ධ සේවයට අයත් නොවන පුරප්පාඩු 236ක්ද, සම්පූර්ණ වශයෙන් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 164ක් සහ පළාත් පාසල් සඳහා පුරප්පාඩු 513ක් ද පවතිනවා.

(iv)
- කොළඹ මහ නගර සහා බලප්‍රදේශයේ ඇති ජාතික පාසල්වලට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා අලුත්වැඩියාව සඳහා සහ ද්විතීයික අංශයේ ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීම හා පාසල් ගොඩනැඟිලි ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් මිලියන 490ක් වෙන් කරන ලදී.
- කොළඹ මහ නගර සහා බලප්‍රදේශයේ ඇති පළාත් පාසල් සඳහා 2025 වර්ෂය සඳහා පුනරාවර්තන ව්‍යාපෘති යටතේ ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් මිලියන 443ක් යොදවා ඇත.
- තවද, 2026 වර්ෂය සඳහා ඉහත සංවර්ධන කටයුතුවලට ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි ඔබතුමා දන්නවා, කොළඹ මහ නගර සභා සීමාව සහ ඒ අවට ප්‍රදේශවල ජාතික පාසල් සහ පළාත් සභා පාසල් තිබෙන බව. පළාත් සභා පාසල් තමයි වැඩියෙන්ම තිබෙන්නේ. පළාත් සභා පාසල්වලට ඇවිල්ලා ඉගෙන ගන්න බහුතරය විශේෂයෙන් ඒ අවට ප්‍රදේශවල ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල්වල ළමයින්. මේ අලුත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පළමුවැනි ශ්‍රේණියේ ප්‍රතිසංස්කරණ මේ වසරේ සිට පටන් අරගෙන තිබෙනවා. ඒ පටන් ගැනීම තුළ ජාතික පාසල්වලට වාගේම ආර්ථික වශයෙන් යම්කිසි ශක්තියක් තිබෙන දෙමව්පියන්ගේ ළමයින් එන පාසල්වලට කිසිදු ආකාරයේ ගැටලුවක් මතු වෙලා නැහැ. ඒ දෙමව්පියෝ ඉස්සරහට ඇවිල්ලා පළමුවැනි ශ්‍රේණියට අවශ්‍ය කරන smart boards, Internet facilities අරන් දෙන්න කටයුතු කරලා තිබෙනවා. නමුත්, අඩු ආදායම්ලාභී පවුල්වල ළමයින් එන පාසල් මෙහිදී විශාල අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. මොකද, ඒ දෙමව්පියන්ට එවැනි ශක්තියක් නැහැ, ඒ ළමයින්ගේ පන්ති කාමරයට smart board එකක් අරන් දෙන්න, Internet facilities අරන් දෙන්න. පළමුවැනි ශ්‍රේණියට අදාළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ අලුත් මොඩියුලය තුළ QR codes විසි ගාණක් තිබෙනවා, මම නිවැරදි නම්. ළමයින්ට ඒවා අධ්‍යයනය කිරීමට අන්තර්ජාල පහසුකම් අනිවාර්යයෙන්ම අවශ්‍ය වෙනවා. ඉතින්, මේ අඩු ආදායම්ලාභී දෙමව්පියන්ගේ දරුවන් එන පාසල්වල මේ පහසුකම් නොමැති වීම නිසාම අධ්‍යාපනය තුළ විෂමතාවක් ඇති වෙනවා. අගමැතිතුමිය එදා ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වලා කිව්වා, "අපි මාර්තු මාසයේ ඉඳලා තමයි උපකරණ ලබා දෙන්නේ" කියලා. මාර්තු මාසය කියන්නේ, මේ වසරේ තුන්වැනි මාසය. ඒ මාස තුනක කාලය තුළ අඩු ආදායම් ලබන දෙමව්පියන්ගේ දරුවන් එන පාසල්වල පළමුවැනි ශ්‍රේණියේ දරුවන්ට ලබා දෙන විකල්පය මොකක්ද?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය ඇසීම පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. *[බාධා කිරීමක්]* මෙවැනි කාරණාවක් තමයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා. මුලින්ම විෂය නිර්දේශ ගත්තොත්, පළමුවැනි ශ්‍රේණියේ දරුවන්ට තමයි නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ අපි මේ අවුරුද්දේ ඉගැන්වීම් පටන් ගත්තේ. ඒ වාගේම, පැරණි විෂය නිර්දේශය යටතේ තමයි 6වැනි ශ්‍රේණියේ ඉගැන්වීම් කරන්නේ. එතකොට, පළමුවැනි ශ්‍රේණියේ - මේක නිශ්චිතයි - අධ්‍යාපන කටයුතු සඳහා ඩිජිටල් පුවරු හෝ ඩිජිටල් මෙවලම් - digital devices - අවශ්‍ය නැහැ. අපි මේක කිහිප වතාවක්ම සඳහන් කළා. විශේෂයෙන්ම අපට සමහර විද්‍යාලවලින් පැමිණිලි ලැබී තිබුණා, smart boards සහ smart devices ලබා ගැනීම සඳහා මුදල් එකතු කරනවාය කියලා. ඒ සම්බන්ධයෙන් පැමිණිලි කිහිපයක් ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා තමයි ගරු අගමැතිතුමිය සඳහන් කළේ, පළමුවැනි ශ්‍රේණිය සඳහා මුදල් එකතු කිරීම අවශ්‍ය නැහැ කියලා.

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

ඒ වාගේම තවත් කාරණයක් තිබෙනවා. මේ වෙනකොට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවත්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත් එකතු වෙලා චීන ආධාර යටතේ පළාත් සහ ජාතික සියලුම පාසල්වලට ඩිජිටල් උපකරණ ලබා දීමේ වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක කරමින් තිබෙනවා. ඉදිරියේදී අවශ්‍යතාව මත, පාසලට බරක් නොවී, දෙමව්පියන්ට බරක් නොවී ඩිජිටල් ක්‍රමයට යන්න පුළුවන්. මේ මොහොතට අදාළව digital devices අවශ්‍ය නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අපි ඉදිරියේදී සියලුම පාසල්වලට ඩිජිටල් මෙහෙයුම් පද්ධතිය ලබා දෙන්න සූදානම් කරලා තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මෙතුමා devices අවශ්‍ය නැහැ කියලා කිව්වාට ජාතික පාසල්වල, ඉහළ පාසල්වල දරුවන්ගේ දෙමව්පියන් මේ වෙනකොට smart boards අරගෙන දීලා වැඩ පටන් අරගෙන තිබෙන්නේ. මෙතුමා කියනවා දන්නේ නැහැ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ප්‍රශ්නයක් නොවෙයි, මම පැහැදිලි කරගැනීමක් මේ කරන්නේ, ගරු කථානායකතුමනි. මගේ අතුරු ප්‍රශ්නය අහන්නම්.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එහෙම නම් ඔබතුමා දැනුම් දෙන්න ඉහළ පාසල්වල ඒවා පාවිච්චි කරන්න එපා කියලා. මොකද, නැත්නම් පහළ පාසල්වල ඉන්න දරුවන්ට ඒ අධ්‍යාපනය ලැබෙන්නේ නැහැ. ආර්ථික වශයෙන් ශක්තියක් තිබෙන දෙමව්පියන්ගේ දරුවන් ඉන්න පාසල්වල ඒ අධ්‍යාපනය ලැබෙනවා. එතකොට අධ්‍යාපනය තුළ විෂමතාවක් ඇති වෙනවා, ඔබතුමන්ලා යටිතල පහසුකම් ලබා නොදීම නිසා.

මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මට මේ ප්‍රශ්නයට කිහිප වතාවක් උත්තර දුන්නා. මම මීට මාස අටකට කලිනුත් ඇහුවා, මීලාද් විද්‍යාලයේ ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම සම්බන්ධයෙන්. ඒ ප්‍රදේශයේ තිබෙන, දෙමළ මාධ්‍යයෙන් උගන්වන එකම මුස්ලිම් පාසල මේක විතරයි. අපි දන්නවා, මේ වෙනකොට ඉඩ කඩ මදිවීම නිසා ඒ පාසල විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා කියලා. පසුගිය පළාත් පාලන මැතිවරණය වෙලාවේදී අගමැතිතුමිය සමඟ පැවැත්වූ සාකච්ඡාවේදී අගමැතිතුමිය ඒ පාසලේ ඉන්න දෙමව්පියන්ට, SDS එකට වාචික පොරොන්දුවක් ලබා දුන්නා, මැතිවරණය අවසන් වෙච්ච ගමන් ඉඩමක් ලබා දෙනවා, නැත්නම් වෙනත් පාසලක් ලබා දෙනවා කියලා. අද වනකොට අපට පේනවා, ඒ වාචිකව ලබා දුන් පොරොන්දුව ඉෂ්ට වෙන්නේ නැහැ කියලා. ඒ වාගේම ඒ පාසලේ දෙමව්පියන් ඒ ප්‍රදේශයේ තිබෙන රජයේ ඉඩම් හඳුනාගෙන ඒ ඉඩම් නම් කරලා දුන්නා. රජයේ ඉඩම් නම් කරලා දුන්නාට පස්සේ ලබා දෙනවා කිව්වත්, අද වෙනකම් තොරතුරක් නැහැ.

ඊළඟ කාරණාව මේකයි. පාසල් කිහිපයක් හඳුනා ගත්තා. මම දන්නවා, ඒ පාසල් ලබා දෙනකොට යම් යම් විරෝධතා ඇවිල්ලා ඒ කටයුතු නැවතුණා කියලා. මීට මාසයකට කලින් ඒ දෙමව්පියෝ ගිහිල්ලා ඒ සඳහා තවත් පාසලක් හඳුනාගත්තා. ඒ පාසලේ ඉන්න පූජකතුමා එකඟ වෙලා ලිපියකුත් ලබා දුන්නා, තාවකාලිකව ඒ පාසලේ ඒ කටයුත්ත පටන් ගන්න කියලා. ඒ පාසල අර කියපු පාසල ළඟම තිබෙන පාසලක්. මොකද, ඒ පාසල වැසී යන පාසලක්. ඒ ලියුම ලබා දීලාත් දැන් සුමාන දෙකකට වඩා අධික කාලයක් වෙනවා. කලාප අධ්‍යාපන කාර්යාලයෙන් තවම ඒ අනුමැතිය ලබා දුන්නේ නැහැ. ඒ හින්දාම ඒ ප්‍රදේශයේ ඉන්න හුඟක් ළමයින්ට ඒ පාසල ලබා ගැනීම අහිමි වෙලා තිබෙනවා, ඒ ඉඩ ප්‍රස්ථාව නැති හින්දා. ඒ ලියුම ලබා දීලා, ස්ථිර තැනක් හම්බ වෙනකල් ඒ පාසලේ තාවකාලිකව එය පටන් ගන්න ඉඩ දෙන්න බැරි ඇයි? තව ටිකක් සිසුන් බඳවාගෙන, අර කියපු පාසලට යාබදව තිබෙන ඒ පාසලේ කටයුතු ඉදිරියට ගෙන යන එක ප්‍රමාද කරන්නේ ඇයි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා පිළිතුරු දෙන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්න දෙකතුනක් අහනවා නේ. ඔබතුමා විනාඩි තුනක් ගත්තා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, මම පිළිතුරු සපයනවා. *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, විනාඩියක්- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තව වෙලාව දෙන්න බැහැ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා පිළිතුරු ලබා දෙන්න.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි,-

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ආණ්ඩු පක්ෂයට එක විනාඩියක් දුන්නොත්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විනාඩි තුනක් ගත්තා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්නය ඇහුවා නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අධ්‍යාපනය වෙනුවෙනුයි මම ඒ ප්‍රශ්නය ඇහුවේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු ලබා දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, ඔය ප්‍රශ්නය සම්බන්ධයෙන් අපි කාලයක් තිස්සේ මැදිහත්වීම් ටිකක් කරලා තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද? *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 139- *[බාධා කිරීමක්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අපේ කට අවුස්සාගන්න එපා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 139, "කථානායකවරයාගේ සාමාන්‍ය අධිකාරය".

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අපි වැදගත් විධියට ප්‍රශ්නයක් අහන කොට- *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
තමුන්නාන්සේට ගෞරවනීය ලෙස මුලසුනේ වාඩි වෙලා සමබරව මේ පාර්ලිමේන්තුව මෙහෙයවන්න තමයි මේ ස්ථාවර නියෝග තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක පාර්ලිමේන්තුවේ වැඩකටයුතු පවත්වාගෙන යාමට අදාළ කාරණාවක් නොවෙයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා පිළිතුරු ලබා දෙන්න.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, මාස කිහිපයක් තිස්සේම අපට ඔය ගැටලුව පැන නැඟිලා තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අපිටත් කියන්න ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන- *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදීත්- *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
කුණුහරුප තමයි කියන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කාටද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මෙතැනින් එළියට දමන්න වෙනවා, කුණුහරුප කියන්න ගියොත්, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී තීරණයකුත් අරගෙන තිබුණා, මේ සම්බන්ධයෙන් පාසලක් නිශ්චිත කර ගැනීම සඳහා. එතකොට ඔබතුමා දන්නවා, ගරු මන්ත්‍රීතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න. *[බාධා කිරීමක්]* ස්ථාවර නියෝග 139ට අදාළ- *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ඒ සම්බන්ධීකරණ කමිටු වාර්තාව අනුව, ගොඩනැඟිල්ලක් නම් කරලා තිබුණා. *[බාධා කිරීම්]* නමුත් ගැටලුව එන්නේ, ඊට පස්සේ එතැනදී යම්කිසි දේශපාලන වුවමනාවක් තකා යම්කිසි දේශපාලන කණ්ඩායමක් විසින් ඒ පාසල -ගොඩනැඟිල්ල- ලබා දීමට විරුද්ධ වීම නිසා. *[බාධා කිරීම්]* ඉතින් මේ කාරණාව ඇතුළේ තිබෙන කාරණා මොනවාද කියන එකත් මේ මන්ත්‍රීතුමන්ලා දන්නවා; වුණේ මොකක්ද කියන එකත් දන්නවා. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ඒ නිසා ඊට පස්සේ නැවත විකල්ප ගොඩනැඟිල්ලක් හොයා ගැනීමේ අවශ්‍යතාව එනවා, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]* ඒ සම්බන්ධයෙන් නිශ්චිත මැදිහත්වීමකුත් කරලා විකල්ප ගොඩනැඟිල්ලකුත් හඳුනාගෙන තිබෙන කොට, ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න කොට, ඒ ගොඩනැඟිල්ල ගන්න බැරි වෙනවා. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කළ නිශ්චිත කාරණාව සම්බන්ධයෙන් කියනවා නම්, ඒ ගොඩනැඟිල්ල සම්බන්ධයෙන් අපි තීරණයක් ලබා දෙන්නම්; ඒ සම්බන්ධයෙන් අපි අවධානය යොමු කරන්නම්. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3, ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, point of Order එක ගරු මන්ත්‍රීතුමා?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 92(ආ) යටතේ මම කියන්නේ. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ කටයුතු සියල්ල සමබර විය යුතුයි. අපට පෙනෙන්නේ නැහැ- *[බාධා කිරීමක්]* ඊයේ දිනයේදීත් උදේ ඔබතුමා- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. ඒක ඔබතුමාගේ අදහසක් විතරයි. *[බාධා කිරීමක්]*

ප්‍රශ්න අංක 3 -1012/2025- (1), ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
වැදගත් විදියට අපි ඇවිල්ලා මෙතැන ප්‍රශ්න අහනවා. ඒකට ඉඩ දෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* මොකක්ද ඇති කියන්නේ? *[බාධා කිරීමක්]* තේරෙන භාෂාවෙන් කථා කරන්න එපා යැ.

## අක්කරපත්තුව, RB35 ප්‍රධාන ඇළ මාර්ගයේ නියාමක දොරටුවක් ඉදිකිරීම: ක්‍රියාමාර්ග

அக்கரைப்பற்று, RB35 பிரதான வாய்க்காலில் கட்டுப்பாட்டுக் கதவை நிர்மாணித்தல்: நடவடிக்கை

CONSTRUCTION OF SLUICE GATE ON RB35 MAIN CANAL AKKARAIPATTU: MEASURES TAKEN

1301/2025

**4. ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) අක්කරපත්තුව වාරිමාර්ග ඉංජිනේරු කලාපයේ, කුරුඳන්කුලම කොට්ඨාසයේ, RB35 ප්‍රධාන ඇළ මාර්ගයේ, නියාමක දොරටුවක් ඉදිකිරීම සම්බන්ධයෙන් තක්සේරු වාර්තාවක් ලබා දෙන ලෙස වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DI/AM/WG/002/2021 හා 2021.05.05 දිනැති ලිපිය මඟින් අම්පාර දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂකවරයාගෙන් ඉල්ලා ඇති බවත්;

(ii) ඉහත ලිපිය යොමු කර මේ වන විට අවුරුදු 2කට වඩා ගතවී ඇතත් මේ දක්වා අදාළ තක්සේරු වාර්තාව ලබා දී නොමැති බවත්;

(iii) ඒ හේතුවෙන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් මේ සම්බන්ධයෙන් නැවතත් අංක DI/AM/WG/AP/002/2023 හා 2023.09.20 දිනැතිව සිහිකැඳවීමේ ලිපියක් යොමු කර ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, ඉහත සඳහන් නියාමක දොරටුව ඉදිකිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அக்கரைப்பற்று நீர்ப்பாசன பொறியியலாளர் வலயத்தின், குருந்தன் குளம் கண்டம் RB35 பிரதான வாய்க்காலில் கட்டுப்பாட்டுக் கதவை (Regulator) நிர்மாணிப்பதற்காக மதிப்பீட் டறிக்கையைச் சமர்ப்பிக்குமாறு DI/AM/WG/002/2021ஆம் இலக்க, 2021.05.05ஆம் திகதிய கடிதத்தின் வாயிலாக நீர்ப்பாசன பணிப்பாளர் நாயகத்தால் அம்பாறை மாவட்ட நீர்ப்பாசனப் பணிப்பாளருக்குப் பணிப்புரை வழங்கப்பட்டது என்பதையும்;

(ii) இக்கடிதம் அனுப்பப்பட்டு 2 ஆண்டுகளுக்கு மேலாகியும் இற்றைவரை அந்த மதிப்பீட் டறிக்கை வழங்கப்படவில்லை என்பதையும்;

(iii) இதன் காரணமாக நீர்ப்பாசனப் பணிப்பாளர் நாயகத்தால் மீண்டும் DI/AM/WG/AP/002/2023ஆம் இலக்க, 2023.09.20ஆம் திகதிய நினைவூட்டல் கடிதம் அனுப்பப்பட்டுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், மேலே குறிப்பிடப்பட்ட கட்டுப்பாட்டுக் கதவை நிர்மாணிப்பதற்கு இன்றளவில் எடுக்கப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Is he aware that -

(i) a request has been made by the Director General of Irrigation by letter No. DI/AM/WG/002/2021 dated 05.05.2021 to the Director of Irrigation for Ampara District to provide an assessment report regarding the construction of a sluice gate on the RB35 main canal in the Kurundankulam Division of the Akkaraipattu Irrigation Engineering Zone;

(ii) although more than two years have elapsed since the above-mentioned letter was sent, the relevant assessment report has still not been submitted; and

(iii) therefore, the Director General of Irrigation has sent a reminder bearing No. DI/AM/WG/AP/002/2023 dated 20.09.2023 with regard to this matter?

(b) If so, will he inform this House of the measures that have been taken up until now for the construction of the said sluice gate?

(c) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

අක්කරෙයිපත්තුව ප්‍රදේශයේ පැන නැඟිලා තිබෙන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තමයි පුළුල්, විස්තරාත්මක පිළිතුරක් බලාපොරොත්තුවෙන් ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය යොමු කරලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) සකස් කර ඇති සැලසුම් අනුව ඇස්තමේන්තු සකස් කිරීම ආරම්භ කර ඇති අතර, 2026 වර්ෂයේ ප්‍රමුඛතා ලේඛනයට ඇතුළත් කර ඇත.

(ඇ) ඉහත පිළිතුරු අනුව අදාළ නොවේ.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ சபாநாயகர் அவர்களே, இதற்குரிய நிதியை இந்த வருடம் ஒதுக்கித் தருவதாக கௌரவ பிரதி அமைச்சர் அவர்கள் சொன்னார். 2021, 2023ஆம் ஆண்டுகளில் இந்தக் கட்டுப்பாட்டுக் கதவை அமைப்பது தொடர்பில் நீர்ப்பாசனத் திணைக்களத்தால் அனுப்பப்பட்ட கடிதங்களின் பிரதிகளை நான் இந்தச் சபையில் *சமர்ப்பிக்கின்றேன்.

என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

அம்பாறை மாவட்டத்தில் கடந்த போக விவசாய அறுவடையின்போது பெருந்தொகையான நெல் கொள்வனவு செய்யப்பட்டு, இப்போதும் நெல் சந்தைப்படுத்தல் சபையின் களஞ்சியசாலையில் களஞ்சியப்படுத்தப்பட்ட நிலையில் இருக்கின்றது. இதனால் இந்தப் போக வேளாண்மை அறுவடைமூலம் பெறப்படுகின்ற அம்பாறை மாவட்ட விவசாயிகளின் நெல்லை, நெல் சந்தைப்படுத்தல் சபையால் கொள்வனவு செய்து, store பண்ண முடியாத நிலைமை ஏற்படும். எனவே, அம்பாறை மாவட்டத்திலுள்ள நெல் சந்தைப்படுத்தல் சபையின் களஞ்சியசாலைகளில் நீண்ட காலமாக களஞ்சியப்படுத்தப்பட்டு இருக்கின்ற நெல்லை அகற்றி, இந்தப் போக அறுவடைமூலம் பெறப்பட்ட விவசாயிகளின் நெல்லைக் கொள்வனவு செய்வதற்குரிய நடவடிக்கைகளை அவசரமாக மேற்கொள்ள முடியுமா? என கௌரவ பிரதி அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ අතුරු ප්‍රශ්නය මූලික ප්‍රශ්නයට අදාළ නොවුණත් පිළිතුරක් ලබා දෙන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, වී මිලදී ගැනීම සඳහා සියලු කටයුතු සූදානම් කර තිබෙනවා. අද වනකොට බොහෝ දිස්ත්‍රික්කවල වී ගබඩා විවෘත කරලා, ගබඩාවලට අස්වැන්න ලැබෙන ප්‍රමාණය අනුව බලලා ගබඩා කරන්න සැලසුම් කරලා තිබෙනවා. පසුගිය කන්නයේ මිලදී ගත් වී ක්‍රමානුකූලව සහල් බවට පත් කරලා වෙළෙඳ පොළට නිකුත් කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. විෂයට අදාළ නොවුණත්, ගරු මන්ත්‍රීතුමා මහජන නියෝජිතයකු විධියට අහපු ප්‍රශ්නයට පිළිතුරක් විධියට තමයි මම කිව්වේ, වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය අපි ආරම්භ කරලා තිබෙනවා, ගබඩා පහසුකම් සකස් කර තිබෙනවා කියලා. එම නිසා ඉදිරියේදී අපට ගැටලුවක් වෙන්නේ නැහැ කියන පණිවුඩය ඔබතුමාට ලබා දෙන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக கேள்விக்கு வழங்கப்பட்ட பதில் தொடர்பில் நான் திருப்தியடையவில்லை. எங்களுடைய அட்டாளைச்சேனை பிராந்தியத்தில் இருக்கின்ற நெல் சந்தைப்படுத்தல் சபைக்குரிய நெற்களஞ்சியசாலைகளில் நீண்ட காலமாக நெல் களஞ்சியப்படுத்தப்பட்டு இருக்கின்றது. இதனால் என்னுடைய பிரதேச மக்கள்கூட தங்களது நெல்லை நெற்சந்தைப்படுத்தல் சபைக்குக் கொடுக்க முடியாத சூழல் இருக்கின்றது. என்னுடைய ஊரில் மட்டுமல்ல, அம்பாறை மாவட்டத்திலுள்ள எல்லா நெல் சந்தைப்படுத்தல் சபைக்குரிய களஞ்சியசாலைகளிலும் களஞ்சியப்படுத்தப்பட்டு இருக்கின்ற நெல்லை வேறு இடங்களுக்கு விரைவாக மாற்ற வேண்டுமென எங்களுடைய மக்கள் சார்பில் கேட்டுக் கொள்கின்றேன். கௌரவ சபாநாயகர் அவர்களே, எனது இரண்டாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன். 'தித்வா' சூறாவளி மற்றும் வெள்ள அனர்த்தத்தால் பாதிக்கப்பட்ட விவசாயிகளின் நெற்காணிகளுக்கான நட்டஈடு தற்போது வழங்கப்பட்டு வருகின்றது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය ඇහුවොත් ගොඩක් හොඳයි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

ගරු කථානායකතුමනි, අපි මෙතැන කථා කරන්නේ අපේ අයිතිවාසිකම් අනුවයි. අපට අතුරු ප්‍රශ්න දෙකක් අහන්න පුළුවන් නේ. ඔබතුමා හැම දාම මේ සභාවේ අපිට පොඩි පොඩි ළමයින්ට වාගේ තමයි කටයුතු කරන්නේ. එහෙම කරන්න එපා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නයක් අහන්නේ අසන ලද - *[බාධා කිරීමක්]*

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

මම එක අතුරු ප්‍රශ්නයක් ඇහුවා. දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න මට අවස්ථාව දෙන්න. ඔහොම කරන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා සම්පූර්ණයෙන් වැරැදියි. අතුරු ප්‍රශ්නයක් අහන්න ඕනෑ, - *[බාධා කිරීමක්]*

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

ඔබතුමා තමයි සභාව කලබල කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා Standing Orders කියවන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

අපි මහජනතාව වෙනුවෙන් ප්‍රශ්නයක් අහන්න ගියාම ඔබතුමා ඉඩ දෙන්නේ නැහැ. එහෙම කරන්න එපා. ඔබතුමා තමයි අපේ නායකතුමා. පාර්ලිමේන්තුවේ කථානායකතුමා. ලොකු ලොකු කථානායකතුමන්ලා ඔය පුටුවේ වාඩි වෙලා තිබෙනවා. ඔබතුමා තමයි අපට first time මෙහෙම කියන්නේ. කරුණාකරලා, එය වෙනස් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, Standing Orders කියවලා එන්න. අතුරු ප්‍රශ්නය අහන්නේ, ලබා දුන් පිළිතුරෙන් පැනනඟින ප්‍රශ්නයක් නිරාකරණය කර ගැනීමටයි. එහෙම කිව්වාම,- *[බාධා කිරීමක්]* හරි ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නකෝ.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

எங்களுடைய பிரதேசத்தில் பாதிக்கப்பட்ட விவசாயிகளுக்கு குறிப்பாக காரைதீவு பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட பிரதேசத்தில் 92 பேருக்கு இன்னும் நட்டஈடு வழங்கப்படாமல் இருக்கின்றது. அதேபோன்று, அட்டாளைச்சேனை, பாலமுனை, ஒலுவில் போன்ற பிரதேசங்களிலும் வழங்கப்படாமல் இருக்கின்றது. எனவே, அவர்களுக்கான நட்டஈட்டை விரைவாக வழங்குவதற்கு நடவடிக்கை எடுக்க முடியுமா? என கௌரவ பிரதி அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, එතුමා මූලික ප්‍රශ්නයෙන් ඇහුවේ වාරිමාර්ග ක්ෂේත්‍රයට අදාළ කාරණයක්. හැබැයි, එතුමා අතුරු ප්‍රශ්න දෙකම ඇහුවේ වන්දි ලබා දීම සම්බන්ධයෙන් සහ වී මිලදී ගැනීම සම්බන්ධයෙන්. මහජන නියෝජිතයෙකුගේ ප්‍රශ්නයක් නිසා මම පිළිතුරක් ලබා දෙන්නම්, ගරු කථානායකතුමනි.

ඔබතුමා මේ අහන, පැන නඟින ප්‍රශ්නවලට අදාළව අපි විසඳුම් ලබා දෙමින් තිබෙනවා. වන්දි මුදල් ලබා දීම ඉතාම විධිමත්ව, ක්‍රමානුකූලව සිදු කරමින් තිබෙනවා. නිලධාරින් අදාළ තොරතුරු ඉදිරිපත් කරන ආකාරය අනුව ඒ සියලු කාරණාවලට අදාළ වන්දි මුදල් අපි ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය මතු වෙන්නටත් පෙර තමයි අපි ප්‍රදේශයේ ගොවි ජනතාව හමුවෙලා කථා කරලා ඔවුන්ට අවශ්‍ය කරන වන්දි මුදල් ලබා දීමේ වැඩ පිළිවෙළ ආරම්භ කර තිබෙන්නේ. ඉතිරි පිරිසටත් තව දින කිහිපයක් ඇතුළත වන්දි මුදල් ලබා දෙන්නට කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -1369/2025- (1), ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -1563/2025 - (1), ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ප්‍රාදේශීය ලේකම් කාර්යාල: වාහන අවශ්‍යතා
### பிரதேச செயலகங்கள்: வாகனத் தேவைப்பாடு
### DIVISIONAL SECRETARIATS: VEHICLE REQUIREMENT

1571/2025

**7. ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාර්යාල සඳහා වෙන් කර ඇති මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රාජකාරි කටයුතු සඳහා මේ වනවිට ප්‍රමාණවත් සහ යෝග්‍ය තත්ත්වයේ වාහන තිබෙන්නේද;

(iv) එසේ නොමැති නම්, යෝග්‍ය තත්ත්වයේ වාහන නොමැති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(v) ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ක්ෂේත්‍ර සේවා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා, නව වාහන ලබාදීමට හෝ දැනට ඇති වාහන නඩත්තු කිරීමට රජය සතුව ක්‍රමවත් හා කඩිනම් වැඩපිළිවෙළක් තිබෙන්නේද;

(vi) පරිපාලන කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ වාහන අවශ්‍යතා පිළිබඳව මේ වනවිට හඳුනාගෙන තිබෙන්නේද;

(vii) එසේ නම්, ඒවා සැපයීම සඳහා අපේක්ෂිත කාල රාමුවක් සහ අයවැය ප්‍රතිපාදන වෙන් කර තිබෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுநிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள பிரதேச செயலகங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி அலுவலகங்களுக்காக ஒதுக்கப் பட்டுள்ள மொத்த வாகனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) பிரதேச செயலாளர்களின் கடமைகளை நிறைவேற்றுவதற்கு போதியளவு மற்றும் பொருத்தமான வாகனங்கள் தற்போது காணப் படுகின்றனவா என்பதையும்;

(iv) இன்றேல், பொருத்தமான வாகனங்கள் இல்லாத செயலகங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(v) பிரதேச செயலாளர்கள் களச் சேவைகளை வினைத்திறனாக ஆற்றும் பொருட்டு புதிய வாகனங்களை வழங்குவதற்கு அல்லது ஏற்கனவே உள்ள வாகனங்களைப் பராமரிப் பதற்கு அரசாங்கத்திடம் முறையான மற்றும் துரித வேலைத்திட்டமொன்று உள்ளதா என்பதையும்;

(vi) நிர்வாகப் பணிகளுக்காக பிரதேச செயலாளர் களின் வாகனத் தேவைப்பாடு இன்றளவில் அடையாளங் காணப்பட்டுள்ளனவா என்ப தையும்;

(vii) ஆமெனில், அவற்றை வழங்குவதற்கான ஓர் உத்தேச காலவரையறையும் அதற்காக வரவு செலவுத்திட்ட ரீதியிலான நிதி ஒதுக்கீடும் மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the total number of Divisional Secretariats in Sri Lanka;

(ii) the total number of vehicles that are allocated to the said Secretariats;

(iii) whether there are adequate numbers of roadworthy vehicles for the duties of the Divisional Secretaries at present;

[ගරු ලාල් ප්‍රේමනාත් මහතා]

(iv) if not, the number of Secretariats which do not have roadworthy vehicles;

(v) whether the Government has in place a systematic and expeditious programme that intends to provide new vehicles or maintain the existing vehicles for the purpose of efficiently carrying out field services of the Divisional Secretaries;

(vi) whether the vehicle requirements of the Divisional Secretaries for administrative purposes have been identified by now; and

(vii) if so, whether an expected time frame has been set for providing those vehicles and budgetary allocations have been made for that?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government**)**
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 339ක් හා උප කාර්යාල 2යි.

(ii) 628කි.

(iii) ප්‍රමාණවත් නොවේ.

පැරණි වාහන වැඩි ප්‍රමාණයක් පවතින අතර, ඒවායේ අලුත්වැඩියා කටයුතු සුදුසු පරිදි සිදු කරමින් භාවිත කරයි.

(iv) මෙම වාහන අතරින් වසර 20කට වඩා පැරණි වාහන 223ක් ද, වසර 15කට වඩා පැරණි වාහන 108ක් ද පවතී.

ඒ අතරින් 1984දී මිලදී ගත් වාහන 09කුත් තිබෙනවා. අවසාන වරට වාහන අරගෙන තිබෙන්නේ 2020දී. එතැන වාහන 06ක් තිබෙනවා. හැම වාහනයක්ම අවුරුදු 5කට වඩා පැරණියි. අවුරුදු 40කට වඩා පැරණි වාහනත් තිබෙනවා.

(v) ඔව්.

රජයේ සංවර්ධන වැඩ පිළිවෙළ කඩිනම් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය පරිපාලනය ශක්තිමත් කිරීම උදෙසා අවශ්‍ය පහසුකම් සම්පාදනයට අවධානය යොමු කර ඇති අතර, ඒ සඳහා අත්‍යවශ්‍ය රාජ්‍ය සේවාවන් හා ක්ෂේත්‍ර කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අත්‍යවශ්‍ය වාහන මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

(vi) දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පරිපාලන කටයුතු සිදු කිරීම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ නිර්දේශ අනුව වාහන 465ක අවශ්‍යතාවක් හඳුනාගෙන ඇත.

(vii) ඔව්. එකී වාහන 465ක අවශ්‍යතාව පිළිබඳව මෙම අමාත්‍යාංශයේ නිරීක්ෂණ හා නිර්දේශ සහ වාර්තාව 2025.10.13 දිනැතිව කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත යොමු කර ඇති අතර, අවශ්‍ය අනුමැතිය හා ප්‍රතිපාදන ලබා ගැනීම කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙතින් සිදු කිරීමට නියමිතය. ඒ අනුව මුදල් අමාත්‍යාංශය වෙතින් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කෙරේ.

(ආ) අදාළ නොවේ.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමාගෙන් අසන මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන ප්‍රධාන නිලධාරින්ගේ, විධායක ශ්‍රේණි නිලධාරින්ගේ ප්‍රශ්නය විසඳීම සඳහා නව රජය කඩිනමින් පියවර ගනිමින් පවතිනවා. ඒ වාගේම, මේ ක්ෂේත්‍රය තුළ වැඩ කරන සේවක සේවිකාවන් විශාල ප්‍රමාණයකුත් ඉන්නවා. විශේෂයෙන්ම ඈත ගම්මානවල සිටින අය ගමනාගමන කටයුතු සඳහා පොදු ප්‍රවාහන සේවය භාවිත කිරීමේදී ඇති වන සමහර අපහසුතා නිසා ඒ අයට නිසි වේලාවට රාජකාරියට පැමිණීමට නොහැකි තත්ත්වයක් උදාවෙලා තිබෙන බව අපි අත්දැක තිබෙනවා. අන්න එවැනි නිලධාරින් සඳහාත්, විශේෂයෙන්ම ක්ෂේත්‍ර නිලධාරින්, සංවර්ධන නිලධාරින් සඳහාත් පොදු වාහන සංචිතයක් හෝ ඒවා ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ඔබතුමාගේ දැනට තිබෙන අදහස මොකක්ද කියලා දැනගන්න කැමැතියි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
**(**The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, මේ වන විටත් වාහන භාවිත කිරීමේදී විවිධ ගැටලු මතු වෙලා තිබෙනවා. ඒ අනුව බොහෝ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මැදිහත්වීමෙන් සංචිතයකින් වාහන ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතිනවා. ඒ වාගේම, මම මේ කාරණයත් සඳහන් කරන්න කැමැතියි. අපි රජය හැටියට අලුතින් වාහන 1,700කට අධික ප්‍රමාණයක් මිලදී ගැනීම සඳහා කටයුතු කරන විට සමහර අයගෙන් කියැවුණා, පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරු 225දෙනාටත් මේ හරහා වාහන ගන්නවා කියලා. ඇත්තටම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225දෙනාට පමණක් නොවෙයි, මෙන්න මේ රජයේ ආයතන සඳහාත් තමයි ඒ වාහන මිලදී ගැනීම සඳහා කටයුතු කළේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පමණක් නොවෙයි, විවිධ දෙපාර්තමේන්තුවල, විශේෂයෙන්ම කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් වාගේ ක්ෂේත්‍රවලත්, ඒ වාගේම පළාත් පාලන ආයතනවලත් බරපතළ ලෙස මේ වාහන පිළිබඳ ගැටලුව තිබෙනවා. මම කලින් කිව්වා වාගේ, මේ තැන්වල තිබෙන බොහෝ වාහන අවුරුදු 20, 25, 30 පැරණි වාහන. ඒ නිසා තමයි අලුත් වාහන මිලදී ගන්න කටයුතු කරන්නේ. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණය පිළිබඳව අවධානය යොමු කරලා, ගැටලු පවතින තැන්වලට අවශ්‍ය පහසුකම් සලස්වන්න පුළුවන්.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා කියන විධියට එතුමා ආණ්ඩුව හැටියට සහ අමාත්‍යාංශය හැටියට හොඳ පියවර කිහිපයක් ගනිමින් ඉන්නවා. ඒ පිළිබඳව එම නිලධාරින් වෙනුවෙන් මගේ ස්තුතිය පුද කරමින්, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු අමාත්‍යතුමනි, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව වැනි ආයතන විසින් රට තුළ කරන මහා පරිමාණ ව්‍යාපෘති තිබෙන බව අපි දන්නවා. එවැනි ව්‍යාපෘතිවලට වාහන විශාල ප්‍රමාණයක් ගේනවා. එහි නීතිමය තත්ත්වය ගැන දන්නේ නැහැ. නමුත්, එවැනි වාහන අඩුපාඩු තිබෙන, ප්‍රවාහන අපහසුතා තිබෙන ආයතනවලට විධිමත් පරිදි අනුයුක්ත කිරීමේ වැඩ පිළිවෙළක් ගැන ඔබතුමා කල්පනා කරලා තිබෙනවාද, එහෙම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට සම්බන්ධ නැති වෙනත් අමාත්‍යාංශවල ව්‍යාපෘති සඳහා ලැබුණු එබඳු වාහන තිබෙනවා. ඒ පිළිබඳව සාකච්ඡා කරලා සුදුසු ක්‍රියාමාර්ග ගන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -1651/2025- (1), ගරු සුනිල් රත්නසිරි මහතා.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -1655/2025- (1), ගරු චානක මාදුගොඩ මහතා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## සයිබර් මූල්‍ය අපරාධ: විස්තර
நிதி தொடர்பான சைபர் குற்றச்செயல்கள்: விபரம்
FINANCIAL CYBERCRIMES: DETAILS

1012/2025

**3. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Rajeevan Jeyachandramoorthy)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ක්‍රෙඩිට් කාඩ් වංචා, අන්තර්ජාල බැංකු වංචා, ව්‍යාජ ඊමේල් පණිවිඩ ආදිය මඟින් සිදු කරන වංචා - phishing, සිම් අංකය පැහැර ගැනීම - SIM swapping, ආයෝජන වංචා, ඩිජිටල් මුදල් පසුම්බි වංචා සහ ඒ සමාන වෙනත් වැරදි ලෙස වර්ගීකරණය කර ඇති සයිබර් මූල්‍ය අපරාධ පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පසුගිය වසර තුන තුළ කිසියම් විශේෂිත සයිබර් මූල්‍ය අපරාධ වර්ගයක් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේද;

(iii) උතුරු පළාතේ මෙන්ම ජාතික වශයෙන් හඳුනා ගෙන තිබෙන සයිබර් මූල්‍ය අපරාධවල ප්‍රවණතා හෝ රටා කවරේද;

(iv) දිස්ත්‍රික්ක සහ පළාත් අතර සිදුවන සයිබර් මූල්‍ය අපරාධ නිරීක්ෂණය කිරීමට, හඳුනා ගැනීමට - track - සහ වර්ගීකරණය කිරීමට මධ්‍යගත යාන්ත්‍රණයක් තිබේද;

(v) එවැනි දත්ත වෙත ප්‍රසිද්ධියේ ප්‍රවේශ විය හැකිද; නැතහොත් එම දත්ත මූල්‍ය ආයතන සමඟ බෙදා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடன் அட்டை மோசடி, நிகழ்நிலை வங்கி மோசடி, மின்னஞ்சல்/நிகழ்நிலை ஏமாற்று மோசடி - phishing, சிம் அட்டை மாற்று மோசடி - SIM swapping, முதலீட்டு மோசடிகள், டிஜிற்றல் பணப்பை மோசடி மற்றும் ஏனைய தொடர்பு டைய குற்றங்களாக வகைப்படுத்தப்பட்ட, நிதி தொடர்பான சைபர் குற்றச்செயல் முறைப்பாடு களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) கடந்த மூன்று வருட காலப்பகுதியில் ஏதேனும் குறிப்பிட்ட வகையான நிதி தொடர்பான சைபர் குற்றச்செயல் கணிசமான அதிகரிப்பு ஒன்றைக் காட்டியுள்ளதா என்பதையும்;

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

(iii) வட மாகாணத்திலும் தேசிய ரீதியிலும் அடையாளப்படுத்தப்பட்டுள்ள நிதி தொடர்பான சைபர் குற்றச்செயல்களின் போக்குகள் அல்லது வடிவங்கள் தொடர்பாகவும்;

(iv) மாவட்டங்கள் மற்றும் மாகாணங்கள் பூராவும் நிதி தொடர்பான சைபர் குற்றச்செயல்களைக் கண்காணித்தல், பின்தொடர்தல் மற்றும் வகைப்படுத்தல் ஆகியவற்றுக்கு மையப்படுத்தப்பட்ட பொறிமுறை ஒன்று காணப்படுகிறதா என்பதையும்;

(v) அத்தகைய தரவுகள் பகிரங்கமாக அணுகப்படக்கூடியவையாக அல்லது நிதி தொடர்பான நிறுவனங்களுடன் பகிரப்படக்கூடியவையாக உள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this house -

(i) the number of financial cybercrime complaints, categorized as credit card fraud, online banking fraud, phishing, SIM swapping, investment scams, digital wallet fraud, and other related offenses, separately;

(ii) whether any particular type of financial cybercrime has shown a significant increase during the past three years;

(iii) the trends or patterns of financial cybercrime that have been identified in the Northern Province as well as nationally;

(iv) whether a centralized mechanism exists to monitor, track and classify financial cybercrime across districts and provinces; and

(v) whether such data is publicly accessible or shared with financial institutions?

(b) If not, why?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | ක්‍රෙඩිට් කාඩ් වංචා | අන්තර්ජාල බැංකු වංචා | ව්‍යාජ ඊමේල් පණිවුඩ ආදිය මඟින් සිදු කරන වංචා (phishing) | සිම් අංකය පැහැර ගැනීම (SIM swapping) | ආයෝජන වංචා | ඩිජිටල් මුදල් පසුම්බි වංචා | ඒ හා සමාන වෙනත් වැරදි |
|---|---|---|---|---|---|---|---|
| 2023 | 2 | 101 | 15 | 1 | 27 | 24 | 161 |
| 2024 | 5 | 153 | 69 | 3 | 59 | 9 | 527 |
| 2025 | 3 | 199 | 95 | 3 | 161 | 22 | 806 |

(ii) ඔව්.

එනම්,

- අන්තර්ජාල බැංකු වංචා
- ව්‍යාජ ඊමේල් පණිවුඩ ආදිය මඟින් සිදු කරන වංචා - phishing
- ආයෝජන වංචා
- ඒ හා සමාන වෙනත් වැරදි

(iii) <u>ප්‍රවණතා</u>

- අන්තර්ජාල භාවිතයේදී, සමාජ මාධ්‍ය භාවිතයේදී එනම් WhatsApp, Facebook, Instagram, Telegram වැනි භාවිතයන් තුළදී සහ මොබයිල් බැංකු හා අන්තර්ජාලය හරහා මුදල් ගෙවීම් කිරීම් ආදියේදී, එනම් online banking/ mobile wallet, online ව්‍යාපාර හා freelancing ව්‍යාපාර වැනි භාවිතයන් වැඩිවීමත් සමඟ සයිබර් මූල්‍ය වංචාවල ප්‍රවණතාවය වැඩි වෙමින් පවතින අතර එම ක්ෂේත්‍රවලට සම්බන්ධ පුද්ගලයන් ඉලක්ක කර මෙම සයිබර් මූල්‍ය වංචා සිදු කරනු ලබයි. මේවා උතුරු පළාතේ සයිබර් අපරාධ රටා ලෙස විශේෂ හඳුනා ගැනීමක් සිදු කර නොමැති අතර සමස්ත දිවයින තුළ පහත සයිබර් අපරාධ රටා හඳුනාගෙන ඇත.

- අන් අයෙකු ලෙස පෙනී සිටිමින් (සමාජයේ ජනප්‍රිය පුද්ගලයන්ගේ නාමය, ඡායාරූප, ව්‍යාපාරික හැඳුනුම් නාම භාවිත කරමින්) "හදිසි අවශ්‍යතාවක්" ඇති බව දක්වමින් කෙටි පණිවුඩ යොමු කරමින් මුදල් ඉල්ලීම සිදු කරන අතර, මේ සඳහා වෘත්තීය පුද්ගලයන් (ගුරුවරුන්, රූපලාවන්‍ය ශිල්පීන්, ව්‍යාපාරිකයන්) වැඩි වශයෙන් ඉලක්ක කරයි.

- පුද්ගලයන්ගේ මනස ඉලක්ක කර ගෙන භීතිය, කරුණාව, හදිසිභාවය භාවිත කරමින් පුද්ගලයන් රවටා වංචා කිරීම සිදු කරනු ලබයි.

- තාක්ෂණය හා විශ්වාසය ඇති කර ගනිමින් බැංකු, අන්තර්ජාල හරහා ගෙවීම් සිදු කරන ලෙස පෙනී සිට fake SMS/email/WhatsApp link යොදාගෙන පරිශීලක නාමය හා මුරපද ලබා ගැනීම, එක් වරක් භාවිතා කරන රහස් අංකය - OTP - ලබා ගැනීම හා බැංකු කාඩ්පත් තොරතුරු ලබා ගැනීම මඟින් වංචා කිරීම සිදු කරනු ලබයි.

- Facebook Marketplace, Instagram, Daraz වැනි අන්තර්ජාල වෙළෙඳ පොළ භාවිතා කර ව්‍යාජ විකිණීම් හෝ ව්‍යාජ මිලදී ගැනීම් මඟින් මුදල් ගෙවූ පසු භාණ්ඩ ලබා නොදීම මඟින් වංචා සිදු කරනු ලබයි.

- WhatsApp හරහා මිතුරු වී ආදරය හා විශ්වාසය මත පදනම් කරගෙන සමාජ මාධ්‍ය හරහා විශ්වාසය ගොඩනඟා ගනිමින් මුදල් ලබා ගැනීම සිදු කරන අතර මෙම මූල්‍ය වංචා බහුතරයක් විදේශිකයින් ලෙස පෙනී සිටිමින් සිදු කරනු ලබයි.

- වෙනත් පුද්ගලයින්ගේ බැංකු ගිණුම් විස්තර භාවිතා කර වංචනිය මුදල් ලබා ගැනීම සිදු කරන අතර, මෙම සයිබර් මූල්‍ය වංචා ආර්ථික අපහසුතා ඇති පුද්ගලයන්ගේ බැංකු ගිණුම් භාවිතා කර සිදු කරනු ලබයි.

(iv) දිස්ත්‍රික්ක සහ පළාත් අතර සිදු වන සයිබර් මූල්‍ය අපරාධ නිරීක්ෂණය කිරීමට, හඳුනා ගැනීමට සහ වර්ගීකරණය කිරීමට මධ්‍යගත යාන්ත්‍රණයක් නොමැත.

(v) දත්ත වෙත ප්‍රසිද්ධියේ ප්‍රවේශ විය නොහැකි අතර එම දත්ත මූල්‍ය ආයතන සමඟ බෙදා නොගනී.

(ආ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මුහුණ දෙන ගැටලු
### நுண், சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில்முயற்சிகள் எதிர்கொள்ளும் சிக்கல்கள்
### ISSUES FACED BY MICRO, SMALL AND MEDIUM-SIZED ENTERPRISES

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ආර්ථිකය ස්ථාවර වෙමින් පවතින බව ආණ්ඩුව පැවසුවත්, රටේ ආර්ථිකයට මහත් දායකත්වයක් ලබා දෙන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් අද සිය ව්‍යාපාර පවත්වාගෙන යාමේදී දැඩි අපහසුතාවකට මුහුණ දී සිටිනවා. වෙළෙඳ පොළ තරගකාරීත්වයට වඩා බැංකු ණය සීමා, Non-Performing Loans - NPL - ලෙස වර්ගීකරණය කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ නාමයෙන් අධික ගාස්තු සහ දඩ පොලී පැනවීම ඔවුන්ට බරපතළ බලපෑමක් වී තිබෙනවා. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් - MSMEs - සඳහා ප්‍රකාශිත රජයේ සහන වැඩසටහන් බොහෝවිට ක්‍රියාත්මක නොවන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වේගයෙන් වැසී යෑමක් දක්නට ලැබෙනවා. එබැවින්, මම මේ සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රශ්න යොමු කරනවා.

1. සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත මඟින් මෙරට දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය කොපමණද? පසුගිය වසර තුන තුළදී ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් - MSMEs - මඟින් කොපමණ අපනයන ආදායමක් ලබා දී තිබේද?

2. 2019 - 2025 වසර අවසානය වන තෙක් ක්‍රියාත්මක ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායක ව්‍යාපාර සංඛ්‍යාව, වසා දමා ඇති ව්‍යාපාර සංඛ්‍යාව, අලුතින් ලියාපදිංචි ව්‍යාපාර සංඛ්‍යාව කීයද? ව්‍යාපාර වසා දැමීම හේතුවෙන් රැකියා අහිමිවීම් පිළිබඳව රජය සතුව ඇති නවතම සංඛ්‍යාලේඛන මොනවාද?

3. නව රජය යටතේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් සඳහා හඳුන්වා දෙන ලද ණය සහන, සහනාධාර වැඩසටහන් මොනවාද? 2025/2026 සඳහා ප්‍රකාශයට පත් කළ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායක ණය යෝජනා ක්‍රම යටතේ වෙන් කළ මුදල් ප්‍රමාණයට සාපේක්ෂව සැබවින්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් වෙත නිකුත් කර ඇති ණය මුදල් ප්‍රමාණය කොපමණද? බැංකු මට්ටමින් මෙම ණය අයදුම්පත් ප්‍රතික්ෂේප වන ප්‍රතිශතය පිළිබඳව රජය සතු දත්ත තිබේද? එම ප්‍රතික්ෂේප කිරීම්වලට හේතු මොනවාද?

4. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරවලින් කොපමණ ප්‍රතිශතයක් වර්තමානයේ Non-Performing Loans - NPLs - ලෙස වර්ගීකරණය වී තිබේද? එම ව්‍යාපාර සඳහා නව ණය හෝ ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා ගැනීමේදී පවතින නීතිමය හා බැංකුමය බාධා ඉවත් කිරීමට රජය විශේෂ වැඩ පිළිවෙළක් සකස් කර තිබේද?

5. රාජ්‍ය ආයතන, මණ්ඩල විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායක සැපයුම්කරුවන්ට ගෙවීමට තිබෙන හිඟ මුදල් ප්‍රමාණය කොපමණද?

   ඒ කියන්නේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් කරපු සැපයුම්වලට රාජ්‍ය ආයතන සහ මණ්ඩලවලින් ගෙවීමට තිබෙන මුදල් ප්‍රමාණය කොපමණද? එම ගෙවීම් සඳහා නියමිත කාල සීමාවක් හඳුන්වා දීමට රජය සූදානම්ද?

6. විදුලි බිල, ඉන්ධන, ප්‍රවාහන පිරිවැය ඉහළ යෑමෙන් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායක ක්ෂේත්‍රයට සිදුව ඇති බලපෑම පිළිබඳව අධ්‍යයනයක් සිදු කර තිබේද? අමුද්‍රව්‍ය ආනයනයේදී මෙන්ම, "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් හානි වූ යන්ත්‍ර සූත්‍ර යළි ආනයනයේදී පවතින බදු ගාස්තු, පාලන බාධා අවම කිරීම පිළිබඳව රජය සලකා බලන්නේද?

7. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බිඳවැටීම වැළැක්වීමේ අරමුණින්, බැංකු විසින් සිදු කරන දේපළ අත්පත් කර ගැනීම්, වෙන්දේසි කිරීම්, නඩුමය ක්‍රියාමාර්ග තාවකාලිකව නවතා දැමීම සඳහා පරාටේ නීතිය යටතේ ක්‍රියාත්මක වන බලතල අත්හිටුවීමට හෝ සීමා කිරීමට රජය සූදානම්ද?

පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම තුළ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් බරපතළ අසහනයකට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම එය ක්‍රියාත්මක කරන්නට පෙර ඇත්තවශයෙන්ම ඒ අයගේ ණය ප්‍රතිව්‍යුහගත කළ යුතුයි. එය ඉෂ්ට කරන්නට රජය ගන්නා ක්‍රියාමාර්ග කවරේද කියන එකත් මම මේ අවස්ථාවේ අහන්න කැමැතියි.

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමා වෙනුවෙන්, පිළිතුරු ලබා දීමට මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, අදාළ අමාත්‍යවරයාට කාලය ගන්නට තිබෙන ඉඩ ප්‍රස්තාව පිළිබඳව මම ප්‍රශ්න කරන්න යන්නේ නැහැ. නමුත් මම ඔබතුමාට සඳහන් කරන්න කැමැතියි, පසුගිය සතියේ මේ පාර්ලිමේන්තුවේ කමිටු කාමරයකදීම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වෙනුවෙන් රජය ක්‍රියාත්මක කරන විශේෂිත වූ වැඩසටහන් පිළිබඳව සවිස්තර ඉදිරිපත් කිරීමක් මේ සියලු මන්ත්‍රීවරුන්ට කළ බව. මමත් ඒකට සහභාගි වුණා. මේ අහලා තිබෙන ප්‍රශ්නවලට උත්තර කේන්ද්‍ර කරගෙන තමයි ඇත්තවශයෙන්ම ඒ ණය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුත්තේ. මම අහන්න කැමැතියි, මේ දත්ත කේන්ද්‍රීයව නොවෙයිද මේ ණය වැඩසටහන් ක්‍රියාත්මක කළේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුර ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටියා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අවසාන වශයෙන් තවත් කාරණයකට මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. විශේෂයෙන්ම අද වනකොට අපේ රටේ කුඩා, සුළු සහ මධ්‍ය පරිමාණයේ වී මෝල් හිමියන් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දී සිටිනවා. ඒ අයට ලබා දෙනවාය කියන මේ සහන පොලී ණය අද වන විට ලැබිලා නැහැ. වී මිලදී ගැනීම්වලින් සියයට 65ක් කරන්නේ කුඩා කර්මාන්තකරුවන්. ඒ නිසා මම රජයෙන් ඉල්ලීමක් කරනවා මේවාට ඉක්මනින් පිළිතුරක් ලබා දෙන්නට කටයුතු කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලබන මීළඟ ප්‍රශ්නය, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා.

## II

## 1990දී මඩකලපුව, කුරුක්කල්මඩම්හිදී ඝාතනය කරන ලද මුස්ලිම් වන්දනාකරුවන් වෙනුවෙන් යුක්තිය ඉටු කිරීම

### 1990 இல் மட்டக்களப்பு, குருக்கள்மடத்தில் கொல்லப்பட்ட முஸ்லிம் யாத்திரிகர்கள் சார்பில் நீதியைப் பெற்றுக்கொடுத்தல்

JUSTICE FOR MUSLIM PILGRIMS KILLED IN KURUKKALMADAM, BATTICALOA IN 1990

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2)இன்கீழ் பின்வரும் விடயத்தை கௌரவ நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் ஹர்ஷன நாணாயக்கார அவர்களின் கவனத்திற்குக் கொண்டுவருகின்றேன்:

கௌரவ அமைச்சர் அவர்களே, 1990 யூலை 12ஆம் திகதி புனித ஹஜ் கடமைகளை நிறைவு செய்துவிட்டு, காத்தான் குடியில் உள்ள தங்களது வீடுகளுக்குத் திரும்பிக் கொண்டிருந்த முஸ்லிம் யாத்திரிகள் கல்முனை-மட்டக்களப்பு பிரதான வீதியில், குருக்கள் மடம் எனுமிடத்தில் தமிழீழ விடுதலைப் புலிகளினால், வலிந்து காணாமலாக்கப்பட்டு உள்ளனரெனக் காத்தான்குடியைச் சேர்ந்த அப்துல் மஜீத் முகம்மது றவூப் என்பவரால் களுவாஞ்சிக்குடி நீதிவான் நீதிமன்றத்தில், 2014.04.09ஆம் திகதி B/172/2014 என்ற இலக்கத்தின்கீழ் வழக்குத் தாக்கல் செய்யப்பட்டிருந்தது. இது தொடர்பிலே நீதியமைச்சுத் தொடர்பான கடந்த வரவு செலவுத்திட்ட விவாதத்தின்போதும் நான் பேசியிருந்ததை நினைவுகூருகின்றேன். மேற்படி சம்பவத்தின்போது 100க்கும் மேற்பட்டவர்கள் வலிந்து காணாமல் ஆக்கப்பட்டு, அவர்களது உடைமைகள் அனைத்தும் பறிக்கப்பட்டு, இறுதியில் கொலை செய்யப்பட்டு, குருக்கள் மடம் கடற்கரையை அண்டியதொரு பகுதியில் புதைக்கப்பட்டுள்ளார்கள் என்ற நியாயமான சந்தேகத்தின் அடிப்படையில் நீதிமன்றத்தின் மேலான தலையீட்டைக் கோரியபோது, 2014 ஏப்பிரல் 28ஆம் திகதி - சுமார் 12 ஆண்டுகளுக்கு முன்பு - கௌரவ நீதிவான் அவர்கள் குறித்த புதைகுழியை அகழ்வதற்குத் தேவையான சகல நடவடிக்கைகளையும் மேற்கொள்ளுமாறு உரிய அரச திணைக்களங்கள் மற்றும் நிறுவனங்களுக்குக் கட்டளை யிட்டிருந்தார். எனினும் இன்றுவரை குறித்த புதைகுழி அகழப்படவில்லை.

கௌரவ சபாநாயகர் அவர்களே, மேற்படி சம்பவமானது வலிந்து காணாமலாக்கப்பட்ட 100க்கும் மேற்பட்ட இலங்கைப் பிரஜைகள் தொடர்பானதாகும். தங்களது உறவினர்களுக்கும் அன்பர்களுக்கும் என்ன நேர்ந்தது என்பதை அறிகின்ற தார்மீக உரிமை பாதிக்கப்பட்ட அனைவருக்கும் காணப்படுகின்றது. அதனடிப்படையில், குருக்கள்மடப் புதைகுழியில் மேற்படி வலிந்து காணாமலாக்கப்பட்டவர்கள் கொலை செய்யப்பட்டு, புதைக்கப்பட்டிருப்பதால், அம்மனித எச்சங்களைத் தோண்டி எடுத்து, மரபணுப் பரிசோதனைகள்மூலம் அடையாளங்கண்டு, அவர்களது குடும்பத்தவர்கள் விரும்பியவாறு மார்க்க அனுஷ்டானங்களை மேற்கொண்டு, இறுதிக் கடமைகளை நிறைவேற்றிய பின் அவற்றை மீள அடக்கம் செய்வதும் பாதிக்கப்பட்டவர்களுக்கு நீதியைப் பெற்றுக் கொடுப்பதும் இவ்வுயரிய சபையினுடைய கடமையாகும்.

கௌரவ சபாநாயகர் அவர்களே, இவ்விடயம் தொடர்பில் நான் இவ்வுயரிய சபையில் பேசிய பின்பு, கௌரவ நீதி அமைச்சர் அவர்கள் அவ்விடத்துக்கு நேரடியாக விஜயம் செய்து, பார்வையிட்டு, அகழ்வுப் பணிகள் உடனடியாக மேற்கொள்ளப்பட வேண்டுமெனவும் அதற்குத் தேவையான சகல ஒத்துழைப்பையும் வழங்கத் தயாராக இருப்பதாகவும் இந்தச் சபையிலே தெரிவித்திருந்தார். அதற்காக, பாதிக்கப் பட்ட மக்கள் சார்பாக அவருக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, ஏற்கனவே இவ்வகழ்வுப் பணிக்காகச் சுமார் 29 இலட்சம் ரூபாய் நிதி ஒதுக்கப் பட்டுள்ளபோதிலும், குறித்த நிதி விடுவிக்கப்படாததன் காரண மாகவே இவ்விடயம் இன்னும் பிற்படுத்தப்பட்டுச் செல்வ தாகவும் அதன் காரணமாக, கடந்த 06.01.2026ஆம் திகதிய வழக்குத் தவணையின்போது கௌரவ நீதிவான் அவர்கள் மேலதிக நிதியைக் கோரியிருப்பதாகவும் அறிகின்றேன்.

கௌரவ நீதிவான் அவர்களின் உத்தரவின் பேரில் குருக்கள்மடம் மனிதப் புதைகுழி அகழ்வுப் பணியை மண்முனை தென் எருவில்பற்று, களுவாஞ்சிக்குடி பிரதேச செயலகமே பொறுப்பேற்றுள்ளதாக அறிகின்றேன். கௌரவ நீதி அமைச்சர் அவர்களே, இதற்குத் தேவையான மொத்த நிதியையும் களுவாஞ்சிக்குடி பிரதேச செயலகத்திற்கு விடுவித்து, அவசரமாக அகழ்வுப் பணிகள் மேற்கொள்ளப்பட வேண்டும். ஏனென்றால், வலிந்து காணாமல் ஆக்கப்பட்டு, கொலை செய்யப்பட்டு புதைக்கப்பட்டுள்ள முஸ்லிம் சகோதரர்களின் ஜனாஸாக்களைத் தோண்டியெடுத்து, அவர்களின் குடும்பத்தவர்கள் விரும்பியவாறு இஸ்லாமிய மார்க்க அடிப்படையில் கடமைகளை நிறைவேற்றி, மீள் அடக்கம் செய்வதற்கும் கிட்டத்தட்ட 35 ஆண்டுகளாகப் பாதிக்கப்பட்ட அந்த மக்கள் சார்பில் நீதியைப் பெற்றுக் கொடுப்பதற்கும் உரிய நடவடிக்கைகளை மேற் கொள்வீர்களா? என்று கௌரவ நீதி அமைச்சரிடம் நான் கேட்க விரும்புகின்றேன். நன்றி.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

Thank you very much, Hon. Member, for raising a very valid and pertinent Question and I am grateful that you raised it in Parliament. Hon. Member, I should say that I also personally visited that place. By the time this matter will be called again on the 09th of February, I assure you and I give you my word, Rs. 2,850,000 would reach the High Court of the area and then, it would be sent to the Kaluwanchikudi -

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

DS Office?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

No, not to the DS Office, but actually to the Magistrate's Court.

Now, let me explain. As you are aware, the commitment by this Government remains and funds would always be available. Now, I will explain why there was that slight delay. As you are aware, when doing these excavations, the Judicial Medical Officers and other scientists decide the excavation phase, and they give a budget to the Magistrate. The Magistrate, thereafter, says this is the amount of money they want for seven days. After that stage, if they want more stages to be excavated, money would be granted, it is not a problem. So, what happened was, when they sent the budgets, with court vacations coming in and with Cyclone "Ditwah", some of those were not completed. So, my Ministry was compelled to ask for further observations, ask them to clarify and justify some of the rates - as you know, these rates are not market rates - because in audit queries, those have to be justified. And, their clarifications and observations regarding those amounts had been given only in January. After receiving those clarifications, money has now been released, I can assure. It would only happen at this first stage - when we were doing the excavations in Chemmani also it was the same - and the second and third tranches would not take time because the budget has already been submitted. So, that was an administrative delay, for which I apologize to the people of the area and the victims' families. But, I assure you that funds would be available on the 09th of February.

As you know, from 2014 when the incident occurred, nothing happened till our Government came in. I am taking personal interest in these matters, especially in excavations. So, excavations will be done and the money will be available on the 09th of February when the matter would be called. I have looked into that matter. By the way, if there is any other issue, anyone could reach me on the phone, especially you, Hon. Member, and I will assist you. I prefer this kind of communication because, sometimes, I also do not get the chance to look into all the details. So, if there is any issue that you are aware of, please do give me a call.

Thank you.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ நீதி அமைச்சர் அவர்கள் அந்த இடத்துக்கு விஜயம் செய்ததுடன், அந்த இடத்தை அகழ்வு செய்வதற்கு - அந்தப் பணிகளை அவசரமாகச் செய்வதற்கு - வேண்டிய நிதியை ஒதுக்கீடு செய்வதற்குத் துரித கதியில் நடவடிக்கை எடுத்துள்ளார். அதற்காக, பாதிக்கப்பட்ட மக்களின் சார்பிலே நான், கௌரவ அமைச்சர் அவர்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

Sorry, Sir, I could not add one more point. I have ordered the excavations as well as the DNA analysis to go simultaneously so that we can avoid delays. Then, in the end, after the investigations, whatever religious rites they want done would be done. So, both the excavations and the DNA analysis are going to be done simultaneously so that investigations would be faster.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, ගරු විජිත හේරත් අමාත්‍යතුමා.

## එක්සත් රාජධානිය විසින් ශ්‍රී ලාංකිකයින් කිහිපදෙනෙකුට එරෙහිව පනවන ලද සංචාරක තහනම: විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## ஐக்கிய இராச்சியத்தால் இலங்கையர்கள் சிலருக்கு எதிராக விதிக்கப்பட்ட சுற்றுலாத் தடை: வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரினது கூற்று
## TRAVEL BANS IMPOSED ON SOME SRI LANKANS BY THE UNITED KINGDOM: STATEMENT BY MINISTER OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

Hon. Speaker, the Answer to the Question raised by the Hon. Ravi Karunanayake under Standing Order No. 27(2) on 09th January, 2026 is as follows:

[ගරු විජිත හේරත් මහතා]

1. Sri Lanka's plural and democratic character has been recognized by the Constitution of Sri Lanka, which predates the defeat of terrorism in 2009.

Although the Constitution does not use the exact terms, it recognizes the country as a democratic and plural society by several Articles read together. Article 1 declares Sri Lanka to be a democratic Republic, while Article 3 vests sovereignty in the People. Article 12 guarantees equality before the law and prohibits discrimination on grounds such as race, religion and language. Articles 18 to 22 recognize both Sinhala and Tamil as Official and National Languages, reflecting linguistic diversity. Although Article 9 accords Buddhism the foremost place, Articles 10 and 14 (1) (e) guarantee freedom of thought, conscience, religion and worship to all. Taken together, these provisions affirm that Sinhalese, Tamils, Muslims and all other communities coexist as equal citizens within Sri Lanka's constitutional framework.

2. The Inter-Ministerial Committee has met and deliberated on this matter. The Cabinet has been verbally kept informed of the deliberations, although no formal report has been submitted. The Hon. Member of Parliament may note that the purpose of the establishment of the Cabinet-appointed Ministerial Committee was to assist the Cabinet in its deliberations on the matter and not to brief Parliament.

3. The sanctions imposed by the United Kingdom on certain Sri Lankan individuals are unilateral measures taken under UK domestic law. Unlike sanctions imposed by the United Nations Security Council under Chapter VII of the UN Charter, these measures are not legally binding on Sri Lanka under international law. Sri Lanka, therefore, has no obligation to recognize, enforce or cooperate with these sanctions and is not required to accept the allegations or legal conclusions on which they are based. Any legally binding decision on criminal responsibility can only be made by Sri Lankan courts or by international courts which have proper legal authority.

Under international law, Sri Lanka has the right to formally object to such sanctions through diplomatic channels and to uphold the principles of sovereignty and non-interference in its internal affairs. While there are international legal mechanisms in theory, their practical use is limited unless the sanctioned country agrees to be bound by them. As a result, the legal effect of the UK sanctions applies only within the United Kingdom and their wider impact is political rather than legal.

Please refer to the answer to question number 5 regarding the actions taken by the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism.

4. The Cabinet is fully apprised of the situation and the Government will take all measures necessary to safeguard Sri Lanka's sovereignty and territorial integrity. As stated in the answer to question number 3 above, these measures are unilateral measures taken by the UK Government under UK domestic law. They do not legally bind Sri Lanka and, in fact, we have publicly stated our disagreement with such unilateral measures.

5. Following the announcement by the UK Government imposing sanctions on four individuals, three of whom were former Commanders of the armed forces, through issuance of a press release titled "UK Sanctions for Human Rights Violations and Abuses during the Sri Lankan Civil War" by the UK Foreign, Commonwealth and Development Office - FCDO - on 24th March, 2025, I met the British High Commissioner on 26th March, 2025 and emphasized that,

- as a Government elected by all communities of Sri Lanka, the Government was in the process of building national reconciliation and unity, which is most important in the current context;
- the action by the UK is a "barrier to this process";
- Clarification was sought as to the reason why the UK Government took this measure at this point in time and whether this measure was driven by domestic politics in the UK, given that the UK FCDO Press Release refers to "a commitment made during the election campaign to ensure those responsible are not allowed impunity".

Further, the Government of Sri Lanka issued a Press Release on 26th March, 2025 in response, underlining that such unilateral action taken by the UK government does not assist, but serves to complicate the national reconciliation process underway in Sri Lanka. I **table*** the Press Release.

It was also reiterated that the Government of Sri Lanka's position is that the Government is in the process of strengthening domestic mechanisms for accountability and reconciliation, and that any past human rights violations should be addressed through domestic accountability mechanisms.

6. The Hon. Member of Parliament would recall that unilateral sanctions were first imposed by the USA in February, 2020 during the Government of President Gotabaya Rajapaksa. That was against General Shavendra Silva. Then, in December, 2021, travel bans were imposed by the USA on former Presidents Mahinda Rajapaksa and Gotabaya Rajapaksa. Canada, in January, 2023, also imposed sanctions on the two former

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

Presidents as well as Staff Sergeant Sunil Ratnayake and Navy Officer Chandana Hettiarachchi. All those sanctions were imposed for alleged human rights violations during the conflict.

Most recently, in December, 2024, the USA imposed sanctions on former Ambassador to Russia Udayanga Weeratunge and ex-CEO of SriLankan Airlines, Kapila Chandrasena, for corruption-related allegations.

So, this action by the UK was not the first such action and therefore, cannot be taken in isolation or as a precedent.

7. The Government has made it clear that it does not condone unilateral sanctions against its citizens by State or non-State actors. Unilateral sanctions are different from sanctions imposed by internationally recognized legal frameworks such as the UN Security Council. All member States are bound by any sanctions imposed by the United Nations Security Council through its resolutions. As stated above, Sri Lanka is not bound by unilateral sanctions. We have always maintained, even at the UN Human Rights Council in Geneva, that if there are allegations of human rights violations against members of the armed forces, they should be dealt with through domestic processes, which our Government has, since assumption of office, taken measures to strengthen. We reject international accountability mechanisms, including the external evidence-gathering mechanism established in 2022 under UNHRC Resolution 51/1. Therefore, our Foreign Policy is clear, that we do not recognize unilateral action taken outside recognized international legal frameworks.

Thank you very much.

ගරු කථානායකතුමනි, ඊළඟ ප්‍රශ්නයට ගරු මන්ත්‍රීතුමා ඉන්න අවස්ථාවේ දී පිළිතුරු ලබා දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නය අහපු මන්ත්‍රීවරයා මම නොවුවත් ගරු විජිත හේරත් අමාත්‍යතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් කර ගන්න කැමැතියි. මා හිතන විධියට, මෙය විශේෂයෙන්ම අපේ රටටත් වැදගත් වෙනවා. ලෝකයේ අධිරාජ්‍යවාදීන්ගේ යටත් විජිත හැටියට පැවැති රටවල් දැන් යම් උත්සාහයක් ගන්නවා ඒ අධිරාජ්‍යවාදයට යටත් වී තිබුණු කාල වකවානුව තුළ ඒ රටවලට සිදු වුණු ආර්ථික හානියට වන්දි ලබා ගැනීමේ වැඩසටහනක් කිරීමට. ඒ කියන්නේ, reparations for colonization. අධිරාජ්‍යවාදී පාලනය තුළින් රටට සිදු වුණු ආර්ථිකමය හානිය, සම්පත් හානිය, දේශීය සම්පත් සූරාකෑම, මංකොල්ලකෑම යනාදී කරුණු කාරණා පිළිබඳව අධිරාජ්‍යවාදින්ගේ යටත් විජිත ලෙස හිටපු රටවල් ජාත්‍යන්තර ප්‍රයත්නයක්, උත්සාහයක් දරනවා වන්දි - reparations - ලබා ගන්න. මා කැමැතියි මේ කාරණාව ඔබතුමන්ලාගේත්, ඔබතුමන්ලාගේ රජයේත් අවධානයට යොමු කරවන්න. අප්‍රිකාවේ සමහර රටවල් මේ දරන උත්සාහයට සමාන උත්සාහයක් අපේ රටේත් ක්‍රියාත්මක කළොත් හොඳයි. ඉන්දීය පාර්ලිමේන්තුවේ ඉන්නවා කොංග්‍රස් පක්ෂය නියෝජනය කරන ආචාර්ය ශෂී තාරූර් කියලා මන්ත්‍රීවරයෙක්. එතුමාට මේ සම්බන්ධ විශේෂඥ දැනුමක් තිබෙනවා. මේ සම්බන්ධව විශේෂිත දේශනයකුත් එතුමා ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ පැවැත්වූවා. මේවා මුල් කරගෙන අපිත් රටක් හැටියට එවැනි උත්සාහයක් දැරුවොත් හොඳයි. යටත් විජිත කාලය තුළ අපේ රටට සිදු වුණු ඒ විශේෂිත වූ අපරාධ කේන්ද්‍ර කරගෙන වන්දි ලබා ගැනීමේ වැඩ පිළිවෙළකට රටක් හැටියට ප්‍රවේශ වීම වැදගත් කියන එක මා ඔබතුමාට යෝජනා කරනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, මට මතකයි, පෘතුගීසීන් ලංකාව යටත් කරගෙන අවුරුදු 500ක් පිරීම නිමිත්තෙන් 2005 වර්ෂයේදී ලොකු සාජ්ජයක් පවත්වන්න තමයි එවකට හිටපු ආණ්ඩුව සැලසුම් කරලා තිබුණේ. නමුත්, අපි එදා ආණ්ඩු පක්ෂය නියෝජනය කරන වෙලාවේ පෘතුගීසි තානාපතිවරයා ලංකාවට ඒ යෝජනාව ගෙනැල්ලා තිබුණා. ලංකාවේ හිටපු අගමැතිවරයාත් ඒකට එකඟතාව පළ කරලා තිබුණා. ඒ තමයි හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා. නමුත්, මම සංස්කෘතික සහ ජාතික උරුමයන් පිළිබඳ එවකට හිටපු ඇමතිවරයා විධියට ඉතා පැහැදිලිවම ඒ යෝජනාව ප්‍රතික්ෂේප කළා. ප්‍රතික්ෂේප කරලා, ඒ අවුරුදු 500ක් පිරීම සමරනවා වෙනුවට, පෘතුගීසීන් අපේ රට යටත් කරගෙන හිටපු කාලය තුළ අපේ රටින් පැහැර ගෙන ගිය පුරාවස්තුවලට, ඒ වාගේම අපේ රටේ ජනතාවගේ ජීවිත හානි කරපු ඒවාට, දේපොළ හානි කරපු ඒවාට වන්දි ලබා දෙන ලෙස අනිවාර්ය යෝජනාවක් ඉදිරිපත් කළා. ඒකෙන්, ඒ අවුරුදු 500 සැමරීම සඳහා භෝජන සංග්‍රහයක් පවත්වන එක වැළැක්වුණා. ඊට පස්සේ අපෙන් පැහැර ගෙනගිය පුරාවස්තු අපට නැවත ලබා දෙන්න එකඟතාව පළ වුණා. ඊට පස්සේ නෙදර්ලන්ත ආණ්ඩුවත් එකඟතාව පළ කරලා අවස්ථා දෙකකදී අපට පුරාවස්තු ලබා දුන්නා. තවත් ඉතිරි වෙලා තිබෙන දේවල් ඉදිරියට ලබා දෙන්න එකඟතාව පළ කර තිබෙනවා. ඒ නිසා අපි ක්‍රමානුකූලව රාජ්‍යතාන්ත්‍රිකභාවය ආරක්ෂා කර ගනිමින්, එහෙත් අප යටත් කරගෙන හිටපු කාල වකවානු තුළ අපෙන් පැහැර ගත් පුරාවස්තු සහ විනාශ කරපු දේපළ, ජීවිත වෙනුවෙන් වන්දි ලබා ගන්න කටයුතු කරමින් ඉන්නවා. ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ කාරණාව ඉතා වැදගත්. ඒ වැදගත් යෝජනාව වෙනුවෙන් දැනටමත් අපි කටයුතු කරමින් තිබෙනවා. ඉදිරියේදී ආර්ථික වශයෙන් වන්දි ලබා ගන්නත් අවශ්‍ය වෙලාවකදී මැදිහත් වෙන්න අපි සූදානම් කියන එකත් අවධාරණය කරනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Foreign Minister, I was listening to your statement on accountability measures. Now, Hon. Foreign Minister, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මේ,-

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
No, let me clarify; I have the right to clarify, Hon. Speaker.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක අදාළ වෙන්නේ නැහැ.

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින ආණ්ඩුවේ වැඩකටයුතු මුලාසථානය ගත යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 80 සහ 81 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### 2026.01.11 දින "ඉරිදා ලංකාදීප" පුවත් වාර්තාව
### 2026.01.11ஆம் திகதிய "இரிதா லங்காதீப" செய்தி அறிக்கை
### NEWS REPORT IN "IRIDA LANKADEEPA" OF 11.01.2026

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩවී ඇති බවට ගරු කථානායකවරයා විසින් 2026 පෙබරවාරි 05 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 80 ඉදිරිපත් කිරීම, ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

## මහජන ආරක්ෂක ආඥාපනත: යෝජනා සම්මතය
## பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டம்: தீர்மானம்
## PUBLIC SECURITY ORDINANCE: RESOLUTION

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2026 ජනවාරි 28 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

To start the Debate, the Hon. Major General (Rtd.) Aruna Jayasekera. You have 13 minutes.

[පූ.භා. 10.45]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට පත් ජනතාවගේ සහ අනෙකුත් යටිතල පහසුකම් කාර්යක්ෂම කිරීම සහ විධිමත් කිරීම වෙනුවෙන් ආපදා තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමේ රෙගුලාසියෙහි කාලය දීර්ඝ කර ගැනීමේ විශේෂ විවාදය තමයි අද පවත්වන්නේ. ඒ සඳහා ආරම්භයක් ගැනීමට මට අවස්ථාව ලැබීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා.

පසුගිය "දිට්වා" සුළි කුණාටුව, ඒ ඇති වෙච්ච මහා බරපතළ ආපදා තත්ත්වය හමුවේ දිස්ත්‍රික්ක 22ක් ජාතික ව්‍යසන පාත්‍ර ප්‍රදේශ හැටියට අපි නම් කළා. එම ආපදාවෙන් පීඩාවට පත් ජනතාවට අත්‍යවශ්‍ය පහසුකම් සැපයීම සහ සේවා පවත්වාගෙන යාමට මේ හදිසි ආපදා තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමේ රෙගුලාසිය ඉතාම වැදගත් වෙනවා. ඒ නිසා තමයි 2025 නොවැම්බර් මාසයේ 28වැනි දා ගරු ජනාධිපතිතුමා විසින් එය ප්‍රකාශයට පත් කළේ.

විශේෂයෙන්ම හදිසි ආපදා තත්ත්වයකදී අත්‍යවශ්‍ය සේවාවන් සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන බව සහ එම සේවාවන් කිසිම බාධාවකින් තොරව, අවහිරතාවකින් තොරව පවත්වාගෙන යාමත් වැදගත් වෙනවා. විශේෂයෙන්ම ජලය, විදුලිය, ඉන්ධන, රෝහල්, දුම්රිය, මහාමාර්ග ඇතුළු ප්‍රවාහනය, ආහාර පාන, දුරකථන යනාදි පහසුකම්වලට අදාළ කටයුතු විධිමත් කිරීමට මේ රෙගුලාසි යටතේ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා පත් වෙනවා. මේ කාර්ය පටිපාටිය සම්බන්ධීකරණය කර ගැනීම සඳහා, ජන ජීවිත ගොඩ නැඟීම සඳහා, ප්‍රාදේශීය මට්ටමේ, ග්‍රාම නිලධාරි මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා දිසාපතිවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, සංවර්ධන නිලධාරින්, අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සහ විදේශ කාර්යාලවල, කොමසාරිස් කාර්යාලවල කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ඔහුට විශේෂ බලතල හිමි වෙනවා. "දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වුණු හානිය ගැන, එහි බරපතළකම ගැන අපි කවුරුත් දන්නවා. ඒ තුළින් සමස්ත පද්ධතියම කඩා වැටුණා. ජල ගැලීම්වලින්, නාය යෑම්වලින් නිවාස, යටිතල පහසුකම් විනාශ වුණා; ජන ජීවිතය අඩපණ වුණා. ඒක, මෑත ඉතිහාසයේ අප දැකපු දරුණුතම ආපදා තත්ත්වයක්; සුනාමියට පසුව ඇති වුණු බරපතළම ආපදා තත්ත්වයක්. අපේ ඉතිහාසයේ කවදාවත් ඒ විධියේ දෙයක් අපි අත් දැකලා නැහැ. දශක ගණනාවකට පසුවයි මෙවැනි බරපතළ ආපදාවක් ඇති වුණේ. ආණ්ඩුවට ස්ථිර වගකීමක් තිබෙනවා, ජන ජීවිතය ගොඩ නඟන්න. ජීවිත හානි හැර අනෙක් යටිතල පහසුකම් යළි පිහිටුවීම අපේ ආණ්ඩුවත් සමඟ, එහෙම නැත්නම් අපේ රජයත් සමඟ එකතු වෙලා සිදු කිරීම අපේ වගකීමයි. එම නිසා හානි වූ දේපළවලට, වගාවලට, ව්‍යාපාරවලට, ජන ජීවිතවලට වන්දි ගෙවීම, නැවත පදිංචි කිරීම වැනි කටයුතු සඳහා විශාල වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒකත් හරිම සංකීර්ණයි. එම නිසා ව්‍යාකූලතා ගොඩක් පැන නැඟිලා තිබෙනවා. ඒවා හරියාකාරව කළමනාකරණය කර ගැනීමත්, විකල්ප ප්‍රදේශවල යටිතල පහසුකම් ගොඩ නැඟීමත්, ආරක්ෂිත ප්‍රදේශ සොයා ගැනීමත්, නැවත පදිංචි කිරීමත්, විකල්ප ප්‍රදේශ සොයා ගැනීමත් ඉතා අසීරුයි. තාක්ෂණික වශයෙන් ඒවා තක්සේරු කිරීම අපට අපහසුයි. මේ ආණ්ඩුව ඇතුළු අපි හැමෝම රටක් හැටියට විශාල අභියෝග රැසකට මුහුණ දුන්නා; තවමත් අභියෝගවලට මුහුණ දෙමින් සිටිනවා. ඒවාට ඉතා ක්‍රියාශීලි ලෙස, එහෙම නැත්නම් විධිමත්ව කටයුතු කරන්න තමයි මේ රෙගුලාසිය අපට වැදගත් වන්නේ.

මේ රජය මේ ආපදාව කළමනාකරණය වෙනුවෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා; විශාල මුදලක් වැය කරනවා. මේ සඳහා වියදම් කරන්නේ මහජන මුදල්. එම නිසා මේ මුදල් මනා විගණනයකින්, නිසියාකාරව, ක්‍රමානුකූලව අවශ්‍යතාවලට, ක්ෂේත්‍රවලට, ජන ජීවිතවලට, ඒ පවුල්වලට, ඒ මිනිසුන්ට හරියාකාරව ලබා දෙන්න ඕනෑ. ඒ මුදල් වැය කිරීමේදී, වන්දි ලබා දීමේදී, එහෙම නැත්නම් එම ක්‍රියාවලියේදී සමහර විට යම්කිසි අඩුපාඩුකම් සිද්ධ වෙන්න පුළුවන්. මොකද, පෙර රජයයන් කළා වාගේ මුදල් අරගෙන ඒවා අකටයුතුකම්වලට, එහෙම නැත්නම් තමන්ගේ පෞද්ගලික අවශ්‍යතාවලට යොදා ගන්න අපට බැහැ. ඒවා ඉතාම පරිස්සමින් යොදවන්න ඕනෑ. ඒ මහජන මුදල් හරියාකාරව වැය කරන්න අපට වගකීමක් තිබෙනවා. එම නිසා ප්‍රමාද සිද්ධ වෙන්න පුළුවන්.

පිට රටවලින් අපට විශාල වශයෙන් සහනාධාර ලැබුණා; රටවල් 32කින් සහනාධාර ලැබුණා. ඒ කියන්නේ ආහාර පාන, ඇඳුම් පැළඳුම් පමණක් නොවෙයි, මහා විශාල උපකරණ, පාලම්, වාහන ආදිය ද ලැබුණා. ඊයේත් ඉන්දියානු රජයෙන් පාලම් විශාල ප්‍රමාණයක් අපට ලැබුණා. ඒ වාගේම, ලෝක බැංකුවෙන් සහ JICA එකෙනුත් ලැබුණා. අපි ඒවා හරියාකාරව කළමනාකරණය කරගෙන, විගණනයට පාත්‍ර කරලා, හරි ස්ථානවලට, හරි ප්‍රදේශවලට යොමු කරනවා. දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉල්ලීම් මත තමයි අප ඒක කරන්නේ. ඉතින් ඒකට මනා සැලැස්මක් තිබෙන්න ඕනෑ. ඒ සැලසුමට ප්‍රවේශයක් ගන්න සහ ඒ සැලසුමට දායක වෙන්න හදිසි ආපදා තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට අදාළ මේ රෙගුලාසි විශාල ලෙස දායකත්වයක් ලබා දුන්නා සහ ලබා දෙමින් පවතිනවා. ඒ නිසා එකී කටයුතු විධිමත් කර ගැනීමට මේක තවදුරටත් අවශ්‍යයි.

අපි මේ මහා ව්‍යසනය -මේ ආපදාව- කළමනාකරණය කළා. මේක මහා විනාශයක්. මේ ආපදාව හේතුවෙන් අප දන්නා හැම ක්ෂේත්‍රයක්ම කඩා වැටුණා. නමුත් අපට තිබුණු ඕනෑකම නිසා, අප නිවැරැදි හා උපායශීලි ක්‍රියාමාර්ග ගත් නිසා මේ රට ඉතාම කෙටි කාලයක් තුළ -සති 6කින් පමණ- සාමාන්‍ය තත්ත්වයට ගේන්න අපට පුළුවන් වුණා. ඒ ආපදාව සති කිහිපයකින් බොහෝ දුරට කළමනාකරණය කර ගන්න අපට හැකි වුණා. ඒකේ ප්‍රතිඵල වශයෙන් තමයි ජාතික මට්ටමින් විතරක් නොව, ජාත්‍යන්තරයෙනුත් අපට හොඳ ප්‍රවේශයක්, හොඳ ප්‍රතිචාරයක් ලැබුණේ. ආර්ථික වශයෙන් අපි ලොකු ජයග්‍රහණ රාශියක් ලබා ගත්තා. ආපදාවට පත් වුණා කියලා, පීඩාවට පත් වුණා කියලා, මහා ව්‍යසනයක් වුණා කියලා කඩා වැටුණු රටක් හැටියට අපි පැත්තකට වැටිලා ඉඳලා හරියන්නේ නැහැ. පසුගිය වර්ෂ එක්ක සංසන්දනය කරන කොට, ආණ්ඩුව හැටියට, රජය හැටියට අපි ක්‍රියාශීලිව සහ වගකීමෙන් කටයුතු කරපු නිසා දේශීය ආදායම වාර්තාගත ලෙස වැඩි වුණා.

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

ගරු කථානායකතුමනි, ආපදාව වුණාට පස්සේ මේ ජනවාරි මාසයේ පමණක් සංචාරකයන් 250,000ත් ඉක්මවා ලංකාවට ඇවිල්ලා තිබෙනවා. ඒකෙන්ම පෙනෙනවා, මේ මහා ව්‍යසනය අප කොච්චර හොඳින් කළමනාකරණය කරගෙන තිබෙනවාද කියලා.

මේ ව්‍යසනයෙන් රට ගොඩ ගැනීම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් "Rebuilding Sri Lanka ජනාධිපති කාර්ය සාධක බලකාය" පිහිටුවූවා. එය, පශ්චාත් ආපදා පුනරුත්ථාපන, ප්‍රතිසාධන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා උපායමාර්ගික නායකත්වය, සම්බන්ධීකරණය ආදිය සඳහා පිහිටුවපු ජාතික මට්ටමේ යන්ත්‍රණයක්. අපේ මිනිස් ජීවිතවලට මෙන්ම පෞද්ගලික සහ පොදු දේපළවලට "දිට්වා" සුළි කුණාටුව මඟින් වෙච්ච හානිය අතිවිශාල නිසා ගරු ජනාධිපතිතුමා හඳුනාගත්තා එවැනි කාර්ය සාධක බලකායක අවශ්‍යතාව. එතුමා ඒ ගැන ප්‍රකාශ කළා. ඒ අවශ්‍යතාව මතයි ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන්, පළාත් ආණ්ඩුකාරවරුන්, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරින් 25 දෙනෙකුගෙන් සමන්විත Rebuilding Sri Lanka Presidential Task Force එක ගරු ජනාධිපතිතුමා විසින් පිහිටුවූයේ. විශේෂ උපකමිටු අටක් හරහා තමයි එහි කටයුතු සිද්ධ වෙන්නේ, අපේ ගරු අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන්. ඒ උපකමිටු අට මොනවාද කියා මා කියන්නම්.

එකක් තමයි, පශ්චාත් ආපදා අවශ්‍යතා ඇගයුම් උපකමිටුව. එමඟින් දත්ත ඒක රාශි කරගෙන සමාලෝචනය, ඇගයීම ආදිය සිදු කර, ඒ අනුව අදාළ අවශ්‍යතා ඉටු කිරීම මූලික වශයෙන් සිද්ධ වෙනවා. අනෙක් උපකමිටු තමයි, පොදු යටිතල පහසුකම් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ උපකමිටුව, පීඩාවට පත් ප්‍රජාව සඳහා නිවාස ප්‍රතිෂ්ඨාපනය කිරීමේ උපකමිටුව, දේශීය ආර්ථිකයන් සහ ජීවනෝපායන් පුනර්ජීවනය කිරීමේ උපකමිටුව, සමාජ යටිතල පහසුකම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ උපකමිටුව, මූල්‍ය සහ අරමුදල් උපකමිටුව -මෙය වැදගත්ම උපකමිටුවක්-, දත්ත සහ තොරතුරු පද්ධති පිළිබඳ උපකමිටුව සහ මහජන සන්නිවේදනය පිළිබඳ උපකමිටුව. මේ ආදි වශයෙන් උපකමිටු අටකින් මේ කටයුතු සිද්ධ වෙනවා. මේ උපකමිටුවල ක්‍රියාකාරිත්වයට, එහෙම නැත්නම් කළමනාකාරිත්වයට ඔවුන් ඉදිරිපත් කරන යෝජනා, සැලසුම් ඒක රාශී කරගෙන අත්‍යවශ්‍ය සේවා, එහෙම නැත්නම් හදිසි ආපදා රෙගුලාසියේ තිබෙන බලතල අනුව අත්‍යවශ්‍ය කොමසාරිස් ජනරාල් මාර්ගයෙන් ඒ ඒ ප්‍රදේශවල, ඒ ඒ දිස්ත්‍රික්කවල, ඒ ඒ ප්‍රාදේශීය ලේකම් යටතේ ඇති අත්‍යවශ්‍යම දේවල් සිද්ධ කරනවා. ඉහත කී ජනාධිපති විශේෂ කාර්ය සාධක බලකාය මේ සඳහා විශේෂයෙන් දායක වෙනවා. අපි ඒ කටයුතු ඉතාම විනිවිදභාවයෙන් සිදු කළා. මේ ලෝකයටම පෙනෙන විධියට, ලෝකයටම හොඳ අවබෝධයක් ලැබෙන විධියට කටයුතු කරපු නිසා තමයි පසුගිය කාල වකවානුව තුළ - පසු ගිය මාසයක දෙකක කාලය තුළ - ආර්ථික වශයෙන් විශාල ජයග්‍රහණ පිළිබඳ තොරතුරු අපට ලැබුණේ .

විශේෂයෙන්ම විදේශ ගමන් බලපත්‍ර දර්ශකයේ නවතම වාර්තාව අරගෙන බලන්න; අපි ස්ථාන තුනකින් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ඒ, මේ තරම් ව්‍යසනයක් වෙලාත් අපි මේ විධියට කටයුතු කළ නිසායි. එහෙම නැත්නම් අපේ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කරන කාර්යාලය නම් කරලා තිබුණේ, සංවිධානාත්මක අපරාධකාරයන්ට පාස්පෝට් තුන හතර හදලා දෙන කාර්යාලයක් කියලා. අපි බලයට ඇවිල්ලා වැඩ කරන්න පටන් ගත්තේ, දූෂණ විරෝධී දැඩි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අරමුණින්. අපි ඒක කළා. අපි පාර්ලිමේන්තුවේ මුල්ම සභා වාරය පටන් ගත්තේත් ඒ කටයුතු මූලික කරගෙන; මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතුව; විශේෂයෙන්ම නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීමේ අරමුණ ඇතුව. ඒ වාගේම අපරාධ නිසා, මත්ද්‍රව්‍ය නිසා ජන ජීවිත කඩා වැටීමේ ප්‍රශ්නය මුල් කරගෙන, ඒවා මැඩ පැවැත්වීම සඳහා විශේෂ මෙහෙයුම් දියත් කිරීම තුළින් ලෝක ප්‍රජාවට අපි ලබා දීපු පණිවුඩය නිසා තමයි මේ වාගේ ව්‍යසනයක් වෙච්ච වෙලාවේ ලෝකයේ රටවල් අපට උපකාර කරන්න පෙරට ආවේ. ඒ අනුව රටක් වශයෙන් ඉහළට යෑමට ලබා ගත යුතු සාධක, අපේ ශක්තිමත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා, එහෙම නැත්නම් රටවල් සමඟ පවත්වපු ගෞරවනීය සබඳතා නිසා තමයි මූලික වශයෙන් අපට මේ තත්ත්වයට එන්න පුළුවන් වුණේ.

විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාව, පොලීසිය, ඒ වාගේම රාජ්‍ය නිලධාරින් ඉතාම දැඩි කැපවීමකින් උදේ දවල් රෑ නොබලා, ඒ ව්‍යසනයේ මහා බරපතළකම, භයානකකම කරට අරගෙන කටයුතු කළ නිසා - විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවේ මහත් කැප කිරීම නිසා - තමයි ඒ වැඩ කටයුතු කළමනාකරණය කර ගන්න අපට පුළුවන් වුණේ.

ඒ වාගේම පොලිසියේ, ත්‍රිවිධ හමුදාවේ අභිමානය ගැනත් ඊයේ කථා කළා, මේ පාර්ලිමේන්තුවේ සමහර මන්ත්‍රීවරු. මමත් යුද හමුදාවේ වසර 35ක් සේවය කළා. ඒ අභිමානය ගැන ඔවුන් දන්නා දෙයක් නැහැ. අඩු ගණනේ හමුදාව ගැනවත් දන්නේ නැහැ. ඒ කථා කළ මන්ත්‍රීවරුන් හමුදාවේ නිලධාරින් පාවිච්චි කළේ කාර් රේස් පදින්න. එහෙම නැත්නම් වැලි කොට්ට ගහන්න; කාර් රේස් පදිනකොට ටයර් තියන්න. එහෙම කළේ ඒගොල්ලන්ට පොඩි පොඩි ආශ්වාද ලබා ගැනීම සඳහා. ඒ විධියට රණ විරුවන්ගේ අභිමානය නැති කළ නිසා තමයි අපි මේ විධියට ඉදිරියට ආවේ. අපි මේ විධියට විශ්‍රාමික සාමූහිකයක් හැදුවේ වෙනත් පෞද්ගලික අරමුණු නිසා නොවෙයි, ජාතික ජන බලවේග පක්ෂයේ ප්‍රතිපත්තිවල තිබුණු ගුණ නිසායි; වැදගත්කම නිසායි. ඒ මන්ත්‍රීවරුන්ගේ මල්ලිලා හමුදාවට ඇතුළත් කර ගත්තේ සුදුසුකම් නැතුව. ඇතුළත් කිරීමේ සුදුසුකම් අයින් කරලා තමයි ඒ වසරවල නාවික හමුදාවට බඳවා ගැනීම් කළේ. ඒ නිසා අභිමානය කෙලෙසුවේ, අභිමානය නැති කළේ ඔවුන්. නමුත් දැන් අභිමානය ඇති කරන්න, දේශපාලනය ත්‍රිවිධ හමුදාවෙන් අයින් කරලා අපි කටයුතු කරනවා.

මේ ව්‍යසනයෙන් ඇති වෙච්ච පීඩාකාරී තත්ත්වය කළමනාකරණය කර ගැනීමට මේ යෝජනා සම්මතය ඉතාම වැදගත් වනවා. ඒ අනුව මම යෝජනා කරනවා, මේ යෝජනා සම්මතය තවත් ඉදිරියට දීර්ඝ කර ගැනීමට.

මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I refer to Standing Order Nos. 100, 101 and 102. In Parliament, there was a Motion moved on 06th January, 2026 to appoint a Select Committee to look into

the electoral system under which Provincial Councils Elections should be held. After the Motion of 06th January, 2026, the Opposition has sent the names of its four Representatives in the Select Committee: the Hon. R.M. Ranjith Madduma Bandara, the Hon. M. Nizam Kariapper, the Hon. Mano Ganesan and myself. But, the Government has still not sent their Representatives' names. Now, it is one month since the Resolution was passed in Parliament. So, this is clearly a Government's move to delay the Provincial Councils Elections.

Then, the Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism, this morning, was talking about domestic mechanisms. Sir, in order to guarantee non-recurrence of such incidents, there has to be some sort of a power-sharing model. But, even one month after the Motion was moved, the Government has not sent the names of their Representatives. So, this is clearly a plan to delay the Provincial Councils Elections. The Hon. Prime Minister is also in the House. Hon. Prime Minister, please act on this. The Opposition has sent its nominations. Why is the Government not appointing their eight Representatives? Basically, we have always been of the view that appointing a Select Committee is to delay elections. Now, you all are just proving it because even after one month, you have still not sent your names. So, would you please expedite that?

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. R.M. Ranjith Madduma Bandara. You have 12 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[පූ.භා. 11.01]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ විවාදය තමයි මේ පැවැත්වෙන්නේ. මට ඉස්සෙල්ලා කථා කරපු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වූ තත්ත්වය සති 6කින් සාමාන්‍ය තත්ත්වයකට ගෙනැල්ලා තිබෙනවා කියලා. මේ කුණාටුව ඇවිල්ලා මේ වන විට මාස දෙකකට වැඩියි. ඒ ඇති වූ තත්ත්වය සාමාන්‍ය තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා නම් අපි අහනවා ඇයි හදිසි නීතිය ගෙනෙන්නේ කියලා. සාමාන්‍යයෙන් අපේ රටේ හදිසි නීතිය ගෙනෙන්නේ මේ රටට විරුද්ධව යම් පාර්ශ්වයක් කටයුතු කරනවා නම්. 1988-89 කාලයේ ජේවීපී එක මිනී මරද්දි අපි හදිසි නීතිය ගෙනාවා. අවුරුදු 30ක් තිස්සේ එල්ටීටීඊ එකේ යුද්ධය තියෙද්දිත් අපි හදිසි නීතිය ගෙනාවා. "දිට්වා" සුළි කුණාටුවෙන් හානියට පත් වෙච්ච අයට සලකන එකට මේ රටේ කවුරුවත් විරුද්ධ නැහැ. විපක්ෂයත්, අනෙකුත් සියලු පක්ෂත්, රටේ ජනතාවත් තමයි රජයට කලින් ගිහිල්ලා මේ අයට සහන සැලසුවේ.

අපි අහනවා, හදිසි නීතිය ගෙනෙන්නේ ඇයි කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේගේ කථාවේදී කිව්වා, හදිසි නීතිය ගෙනෙන්නේ නිලධාරින්ගෙන් වැඩ ගන්න කියලා. නිලධාරින්ගෙන් වැඩ ගන්න හදිසි නීතිය ඕනෑද? සාමාන්‍ය තත්ත්වයක් යටතේ ඒක කරන්න පුළුවන්. මගේ ළඟ තිබෙනවා, ගරු ජනාධිපතිතුමා 2025.11.28වැනි දා නිකුත් කරපු ගැසට් පත්‍රය. එහි සඳහන්ව තිබෙනවා, හදිසි නීතිය පනවන්න හේතු. ඉන් එකක් තමයි, පත්‍රිකා ආදිය බෙදාහැරීම. ඇත්තටම මොකක්ද මේකට හේතුව? තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය මර්දනය කරන්න හදනවා. "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත්වූවන්ට ආධාර කරනවා කියලා ඒකට විරුද්ධව කවුරුවත් පත්‍රිකා බෙදන්නේ නැහැ. හදිසි නීතිය පනවන්න තවත් හේතුවක් තමයි, කටකථා හෝ අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම හෝ පැතිරවීම. මේකෙන් තමුන්නාන්සේලා බලාපොරොත්තු වන්නේ මේ රටේ සාමාන්‍ය තත්ත්වය මර්දනය කිරීමයි. කවුරු හරි රජයට විරුද්ධව කථා කරනවා නම්, කවුරු හරි රජයට විරුද්ධව පෙළපාළි යනවා නම් ඒවා නවත්වන්නයි තමුන්නාන්සේලා මේ කටයුතු කරන්නේ. මෙම ගැසට් නිවේදනයේ තවදුරටත් තිබෙනවා, කිසිම තැනැත්තකු නීත්‍යානුකූල අවසරයක් නොමැතිව පොදු මාර්ගයකට, පාලමකට, බෝක්කුවකට අවහිර කරනවා නම් එය වරදක් කියලා. නමුත්, කවුරුවත් එහෙම අවහිර කරන්නේ නැහැ. හැබැයි, විරෝධය පළ කිරීමේ අයිතිය තිබෙනවා. අපි බලයේ සිටියදී තමුන්නාන්සේලා - ජනතා විමුක්ති පෙරමුණ- මේ රටේ හැම දාම විරෝධතා පැවැත්වූවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ හැම දාම හිටියේ පාරේ. අද ඒවා නවත්වන්න තමයි තමුන්නාන්සේලා "දිට්වා" සුළි කුණාටුව හේතුකාරක කරගෙන මේ හදිසි නීතිය පනවන්නේ.

අපි දැක්කා, මේ රටේ වෛද්‍යවරුන් පාරට බැස්සා; උද්ඝෝෂණ කළා; විරෝධතා දැක්වූවා. ඒ වාගේම මේ රටේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ එළියට බැහැලා විරෝධතා දැක්වූවා. ඒවා පාලනය කරන්නයි තමුන්නාන්සේලා මේ හදිසි නීතිය දමන්නේ. මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිටින කාර්ය මණ්ඩල එළියට ආවා. ඒ වාගේම විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේදී වන්දි ගෙවීමේ ප්‍රශ්නයක් ආවාම, ඒ අය එළියට ආවා. අපි අහනවා, තමුන්නාන්සේලාගේ රජය මේ හදිසි නීතිය දික් කරන්නේ මේ රටේ ආණ්ඩුවට විරුද්ධව එන බලවේග පාලනය කරන්නද කියලා.

බලන්න, ත්‍රිකුණාමලයේ බුදු පිළිමයක් සම්බන්ධව පැන නැඟුණු කාරණයේදී අයුතු ඒක රාශි වීම කියලා මේ රටේ ස්වාමීන් වහන්සේලා හතරනමක් තමුන්නාන්සේලා අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ හදිසි නීතිය යටතේ තමයි. *[බාධා කිරීමක්]* නැහැ, ඒක අපි ළඟ තිබෙනවා. "B" report එකත් තිබෙනවා. තමුන්නාන්සේ පසුව උත්තර දෙන්න. අපි අහනවා, බලංගොඩ කස්සප හාමුදුරුවන් ඇතුළු ඒ හාමුදුරුවරුන් කරපු වැරැද්ද මොකක්ද කියලා. හාමුදුරුවරු පිරිත් කිව්වා. පිරිත් කියපු එකට තමයි අද උන්වහන්සේලා රිමාන්ඩ් කරලා තිබෙන්නේ. අපට ආරංචියි,

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

ත්‍රිකුණාමලය බන්ධනාගාරයේ උණක් බෝ වන බවට. මේ හාමුදුරුවරුන් හතරනමටම ඒ උණ රෝගය වැලඳිලා. ඒ හාමුදුරුවරුන් වරදක් නොකර, පිරිත් කියපු එකට තමයි උන්වහන්සේලා රිමාන්ඩ් කරලා තිබෙන්නේ. අධිකරණයේදී උන්වහන්සේලා වෙනුවෙන් ඇප ඉල්ලා තිබෙනවා. නමුත් ඇප දීලා නැහැ. මොකක්ද, ඒ පොලිස් නිලධාරින් කියා තිබෙන්නේ? පොලිස් නිලධාරින් කියා තිබෙනවා, පොලීසියට විරුද්ධව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කර තිබෙනවා, ඒක අයින් කර ගත්තොත් ඇප දෙනවා කියලා. මම අහනවා, මේකද මේ රටේ නීතිය කියලා. මම පොලිස්පතිතුමාට කියනවා, පොලීසිය භාර ඇමතිතුමාට කියනවා, නියෝජ්‍ය ඇමතිතුමාට කියනවා, මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලා. හාමුදුරුවන්ට මුතු කුඩේ කැඩෙනකම් ගහලා, හාමුදුරුවන් රිමාන්ඩ් කරලා. 12දෙනෙක් අද රිමාන්ඩ් එකේ ඉන්නවා. කරුණාකරලා මේවාට පියවර ගන්න.

"දිට්වා" සුළි කුණාටුව නිසා මරණ 646ක් වෙලා තිබෙනවා. තවම රුපියල් ලක්ෂයයි ගෙවා තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, රුපියල් 25,000 සිට රුපියල් ලක්ෂ 100 වෙනකම් ගෙවනවා කියලා. රුපියල් ලක්ෂ 10 තවම ගෙවා නැහැ. මේවා ගැන වාර්තාවක් ඉදිරිපත් කරන්න. ඒ විතරක් නොවෙයි. එම ආපදාව නිසා 173දෙනෙක් අතුරුදහන් වුණා. අතුරුදහන් වුණු අයට වන්දි ගෙවන්න බැහැ, මරණ සහතිකය ලැබෙනකම්. අපි අහනවා, ඒකට තමුන්නාන්සේලා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා. නිවස සම්පූර්ණයෙන් හානි වුණු, නිවස සම්පූර්ණයෙන් නැති වුණු 5,988දෙනෙක් ඉන්නවා. අපි ආණ්ඩුවෙන් අහනවා, මේගොල්ලන් වෙනුවෙන් මොනවාද කරලා තිබෙන්නේ කියලා. තමුන්නාන්සේලා මෙතැනට ඇවිල්ලා එක එක දේවල් කියාවි. මේ අය ස්ථානගත කරන්න, වෙන තැනක නවත්වන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවාද? තවම එහෙම කටයුතු කරලා නැහැ. අද ඒ පවුල් ටික තැන් තැන්වල, නෑදෑ ගෙවල්වල ඉන්නේ.

තමුන්නාන්සේලා කළේ කිහිප දෙනෙකුට රුපියල් 25,000ක් සහ රුපියල් 50,000ක් දුන්න එක. ඒක දීලා කියනවා, "සුළි කුණාටුව වෙනුවෙන් අපි සියලු සහන සැපයුවා" කියලා. NBRI එකේ වාර්තා ටික තවම ඇවිල්ලා නැහැ. කඳවුරුවල හිටපු කට්ටිය දැන් ගෙවල්වලට යවනවා. ඒ සමහර අයට ඉන්න තැනක් නැහැ. නිවාස 5,988ක් සම්පූර්ණයෙන් විනාශ වෙලා තිබෙනවා. නිවාස 108,000කට අර්ධ හානි සිදු වෙලා තිබෙනවා. තවත් නිවාස නම් කරලා තිබෙනවා, ඒවායේ ඉන්න සුදුසු නැහැ කියලා. මම ඊයේ පෙරේදා නුවරඑළිය ප්‍රදේශයට ගියා. තමුන්නාන්සේලා නිවසකට කුලිය හැටියට ගෙවන්නේ මාසයකට රුපියල් 25,000යි. තවම ඒක ගෙවන්නේත් නැහැ. මොනවාද ඒ අය ඉල්ලන්නේ? ඒ අය කියන්නේ, "අපි කාගේ හරි නිවසකට කුලියට යනවා නම්, අපෙන් මාස හයක key money ඉල්ලනවා. අද අපට ඉන්න තැනක් නැහැ. කඳවුරුත් නැහැ. අපට මුදල් දෙන්නෙත් නැහැ. කරුණාකරලා අපට විසඳුමක් ලබා දෙන්න" කියලායි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ කඳවුරුවල ඉඳලා ගිය අයට දීමනා ගෙවනවාද කියලා අපි අහනවා.

සුළි කුණාටුව නිසා හානි සිදු වුණු අනෙක් ක්ෂේත්‍රය තමයි කෘෂිකර්ම ක්ෂේත්‍රය. ලෝක බැංකු වාර්තාවට අනුව ඇමෙරිකානු ඩොලර් මිලියන 814ක හානියක් මේ රටේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට සිදු වෙලා තිබෙනවා. ඒ අයට වන්දි වශයෙන් තමුන්නාන්සේලා කීයක් ගෙවලා තිබෙනවාද? ගොවියෝ හැම තැනම කන්නලව් කරනවා කීයක්වත් හම්බ වුණේ නැහැ කියලා. ඒගොල්ලෝ අවුරුද්ද පුරා ජීවත් වෙන්නේ වගාවෙන් ලැබෙන ආදායමින්. අනෙක් එක, ඓතිහාසික සුනාමි ව්‍යසනය වෙලාවේදීවත්, ගංවතුර වෙලාවේදීවත් අපේ කිසිම දේශපාලනඥයෙක් ඒවාට ඇඟිලි ගැහුවේ නැහැ.

මම ඊයේ පෙරේදා මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිල නගරයේ, බැදියාව කියන ගමට ගියා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා ඉන්නෙත් ඒ ගමේ. බඩු මලු දීලා තිබෙන්නෙත් JVP එකේ අයට විතරයි. අනෙක් අයට නැහැ. ග්‍රාම නිලධාරි සංගමය කිව්වා, "දේශපාලනඥයන්ගෙන් අපට බලපෑම් ඇවිල්ලා තිබෙනවා. එම නිසා අපි රාජකාරියෙන් ඉවත් වෙනවා" කියලා. ඔන්න, තමුන්නාන්සේලා සුළි කුණාටුවෙන් ආපදාවට පත් වුණු මිනිසුන්ට සාධාරණත්වය ඉෂ්ට කළ විධිය! ගරු අගමැතිතුමියනි, සාධාරණත්වය ඉෂ්ට කරන්නේ මෙහෙමද? සමහර ප්‍රාදේශීය ලේකම්වරු කියනවා, තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු බලපෑම් කරන නිසා ඒ කටයුත්තෙන් ඉවත් වනවා කියලා. මේ රටේ කවදාවත් මීට පෙර රාජ්‍ය යන්ත්‍රණයට බලපෑම් කරලා නැහැ. නමුත්, තමුන්නාන්සේලා මේ විධියට තමයි සුළි කුණාටුවෙන් අපදාවට පත් වුණු ජනතාව සම්බන්ධයෙන් කටයුතු කරලා තිබෙන්නේ. විපත වෙලා දැනට මාස දෙකක් ගතවෙලා තිබෙනවා. මිනිස්සු නැවත පදිංචි කරවීමට සුදුසු ඉඩම් සොයාගෙන තිබෙනවාද කියලා මම අහනවා. ඒකට නේ හදිසි නීතිය දීර්ඝ කරන්නේ. ඉඩම් හොයාගෙන තිබෙනවාද? නැහැ. සමහර ප්‍රදේශවල හොයාගෙන නැහැ. කරුණාකරලා ඒ අනාථ කට්ටිය ඉක්මනින් නිවාසවල පදිංචි කරවන්න කටයුතු කරන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
විපක්ෂයෙන් මට තව ටිකක් කාලය ලබා දෙයි.

දැන් ජනාධිපතිතුමා ගිහින් cheques බෙදනවා. ඊයේ පෙරේදා අනුරාධපුරයට ගිහින් cheques බෙදුවා. අද නුවර ගිහින් cheques බෙදනවා. බෙදපු cheques කිහිපයක් අගරු - return - වෙලා තිබෙනවා. අපේ නීතියට අනුව සාමාන්‍යයෙන් එය අපරාධ වරදක්. එහෙම නම් ජනාධිපතිවරයා අපරාධ වරදක් කරලා තිබෙනවා. තමුන්නාන්සේලා ආණ්ඩුවෙන් චෙක්පත් දෙනවා. ඒවා අගරු වනවා. ආණ්ඩුව වාගේම ඒවාත් අගරු වෙලා. චෙක්පතුත් අගරු වෙලා.

ඒ විතරක් නොවෙයි. මාධ්‍ය මර්දනය කරන්න කටයුතු කරනවා. දැන් හදිසි නීතිය දීර්ඝ කරන්නේ ඒකයි. අගමැතිතුමිය මේ අවස්ථාවේ සභාවේ ඉන්න එක හොඳයි. එතුමිය කියනවා, 6වන ශ්‍රේණියේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම නැවැත්වූයේ රජය නොවෙයි, විපක්ෂය ලු. ඒකේ වැරැද්ද විපක්ෂයේ ලු. ජනවාරි 04වැනි දා අගමැතිතුමියම කියනවා, "අපි මොඩියුල සියල්ල seal කළා, පරීක්ෂණ ආරම්භ කළා, ඒක බරපතළ වරදක්, අපි කොළ ඉරලා නැවත මොඩියුලය දෙනවා" කියලා. තමුන්නාන්සේලා කොළ ඉරුවාට හරියනවාද? දැන් අගමැතිනිය කොළේ ඉරාගෙන තිබෙන්නේ, ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය නිසා. වෙන ඒවායින් නොවෙයි. 2026 ජනවාරි 04වැනි දා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවේදී විජිත හේරත් මැතිතුමා කියනවා, "නුසුදුසු වෙබ් අඩවියක් ඇතුළුවීම බරපතළ වරදක්" කියලා. ජනවාරි 13වැනි දා ජනාධිපතිතුමා කියනවා, මොඩියුල සකස් කිරීමේ ගැටලු තිබෙන බව. එතුමා ඒක පිළිගන්නවා. ඊළඟට, ගරු පුහුණුවේ අඩුපාඩු තිබෙන බව ජනාධිපතිතුමා පිළිගන්නවා; තාක්ෂණික ගැටලු තිබෙන බව ජනාධිපතිතුමා පිළිගන්නවා. එය එතුමාගේ මාධ්‍ය නිවේදනයේ සඳහන්ව තිබෙනවා. 6 වන ශ්‍රේණියේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය 2027 දක්වා කල් දමන්න තීරණය කළා. අපි ද මේවා කියලා තිබෙන්නේ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තව විනාඩියක කාලයක් ලබා දෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඒ විතරක් නොවෙයි. බිමල් රත්නායක මැතිතුමා කියනවා, "6 ශ්‍රේණියේ පෙළපොත් මුද්‍රණයට අදාළ පියවර නිසි ලෙස අනුගමනය කර නැහැ, මෙය වරදක්. ඒ වරද සරල නොසැලකිල්ලක් නොව බරපතළ වරදක්" කියලා. ගරු අගමැතිතුමියනි, ඔබතුමියට මේ චෝදනා එල්ල කරන්නේ මේ ආණ්ඩුවේම ඉන්න JVP එකේ ඇමතිවරු ටික. අපි කියනවා, කරුණාකර තමුන්නාන්සේලා කරපු වැරැද්ද වෙන අය පිට පටවන්න එපා කියලා. ඒ වාගේම, අද මාධ්‍ය මර්දනය කරන්න, විපක්ෂය මර්දනය කරන්න, මේ රටේ ආණ්ඩුවට විරුද්ධව එන අය මර්දනය කරන්න තමුන්නාන්සේලා පනවන හදිසි නීතියට අපි විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. අපි එයට විරුද්ධව ඡන්දය දෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අගමැතිතුමියනි, ඔබතුමියටයි මීළඟට කාලය වෙන් වන්නේ.

[පූ.භා. 11.14]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි මේ විවාද කරන්නේ "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශ කිරීම පිළිබඳ ගැසට් නිවේදනය දීර්ඝ කිරීම සඳහායි. ඔබතුමියත්, අප සියලුදෙනාත් හොඳින් දන්නා කාරණයක් තමයි, "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් මේ රටට වෙච්ච හානිය, මේ රටේ ජනතාවට වෙච්ච හානිය. අපි බලාපොරොත්තු නොවූ අන්දමට අපේ රටේ යටිතල පහසුකම්වලට - විශේෂයෙන් පාරවල්වලට, පාලම්වලට - කොතරම් හානියක් සිද්ධ වුණාද කියන එක නැවත නැවත අවධාරණය කළ යුතු නැහැ. අපි සියලුදෙනා ඒ ගැන දන්නවා. අපට පාසල් ගණනාවක් තිබෙන ස්ථානවලින් ඉවත් කර නැවත ගොඩනැඟීමට තිබෙනවා. ඒ වාගේම නිවාස ගණනාවක් ගොඩනැඟීමට තිබෙනවා. ඉතිහාසයේ අපි දැකපු නැති තරමට නායයෑම් සිද්ධ වෙලා තිබෙනවා. මේ වෙනකොටත් 1,300ක් පමණ නායයෑම් පිළිබඳව NBRI වාර්තා ලැබී තිබෙනවා. මීට කලින් කිසිසේත්ම සිද්ධ නොවූ විධියට අපේ යටිතල පහසුකම්වලට සිදු වූ හානි සහ නායයෑම් අවදානම වැඩිවෙලා තිබෙනවාය කියන එක සියලුදෙනා දන්නා කාරණයක්. ඒ තත්ත්වය තුළ මේ කටයුතුවලට මැදිහත් වෙන්න අපට සිද්ධ වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ මැදිහත් වීම සඳහා සම්පත් mobilize කරගන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ කියන්නේ මානව සම්පතත්, ද්‍රව්‍යමය අවශ්‍යතා සියල්ලත් අපට ඉතාම ඉක්මනින් mobilize කරගෙන ඒවා සොයාගෙන ක්‍රියාත්මක කරන්න සිද්ධ වෙලා තිබෙනවා. වැරදි තැන් නිවැරදි කරන්නත්, මේ සිද්ධ වෙලා තිබෙන හානිය අවම කරන්නට ගත යුතු පියවර ගැනීමටත් අපට විශාල වැඩ කොටසක් පැවරී තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම හදිසි නීතිය දීර්ඝ කිරීමේ අවශ්‍යතාව පැන නඟින්නේ ඔන්න ඔය තත්ත්වය මත පමණයි. මේ තුළින් සිද්ධ වන ප්‍රධාන දේ මෙයයි. ඇත්ත වශයෙන්ම අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යෑමත්, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා පත් කිරීමත් තමයි මේ තුළින් අපි බලාපොරොත්තු වන්නේ. ඔය ප්‍රධාන කරුණු දෙක සඳහා තමයි අපි මේ නීතිය පාවිච්චි කරන්නේ. ඒ පාවිච්චි කරන්නෙත් මේ ඇතිවෙලා තිබෙන තත්ත්වය තුළ කළ යුතු ක්‍රියා කාර්යක්ෂමව සහ ඉතාම වේගයෙන් - පුළුවන් තරම් වේගයෙන්- සිදු කරන්නයි. මේ ප්‍රදේශ, මේ ජනතාවගේ ජීවිත යථා තත්ත්වයට පත් කිරීමේ අවශ්‍යතාව මත තමයි අපි මේ නීතිය තව මාසයකින් දීර්ඝ කරන්න පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට අමතරව මේ හා සමානව ගරු ජනාධිපතිතුමා විසින් Task Force එකක් පත් කර තිබෙන බව ඔබතුමියත් දන්නවා. මේ වැඩකටයුතු තවදුරටත් නියාමනය කිරීමටත්, සැලසුම් කිරීමටත්, අවශ්‍ය සම්පත් හරියට යොදාගැනීමටත් එම කාර්ය සාධක බලකාය පත් කර තිබෙනවා. එහි සභාපතිත්වය දරන්නේ මම. ඒ යටතේ අපි මේ වෙනකොට එක් එක් ක්ෂේත්‍ර හරහා එක් එක් කාරණා පිළිබඳව උපකමිටු 08ක් පත් කර තිබෙනවා. "දිට්වා" සුළි කුණාටුව නිසා සමාජයේ යටිතල පහසුකම්වලට වෙලා තිබෙන හානිය, ආර්ථික ක්ෂේත්‍රයට වෙලා තිබෙන හානිය, මානව සම්පතට වෙලා තිබෙන හානිය කියන මේ සියල්ලම බලන්නත්, මුදල් පරිහරණය පිළිබඳව බලන්නත් subcommittees 8ක් පත් කරලා, ඒ හරහාත් අපි මේ වනකොට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

මීට අමතරව, we have appointed a high-level committee to coordinate the foreign aid received. As you know, we received a lot of support from the international community post-"Ditwah", both as monetary assistance and also with personnel. Many foreign missions supported us; many countries supported us. So, to coordinate international assistance, we have appointed a high-level committee, which is in operation right now, and to make sure that the support we are getting is used meaningfully and effectively. The only intension of the Government in extending these Emergency Regulations, once again, I want to reiterate, is to ensure that the response to this completely unprecedented situation is being managed efficiently and as quickly as possible, so that we could restore the lives, the livelihoods and the day -to-day activities of these affected communities as soon as possible.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පාර්ලිමේන්තුවේ ප්‍රධාන විපක්ෂයේ පුරුද්දක් බවට පත් වෙලා තිබෙනවා, උදේ වරුවේ මේ සභාවට ඇවිල්ලා පදනම් විරහිත කරුණු කාරණා සම්බන්ධයෙන් කියවන එක. මම ඇත්තටම කනගාටු වෙනවා, විපක්ෂයේ සිටින ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් අතිනුත් එවැනි දේවල් සිදුවීම පිළිබඳව. මම උදාහරණයක් කියන්නම්.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් මේ ගරු සභාවේදී කිව්වා, ත්‍රිකුණාමලය සිද්ධියට අදාළව ඒ භික්ෂූන් වහන්සේලා අත්අඩංගුවට ගත්තේ හදිසි නීතිය යටතේ කියලා. ඒක සම්පූර්ණයෙන් වැරදියි නේ. ඒක සම්පූර්ණ අසත්‍යයක්. සාමාන්‍ය නීතිය යටතේ තමයි එතැනදී කටයුතු කළේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අයුතු ජන රාශිය කියන කාරණය යටතේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අයුතු ජන රාශිය කියන්නේ දණ්ඩ නීති සංග්‍රහය යටතට ගැනෙන වරදක් නේ. මොනවාද මේ කියන්නේ?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඒ සිද්ධියට අදාළව නීතිය ක්‍රියාත්මක වුණේ හදිසි නීතිය යටතේ නොවෙයි, සාමාන්‍ය නීතිය යටතේ. ඒ නිසා මේ සභාවට ඇවිල්ලා එවැනි අසත්‍ය තොරතුරු ප්‍රකාශ කිරීම අතිශයින්ම වැරදියි. ඒ වාගේම දැන් මෙතැන කියනවා, හදිසි නීතිය තුළ කරන්න පුළුවන් දේ මොකක්ද කියලා. මෙතැන විවාදය තිබෙන්නේ හදිසි නීතිය තුළ කරන්න පුළුවන් දේ මොකක්ද කියන එක නොවෙයි. අපි හදිසි නීතිය මොකක් වෙනුවෙන් පාවිච්චි කළාද කියන එකයි බලන්න ඕනෑ. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කියනවා නම් ත්‍රිකුණාමලය සිද්ධිය අවස්ථාවේ හදිසි නීතිය යටතේ තමයි ඒ අත්අඩංගුවට ගැනීම් සිදු වුණේ කියලා, ඒක වැරදියි.

ඊළඟට කිව්වා, අපි හදිසි නීතිය පාවිච්චි කරලා මාධ්‍ය මර්දනය කරනවා කියලා. නිශ්චිත වශයෙන් මට කියන්න, කොහේද එහෙම එකක් වුණේ කියලා? විරෝධතා කරන්න දුන්නේ නැහැ, විරෝධතාවලට එරෙහිව ක්‍රියාත්මක වුණා කියලා කිව්වා. එහෙම වෙච්ච නිශ්චිත සිද්ධියක් කියන්න, ගරු මන්ත්‍රීතුමා. කොතැනද, මොන protest එකටද අපි බාධා කළේ කියන්න. එවැනි protest එකක් නොකරන තැනට අපි කටයුතු කළේ කොතැනකදීද කියන්න. ඒ නිශ්චිත කාරණා කියන්න. පොදුවේ නිකම් කාරණා කියන්න එපා. මට කියන්න, අපේ ආණ්ඩුව පසුගිය මාස දෙක ඇතුළත විරෝධතාවක් නවත්වා තිබෙන්නේ කොහේද කියලා? හදිසි නීතිය යටතේ මාධ්‍ය suppress වුණේ කොතැනද? එවැනි සිද්ධි මොනවාද කියලා අපට හරියට කියන්න. එහෙම නැතිව එහෙම වුණා කියලා විතරක් කියන්න එපා. *[බාධා කිරීමක්]* ඔබතුමා ඇහුවා, හදිසි නීතිය දාන්නේ ඇයි කියලා. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා එක්ක වාද කරන්න අවශ්‍ය නැහැ. එතුමා කරපු කථාවටයි මම මේ පිළිතුරු දෙන්නේ. එතුමාට පිළිතුරු දෙන්න මටත් අවස්ථාවක් තිබිය යුතුයි කියලා මම හිතනවා. එතුමා කිව්වේ එහෙම වුණා කියලායි. අපි මාධ්‍ය මර්දනය කළා, විරෝධතාවලට ඉඩ දුන්නේ නැහැ, ත්‍රිකුණාමලයේ වූ සිද්ධියේදී භික්ෂූන් වහන්සේලා හදිසි නීතිය යටතේ අත්අඩංගුවට ගත්තා, එවැනි දේවල් සිද්ධ වුණා කියලා තමයි මේ කියන්නේ. නමුත් ත්‍රිකුණාමලය සිද්ධිය සම්බන්ධයෙන් ඔය කියපු දේවල් බොරු. ඒ කියපු විධියට නොවෙයි එතැන සිද්ධිය වුණේ. ඒ නිසා ඒ කථාව වැරදියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම අහන්නේ, කොතැනද හදිසි නීතිය යටතේ මාධ්‍ය මර්දනයක් පසුගිය මාස දෙක ඇතුළත සිද්ධ වුණේ, කවුරුද, කොතැනද අත්අඩංගුවට ගත්තේ, මොකක් හරි විරෝධතාවක් වෙනුවෙන් මේ නීතිය පාවිච්චි කරලා අපි මැදිහත් වුණු සිද්ධි මොනවාද කියලායි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු අගමැතිතුමියනි, ඔච්චර අසරණ කරන්න එපා, විපක්ෂය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
මම හරි නිශ්චිත දෙයක් නේ මෙතැන කියන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. නීතියේ තිබෙන දේ නොවෙයි නේ ඒ මන්ත්‍රීතුමා කිව්වේ. අපි එසේ කරනවා, එසේ කරලා තිබෙනවා කියලායි එතුමා කිව්වේ. මම අහන්නේ, කොතැනද එහෙම සිද්ධ වුණේ, ඒ සිද්ධි මොනවාද කියලායි. මොකද, ඒවා අපිත් දැනගන්න ඕනෑ. මේ නීතිය පාවිච්චි කරලා එහෙම කළා නම්, අපිත් නොදැනුවත්ව නම් එහෙම සිද්ධ වුණේ, ඒක බරපතළ ප්‍රශ්නයක්. එම නිසා ඒවා අපට දැනුම් දිය යුතුයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු අගමැතිතුමියනි, ඔච්චර අසරණ කරන්න එපා, විපක්ෂය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
විපක්ෂය දැන් විරෝධතා ගැන කථා කරනවා නේ. පසුගිය සති ගණන තුළම මම දැක්කා, ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරියේ සංවර්ධන නිලධාරින් විරෝධතා කරනවා. ගරු විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුත් එතැනට ගිහින් ඔවුන් එක්ක සාකච්ඡා කරනවා, මාධ්‍ය සාකච්ඡා තියනවා අපිත් දැක්කා. ඉතින් කොතැනද අපි මර්දනයක් කරලා තිබෙන්නේ? *[බාධා කිරීමක්]* ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාට කියන්න කාරණයක් තිබෙනවා නම් මූලාසනයෙන් අවසර ගන්න. *[බාධා කිරීමක්]* Point of Order එකක් නැත්නම් කරුණාකරලා මගේ කථාවට බාධා කරන්න එපා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අගමැතිතුමියට බාධා කරන්න බැහැ නේ, කථාව ඉවර වෙනකම් ඉන්න.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳින් දන්නවා, point of Order එකක් නැත්නම් මැදිහත් වෙන්න බැහැ කියලා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට අවශ්‍ය වන්නේ පැහැදිලි කර ගැනීමක්.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඒ පැහැදිලි කර ගැනීම කරන්න ඔබතුමාගේ වෙලාවේදී. *[බාධා කිරීමක්]*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
හරි, අහන්න. මොකක්ද ප්‍රශ්නය?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම දැන් ඔබතුමිය කියන කාරණා අහගෙන හිටියා. මම අහන්නේ ඇයි එහෙම නම් මේ නීතිය නැවත දික් කරන්නේ කියලායි. මොකක්ද ඒකට හේතුව? මට කියලා දෙන්න, මෙන්න මේ හේතු නිසා හදිසි නීතිය දික් කරනවා කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
මේ කථාව ආරම්භ කරනකොටම මම ඒ කරුණු ඉදිරිපත් කළා. මම ඒ කරුණු ඉදිරිපත් කරලා තමයි මාතෘකාවට ආවේ. එතකොට ඔබතුමා Chamber එකේ හිටියේ නැහැ. හැන්සාඩ් වාර්තාව කියවලා මම කියපු දේ දැනගන්න පුළුවන්. මම කියපු දෙයක් repeat කරන්න යන්නේ නැහැ, මගේ කාලය නාස්ති කරගෙන.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ සභාවේදී නැවත වතාවක් කියැවුණා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කල් දැමීම පිළිබඳව සහ ඒ ක්‍රියාවලිය ගැන. ඇත්තටම ඒ කරුණ මතු වූ නිසා මම නැවත වතාවක් ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්නම්. රජයක් හැටියට අපි සහ විෂය භාර අමාත්‍යවරිය හැටියට මම ඒ සිද්ධිය වාර්තා වුණාම එය නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත්තා. අපි ඒ ක්‍රියාමාර්ග අරගෙන ඒ අනුව ක්‍රියාත්මක වුණා. ඒ වෙච්ච අඩුපාඩුව වෙනුවෙන් අපි තීරණ ගණනාවක් ගත්තා. ඒවා ප්‍රතිපත්තිමය කාරණා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල වැදගත්කම සහ ඒ වගකීමේ ප්‍රකාශයක් හැටියට තමයි අපි ඒ නිවැරදි කිරීම් කරගෙන යන්නේ. මම හිතන විධියට, එහෙම තමයි වග කිව යුතු රජයක් මැදිහත් විය යුත්තේ. වැරදි වෙනකොට ඒවා යටපත් කරන එක නොවෙයි කළ යුත්තේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂය විසින් දිගින් දිගටම ඒ කාරණය මතු කරන නිසා තමයි අපිත් මේ කරුණු පැහැදිලි කරන්නේ. නමුත් එතුමන්ලාගේ දෙබිඩි ප්‍රතිපත්තිය තමයි අපි මෙතැනදී ප්‍රශ්න කළ යුත්තේ. එක වෙලාවක එතුමන්ලා විසින්ම අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට එරෙහිව විශාල කතිකාවක් ගොඩනඟලා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ව්‍යාකූල තත්ත්වයක් සමාජගත කිරීමට උත්සාහ ගත්තා. ප්‍රතිසංස්කරණ එපා කියලා විරෝධතා සංවිධානය කළේ මෙතුමන්ලා නොවෙයි නම් ඒ කවුද කියන එකයි මම අහන්නේ. කතරගම දේවාලයට ගිහිල්ලා ප්‍රතිසංස්කරණ එපා කියලා පොල් ගැහුවේ කවුද? තව කොහේ හරි කෝවිලකටත් ගිහිල්ලා පොල් ගැහුවේ කවුද? *[බාධා කිරීම්]* ඔබතුමන්ලාගේ සංවිධායකවරයෙක්. *[බාධා කිරීම්]* අපි හොඳට, පැහැදිලිව ඒ දර්ශනත් දැක්කා. එතුමා වීඩියෝ කරනකොට "මාව ගන්න එපා, මාව ගන්න එපා" කියලාත් ඔහු කිව්වා. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සජබයේ හොරණ ආසන සංවිධායක.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
සජබයේ හොරණ ආසන සංවිධායකවරයා. දිස්ත්‍රික් මට්ටමින්, කොට්ඨාස මට්ටමින් විරෝධතා සංවිධානය කළේ නැද්ද, දැන් මේ දන්නේ නැහැ වාගේ කථා කරන්නේ? *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි කියන්නේ මේකයි. ප්‍රතිසංස්කරණ තුළින් අසත්‍යකරණයක් සිද්ධ වුණා කියලා විපක්ෂ නායකතුමා ම මේ සභාවේදී කිව්වේ නැද්ද? එතුමා මේ සභාව තුළදීත් එහෙම කිව්වා. මේ සභාවෙන් පිටතදීත් කිව්වා. ඒ නිසා අසත්‍යකරණය සිද්ධ වුණේ කොහොමද කියලා ඔබතුමා පොඩ්ඩක් පැහැදිලි කරන්න, ගරු විපක්ෂ නායකතුමනි.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අපි අකුළා ගත්තේ නැහැ. කරුණාකර ඔබතුමන්ලා මේක වැරදි විධියට තේරුම් ගන්න එපා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අපි අකුළා ගෙන නැහැ. 1 ශ්‍රේණියේ එක දැන් ක්‍රියාත්මකයි. ප්‍රතිසංස්කරණවලට අදාළ කුලුනු පහේ වැඩ කටයුතු අපි කරගෙන යනවා. 6 ශ්‍රේණිය විෂය මාලා ක්‍රියාත්මක කිරීම 2027ට කල් දැම්මා. මොකද, එතැන ප්‍රශ්නයක් තිබුණා. ඒ ප්‍රශ්නය පිළිගෙන නිවැරදි කරන්න ඕනෑ නිසා අපි ඒක 2027 වසර දක්වා කල් දැම්මා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියන්නේ, 1 ශ්‍රේණියේ module එක විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒක ඊට එහා ගිය ක්‍රියාවලියක්. ඊට එහා ගිය ක්‍රියාකාරකම් ගණනාවක් එහි තිබෙනවා. ඒවා කිසිසේත්ම අපි අකුළාගෙන නැහැ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණත් අපි අකුළා ගෙන නැහැ. ඒවා අපි කරගෙන යනවා. නිවැරදි කළ යුතු තැන්වල නිවැරදි කිරීම් කරන්න අපි කාලය ගන්නවා. එච්චරයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතැනදී අපටත් කරුණු මත සංවාද කරන්න අවශ්‍යයි. මොනවා හරි ඇත්ත කාරණා මේ සභාවට ඇවිල්ලා කියලා, නිවැරදි කර ගත යුතු තැන් නිවැරදි කර ගැනීම වෙනුවෙන් මේ ගරු සභාව තුළ සිද්ධ වන සංවාද අපට වැදගත්. නමුත්, එසේ නොකර මේ විධියට විවිධ කාරණා ප්‍රකාශ කරලා මෙතැනින් යන එක සාධාරණ නැහැ කියන එකයි මම කියන්නේ. උදාහරණයක් හැටියට ගත්තොත්, අපි හරියට දීමනා දීලා නැහැ කියනවා. මට ලැබී ඇති කාලය අවසන් වන නිසා මම කරුණු හතරයි කියන්නේ. ඒ කාරණයත් කියා මගේ කථාව මම ඉක්මනින් අවසන් කරන්නම්. මට විශ්වාසයි, අපේ මන්ත්‍රී කණ්ඩායම අද දවසේ ඉතුරු වෙලාව තුළ අනෙක් කාරණාත් ප්‍රකාශයට පත් කරයි කියලා.

ආපදාවට පත් පාසල් දරුවන් වෙනුවෙන් රුපියල් 15,000 දීමනාව ලබා දීම 02වැනි දා වෙනකොට සියයට 72ක් සම්පූර්ණ කර තිබෙනවා. මරණයට පත් වූ පුද්ගලයන් වෙනුවෙන් වන්දි මුදල් ලබා දීම සියයට 50ක් සම්පූර්ණ කර තිබෙනවා. රුපියල් 50,000 දීමනාව ලබා දීම සියයට 77ක් සම්පූර්ණ කර තිබෙනවා. රුපියල් 25,000 දීමනාව ලබා දීම සියයට 98ක් සම්පූර්ණ කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සුළි කුණාටුව ඇති වෙලා මාස දෙකක කාලයක් තුළ තමයි මේ ප්‍රගතිය අපි ලබාගෙන තිබෙන්නේ. ඊට පසුව දෙන්න තිබෙන දීමනාවලත් ප්‍රගතියක් තිබෙනවා. ඒවා තක්සේරු කරන්න ඕනෑ. අලුත් නිවාස හදනකොට, ඒ නිවාස හදන්න ඕනෑ තැන්වලට NBRO report එක ඕනෑ, assessment එකක් ඕනෑ. ඒ අනුව ඒ වැඩ කරගෙන යන්න ඕනෑ. Livelihoodවලට දෙන දීමනා - විශේෂයෙන්ම කෘෂිකර්මය සඳහා - ලබා දෙන්නේ යම් assessment එකක් පාදක කරගෙනයි. ඒවා දවසින් දෙකෙන් දෙන්න පුළුවන් ඒවා නොවෙයි. නමුත්, ඒ ක්‍රියාවලිය සිද්ධ වෙමින් යනවා.

ඒ නිසා කරුණු දැනගෙන කියන්න කියලා නැවත වතාවක් ඉල්ලමින්, මේ විධියට බොරු, සාවද්‍ය කට කථා මේ සභාවට ඇවිල්ලා පතුරුවන්න එපා කියන එකත් ඉතාම ගෞරවනීයව අපේ විපක්ෂයෙන් මා ඉල්ලා සිටිනවා.

මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විපක්ෂ නායක, ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 11.31]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ව්‍යසනය හොඳටම කළමනාකරණය කළා, ජාතික යන්ත්‍රණයක් නිර්මාණය කළා, ජනාධිපති කාර්ය සාධක බලකායක් ක්‍රියාත්මක වෙනවා, නිවාස සහන දෙනවා, ජීවනෝපාය සහන දෙනවා, යටිතල පහසුකම් ලබා දෙනවා, අරමුදල් හොඳට කළමනාකරණය කරනවා, ව්‍යසන කළමනාකරණය සඳහා කමිටු 9ක් ක්‍රියාත්මක කරනවා යනාදී වශයෙන් රජය පැත්තෙන් නියෝජ්‍ය අමාත්‍යවරයා කරුණු ඉදිරිපත් කරනවා අපට අහන්න ලැබුණා.

අගමැතිතුමියත් මේ සභාවේ ඉන්න අවස්ථාවේදී මම මේ කාරණය අහන්න කැමැතියි. රුපියල් 25,000 ලබා දෙන්න හදිසි නීතිය ඕනෑද? රුපියල් 50,000 ලබා දෙන්න හදිසි නීතිය ඕනෑද? ඒ වාගේම වගා හානි වෙනුවෙන් සල්ලි ලබා දෙන්න හදිසි නීතිය ඕනෑද? රුපියල් ලක්ෂ 50 ලබා දෙන්න හදිසි නීතිය ඕනෑද? රුපියල් ලක්ෂ 100 ලබා දෙන්න හදිසි නීතිය ඕනෑද? ටකරමකට රුපියල් ලක්ෂ 10 බැගින් ලබා දෙන්න හදිසි නීතිය ඕනෑද? ඒවාට හදිසි නීතිය මොකටද? ගරු අගමැතිතුමියනි, ඔබතුමිය උත්තර දෙන්නේ නැතුව නැඟිටලා යනවා නේ. පොඩ්ඩක් ඉන්න කෝ, මේවාට උත්තර දෙන්න. *[බාධා කිරීමක්]* මේ අරමුදල් බෙදා දෙන්න මොනවාටද හදිසි නීතිය? එහෙම නම්, මුළු රාජ්‍ය පාලනයට 365 දවසේම හදිසි නීතිය අවශ්‍යයි. නමුත්, සිදු විය යුත්තේ මොකක්ද? සිදු විය යුතු දේ මේකයි. ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනත වෙනස් වෙන්නට ඕනෑ. අලුත් අමාත්‍යාංශයක් බිහි වෙන්නට ඕනෑ, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හැටියට. ඒ වාගේම ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන ශක්තිමත් කරන්නට ඕනෑ. ඒ ආයතනවල නිලධාරින් වාගේම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරින් ආපදා අවස්ථාවේදී විශිෂ්ට සේවාවක් කළා. හැබැයි, රජයට බැරි වුණා, තිබෙන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතත් හරියට උපයෝගී කර ගන්න. මේ පවතින රජයට බැරි වුණා, මේ පනත කියවලා, මේ පනතේ 11වන වගන්තිය යටතේ විශේෂයෙන්ම ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න. එහෙම ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න බැරි වුණු ආණ්ඩුවක් තමයි අද රට පාලනය කරන්නේ. මේ පනතේ 11වන වගන්තිය ක්‍රියාත්මක කළා නම්, අනිවාර්යයෙන්ම 12වන වගන්තිය හරහා මේ සියලු දේම ඉෂ්ට සිද්ධ කරන්නට හැකියාව ලැබෙනවා. නමුත්, සිදු විය යුත්තේ මොකක්ද? සිදු විය යුත්තේ රජය වහාම IMF එකත් එක්ක සාකච්ඡා කරලා, අලුත් IMF ගිවිසුමකට යන එකයි. මොකද, 2028 අවුරුද්දේ ඉඳලා වාර්ෂිකව ඇමෙරිකානු ඩොලර් බිලියන 4 ගාණේ ගෙවන්නට අපට හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒකයි ඇත්ත කථාව.

ලෝක බැංකුව කියනවා, මේ අවුරුද්දේ ආර්ථික වර්ධන වේගය සියයට 3.5යි කියලා. ලබන වසරේ ආර්ථික වර්ධන වේගය සියයට 3.1යි. අපි ප්‍රාර්ථනා කරනවා, ඊට වැඩිය ආර්ථික වර්ධන වේගය වැඩි වේවා කියලා. හැබැයි, මේ තත්ත්වය තුළ 2028 වසරේදී විදේශ ණය ගෙවීම බරපතළ ගැටලුවක් බවට පත් වෙනවා. ඒ නිසා ප්‍රමාද නොවී IMF එකත් එක්ක සාකච්ඡා කරලා ගිවිසුම වෙනස් කර ගන්න. ජාත්‍යන්තර ආධාරක සමුළුවක් කැඳවන්නට දැනටමත් ප්‍රමාදයි. දැන් ඔබතුමන්ලා හිතාගෙන ඉන්නවා, මේ World Bank එකෙන් දුන් තක්සේරුව, අවසාන තක්සේරුව කියලා. ඒක වැරදියි. මේක Global Rapid Post-Disaster Damage Estimation - GRADE - report එකක්; ලබා දුන් ඉක්මන් වාර්තාවක්.

ඇත්ත වශයෙන්ම හානිය ඇමෙරිකානු ඩොලර් බිලියන 4.1 නොවෙයි. ඊට වඩා විශාල හානියක් සිද්ධ වෙලා තිබෙනවා. නමුත්, ඔබගේ තිබෙන කුහකකම, උද්ධච්චකම, තවත් කෙනෙකු හෝ කණ්ඩායමක් යෝජනා කරන දේ පිළිගන්නට බැරිකම, මහන්තත්තකම නිසා මේ රට වෙනුවෙන් ඉටු විය යුතු කාර්යභාරය ඔබ ඉෂ්ට කරන්නේ නැහැ. ඒක තමයි කනගාටුදායක කාරණාව. දැන් මොකක්ද ඔබතුමන්ලා කරන්නේ? හදිසි නීතිය හෝ වේවා, පවතින නීතිය හෝ වේවා, වෙරළ සංරක්ෂණ නීතියත් උපයෝගී කරගෙන මහා සංසරත්නය දැම්මා, කුඩුවට. රටේ උත්තරීතර නීතිය හරහා -ඔබතුමා කියවලා බලන්න- බුද්ධ ශාසනයට සුවිශේෂී තැනක් ලැබෙනවා. ඒක මේගොල්ලන්ට තේරෙන්නේ නැහැ. බුද්ධ ශාසනයට තිබෙන උත්තරීතර තැන තේරෙන්නේ රූප රාමුවට පමණයි, වීඩියෝ දර්ශනවලට පමණයි, ප්‍රවෘත්ති ප්‍රකාශනවලට පමණයි. බුද්ධ ශාසනයට උත්තරීතර තැන ලැබෙනවා වාගේම සෙසු ආගම්වලට, සෙසු සංස්කෘතිවලට නිසි රැකවරණය, ආරක්ෂාව සුරක්ෂිතභාවය ලබාදෙන භූමියක් තමයි, අපේ මාතෘ භූමිය. මේ රටේ උත්තරීතර නීතිය ක්‍රියාත්මක කරන්න තේරෙන්නේ නැහැ. අපේ පක්ෂයේ ගරු මහ ලේකම්තුමා කිව්වා වාගේ "මූලික අයිතිවාසිකම් පෙත්සම ඉවත් කර ගන්නවා නම් ඇප දෙන්නම්" කියන පදනම මත මහ සංසරත්නය සිරගත කර තිබෙනවා. එතකොට මම අහන්න කැමැතියි, මොන පදනමක් මත ද මිහින්තලයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට "වනචාරී" කියලා ආමන්ත්‍රණය කරන්නේ කියලා? මොකක් යටතේද එහෙම කථා කරන්නේ? එහෙම කථා කරන්න පුළුවන්ද? *[බාධා කිරීමක්]* රජයේ පාර්ශ්වයෙන් කියනවා, "කවුද කිව්වේ, මම ලු කිව්වේ" කියලා. හරියට හරි. ඒ තරමම මොළයක් තිබෙනවා, මේ ආණ්ඩු පාර්ශ්වයේ ඉන්න මන්ත්‍රීවරුන්ට. ඒ තරමම දැනුමක් තිබෙනවා. මම ලු කිව්වේ. නමුත්, රටේ ලක්ෂ 220ම දන්නවා, වනචාරියා කවුද, සදාචාර පුද්ගලයා කවුද කියන එක. ඒක අමුතුවෙන් විග්‍රහ කරන්නට අවශ්‍ය නැහැ.

මහ ලොකුවට රණ විරුවන් ගැන කථා කරනවා. මුලතිව්, වලෙයි ප්‍රදේශයේ මෝය කට පුළුල් කිරීමේ මෙහෙයුමට ගිහිල්ලා නාවික හමුදා කඳවුරේ සේවය කරපු නිලධාරින් කිහිපදෙනකු අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ නිලධාරින් තමයි, ඩබ්ලිව්.වී.ඒ.ඩී. වැවිට, ඩබ්ලිව්.ජී.කේ.ඩී. වික්‍රමසිංහ, එස්.පී. ශානක, ඩබ්ලිව්.පී.එල්.සී. වික්‍රමරත්න කියන අය. මේ අයගේ පවුල්වල සාමාජිකයන් ඔබතුමන්ලා හමුවෙන්නට අවස්ථාවක් දිගින් දිගටම ඉල්ලා තිබෙනවා. නමුත්, අදාළ ඇමතිවරුන්, බලධාරින්, -ඒ අවස්ථාව ලබා දීලා නැහැ. ඒ තරමම උද්ධච්ච රජයක් තමයි අද තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම තව පොඩි වෙලාවක් ගන්නවා.

මහ ලොකුවට නියෝජ්‍ය ආරක්ෂක ඇමතිවරයා අභිමානය ගැන කථා කරනවා. ඔව්, මේසයකුයි, බංකුවකුයි අරගෙන ආවාම රටේ ජාතික ආරක්ෂාව පිළිබඳව ටියුෂන් පන්ති ලබා දීමේ අභිමානය එතුමාට ඇති. නමුත් මම අහන්න කැමැතියි, කෝ පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවන් ටික? දැන් කී වතාවක් කාදිනල්තුමා රැවැට්ටුවාද? කී වතාවක් කාදිනල්තුමාට, කතෝලික ප්‍රජාවට, රටේ ජනතාවට බොරු කිව්වාද කියා මම අහන්න කැමැතියි.

ඒ වාගේම අවසාන වශයෙන් මම මේ අවස්ථාවේ මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමිය අපේ උත්තරය අහනකල් හිටියේ නැහැ, නැඟිටලා ගියා. ඒකට කමක් නැහැ. නමුත් මම බලාපොරොත්තු වෙනවා, අඩුම ගාණේ එතුමියගේ කාර්යාලයේ ඉඳගෙන හෝ මේකට සවන් දෙයි කියලා. දැන් එතුමිය කියනවා, කිසි වරදක් වුණේ නැහැ ලු. එතුමියට වරදක් නොවෙන්න පුළුවන්. නමුත්, 6 ශ්‍රේණියේ ඉංග්‍රීසි මොඩියුලයට අසභ්‍ය වෙබ් අඩවියක් ඇතුළත් වුණාද, නැද්ද? අසභ්‍යකරණය හැටියට අපි හැඳින්වුයේ අන්න ඒක. ඒක ඇතුළත් වුණාද නැද්ද කියලා අපි අහන්න කැමැතියි.

ඊට පස්සේ ජනාධිපතිවරයා එතුමාගේ වෙබ් අඩවියේ කියනවා, මොඩියුල සකස් කිරීමේදී පවතින ගැටලු, ගුරු පුහුණු කිරීමේ ප්‍රමාදය, තාක්ෂණික ගැටලු නිසා 6 ශ්‍රේණියට ආරම්භ කරන්න ගිය ප්‍රතිසංස්කරණ 2027 වසර දක්වා කල් දමනවා කියලා. ඇත්තම කථාව තමයි, අර අසභ්‍ය වෙබ් අඩවිය ඇතුළු වුණු නිසා ඒක නතර කර ගත්ත එක. ඒ නතර කර ගත්ත සැබෑ හේතු හැටියට ජනාධිපතිවරයා ඇත්ත කියනවා, අගමැතිතුමිය මෙතැනට ඇවිල්ලා අසත්‍ය කියනවා. ජනාධිපතිවරයාටයි, අගමැතිවරියටයි එකඟ වෙන්න බැහැ, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක නොකරන්නේ මොකද කියන කාරණාවට. දැන් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට විරුද්ධව පොල් ගැහුවා කියනවා නේ. අපි පැහැදිලිවම විරුද්ධ වුණේ මේ අසභ්‍යකරණයට. ආණ්ඩු පක්ෂයේ ඉන්න 159දෙනාම කියනවාද, අර ඉංග්‍රීසි මොඩියුලයට අසභ්‍ය වෙබ් අඩවිය ඇතුළත් කරපු එක හරි කියලා? පුළුවන් නම්, කොන්දක් තිබෙනවා නම්, නැඟිටලා කියන්න ඒක හරි කියලා. මම මගේ වෙලාවෙන් කාලය දෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුරුත් ඒක හරි කියන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අන්න, ආණ්ඩුව පැත්තෙන් කියනවා, කවුරුත් ඒක හරි කියන්නේ නැහැ කියලා. එහෙම නම්, ඇයි දෙයියනේ ඇතුළත් කළේ? ඇයි ඇතුළත් කළේ? දැන් ඒක නිසා නැවැත්තුවා කියලා අගමැතිතුමිය කියනවා. හැබැයි, ජනාධිපතිතුමා වෙනත් කථාවක් කියනවා. එතුමා කියනවා, ගුරු පුහුණු කිරීමේ ප්‍රමාදය, මොඩියුල සකස් කිරීමේ ගැටලු, තාක්ෂණික ගැටලු තිබෙනවා කියලා. මෙන්න, දෙබිඩි කථාව. මෙන්න, දිව දෙකේ කථාව. දැන් පළමුවැනි ශ්‍රේණියේ ප්‍රතිසංස්කරණ පටන් අරගෙන තිබෙනවා, ඩිජිටල් ශ්‍රී ලංකාවක් ගොඩ නඟන්න. මම ආණ්ඩු පාර්ශ්වයේ ගරු මැති ඇමතිතුමන්ලාගෙන් අහන්න කැමැතියි, Information and Communication Technology කියන subject එක Grade 1 subject එකක් හැටියට ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන්නට මේ ප්‍රතිසංස්කරණ තුළ ඇතුළත් වෙලා නැත්තේ ඇයි කියලා. තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය ඇතුළත් කරලා නැත්තේ ඇයි? ජාත්‍යන්තර,-

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
විශේෂඥ-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මෙහෙමයි. පැලවත්තේ විශේෂඥ සමිතිය හරියන්නේ නැහැ නේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශේෂඥ සමිතිය වෙන්න ඕනෑ නේ. දැන් ලෝක ප්‍රමිතිය මොකක්ද? මොකක්ද ජාත්‍යන්තර ප්‍රමිතිය? K to 12. මම පැහැදිලිව කියන්නම්, Kindergarten to 12; පෙර පාසලේ සිට 12 වසර දක්වා, ICT. ඔන්න ජාත්‍යන්තර ප්‍රමිතිය! ඒක 12 ශ්‍රේණිය දක්වා තිබිය යුතුයි. මෙහෙම ජාත්‍යන්තර ප්‍රමිතියක් තිබෙන කොට අඩුම ගණනේ Grade 1 to 5 දක්වාවත් ඉංග්‍රීසි භාෂාව කේන්ද්‍ර කරගෙන තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය ලබා දෙන්නට මේ රජය සමත් වෙලා නැහැ. ඇත්ත වශයෙන්ම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරනකොට අපි කිව්වා, Green Paper, White Paper කියලා. Green Paper, White Paper එක ගැනවත් තේරුමක් නැති ඇත්තෝ අපට කියනවා, නැහැ, ඒක වෙන පාටකින් අපි ලියලා දෙන්නම් ලු. මොන විහිළු කථාද? මේ තරමේ සාක්ෂරතාවක් තිබෙන අය තමයි අපේ රටේ අධ්‍යාපනයේ පරිවර්තනාත්මක යුගය නිර්මාණය කරන්නට යන්නේ.

ඒ වාගේම මම බොහොම පැහැදිලිව ආණ්ඩුවෙන් කාරණයක් අහන්න කැමැතියි. ආපදාවේදී නිවසක ටකරමක් ගියා නම් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කිව්වා. ටකරමක් ගියාම ඒ රුපියල් ලක්ෂ 10 ලබා දෙන්නට හදිසි නීතිය අවශ්‍යද? ඇත්ත වශයෙන්ම අවශ්‍ය නැහැ. මෙය පවත්වාගෙන යන්නේ ඔබගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී, මර්දන ප්‍රතිපත්තිය තවදුරටත් ක්‍රියාත්මක කරන්නයි. වහාම ක්‍රියාත්මක වන පරිදි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පොරොන්දු වුණු ආකාරයට හකුළා ගන්න. හැබැයි, අපි පිළිගන්නවා රටේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත කරන්න, රටට ජාතික ආරක්ෂක පනතක් අවශ්‍යයි කියන එක. එය ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව, මානව හිමිකම්, මානව අයිතිවාසිකම් පිළිබඳ අණපනත්වලට අනුව, ඒ අයිතිවාසිකම් සුරක්ෂා වෙන ආකාරයට ක්‍රියාත්මක කරන්නට වගබලා ගන්න කියලා අපි රජයට යෝජනා කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇන්ටන් ජයකොඩි නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 11.46]

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මහජන ආරක්ෂක ආඥාපනත යටතේ හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳවයි අද අපි සාකච්ඡා කරන්නේ. හදිසි නීතිය සහ හදිසි තත්ත්ව යටතේ තමයි මේ රට වැඩි කාලයක් පාලනය වුණේ. ප්‍රධාන වශයෙන් වත්මන් විපක්ෂයේ කණ්ඩායම් තමයි මීට පෙර මේ රට පාලනය කෙරුවේ. ඒ පාලන කාලවලදී හදිසි නීතිය

[ගරු ඇන්ටන් ජයකොඩි මහතා]

යටතේ මේ රට පාලනය කළේ කොහොමද කියලා අපි දන්නවා. උද්සෝෂණ මර්දනය කෙරුවා; මාධ්‍ය මර්දනය කෙරුවා; දේශපාලන විරුද්ධවාදීන් මර්දනය කෙරුවා. එතුමන්ලා අනුගමනය කළ ක්‍රියා කලාපය මත ඉඳන් විපක්ෂය මේ ආණ්ඩුව ගැනත් හිතනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුව නිසා පැවැති ආපදා තත්ත්වය නිසා ජනතාවට සහාය දීම සඳහා මේ හදිසි තත්ත්වය දීර්ඝ කරනවා මිස, එය කරන්නේ වෙනත් කිසිදු හේතුවකට නොවෙයි.

විපක්ෂයට අයිති කාර්යභාරයක් තමයි, උද්සෝෂණ පවත්වන එක. ඔවුන් ඒක කළ යුත්තක්. ඒක විපක්ෂයේ කාර්යභාරය. විපක්ෂයට උද්සෝෂණයක් සංවිධානය කර ගන්න නොහැකි වීම මේකට අදාළ කර ගන්න එපා. අපි දැක්කා, පසුගිය කාලයේ උපාධිධාරී ගුරු සංවර්ධන නිලධාරින්ගේ ගැටලුවේදී විපක්ෂය ඒකට මැදිහත් වෙන්න උත්සාහ කරපු ආකාරය. අන්තිමට ලෙයිනුත් අත්සන් කරලා දෙන්නම් කිව්වා. නමුත්, හොඳ වෙලාවට ඒක වුණේ නැහැ. ලෙයින් අත්සන් කරන්න ගියා නම් ඒක ඇතුළේ තිබෙන්නේ ලේ නොවෙයි කියලා පැහැදිලි වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හදිසි ආපදා තත්ත්වයක් ප්‍රකාශයට පත් කළේ ඇයි කියන එක පිළිබඳව, "දිට්වා" සුළි කුණාටුවේදී ඇති වුණු තත්ත්වය පිළිබඳව, ඒකේ ගැඹුර පිළිබඳව යම්කිසි අවබෝධයක් ගත්තොත් හොඳයි කියලා මම හිතනවා. විශාල ආපදාවක් හැටියට අපේ රටේ මීට පෙර සිදු වුණේ, 2004 දෙසැම්බර් 26 පෝය දිනයේ උදේ සිදු වෙච්ච සුනාමි ව්‍යසනයයි. ඒ කියන්නේ, ඉන්දුනීසියාව අවට magnitude 9.2ක භූමි කම්පාවෙන් සිදු වෙච්ච විනාශය. අපි ඒක තමයි දැවැන්තම විනාශය හැටියට දැක්කේ. ඒකෙන් පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් - 30,000කට ආසන්න ප්‍රමාණයක් - මිය ගියා. හැබැයි, ඒක බලපෑවේ ඉතා කුඩා ප්‍රදේශයකට හෙවත් වෙරළ තීරය සීමාවට. එදා අඩි 30ක, 40ක මුහුදු රැල්ලක් ආවා. ඒකට බලපෑ තවත් සාධකයක් තිබුණා. ඒක තමයි එදා පෝය දවසක් වීම. පෝය දවස නිසා මුහුදේ ජල මට්ටම බොහෝ විට දළ වශයෙන් තවත් අඩි දෙකතුනක් - මීටරයක් විතර - ඉස්සෙනවා. ඒකත් ඒ විනාශයට බලපෑවා. මෙන්න මේ හේතු නිසා විශාල ජනතාවක් මිය ගියා.

ඒ ආපදාව නිසා සිදු වෙච්ච විනාශය හැටියට දක්වන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 1.2යි. හැබැයි, "දිට්වා" සුළි කුණාටුව නිසා ඒ වාගේ හතර ගුණයකට ආසන්න ප්‍රමාණයක් විනාශයට පත් වෙලා තිබෙනවා. විපක්ෂ නායකතුමාත් ඒක පිළිගන්නවා. තවම ඒක නිවැරැදිව ගණනය - calculate - කරලා නැහැ. ඒක ඉදිරියට ප්‍රකාශ කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුව දිස්ත්‍රික්ක 22කට දැඩිව බලපෑවා. ඉතිරි දිස්ත්‍රික්ක තුනටත් යම් ආකාරයක බලපෑමක් සිදු වුණා. මේ ඇති වූ "දිට්වා" සුළි කුණාටුව පළමු කාණ්ඩයට, එහෙම නැත්නම් දෙවන කාණ්ඩයට අයත් සුළි කුණාටුවක්. එය හතරවන, පස්වන කාණ්ඩ දක්වා වර්ධනය වුණා නම් විනාශය මීට වඩා විශාලයි. පළමුවැනි සහ දෙවැනි අවස්ථාවල දැඩි වර්ෂාවක් පතනය වුණා. එම කුණාටුවේ කේන්ද්‍රය නැගෙනහිර වෙරළ තීරය ඔස්සේ උඩට ගමන් කිරීම නිසා අපේ රටේ මධ්‍ය කඳුකරය ඇතුළු ප්‍රදේශවලට විශාල වර්ෂාවක් පතිත වුණා. සමහර ස්ථානවලට මිලිමීටර් 600කටත් වඩා වැඩි වර්ෂාවක් පතිත වුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වර්ග කිලෝමීටරයක් සැලකුවහොත්, එයට ලැබුණු වර්ෂා ජලයේ ප්‍රමාණය සමහර ස්ථානවලට දළ වශයෙන් අක්කර අඩි 500කට වැඩි ප්‍රමාණයක්. අපි සාමාන්‍යයෙන් එය අක්කර අඩිවලින් කියන්නේ.

මම එහි බරපතළකම තේරුම් ගැනීමට උදාහරණයක් හැටියට මේ කාරණය කියන්නම්. කොත්මලේ ජලාශයේ පෝෂක ප්‍රදේශයට ලැබුණු වර්ෂාපතනය කොත්මලේ ජලාශයේ ගබඩා කළ හැකි ජල ප්‍රමාණය වාගේ තුන් ගුණයකට වඩා වැඩියි. එතරම් අධික ජල ප්‍රමාණයක් ලැබුණා. දින එකහමාරක් තුළ තමයි ඒ ජල ප්‍රමාණය ලැබුණේ. අපි දන්නවා ජලය ගමන් කරන ආකාරය. ජලය ගමන් කරන්නේ - ජලය ගලා යන්නේ, run off වෙන්නේ - ඉතාම කෙටි කාලයක් තුළයි. දින එකහමාරක බලපෑමක් වුණත්, පැය කිහිපයකින් තමයි, ඒ කියන්නේ අවසාන පැය කිහිපයේ තමයි ඒ ක්‍රියාවලිය ආරම්භ වෙන්නේ. ඒ ක්‍රියාවලිය ආරම්භ වෙලා ජලය ගලාගෙන යනවා. ගලාගෙන ගිහිල්ලා ජලාශය පිරෙනවා. ඉතින් මෙන්න මේ කාරණය නිසා ජලාශයේ ආරක්ෂාවට ඉංජිනේරුවන් යම් යම් කාර්යයන් සිද්ධ කළ බව අපි දන්නවා. එහි ප්‍රතිවිපාක විධියට අපි දැක්කා, ගම්පොළ, පේරාදෙණිය සහ ඊට පහළ ප්‍රදේශවල ඇති වූ ජල ගැලීම්වල ප්‍රමාණය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊට අමතරව මෙහි සිදු වුණු විශාලතම දේ තමයි අපගේ මධ්‍යම කඳුකරයේ තිබෙන පස් ස්තරවලට ජලය විශාල ප්‍රමාණයක් ලැබීම නිසා ඒවා උපරිමයටත් වඩා වැඩි ජල ප්‍රමාණයක් -අතිරික්තයක්- උරාගෙන තිබීම හේතුවෙන් එම පස් ද්‍රාවණයක් ලෙස හැසිරෙන්නට පටන් ගැනීම. එතකොට මොකද වෙන්නේ? ඉතාම සුළු චලනයකදීත් ඒ පස් කඩාගෙන පහළට හැලෙන්න පටන් ගන්නවා. එය දරාගෙන ඉන්න බැහැ; මොකද, bearing capacity එකක් නැහැ. එම නිසා ජලය පහළට ගලාගෙන එනවා. ඒ නිසා ස්වාභාවික බෑවුම් ඇති තැන් සහ මිනිසා විසින් ඇති කරනු ලැබූ බෑවුම් සහිත ස්ථාන -ඇලි - 1,250කට අධික ප්‍රමාණයක් සෝදාගෙන ගියා; නාය යෑම් ප්‍රමාණයක් සිද්ධ වුණා. අපේ රටේ ස්ථායිතාව රැඳී තිබෙන්නේ, අපේ ජලාශ වෙච්චා, අපේ ස්වාභාවික බෑවුම් වෙච්චා ඒවායේ ස්ථායිතාව රැඳී තිබෙන්නේ මිලිමීටර් 200ට වඩා අඩු වර්ෂාපතනයකට ඔරොත්තු දෙන ප්‍රමාණයටයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම ගංවතුරින් සහ නාය යෑමෙන් පුද්ගලයන් 111,000කට විතර බලපෑමක් සිදු වුණු බව අපි දන්නවා. ඒ වාගේම ආපදා මධ්‍යස්ථාන 1,400කට වඩා වැඩි ප්‍රමාණයක් පිහිටුවන්න සිද්ධ වුණා. මිය ගිය ප්‍රමාණය 650කට ආසන්නයි. අතුරුදහන් වූ ප්‍රමාණය 173කට ආසන්නයි. ඉතින්, මෙවැනි තත්ත්වයක් යටතේ ගරු ජනාධිපතිතුමාට සිද්ධ වුණා, හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න. මේ හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කරන්න සිද්ධ වුණේ විපතට පත් ජනතාවට සහන සැලසීම සඳහායි. ඒ සඳහා 2025.11.28 දින 2464/30 දරන අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කළ බව අපි දන්නවා. ඒ ගැසට් පත්‍රය නිකුත් කරලා අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙක් පත් කළා. මේ ව්‍යසනයේදී ප්‍රධාන වශයෙන්ම ජනාධිපතිතුමාගේ සිට ආණ්ඩුකරණයේ ඉන්න සියලු දේශපාලන අධිකාරිය ආපදා කළමනාකරණ වැඩ කටයුතුවලට සම්බන්ධ වුණා. ඒ වාගේම, විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුත් ඇත්තටම මහන්සි වුණා. මේ රටේ ජනතාවත් මහන්සි වුණා. මේ රටේ රාජ්‍ය සේවකයෝ විශාල වශයෙන් මහන්සි වුණා. ඒ වාගේමයි, ත්‍රිවිධ හමුදාවත්. දේශපාලන දැක්මක් මත මේ කියන අයගේ සහභාගිත්වයෙන් සුළි කුණාටුවෙන් සිදු වුණු ආපදාවෙන් රට යම්කිසි මට්ටමකට උඩට ගෙනෙන්න අපට පුළුවන්කමක් ලැබුණා. ඒ වෙනුවෙන් කැප වුණු සියලුදෙනාටම අපි ස්තුතිවන්ත වෙනවා.

මම දැක්කා විපක්ෂයෙන් අහනවා, හදිසි තත්ත්වයක් ඇයි කියලා. මම කියන්නම් හදිසි තත්ත්වයක් අවශ්‍ය වෙන්නේ ඇයි කියලා. ගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කළාට පසුව අපි අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙකු පත් කළා. ඒ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස්

ජනරාල්වරයා මොකක්ද කළේ? ත්‍රිවිධ හමුදාවට නියෝග දෙන්න පටන් ගත්තා. මම අත්‍යවශ්‍ය සේවා කොමසාරිස්ට කථා කරලා ඔහුගෙන් අවශ්‍ය තොරතුරු ලබා ගෙන අවශ්‍ය පියවර ගත්තා. එතුමා සම්බන්ධයෙන් මට ලැබුණු පෞද්ගලික අත්දැකීම ඒකයි. එක වෙලාවකදී භූ විද්‍යාඥයන්ගේ හිඟකම නිසා මේ රටේ නාය යෑම් පිළිබඳ වාර්තා දෙන්න NBRO එකට හැකියාවක් තිබුණේ නැහැ. ඒ වෙලාවේ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාට කථා කළාම ඔහු අනෙක් ආයතනවලට කිව්වා, ඒවායේ ඉන්න භූ විද්‍යාඥයන් මේ කටයුතුවලට වහාම release කරන්න කියලා. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ, ජල සම්පත් මණ්ඩලයේ සහ අනෙකුත් ආයතනවල භූ විද්‍යාඥයන් ටික නිදහස් කරන්න ඇත්ත වශයෙන්ම හැකියාව ලැබුණේ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා කියපු නිසා. ඒ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා පත් කළේ මේ කියන හදිසි තත්ත්වය යටතේයි. එහෙම නම් කාටවත් කියන්න බැහැ එය කළේ වෙනත් කාරණයක් නිසාය කියලා. ඒ වාගේම, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා නිකුත් කරපු ඒ චක්‍රලේඛයත් එක්ක පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යා අංශයේ සිසුන්ගේ අවසාන විභාගය කල් දාලා ඒකේ ඉන්න ශිෂ්‍යයෝ ටිකත් යොදා ගත්තා, මේ කාර්යයට සහාය දෙන්න කියලා. මෙහෙම වටපිටාවක් තුළ තමයි අපි මේ හදිසි අවස්ථාව භාවිතයට ගන්නේ.

ඇත්තටම අපි කෘතඥතාව පළ කරන්න ඕනෑ, මේ ආපදාව කළමනාකරණය කිරීමට දායක වූ සැම දෙනාටම. මොකද, නාය යෑම් සිදු වෙලා අවුරුදු 8කට වැඩි කාලයක් ගිහිල්ලාත්, තවම ඒවායෙන් පීඩා විඳින පිරිස් සිටින ප්‍රදේශ තිබෙනවා. උදාහරණයක් තමයි, මීරියබැද්ද. ඒ වාගේ තවත් ස්ථාන තිබෙනවා. ඒ ආපදාවලින් විපතට පත් සමහර පුද්ගලයෝ, සමහර පවුල් තවමත් ඉන්නවා, අනාථ කඳවුරුවල. මෙහෙම තත්ත්වයක් යටතේ තමයි ඔබතුමන්ලාගේ කාර්යභාරයත් සිද්ධ වුණේ.

දැන් NBRO එක ගැන කථා කරනවා. විපක්ෂ නායකතුමාගේ පියා තමයි ඒක ආරම්භ කළේ. මට මතක විධියට එතුමාගේ අමාත්‍යාංශය යටතේත් NBRO එක තිබුණා. හැබැයි, මෙවැනි වැදගත් ආයතනයක් එතුමන්ලා පනතකින් තහවුරු කළේ නැහැ. අපි බලයට ඇවිල්ලා මීට මාස තුන හතරකට කලින් තමයි ඒකට අවශ්‍ය පනත ගෙනැල්ලා ඒක රටේ වැදගත් ආයතනයක් බවට පත් කර ගත්තේ. එතුමන්ලා කොහොමද හැසිරුණේ කියන එක දැන් විපක්ෂ නායකතුමන්ලාට අමතකයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂයේ පැවැත්ම තිබෙන්නේ වෙන කිසිවක් නිසා නොව ආපදාවට ලක් වූ ජනතාව තවත් පීඩාවෙන් සිටීම තුළයි කියා මම හිතනවා. ඒ ජනතාව පීඩාවෙන් සිටීම තුළ ඒ අයගේ පැවැත්ම තහවුරු කර ගන්න බලනවා. ඒ වාගේම රටේ දුප්පත්කම තිබෙනවා නම් ඒ දුප්පත්කම පාවිච්චි කරලා ඔවුන්ගේ දේශපාලන ස්ථාවරත්වය තහවුරු කර ගන්න බලනවා. ජනතාවගේ නූගත්කම පාවිච්චි කරලා ඔවුන්ගේ දේශපාලන ස්ථාවරත්වය වාගේම ඔවුන්ගේ පැවැත්ම තහවුරු කර ගන්න උත්සාහ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේක ජනතාවාදී ආණ්ඩුවක්. මේ ජනතාවාදී ආණ්ඩුව හැම තිස්සේම හිතන්නේ ජනතාව පිළිබඳවයි. ජනතාව පීඩාවට පත් වීම, දුප්පත්කම නවත්වලා ජනතාවගේ සාක්ෂරතාව, උගත්කම, දේශපාලන සාක්ෂරතාව, සංස්කෘතික සාක්ෂරතාව වාගේම විද්‍යාත්මක සාක්ෂරතාව ඉහළ නංවන්න තමයි අපි කටයුතු කරන්නේ. ජනතාව විඳින පීඩාව එක්ක සෙල්ලම් කරන්න අපට අවශ්‍යතාවක් නැහැ. ඒ නිසා තමයි අපි මේ හදිසි නීතිය දීර්ඝ කරන්නේ. මම හිතනවා, විපක්ෂය ඒකට සහයෝගය ලබා දෙන්න ඕනෑ කියලා. මේ ආපදාව නිසා පූර්ණ හානි සිදු වුණු නිවාස 6,018ක් තිබෙනවා. ඒ වාගේම අර්ධ හානි සිදු වුණු නිවාස 108,000ක් තිබෙනවා. මේ ප්‍රශ්නය විසඳන්න, මේ පීඩාව තුරන් කරන්න අපට අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙක් අවශ්‍යයි; අපට හදිසි නීතිය අවශ්‍යයි. මේ හදිසි නීතිය සම්මත කර ගන්නේ ඒ සඳහාම පමණයි. ඒකට විරුද්ධ වෙන්න විපක්ෂයට අවශ්‍යතාවක් නැහැ කියලා මම හිතනවා. හැබැයි, ඔවුන් ඒකට විරුද්ධ වෙන්නේ ඔවුන්ගේ පැවැත්ම නැති වෙයි කියායි. මොකද, ජනතාව විඳින පීඩාව නැති වුණොත් ඒක මේ අයට බරපතළ ප්‍රශ්නයක්.

මට කථා කරන්න කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 11.59]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இடம்பெறுகின்ற விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி!

இலங்கையில் அவசரகால நிலைமை நிலவுவதால் நாட்டின் அமைதியைப் பாதுகாத்தல் மற்றும் பொது மக்களின் வாழ்க்கைக்கு அத்தியாவசியமான வழங்கல்கள் மற்றும் சேவைகளைக் கொண்டுநடாத்துவதற்கென பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின் 2ஆம் பிரிவின்கீழும் அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டத்தின் 2ஆம் பிரிவின் கீழும் தீர்மானமொன்றை நிறைவேற்றுவதற்காக இன்று இந்தச் சபையில் இந்த விவாதம் இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது.

'தித்வா' சூறாவளியையும் அதனைத் தொடர்ந்து ஏற்பட்ட அனர்த்தத்தையும் கையாளுவதற்குத் தேவையான அதிகாரங்களைக் கொண்ட சட்டங்கள் ஏற்கெனவே நடைமுறையில் இருக்கும்போது, மாண்புமிகு சனாதிபதி அவர்களால் பிரகடனப்படுத்தப்பட்ட அவசரகாலச் சட்டத்தை மீண்டும் நீடிப்பதற்காகவே இன்று இந்த விவாதம் இடம்பெறுகின்றது. அனர்த்தம் ஏற்பட்ட பின்னர், மாண்புமிகு சனாதிபதி அவர்கள் அவசரகாலச் சட்டத்தைப் பிரகடனப்படுத்தினார். அந்த நேரத்தில் அதற்கான தேவை இருந்தது என்பதை எங்களால் ஏற்றுக்கொள்ளலாம். சுனாமி அனர்த்தத்துக்குப் பிறகு ஏற்பட்ட மிக மோசமானதும் எதிர்பார்க்கப்படாததுமான பாரியதோர் அனர்த்தத்தைக் கையாளுவதற்கு இச்சட்டம் தேவையாக இருந்திருக்கலாம். இப்போது நாங்கள் அனர்த்த முகாமைத்துவத்தின் நான்காவது படிநிலையில் - recovery periodஇல் -நிற்கின்றோம். அனர்த்தத்தால் பாதிக்கப்பட்டவர்களுக்கான மீள்கட்டுமான நடவடிக்கைகளைச் செய்கின்ற இந்தக் காலப்பகுதியில், பொதுமக்களின் அத்தியாவசிய தேவைகளைப் பூர்த்திசெய்ய வேண்டும் அல்லது பாதிக்கப்பட்ட மக்களுடைய பிரச்சினைகளைத் தீர்க்க வேண்டும் என்ற காரணத்தைச் சொல்லி, அவசரகாலச் சட்டத்தை நீடிக்க வேண்டுமா? என்ற கேள்வி எங்களுக்குள் எழுகின்றது.

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

நீடிக்கப்படவிருக்கின்ற இந்த அவசரகாலச் சட்டமானது, இப்போது எதிர்க்கட்சியில் இருக்கின்றவர்களது கடந்த அரசாங்க காலத்தில் மிக மோசமாக எங்களுடைய மக்களை அடக்கி ஒடுக்குவதற்காகப் பயன்படுத்தப்பட்டது என்பது உங்களுக்குத் தெரியும்! இப்போது சொல்லப்படுகின்ற அவசரகாலச் சட்டத்தின் பகுதி 11இல் PTA - Prevention of Terrorism Act - எனப்படுகின்ற பயங்கரவாதத் தடைச் சட்டம்கூட உள்ளடக்கப்பட்டு இருக்கின்றது. பயங்கரவாதத் தடைச் சட்டமானது, இந்த நாட்டில் மக்களுடைய அடிப்படை உரிமைகளை மீறுவது மட்டுமல்ல, மனித குலத்துக்கு எதிரான குற்றங்களைப் புரிவதற்கும் - மக்களைப் படுகொலை செய்வதற்கும் - பயன்படுத்தப்பட்டது. இவ்வாறான பயங்கர வாதத் தடைச் சட்டத்தை உள்ளடக்கியிருக்கின்ற இந்த அவசரகாலச் சட்டத்தை இந்த அரசாங்கமும் ஏதோவொரு தேவைக்காகப் பயன்படுத்த நினைக்கின்றதா? என்ற சந்தேகம் எங்களுக்குள் எழுகின்றது. அதை ஏற்றுக்கொள்ளவேண்டிய சூழல் உங்களுக்கு இருக்கின்றது. பாதிக்கப்பட்ட தரப்பு என்ற வகையில், நாங்கள் இந்த அவசரகாலச் சட்டத்தை எதிர்க்கின்றோம்.

அவசரகாலச் சட்டம், பயங்கரவாதத் தடைச் சட்டம் போன்ற நாட்டு மக்களுக்கு விரோதமான சட்டங்களை அகற்றுவதாகச் சொல்லிக்கொண்டுதான் இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தது. ஆனால், அதற்கு மாற்றீடாக இன்னொரு சட்டத்தை அரசாங்கம் அறிமுகப்படுத்தி இருக்கிறது. அதற்கு மாற்றீடாக அறிமுகப்படுத்தப்பட்ட சட்டம் ஏற்கனவே இருந்த பயங்கரவாதத் தடைச் சட்டத்தைவிட மிக மோசமானது என்றே நாங்கள் கருதுகின்றோம். ஏனெனில், அந்தச் சட்டத்தில் 'பயங்கரவாதம்' என்பதற்கான வரைவிலக்கணம் எங்கும் குறிப்பிடப்படவில்லை. "Terrorism" என்பதற்கான definition is not mentioned anywhere. ஆனபடியால், நீங்கள் ஆட்சியை நடத்துவதற்கு உங்களுக்குத் தேவையான சந்தர்ப்பங்களில் எதையும் பயங்கரவாதமாகச் சொல்லலாம். 'பயங்கரவாதம்' என்பதற்கு வரைவிலக்கணம் கொடுக்கப்படாத நிலையில், இந்த அரசாங்கத்துக்கு எதிராகப் பிரச்சினைகள் வரும்போது, எதையும் பயங்கரவாதமாகச் சித்திரிப்பதற்கு வாய்ப்பு இருக்கின்றது. அதை நீங்கள் உணர்ந்தீர்களா என்பது எனக்குத் தெரியாது. பயங்கரவாதத் தடைச் சட்டமானது, மக்களின் அடிப்படை உரிமைகளை மீறுகின்ற ஒரு சட்டமாகவே இதுவரை இருந்திருக்கிறது. அதற்கு மாற்றீடாகக் கொண்டுவரப்பட இருக்கின்ற சட்டம்கூட, ஏற்கனவே இருக்கின்ற பயங்கரவாதத் தடைச் சட்டத்திலும் பார்க்க மோசமானதாக இருக்கின்றது. இவ்வாறான சூழ்நிலையில், அனர்த்தம் நிகழ்ந்து இரண்டு மாதங்களுக்குப் பிறகும் அவசரகாலச் சட்டத்தை நீடிக்க வேண்டுமா? என்ற கேள்வியை நான் இங்கே கேட்க விரும்புகின்றேன்.

இப்போது இங்கு பேசியவர்கள், அண்மையில் திருகோணமலையில் சில மதகுருமாரை சிறையில் அடைத்தது தொடர்பாகப் பேசினார்கள். மதகுருக்களாக இருக்கலாம், அமைச்சர்களாக இருக்கலாம், தனவந்தர்களாக இருக்கலாம், இந்த நாட்டில் சட்டத்தின்முன் அனைவரும் சமம். எங்களுடைய நாட்டின் அரசியலமைப்பை மீறுகின்ற அல்லது இந்த நாட்டின் சட்டத்தை மீறுகின்ற எவராக இருந்தாலும், அவர்கள் சட்ட நடவடிக்கைக்கு உட்பட்டவர்கள். அந்த வகையில், நான் உங்களுக்குப் பாராட்டுக்களைத் தெரிவித்துக் கொள்கின்றேன். சட்டத்தை மீறியவர்கள் எவராக இருந்தாலும் அவர்களுக்கு எதிராக நடவடிக்கை எடுங்கள்! அதற்கு நாங்கள் உறுதுணையாக இருப்போம்.

இந்த நாட்டில் பயங்கரவாதத் தடைச் சட்டம் அமுலில் இருந்தபோது, அதனைப் பயன்படுத்தி எங்களுடைய பகுதியைச் சேர்ந்த இந்து மத குருக்கள் சந்தேகத்தின் பேரில் கைதுசெய்யப்பட்டு, எந்தவித விசாரணையும் இல்லாமல் பல தசாப்தங்களாகச் சிறையில் அடைக்கப்பட்டார்கள். அதுமாத்திரமன்றி, அவர்கள் சிறையில் இறந்த சம்பவங்களும் பதிவாகி இருக்கின்றன. அவர்களும் ஒரு குறிப்பிட்ட மதத்தின் தலைவர்கள்! எனவே, பேசுகின்ற மொழி அல்லது பின்பற்றுகின்ற மதத்தை அடிப்படையாக வைத்து சட்டத்தைப் பாவிக்க முடியாது. சட்டத்தை மீறுபவர்கள் யாராக இருந்தாலும், அவர்களுக்கு எதிராகச் சட்டத்தைப் பயன்படுத்த வேண்டும். ஆனால், சர்வதேச நியமங்களுக்கு உட்பட்டதாக, மக்களுடைய அடிப்படை உரிமைகளை மீறாத வகையில் சட்டங்கள் உருவாக்கப்பட வேண்டும்.

2004ஆம் ஆண்டு சுனாமியால் மிகவும் மோசமாகப் பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரணம் வழங்குவதற்காக, அவர்களுக்கான மீள்கட்டுமானத்தைச் செய்வதற்காக P-TOMS எனப்படுகின்ற Post-Tsunami Operational Management Structure - சுனாமிக் கட்டமைப்பைக் கொண்டுவந்தபொழுது, இப்போது அரசாங்கத்தில் இருக்கின்றவர்கள் அதை எதிர்த்து இல்லாமல் செய்தார்கள். இங்கு இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்களில் எத்தனை பேருக்கு இது தெரியுமோ, தெரியாது. நாங்கள் பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரணம் கொடுப்பதை நிறுத்துமாறு கோரி சட்ட நடவடிக்கைக்குப் போகவில்லை. நீங்கள் மோசமான அவசரகாலச் சட்டத்தை நீடிப்பதில் எங்களுக்குச் சந்தேகம் இருக்கின்றது. ஏற்கெனவே இந்தச் சட்டத்தால் பாதிக்கப்பட்ட ஒரு மக்கள் குழுவிலிருந்து வந்தவன் என்ற அடிப்படையில், அந்தச் சந்தேகம் எனக்கு ஏற்படுவதை நீங்கள் பிழை என்று சொல்ல முடியாது.

இவ்வாறான சட்டங்களைக் கொண்டுவரும்போது இந்த நாட்டில் நீங்கள் சொல்கின்ற நல்லிணக்கம் ஏற்படுமா என்பதை ஒரு தடவை சிந்தித்துப் பார்க்க வேண்டும். இரண்டு தரப்புகளும் விட்டுக்கொடுப்புகளைச் செய்வதன் மூலம்தான் நல்லிணக்கம் ஏற்படும். அதை ஏற்படுத்துவதற்கான முன்முயற்சிகளை நீங்கள் மிகவும் அவதானமாக எடுக்க வேண்டும். அண்மையில் எங்களுடைய மாவட்டத்தில் நடந்த ஒரு விடயத்தை இதற்கு உதாரணமாகச் சொல்லலாமென நினைக்கின்றேன்.

1983ஆம் ஆண்டு மகாவலி 'எல்' வலயம் என்ற பெயரில் எங்களுடைய பிரதேசத்தில் வாழ்ந்த மக்களை விரட்டிவிட்டு, வேறு மாகாணங்களில் இருந்து கொண்டுவரப்பட்ட சிங்கள மக்களை அங்கு குடியேற்றினார்கள். 2011ஆம் ஆண்டு அந்த மக்களுடைய நீர்த் தேவையைப் பூர்த்திசெய்வதற்காக மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய அரசாங்கம் கிவுல் ஓயா திட்டத்தைக் கொண்டுவந்தது. இந்தத் திட்டத்தின் ஊடாக அந்த மக்களுக்குத் தண்ணீர் கொடுப்பதில் எங்களுக்குப் பிரச்சினை இல்லை. எல்லோருக்கும் நீர் மிகவும் முக்கியமானது. எனினும், இந்தத் திட்டத்தின் ஊடாக ஒரு பகுதி மக்கள் பாதிக்கப்படுகின்றார்கள். அவ்வாறு பாதிக்கப்படுகின்ற மக்கள் தொடர்பில் 2011ஆம் ஆண்டு இருந்த அரசாங்கம் எந்தக் கரிசனையும் எடுக்கவில்லை. இப்பொழுது நீங்களும் அதே திட்டத்தை ஆராயாமல் நடைமுறைப்படுத்த முயற்சி எடுப்பதன் ஊடாக, பாதிக்கப்படுகின்ற மக்களின் நலன் சம்பந்தமாக சிறிதளவேணும் சிந்திக்கவில்லை என்ற காரணத்தால்தான் கடந்த வாரம் நாங்கள் வவுனியாவில் ஓர் எதிர்ப்பு ஆர்ப்பாட்டத்தை ஒழுங்கு செய்தோம். இந்த எதிர்ப்பு ஆர்ப்பாட்டமானது பாதிக்கப்படுகின்ற மக்களுக்காகச் செய்யப்பட்டதே ஒழிய, அரசியல் நோக்கங்களுக்காக அல்ல. வீதியில் இறங்கிப் போராடி, ஆட்சியைக் கைப்பற்றுவது

எங்களது நோக்கம் அல்ல. அப்படி எங்களால் இலங்கையின் ஆட்சியைக் கைப்பற்ற முடியாது. தயவுசெய்து, எங்களுடைய நோக்கத்தைத் தெளிவாகப் புரிந்து கொள்ளுங்கள்! எங்களுடைய மக்கள் எதிர்கொள்கின்ற பிரச்சினைகள் பற்றி நீங்கள் சிந்திக்காமல், மக்களால் விரட்டப்பட்ட முன்னைய அரசாங்கம் கொண்டுவந்த திட்டங்களை எந்தவித ஆலோசனையுமின்றி, அந்தப் பகுதி மக்களுக்குத் தெரியாமல் நடைமுறைப்படுத்துவதை தயவுசெய்து உடனடியாக நிறுத்துங்கள்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
எனக்கு இன்னும் இரண்டு நிமிடம் தாருங்கள்! ஒரு விடயத்தை மாத்திரம் சொல்லி முடிக்கிறேன். எங்களுடைய கட்சியின் நேரத்திலிருந்து அந்த நேரத்தை நான் எடுத்துக் கொள்கின்றேன். அதை நீங்கள் note பண்ணிக் கொள்ளுங்கள்!

இப்போது எங்களுடைய பிரதேசத்தில் 65 சதவீதத்துக்கும் மேற்பட்ட விவசாய நிலங்களில் அறுவடை முடிந்துவிட்டது. நெல் சந்தைப்படுத்தும் சபை நெல்லுக்கான விலை நிர்ணயத்தைச் செய்துள்ளபோதிலும், இன்றுவரை எங்களுடைய மாவட்டத்தில் அந்த விலைக்கு நெல் கொள்வனவு செய்யப்படவில்லை. அரசின் ஆகக் குறைந்த கொள்வனவு விலை 120 ரூபாய்! எனினும், எங்களுடைய மாவட்டத்தில் 80 ரூபாய்க்குத்தான் கொள்வனவு செய்கிறார்கள். இது பாரிய அநியாயம்! இதனால் ஒரு விவசாயி ஓர் ஏக்கருக்கு கிட்டத்தட்ட 30,000 ரூபாயை இழக்கிறார். அவர்கள் ஏற்கனவே அனர்த்தத்தாலும் பாதிக்கப்பட்டு இருக்கிறார்கள்.

இன்று நான் நெல் சந்தைப்படுத்தும் சபையின் தலைவரோடு பேசியபோது, அடுத்த திங்கட்கிழமையிலிருந்து நிர்ணய விலைக்கு நெல்லைக் கொள்வனவு செய்வதாகச் சொன்னார். 70 - 75 சதவீதமான விவசாய நடவடிக்கைகள் நிறைவுற்ற பிறகு, நீங்கள் யாரிடமிருந்து நெல்லைக் கொள்வனவு செய்யப் போகிறீர்கள்? இவ்வாறுதான் சென்ற வருடமும் நடந்தது. தயவுசெய்து, நெல் கொள்வனவை இப்போதாவது மேற்கொள்ளுங்கள்! மிகுதியாக இருக்கின்ற 30 சதவீத விவசாயிகளாவது பயனடையக்கூடிய வகையில் நெல் கொள்வனவை மேற்கொள்ளுங்கள்! அடுத்த வருடத்திலாவது எங்களுடைய பிரதேசத்தில் அறுவடை நடைபெறுகின்றபோது, நெல்லைக் கொள்வனவு செய்வதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டுமெனக் கேட்டு, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආර්.ජී. විජේරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.13]

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)
මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපි අද විවාද කරමින් සිටින්නේ මහජන ආරක්ෂක පනත යටතේ ගෙනෙන රෙගුලාසියක් වන හදිසි නීතිය තවදුරටත් දීර්ඝ කිරීම පිළිබඳවයි. "දිට්වා" සුළි කුණාටුවත් එක්ක ඇති වෙච්ච තත්ත්වය මොනතරම් බරපතළ ද කියලා අපි කවුරුත් දන්නවා. එය ජාතික වශයෙන් මොනතරම් විනාශයක් ද කියන එක මීට කලින් ඉදිරිපත් කරපු කරුණුවලදී තහවුරු වුණා.

මා නියෝජනය කරන නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඇළ මාර්ග 245ක් විනාශ වෙන තරමට මේ කුණාටු තත්ත්වය බරපතළ වුණා. මේ නිසා අමුණු 89ක් කැඩී බිඳී ගියා. කුඩා වැව් 9ක් මුළුමනින් විනාශ වුණා. කෘෂි මාර්ග 81ක් විනාශ වුණා. ඒ විතරක් නොවෙයි. දිස්ත්‍රික්කය පුරා RDA එකට අයිති මාර්ග කිලෝමීටර 600න් 280ක් පමණ විනාශ වුණා. ඒ නිසා ඒ සිදු වූ විනාශය සුළුපටු එකක් නොවෙයි. ඒ නිසා මේ හදිසි අවස්ථා තත්ත්වය ප්‍රකාශයට පත් කරන්න එදා පක්ෂ, විපක්ෂ අපි සියලුදෙනාම එකතු වුණා ඔබතුමියට මතක ඇති, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එදා ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට පැමිණියා. පක්ෂ, විපක්ෂ සියලුදෙනා එකට එක්රැස් වෙලා රැස්වීමක් තිබුණා. විපක්ෂ නායකතුමාගේ පරිණත දැනුම නිසා ද දන්නේ නැහැ, හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න කියලා එතුමා යෝජනා කළා. ඒ අනුව හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කළා. ඉන් පස්සේ මේ සහන කටයුතු යම් ආකාරයකට යථාවත් කිරීම සඳහා මැදිහත් වෙන්න පුළුවන්කම ලැබුණා.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ විතරක් රුපියල් 25,000ක දීමනාව දෙන්න රුපියල් විසිකෝටි තිස්එක්ලක්ෂ හැත්තෑපන්දහසක මුදලක් ලබා දීලා තිබෙනවා. මොකද, තවම රුපියල් 25,000 නැහැ, තවම රුපියල් 50,000 නැහැ කියලා සමහර අය කිව්වා නේ. ඒ නිසායි මම මේ කාරණය කියන්නේ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ රුපියල් 25,000 දීමනාව විධියට විතරක් රුපියල් විසිකෝටි තිස්එක්ලක්ෂ හැත්තෑපන්දහසක මුදලක් ලබා දීලා තිබෙනවා. රුපියල් 50,000 දීමනාව විධියට රුපියල් පන්කෝටි අනූපන්ලක්ෂයක මුදලක් ලබා දීලා තිබෙනවා. මේ, පසුගිය දෙසැම්බර් 31 වෙනකොට තිබෙන වාර්තාව. ඒ විතරක් නොවෙයි. පාසල් ළමුන් සඳහා ගෙවන රුපියල් 15,000 දීමනාව වෙනුවෙන් එක්කෝටි අනූපන්ලක්ෂ අනූදහසක් ගෙවලා තිබෙනවා. මේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ තොරතුරු විතරයි.

ඊළඟට, වගා හානිවලට මුදල් ගෙව්වේ නැහැ කියලා තව කාරණයක් ඉස්මතු කළා. ඒ නිසා මම මේ මොහොතේම කෘෂිකර්ම අමාත්‍යාංශයට කථා කරලා වාර්තාවක් ගත්තා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ තිබෙන තොරතුරුවලට අනුව ඊයේ දිනය වන විට වගා හානි සඳහා මුළු ලංකාව පුරා ගොවීන් 50,522කට ගෙවලා තිබෙන මුදල රුපියල් කෝටි 212ක්. හරියටම කියනවා නම් ඊයේ වෙනකොට ගෙවපු ඒ මුදල රුපියල් දෙසියදොළොස්කෝටි හැත්තෑනවලක්ෂ විසිහයදහස් හත්සියඅසූඑකයි ශත විසිදෙකයි. මේ සා විශාල මුදලක් ගොවීන් සඳහා වන්දි විධියට ගෙවලා තිබෙනවා. ඒ අනුව ජන ජීවිත යථාවත් කිරීම වෙනුවෙන් දින 70ක් වාගේ කාලයක් ඇතුළත ක්‍රියාමාර්ග ගන්න රජයක් විධියට අපට හැකියාව ලැබිලා තිබෙනවා. හැබැයි මේ තත්ත්වය අවසන්ද? මේ හදිසි අවස්ථා තත්ත්වය තවදුරටත් දීර්ඝ කළ යුතුද, නැද්ද කියන කාරණය සම්බන්ධයෙන් පැවැත්වෙන විවාදයේදී තමයි අපි මේ කථා කරමින් ඉන්නේ.

මා ඒ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් කියන්නම්. නුවරඑළිය දිස්ත්‍රික්කයේ විතරක් ඇළ මාර්ග කොච්චර විනාශ වුණාද කියලා මා මුලින් සඳහන් කළා. හැබැයි මිනිස් සහභාගිත්වයෙන්, ඒ වාගේම අනෙකුත් දිස්ත්‍රික්කවල සහෝදර ජනතාවගේ මැදිහත්වීමෙන් අපට ඒ ඇළ මාර්ග යම් ප්‍රමාණයකට පිළිසකර

[ගරු ආර්.ජී. විජේරත්න මහතා]

කරන්න හැකියාව ලැබුණා. අපි වැලි කොට්ට ටිකක් ගහලා, තාවකාලිකව ජලය සපයලා වගා කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒත් ඒක ස්ථිර පිළියමක් නොවෙයි. අද ගොවිජන සේවා කොමසාරිස්තුමාට කථා කළාම ඔහු කියන්නේ මොකක්ද? මේවා පිළිසකර කරන්න නම් අනිවාර්යයෙන් තාක්ෂණ දැනුම ඕනෑ, ඉංජිනේරු සහාය ඕනෑ, ඒ සඳහා දෙපාර්තමේන්තුවල සිටින නිලධාරින් ප්‍රමාණවත් නැහැ කියලා එතුමා කිව්වා. ඒ විතරක් නොවෙයි, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ - NBRI - තාක්ෂණ උපදෙස් අවශ්‍ය වෙනවා කියාත් එතුමා කිව්වා. එහෙම නම් මේක සාමාන්‍ය තත්ත්වයක් නොවෙයි. සාමාන්‍ය තත්ත්වයේ ක්‍රියාමාර්ග තුළ මේ කටයුතු ලේසියෙන් පහසුවෙන් කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අනෙකුත් ආයතනවල සහාය, සම්බන්ධීකරණය දැන් අවශ්‍ය වෙනවා. ඒ නිසා තමයි අපි කියන්නේ මේක විශේෂ අවස්ථාවක් සේ සලකා අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙකුගේ මැදිහත්වීම යටතේ අනෙකුත් ආයතනවල සහාය අරගෙනයි මේ කටයුතු කඩිනම් කරන්න පුළුවන්කම තිබෙන්නේ කියලා. මෙය සාමාන්‍ය තත්ත්වයකට වඩා එහා ගිය විශේෂ තත්ත්වයක් නිසාත්, මේ කටයුතු වඩාත් හොඳින් කාර්යක්ෂමව කරගත යුතු නිසාත් අනිවාර්යයෙන්ම මහජන ආරක්ෂක ආඥාපනත යටතේ වන මේ යෝජනා සම්මතය තවත් යම් කාලයකට දීර්ඝ කර ගත යුතුම වෙනවා.

මා මුලින් කිව්වා, RDA එකේ මාර්ගවලින් සියයට 45කට වැඩි ප්‍රමාණයක් විනාශ වෙලා තිබෙනවා කියලා. මේ මාර්ග පිළිසකර කරන්න ඒ ආයතනයේ තිබෙන ශක්තිය, නැත්නම් ඉන්න පිරිස ප්‍රමාණවත් වෙන්නේ නැහැ. එහෙම නම් ඊට වඩා වැඩි සහායක් ලබා ගන්න, විවිධ ආයතනවල තාක්ෂණික සහාය ලබා ගන්න අපට අනිවාර්යයෙන් මේ පනතේ බලතල උපයෝගි කර ගන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ සියලු කරුණුවලින් කියාපාන්නේ අන් කවරක්වත් නොවෙයි. මේ ව්‍යසනය නිසා මහා විනාශයක් වෙලා තිබෙනවා. ඒ විනාශයෙන් ගොඩ එන්න නම්, යම් තරමකට යථාවත් කර තිබෙන ජන ජීවිත තවදුරටත් ශක්තිමත් කරන්න නම්, අනිවාර්යයෙන්ම මිනිස් පවුරක් විධියට අපි සියලු ආයතන ඒකාබද්ධ කරගත් ක්‍රියාවලියක් හරහා නිසි සැලසුම්, නිසි කළමනාකරණයක් කර ගත යුතුම වෙනවා. ඒ නිසා මේ කටයුතු සම්බන්ධීකරණය කරන්න දැන් බලපැවැත්වෙන තත්ත්වය තවත් යම් කාලයකට දීර්ඝ කිරීමේ ඕනෑකම තිබෙනවා. එහෙම වුණොත් තමයි අපි බලාපොරොත්තු වන නිසි තත්ත්වය ළඟා කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ.

සාමාන්‍යයෙන් ආරක්ෂිත රාජකාරිවල යෙදෙන හමුදා භටයන් තුවක්කුවක් අතේ තියාගෙන ඉන්න ආකාරය අපි දැක තිබෙනවා. හැබැයි එතැනින් එහාට ගිහිල්ලා ඔවුන්ගේ සේවය අපට ලබා ගන්න පුළුවන්කම ලැබුණා, විශාල පිළිසකර කිරීම් සඳහා. ඉදිරියටත් අපට ඔවුන්ගෙන් ඒ සේවය ගන්න අවශ්‍ය වෙනවා. ඒ අවශ්‍යතා සම්පූර්ණ කරගන්න පුළුවන්කම තිබෙන්නේ, නිසි නියෝග දෙන්න පුළුවන්කම තිබෙන්නේ හදිසි තත්ත්වයක් පැවතුණොත් පමණමයි. ඒ නිසා මා නැවත නැවතත් අවධාරණය කරන්නේ මේ විශේෂ තත්ත්වය සැලකිල්ලට අරගෙන මේ කටයුතු නිසි පරිදි ඉදිරියට ගෙන යෑම සඳහා මේ කටයුත්ත සිද්ධ කරන්න ඕනෑය කියලායි.

අවසාන වශයෙන් මා මේ කාරණය කියන්නම්. හදිසි නීතිය පැනෙව්වේ, එහෙම නැත්නම් මේ හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කළේ පාර්ලිමේන්තුවක් විධියට පක්ෂ විපක්ෂ සියලුදෙනාම එකතු වෙලායි. මේ ව්‍යසනයෙන් පසු ඇති වූ තත්ත්වයට මුහුණ දුන්නේ, ඒ සඳහා වැඩ කටයුතු සිද්ධ කළේ පක්ෂ, විපක්ෂ සියලුදෙනාම එකට එකතු වෙලායි. අපි දැක්කා, විපක්ෂයේ මන්ත්‍රීවරුත් යම් ප්‍රමාණයකින් මේ කටයුතුවලට දායක වුණා කියලා. ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා කොළඹ ඉඳලා අපේ නුවරඑළිය දිස්ත්‍රික්කයට ගිහිල්ලා ඈත දුෂ්කර ගම්මානවල සුරක්ෂා මධ්‍යස්ථානවලට උදවු උපකාර කළ හැටි මට මතකයි. ඒ නිසා පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව මේ ව්‍යසනයෙන් පසු ඇති වූ තත්ත්වයට අප සියලුදෙනා මුහුණ දුන්නා. එහෙම නම් මේ තත්ත්වය තවදුරටත් සාමාන්‍ය තත්ත්වයට පත්කර ගැනීම සඳහා මේ මහා මෙහෙයුම වෙනුවෙන් පක්ෂ, විපක්ෂ සියලුදෙනා ඒකමතිකව මේ යෝජනාව සම්මත කරගනිමු කියන යෝජනාව කරනවා. මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.22]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම අද විනාඩි කිහිපයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. "දිට්වා" සුළි කුණාටුවෙන් වූ විනාශය ගැන අපට විශාල අවබෝධයක් තිබෙනවා. නමුත් මට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මේකයි. තොරතුරු ලැබිලා තිබියදීත්, "දිට්වා" සුළි කුණාටුවට සූදානම් වෙලා මේ විනාශය වළක්වා ගන්න බැරිවුණු ආණ්ඩුවක් දැන් වෙච්ච හානිවලට වන්දි ගෙවමින් වැඩකටයුතු කරමින් යනවා. ඒවායේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මම ඒවා ගැන දැන් කථා කරන්න යන්නේ නැහැ.

මම අද කථා කරන්න හදන්නේ, "දිට්වා" සුළි කුණාටුවෙන් විනාශ වෙච්ච රට හදන වැඩ පිළිවෙළට මේ මහජන ආරක්ෂක ආඥාපනත යටතේ හදිසි නීතිය පාවිච්චි කරන්නේ ඇයි කියන එක ගැනයි. මොකක්ද, හදිසි නීතිය පාවිච්චි කරලා කරන්න හදන සංවර්ධනය? මම කියන්නම්, මේකේ තිබෙන භයානක කාරණා. මේ අති විශේෂ ගැසට් පත්‍රයේ 15වැනි වගන්තියේ තිබෙනවා, යම් ස්ථානයකට හෝ ප්‍රදේශයකට ඇතුළු වීම තහනම් කිරීම සම්බන්ධව. දැන් "දිට්වා" සුළි කුණාටුවට පසු මේ වැඩ කටයුතු ටික කරගෙන යනකොට මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවාද, කොහේට හරි ඇතුළු වෙන එක තහනම් කරන්න? ඒකට හදිසි නීතිය ඕනෑද? ඒ සඳහා තිබෙනවා, ලංකාවේ භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය. ඒගොල්ලන්ට පුළුවන් නිවේදනයක් නිකුත් කරන්න, මෙතැනට එන්න එපා කියලා. එච්චරයි. හැබැයි හදිසි නීතිය දමලා කියනවා, මේ පැත්තට එන්න එපා කියලා.

ඊළඟට, නිසි බලධාරියෙකු පත් කරන්න පුළුවන්, ජනාධිපතිතුමාට. මොකටද මේ? රට හදන්නද? රටේ ජනාධිපති - නිසි බලධාරියා- ඉන්නවා; ඇමතිවරු ඉන්නවා. දැන් මේ Regulation 5 බලන්න. ඒකේ තිබෙනවා, "Appointment of the Competent Authorities" කියලා. නිසි බලධාරියෙක් පත් කරන්න පුළුවන්. මොකටද මේ? ඊළඟට, Regulation 12 බලන්න. ඒකට අනුව, if the President declares a service essential, the service of any employee who fails to attend work for just one day without a lawful excuse, even if the absence is part of a strike, is deemed, for all purposes, to have forthwith been terminated or as vacated his employment. ඒ කියන්නේ,

කිසියම් පුද්ගලයෙක් නොදන්වා සේවයට වාර්තා නොකර සිටීම, ඔහුගේ සේවය තහනම් කරන්න, එහෙම නැත්නම් ඔහු සේවයෙන් ඉවත් කරන්න හේතුවක් බවට පත් වනවා. ඇයි, ඒවා මේකට දමන්නේ? මොකටද? ඇයි, මේ හදිසි නීතිය "දිට්වා" සුළි කුණාටුවට අදාළව පාවිච්චි කරන්නේ? මම ඒකයි අහන්නේ. මම අගමැතිතුමියගෙනුත් ඇහුවේ ඒකයි. හරි. ඔබතුමන්ලා වැඩ ටික කරන්න. අපිත් උදව් කරන්නම්. හැබැයි ඒකට හදිසි නීතිය ඕනෑ නැහැ. අපි කිව්වේ, හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න කියලායි. හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන එකයි, හදිසි නීතිය ගෙනැල්ලා මුළු ලංකාවටම හදිසි නීතිය පනවන එකයි කියන්නේ දෙකක්. ඒකයි අපේ තර්කය.

ඊළඟට මම තවත් කාරණයක් කියන්න කැමැතියි. දැන් මේකේ අපරාධමය වගකීමකුත් - criminal liability එකකුත් - තිබෙනවා. ඊළඟට, Regulation 19හි spreading of rumours and false statements පිළිබඳව සඳහන් වනවා. ඒ කියන්නේ, no person shall communicate, publish, generate or disseminate rumour or false statement through any means including electronic, digital or artificial intelligence systems, which is likely to cause public alarm or public disorder. මේ කරන්න හදන්නේ මාධ්‍ය මර්දනය. මේකේ බොහොම පැහැදිලිව තිබෙනවා, ජනතාවට යම් කිසි විධියක කරුණු ඉදිරිපත් කිරීම, rumours or false statements ගැන. ඒක නේ අර "ලංකාදීප" පත්තරේ තිබිච්ච කාරණය ගැන ඊයේ-පෙරේදා කථානායකතුමා කිව්වේ. එතුමන්ලා කියලා තිබෙන්නේ, මේ පාර්ලිමේන්තුව ඇතුළේ මෙහෙම සිද්ධියක් වෙනවාද -අයිස් ගහලා තිබෙනවාද, මත්පැන් බීලා තිබෙනවාද- කියන එක සම්බන්ධව කරන පරීක්ෂණය පිළිබඳව. ඒක හොඳයි කියලා තමයි ලියලා තිබෙන්නේ. මොකක්ද කථානායකතුමා ඇවිල්ලා කිව්වේ? එතුමා දැන් අර පුද්ගලයා ගෙන්වනවා, Ethics and Privileges Committee එකට. මේ හදිසි නීතියත් ඕවාටම තමයි පාවිච්චි කරන්නේ. ඒ කියන්නේ, ලංකාවේ තිබෙන මාධ්‍යවලට කිසියම් කාරණයක් පිළිබඳව ප්‍රවෘත්තියක් දමන්න බැහැ; දමපු ගමන් හදිසි නීතිය යටතේ ඒගොල්ලන් වරදකරුවන් බවට පත් වනවා. මෙතැනට ඇවිල්ලා නලින්ද ජයතිස්ස ඇමතිතුමා කියනවා, "අපි ඕනෑ වෙලාවක මේවා තහනම් කරන්න සූදානම්" කියලා. එතකොට මේ හදිසි නීතිය පාවිච්චි කරන්නේ ඒකට. අපි අහන්නේ, "දිට්වා" සුළි කුණාටුවෙන් විනාශ වෙච්ච රට හදන්නත් ඇයි මේ හදිසි නීතිය පාවිච්චි කරන්නේ කියලායි.

ඊළඟට, Regulation 33. මොකක්ද එතැන තිබෙන්නේ බලන්න. මේකට අනුව, no legal proceeding, civil or criminal, can be instituted against any person for acts done in good faith while performing duties under these Regulations. මේකේ තව කාරණා ගණනාවක් තිබෙනවා. මම කියන්න කැමැතියි, මේක දැන් විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන බව.

ඊළඟට, මම සංස්කෘතික වටිනාකමක් සහිත පුරාවිද්‍යාත්මක ස්ථාන විනාශ කරන එක පිළිබඳවත් කියන්න කැමැතියි. බලන්න, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටුවන්නාව විහාර භූමියේ නව දැදුරුඔය ජලාශයට උතුරු දිශාවෙන් පිහිටා තිබෙන පුරාවිද්‍යාත්මක ස්ථානයක් විනාශ කරන වැඩ පිළිවෙළක් දැන් පටන් ගෙන තිබෙනවා, වයඹ පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂ එම්.ජී. රත්නපාල. 1963දී පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස මෙම ස්ථානය නම් කර තිබෙනවා. බුදුරජාණන් වහන්සේ සංකේතවත් කිරීමට ඒ කාලයේ භාවිත කළේ, බෝධි වෘක්ෂය, සිරිපතුල, ධර්ම චක්‍රය සහ ආසනය. මේගොල්ලන් දැන් වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා, එම ස්ථානයේ පිහිටා ඇති ආසනඝරය නැවත හාරන්න. ඒවා එහෙම හාරන්න බැහැ. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. මේ කටුවන්නාව ආසනඝරය දැන් වෙන විධියකට නැවත ස්ථාපිත කරන්න තමයි මේගොල්ලන් හදන්නේ. මේක තව විනාශයක්.

ඊළඟට, තව වැදගත් කාරණයක් කියන්න තිබෙනවා. ඒ කාරණය තමයි, ඉබ්බන්කටුව ඓතිහාසික සුසාන භූමියක තිබුණු සුසානයක් ගලවා අරගෙන යෑම. මේවා සම්පූර්ණයෙන්ම වැරදි වැඩ. ඒක අරගෙන ගිහිල්ලා මොකක්ද කරලා තිබෙන්නේ? මහනුවර කෞතුකාගාරයේ රසායනාගාර ගබඩාවේ දැන් මේක සඟවා තිබෙනවා. විරාජි බාලසූරිය කියන මාණ්ඩලික නිලධාරිනිය තමයි දැන් මධ්‍යම පළාතේ සංස්කෘතික කටයුතු භාරව ඉන්නේ. ඇය අවසරය දෙනවා. අවසරය දෙනවා නොවෙයි, ජ්‍යෙෂ්ඨ පොලිස්පතිට ලියනවා, "අපි මේක අරගෙන එනවා. කරුණාකරලා මේකට අවසරය දෙන්න." කියලා. එහෙම තමයි මේක අරගෙන ගිහින් තිබෙන්නේ. පුරාවිද්‍යා නටබුන් තමයි මෙහෙම ගලවා ගෙන යන්නේ.

ඊළඟට, මැණික්දෙන පෙන්වා සීගිරිය කළුදිය පොකුණ පුවරු ලිපිය ගලවා මහනුවර කච්චේරියේ සවි කරන්න හදනවා. මේ රටේ සංස්කෘතික විනාශයක් මේ සිද්ධ වෙන්නේ. ඒ අස්සේ ජනාධිපතිතුමා කියනවා, උතුරට එන්නේ වෛරක්කාර ලෙස හිතන කට්ටිය කියලා. ඒ කළ ප්‍රකාශයට අපේ රාසමාණික්කම් මැතිතුමා ජනාධිපතිතුමාට ස්තුති කරනවා, පාර්ලිමේන්තුවේදී. මාර කථාවක්! එතකොට කාට ඕනෑවටද මේවා කරන්නේ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම තව සුළු වෙලාවක් ගන්නවා.

මේක තමයි අද පැහැදිලිවම තිබෙන තත්ත්වය. මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, ත්‍රිකුණාමලයේ අපේ හාමුදුරුවරුන් ඇතුළු 10දෙනෙක් මාසයක් තිස්සේ හිරේ බව. ඇප දෙන්නේ නැහැ. ඇප දෙන්න ගියාම, SSP කියනවා, නඩු දෙකක් අයින් කර ගන්න කියලා. ඔහුට විරුද්ධව මානව හිමිකම් නඩු දමා තිබෙනවා. එහෙම කොහොමද ගණන් හිලව් බේරා ගන්නේ? කරුණාකරලා මේ අය නිදහස් කරන්න කියන කාරණයත් මම මතක් කරනවා.

මම අවසාන වශයෙන් ඔබතුමියට තව කාරණයක් කියන්න කැමැතියි. භාණ්ඩාගාරය පිරී තිබෙනවා කිව්වා නේ. දැන් මොකද වෙලා තිබෙන්නේ? ලීසිංවලට මෙච්චර කාලයක් සියයට 75ක්, 80ක් දුන්නා. අද මොකද වෙලා තිබෙන්නේ? අද දෙන්නේ සියයට 50යි. මේ රටේ ලීසිං දමන අහිංසක මිනිස්සුන්ට වටිනාකමින් සියයට 75ක්, 80ක් ණය දුන්නා. දැන් ඒ ආයතන දෙන ණය සීමාව සියයට 50 මට්ටමට වැටී තිබෙනවා. මේ ගැන කරුණාකර සොයා බලන්න කියා මම ඉල්ලනවා.

මේ හදිසි නීතිය පාවිච්චි කරලා "දිට්වා" සුළි කුණාටුවෙන් මේ රටට වෙච්ච විනාශය නවත්වන්න ඔබතුමන්ලාට බැහැ. රට මර්දනය කරන තැනකට තමයි මේක පාවිච්චි කරන්නේ කියන කාරණයත් මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! දිවා ආහාර විවේකය සඳහා ගරු සභාවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනු ලැබේ.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.*
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් රත්නසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ හදිසි නීතිය සම්බන්ධයෙන් වන යෝජනා සම්මතය අද දවසේ විවාදයට ගැනෙනවා. මෙහිදී විපක්ෂය නියෝජනය කරන ගරු පී. සත්‍යලිංගම් මන්ත්‍රීතුමාට යම් සැකයක් තිබුණා, මේ හදිසි නීතිය දීර්ඝ කිරීම ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව කටයුතු කරන්නට සැලසුම් කරන ලද්දක්ද කියලා. එතුමන්ට මතක් කරන්නට ඕනෑ, දීර්ඝ කාලයක් අපේ රටේ හිටපු පාලකයෝ ඒ අයගේ පාලනයට එරෙහි වන, ඒ අයට සවන් නොදෙන, ඒ අයගේ මැතිවරණ ව්‍යාපාරයේ අතකොළු බවට පත් නොවන ජනතාවට එරෙහිව නීති රීති, අණපනත් ක්‍රියාත්මක කළ ඉතිහාසයක් තිබුණු බව. ගරු සත්‍යලිංගම් මන්ත්‍රීතුමාගේ මතකයට එන්න ඇති, යාපනයේ පුස්තකාලය ගිනිබත් කළ ඉතිහාසය, දෙමළ, මුස්ලිම් හා සිංහල අහිංසක තරුණ දරුවෝ ඝාතනය කළ ඉතිහාසය. එම නිසා එතුමාගේ සැකය සාධාරණයි. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ජනාධිපතිතුමා කිව්වා, මේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය අහෝසි කරන්නට, අවලංගු කරන්නට කිසිසේත්ම මේ හදිසි නීති අණපනත් පාවිච්චි කරන්නේ නැහැ කියලා.

ගරු විපක්ෂ නායකතුමා ප්‍රශ්න කළා, රුපියල් 25,000, රුපියල් 50,000 බෙදන්න හදිසි නීතිය අවශ්‍යද කියලා. රුපියල් 25,000, රුපියල් 50,000 බෙදන්න හදිසි නීතිය අවශ්‍ය නැහැ. හැබැයි, ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ආපදාවලට ලක් වූ ජනතාවට යම් සහනයක් දෙනවාය කියපු ගමන් විපක්ෂ නායකතුමා කොහේ හරි තිබෙන සුරුකුම් මධ්‍යස්ථානයකට යනවා. ඒ ජනතාව අතරට ගිහිල්ලා, මේ සහන ලැබුණාද කියලා ඉතා ඉක්මනින් විමසලා ඒ ජනතාව අතර නොසන්සුන්තාවක් ඇති කරනවා; කලබලයක් ඇති කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ හදිසි නීති අණපනත් ගෙනැල්ලා අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා බලාත්මක කරලා තිබෙන්නේ. එක පැත්තකින්, ජනතාව නොසන්සුන් කිරීම, පීඩාවට පත් වෙලා ඉන්න ජනතාව නොසන්සුන් කිරීම අපි වළක්වන්නට ඕනෑ. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු, විශේෂයෙන් විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායම ගිහිල්ලා නැවත නැවත කරන නොසන්සුන් කිරීම අපි වළක්වන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වෙරළ සංරක්ෂණ නීතිය භාවිත කරලා හාමුදුරුවෝ අත්අඩංගුවට අරගෙන තිබෙනවාය කියලා විපක්ෂ නායකතුමා කියනවා. තව කෙනෙක් කියනවා, හදිසි නීතිය භාවිත කරලා හාමුදුරුවෝ අත්අඩංගුවට අරගෙන තිබෙනවා කියලා. හැබැයි, අපි විපක්ෂ නායකතුමාට මතක් කරන්නට ඕනෑ, ගමකට ගිහිල්ලා හාමුදුරුනමක් තරුණ දරුවන්ට කිව්වා නම් යුක්තිය සාධාරණය වෙනුවෙන් හඬ නගපල්ලා කියලා, ඒ හාමුදුරුවන්ට නැවත පන්සලට වඩින්න නොදුන් කාලයක් තිබුණ බව. ධර්ම චක්‍රය දාලා, සිවුර ගලවලා, දෙන්න පුළුවන් දෙතිස්වද දීලා මරා දමපු ඉතිහාසයක් තිබුණා. ඉතිහාසයේ ඒවා මෙහෙයවූයේ එතුමාගේ තාත්තා කියලා කළු අකුරෙන් මේ රටේ ඉතිහාසයේ ලියැවිලා තිබෙනවා. එදා එතුමාට නොතිබුණු වේදනාවක් අද තිබෙනවා. අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා එතුමා කිඹුල් කඳුළු හෙළනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂ නායකතුමා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, අධ්‍යාපනයේ සිදු වන සාධනීය පරිවර්තනය පිළිබඳව විවිධ අවස්ථාවල විවිධ මතවාද නියෝජනය කළා. හැම දාම රටේ තිබුණු මතවාදයක් තමයි, අධ්‍යාපනය පෞද්ගලීකරණය කරන්නට යනවාය කියන එක. හැබැයි, මෙවර අධ්‍යාපනය පෞද්ගලීකරණය කරන්න යනවාය කියන වචන ශබ්ද කෝෂයෙන් ඉවත් වෙලා ගියා. ඒකට හේතුව තමයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2026 අය වැයෙන් අධ්‍යාපනයේ සාධනීය පරිවර්තනයක් කරන්න අපි රුපියල් මිලියන 25,000ක් වෙන් කරලා තිබීම. දෙමව්පියන් දරන අධ්‍යාපනයේ බර අඩු කරන්න, දරුවන්ට අධ්‍යාපනයේ දුක අඩු කරන්න, රුපියල් මිලියන 25,000ක් අපි වෙන් කර තිබෙනවා. ඒ රුපියල් මිලියන 25,000න් රුපියල් මිලියන 17,000කට වැඩි ප්‍රමාණයක් වෙන් කළා පාසල්වල යටිතල පහසුකම් දියුණු කරන්න. විෂයමාලා සංවර්ධනයට රුපියල් මිලියන 6,000කට වැඩි ප්‍රමාණයක්, මානව සම්පත් සංවර්ධනයට රුපියල් මිලියන 1,000කට වැඩි ප්‍රමාණයක්, ඇගයීම් හා තක්සේරු ක්‍රියාවලිය දියුණු කරන්න රුපියල් මිලියන 300කට වැඩි ප්‍රමාණයක්, මහජනතාව දැනුවත් කරන්න රුපියල් මිලියන 36කට වැඩි ප්‍රමාණයක් වෙන් කළා. ඒ නිසා කිසි කෙනෙකුට අධ්‍යාපනය පෞද්ගලීකරණය කරන්න උත්සාහ කරනවා කියා කියන්න බැරි වුණා. මොකද, අධ්‍යාපනයේ බර දෙමාපියන්ගෙන් අඩු කරන්න ඒ අවශ්‍ය මූල්‍ය වැය ආණ්ඩුව විසින් දරාගන්නට කටයුතු කරමින් සිටින නිසා.

අපේ රටේ විද්‍යාපීඨ 20ක් තිබෙනවා. මේ විද්‍යා පීඨ 20හි වසර 16ක් එකම විෂය නිර්දේශය උගන්වමින් තිබුණේ. ඒවායින් එළියට එන ගුරුවරු අලුත් තාක්ෂණය එක්ක, නව දැනුම එක්ක සන්නද්ධ කරන්නට ඕනෑ. ඒ නිසා පසුගිය කාලයේ ගුරුවරු 132,000කට අධික ප්‍රමාණයක් පුහුණු කළා. අපි එක් පැත්තකින් මානව සම්පත සංවර්ධනය කළා. අනෙක් පැත්තෙන් භෞතික සම්පත් සංවර්ධනය කරන්න මුදල් එව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2007න් පසු අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගෙන තිබුණේ නැහැ. නමුත්, 2025දී නැවත බඳවා ගැනීම් ආරම්භ කළා. විදුහල්පතිවරුන්ට ස්ථිර පත්වීම් ලබා දීම මේ වසරේ මාර්තු මාසයට පෙරාතුව කරන්නට උත්සාහ කරමින් ඉන්නවා. ඒ අනුව, භෞතික සම්පත් වර්ධනය කර තිබෙනවා. මානව සම්පත් වර්ධනය කර තිබෙනවා. අලුත් දැනුම පාසල් පද්ධතියට එක් කරන්නට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් සිටිනවා. මොඩියුල 106ක් අතර එක් මොඩියුලයක සිද්ධ වෙච්ච වරදක් අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම අසාර්ථකරණයට ලක් කරනවා කියලා මේ විපක්ෂ නායකතුමා ම තමයි කිව්වේ. ඒ වරද සිද්ධ වෙච්ච සැණින් අධ්‍යාපන අමාත්‍යාංශය විදියට, ගරු අගමැතිතුමිය විදියට සම්පූර්ණ මැදිහත්වීමක් කරලා ඒ මොඩියුලය සම්පූර්ණයෙන් සීල් කරන්න කටයුතු කළා. ඒ වාගේම ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරු

තුන්දෙනෙක් පත් කර fact-finding committee එකක් ආලා දින 02ක් ඇතුළත වාර්තාවක් ගත්තා. ඊට පසු රංජිත් ආරියරත්න විශ්‍රාමික ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් මූලික විමර්ශනයක් ආරම්භ කළා. එම මූලික විමර්ශනය ජාතික අධ්‍යාපන ආයතනය හරහා සිද්ධ වුණා. ඒ වාගේම, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් CID එකට පැමිණිලි කළා, මෙතැන කුමන්ත්‍රණයක් සිද්ධ වෙලා තිබෙනවාද කියා සොයා බලන්න කියලා. ඒ අනුව, පසුගිය දවසේ ජාතික අධ්‍යාපන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා අනිවාර්ය නිවාඩු යැව්වා. ඒ වාගේම, ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුවේ කථිකාචාර්යවරයා සහ සහකාර කථිකාචාර්යවරයා වැඩ තහනමට ලක් කළා. රජයක් විධියට, ආණ්ඩුවක් විධියට ගන්න තිබෙන සියලු ක්‍රියාමාර්ග අරගෙන තිබියදී විපක්ෂ නායකවරයා තවදුරටත් ප්‍රකාශ කරනවා, අධ්‍යාපනය අසහායකරණයට ලක් කළා කියලා. අපි ගරු විපක්ෂ නායකතුමාට කියනවා, ආණ්ඩුවට එරෙහි වුණාට කමක් නැහැ, රටට එරෙහි වෙන්න එපා කියලා. එහෙම රටට එරෙහි වෙනවා නම් මේ විපක්ෂය රටට සාපයක් වෙච්ච විපක්ෂයක් වෙනවා. ඔබ ආණ්ඩුවට ගල් මුල් ගහන්න, ආණ්ඩුවට එරෙහි වෙන්න, හැබැයි රටට එරෙහි වෙන්න එපා කියන පණිවුඩය අපි දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුවේ බලපෑම නිසා ඩොලර් බිලියන 1.4ක -රුපියල්වලින් ගත්තොත් රුපියල් බිලියන 1,200ක- හානියක් සිද්ධ වුණා. නිවාසවලට ඩොලර් බිලියන 985ක හානියක් වුණා. ගොඩනැඟිලිවලට ඩොලර් මිලියන 562ක හානියක් වුණා. යටිතල පහසුකම්වල ඩොලර් මිලියන 1,735ක හානියක් සිද්ධ වුණා. කෘෂිකාර්මික බිම්වලට ඩොලර් මිලියන 814ක හානියක් සිද්ධ වෙලා තිබෙනවා. මෙය සරල හානියක් නොවෙයි. මෙය අපේ රටට දරන්න පුළුවන් ආර්ථික හානියක් නොවෙයි. ඒ නිසා අපි හැමෝම එකතු වෙලා රට ගොඩනඟන්නට අවශ්‍ය අවස්ථාවක විපක්ෂයේ භූමිකාව වෙලා තිබෙන්නේ මොකක්ද? වතු කම්කරුවන්ගේ වැටුප වැඩි කළාම විපක්ෂය ඒකට එරෙහි වෙනවා. "දිට්වා" සුළි කුණාටුවේ බලපෑමට ලක්වෙලා ඒ පවුල් අසරණ වුණාට පස්සේ ඒ පවුල්වලට ලබාදෙන දීමනාව වළක්වන්න කරන්න පුළුවන් සියලු කුඩුකේඩුකම්, අඩන්තේට්ටම් කරමින් ඉන්නවා. ඒ වාගේම, අධ්‍යාපනයේ සාධනීය පරිවර්තනයක් කරන්න හදනකොට ඒකට එරෙහි වෙනවා. ඇයි? ඒගොල්ලන් රැකියා දෙන ස්වභාවය මේ රටේ හැමෝම දන්නවා. ඒක තමයි, උස නම් සිකියුරිටි, මිටි නම් කම්කරු. ඒ විධියට තමයි ඒගොල්ලන් රැකියා දුන්නේ. ඒ ඉතිහාසය වෙනස් කරලා නව පරිච්ඡේදයක් ආරම්භ කිරීමේ අවශ්‍යතාව අපට තිබෙනවා.

ඒ වාගේම, මේ ආපදාවට ලක් වෙච්ච සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් රැක ගැනීම සඳහා රජයක් විධියට අපට කරන්න පුළුවන් උපරිම කටයුතු අපි සිදු කරමින් ඉන්නවා. ඒ සඳහා අපි සියයට 5ක පොලියට රුපියල් මිලියන 25,000ක් බැංකුවලට නිදහස් කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

"දිට්වා" සුළි කුණාටුවේ බලපෑමට ලක් වෙච්ච කර්මාන්තකරුවන් වෙනුවෙන් රුපියල් මිලියන 10,000ක් නිකුත් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ කර්මාන්තකරුවන් රැක ගැනීම සඳහා අපි මැදිහත් වෙලා ඉන්නවා. ජාතික ණය සුරැකුම් මධ්‍යස්ථානය හදන කොට විපක්ෂයේ අය අපට හිනා වුණා, ඇප නැතිව ණය දෙන්න බැහැ කියලා. අන්න, අපි එම ආයතනය හදලා තිබෙනවා. අපි ගිය අවුරුද්දේත් ඇප නැතිව ඒකෙන් ණය දුන්නා; මේ අවුරුද්දේත් ඇප නැතිව ණය දෙනවා. තිබුණාටත් වඩා හොඳ රටක් අපි නිර්මාණය කරනවාය කියන පණිවුඩය ලබා දෙමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.11]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று விவாதிக்கப்படுகின்ற பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின் கீழ் பல விடயங்கள் உள்ளன. விசேடமாக, இதன்மூலம் அத்தியாவசியத் தேவைகளை நிறைவேற்றும் பொருட்டுச் சில ஏற்பாடுகள் கொண்டுவரப்பட்டாலும், இந்த அரசாங்கம் ஆட்சிக்கு வர முன்பு, "நாங்கள் ஆட்சிக்கு வந்தால் முதலில் பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்குவோம், பயங்கரவாதத் தடைச் சட்டத்திற்கு நிகரான எந்தச் சட்டத்தையும் கொண்டுவர மாட்டோம்" என்று சொன்னது. ஆனால், இன்றும் இந்தப் பயங்கரவாதத் தடைச் சட்டம் என்பது தொடர்ச்சியாக அமுல்படுத்தப்படுகின்ற ஒன்றாக இருக்கின்றது. இந்தச் சட்டத்தின்மூலம் மனித உரிமைகள் மீறப்படுவதற்கான அதிக வாய்ப்பு இருக்கின்றது. அதுமட்டுமல்ல, இதன்கீழ் மக்களுக்கான நீதி, நியாயம் மறுக்கப்படுகின்ற ஒரு சூழ்நிலை காணப்படுகின்றது.

அண்மையில் 'தித்வா' புயலின் காரணமாக ஏற்பட்ட அனர்த்தத்தைச் சீர்செய்வதற்காகக்கூட ஏனைய சட்டங்களுடன் இந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்தையும் அமுல்படுத்துகின்ற துர்ப்பாக்கிய நிலை ஏற்பட்டிருந்தது. இந்த அனர்த்தத்திற்காக இதனைக் கொண்டுவர வேண்டுமா? என்ற கேள்வியை எழுப்ப வேண்டிய ஒரு நிலை எங்களுக்கு இருக்கின்றது. இதற்காக இவற்றைக் கொண்டுவர வேண்டிய அவசியம் இல்லை. ஏனென்றால், இந்த ஏற்பாடுகளைக் கொண்டுவந்துவிட்டு, இதனை வைத்து ஏனைய விடயங்களை நீங்கள் கையாளக்கூடிய ஒரு சூழ்நிலை காணப்படும். எமது மக்கள் ஒரு நீதிக்காக, நியாயத்துக்காகப் போராடுகின்றபோது இந்த ஏற்பாடுகள் அவர்களின் நியாயமான கோரிக்கைகளை மறுக்கின்ற செயற்பாட்டுக்கு உதவுவதாக அமையும். ஆகையால், இந்த அனர்த்தத்திற்காக இந்தச் சட்டத்தின் ஏற்பாடுகளை இந்த வேளையிலே கொண்டு வரவேண்டிய அவசியம் இல்லையென்றுதான் நாங்கள் கருதுகின்றோம். ஏனென்றால், இப்பொழுது அனர்த்த மீட்புச் செயற்பாடுகள் இறுதிக் கட்டத்திலே இருக்கின்றது. அதாவது, நிவாரணங்களை வழங்குகின்ற, அல்லது அழிவுகளைப் புனரமைக்கின்ற செயற்பாட்டிலே அரசாங்கம் ஈடுபட்டிருக்கின்ற இந்த நிலையிலே இந்தச் சட்ட ஏற்பாடுகளைக் கொண்டுவர வேண்டிய அவசியமில்லை யென்றுதான் நான் கருதுகின்றேன்.

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

விசேடமாக, எதிர்க்கட்சித் தலைவர் சஜித் பிரேமதாஸ அவர்கள் ஒரு விடயத்தைச் சொல்லியிருந்தார். "பௌத்தத்திற்கு முன்னுரிமை வழங்கப்படுகின்ற எமது நாட்டில் பௌத்த தேரர்கள் - பிக்குகள் இந்தச் சட்டத்தினாலே அடக்கப்பட்டிருக்கிறார்கள்" என்று அவர் கூறினார். நான் இந்த வேளையிலே அவரிடம் ஒரு விடயத்தைக் கேட்க விரும்புகின்றேன். இந்த நாட்டிலே பௌத்த தேரர்களுக்கு மட்டும்தானா பிரச்சினை இருக்கின்றது? ஏனைய மதத்தவர்களை ஏன் நீங்கள் சமத்துவமாகப் பார்க்கவில்லை? இந்த நாட்டிலே தேரர்களுக்கு ஒரு நீதி, இந்துமத குருமாருக்கும் கிறிஸ்தவப் பாதிரிமாருக்கும் முஸ்லிம் மௌலவிமாருக்கும் வேறு நீதியா? என்று கேட்க விரும்புகின்றேன். சஜித் பிரேமதாஸ அவர்கள், "பௌத்தத்திற்கு முன்னுரிமை கொடுக்க வேண்டும். தேரர்களைப் பாதுகாக்க வேண்டும்" என்று குறிப்பிடுகின்றார். இந்த நாட்டிலே தேரர்கள் பிழை செய்தாலும் அவர்களுக்குத் தண்டனையில்லை என்று அவர் கருதுகின்றார். இதை நாங்கள் வேடிக்கையான ஒரு விடயமாகவே பார்க்கின்றோம். எதிர்க்கட்சித் தலைவரின் இந்தக் கருத்தை நாங்கள் ஏற்றுக்கொள்ள முடியாது. உண்மையில் இந்த அரசு நல்ல பல விடயங்களைச் செய்திருக்கின்றது. குறிப்பாக, போதைப்பொருளைக் கட்டுப்படுத்துவதில், இலஞ்சம், ஊழல்களைக் கட்டுப்படுத்துவதில் பாரிய முன்னெடுப்புகளை மேற்கொண்டிருக்கின்றது. அந்த வகையில், இந்த அரசை நாங்கள் பாராட்ட வேண்டும். ஆனால், இந்தப் பயங்கரவாதத் தடுப்புச் சட்டம் என்பது, எங்களது நாட்டுக்கும் எங்களது மக்களுக்கும் அநீதியை இழைக்கின்ற ஒரு சட்டமாக இருக்கின்றது. இதனை நீக்குவதற்குவதற்கான அனைத்து வழிகளையும் நீங்கள் மேற்கொள்ள வேண்டும்.

அடுத்ததாக, பொதுமக்கள் பாதுகாப்பு அமைச்சுடன் தொடர்பான ஒரு விடயத்தைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்; அது, கடவுச்சீட்டு விநியோகத்தில் ஏற்படும் பாரிய காலதாமதம். எமது நாட்டிலிருந்து புலம்பெயர்ந்து வாழுகின்ற மக்கள், தங்களது உழைப்புக்காக வெவ்வேறு நாடுகளில் வேலை செய்கின்றார்கள்; வெவ்வேறு நாடுகளில் வாழ்கின்றார்கள். அவர்களின் கடவுச்சீட்டுகள் காலாவதியாகும்போது அதனைப் புதுப்பிப்பதற்காக எந்தெந்த நாடுகளில் இருக்கின்றார்களோ, அந்த நாடுகளில் உள்ள இலங்கைக்கான தூதுவராலயங்களின் ஊடாக விண்ணப்பிக்கின்றார்கள். ஆனால், அந்தத் தூதுவராலயங்கள் உரிய நேரத்தில் அந்த விடயங்களைக் கையாள்வதில்லை. கடவுச்சீட்டினைப் புதுப்பித்தல் அல்லது காலத்தை நீடித்தல் போன்ற விடயங்களுக்காக விண்ணப்பித்து ஒரு வருடம், இரண்டு வருடம் ஆகியும்கூட அவை நிறைவேற்றப்படுவதில்லை. இது உண்மையாக பாரதூரமானதொரு பாதிப்பாகக் காணப்படுகின்றது. வெளிநாடுகளில் வாழும் நபர்கள், மரண வீட்டுக்கோ அல்லது கல்வி ரீதியான நடவடிக்கைக்காகவோ அல்லது வேறு அவசிய தேவை கருதி நாட்டுக்கு வருவதற்கோ அல்லது visaஐ புதுப்பிப்பதற்கோ முடியாதாவொரு துர்ப்பாக்கிய நிலையில் இருக்கின்றார்கள். இந்த நிலை ஏன்? விண்ணப்பித்து ஒரு வருடம், இரண்டு வருடங்களாகியும்கூட அது கிடைக்காதவர்கள் இருக்கின்றார்கள். இதனால் புலம்பெயர்ந்து வாழுகின்ற எங்களுடைய உறவுகள் மிகவும் கஷ்டமான சூழ்நிலைக்குள் தள்ளப்பட்டிருக்கின்றார்கள். இதனை இந்த அரசு துரிதமாகக் கையாள வேண்டும். ஏனென்றால், அந்தத் தூதுவராலயங்களில்கூட மோசடியான பல விடயங்கள் நடைபெற்றுக் கொண்டிருக்கின்றன. கடவுச்சீட்டு உரிய நேரத்தில் புதுப்பித்தலுகாக இங்கு அனுப்பப்படுவதில்லை. ஆனால், அந்த விடயங்களை இடைத்தரகர்கள் கையாண்டு, சிலரிடம் ஆறு இலட்சம் - ஏழு இலட்சம் ரூபாய் பணத்தை வாங்கிவிட்டு, மோசடியில் ஈடுபடுவதை நாங்கள் காணக் கூடியதாக இருக்கின்றது.

ஆகவே, சரியானதொரு தரவுத்தளம் அமைக்கப்பட வேண்டும். உத்தியோகத்தர்களின் பொறுப்பற்ற நடத்தை காரணமாகவும் ஊழல் மற்றும் நிருவாகச் சீர்கேடு காரணமாகவும் கடவுச்சீட்டு விநியோகத்தில் ஏற்படும் காலதாமதத்தால் எமது மக்கள் பாரிய இழப்புகளைச் சந்திக்கின்றார்கள். எனவே, நவீன டிஜிட்டல் கண்காணிப்பு முறையை - ranking systemஐ - உருவாக்க வேண்டும். அது மட்டுமல்ல, இந்தத் தூதுவராலயத்திலே இடம்பெறுகின்ற விடயங்களைக் கண்காணிப்பதற்கான விசேட நடைமுறையைப் பின்பற்ற வேண்டும்; இழுபறிகளைத் தீர்க்க, துரிதப்படுத்தப்பட்ட பொறிமுறையை உருவாக்க வேண்டும் என்பதனை இந்த இடத்தில் குறிப்பாகக் கூற விரும்புகின்றேன். ஒரு நாட்டின் தூதரகம் என்பது அந்த நாட்டின் முகம்! அந்த முகம் இன்று ஊழலினாலும் அலட்சியத்தினாலும் கறைபடிந்து போயுள்ளது. எனவே, இந்த அரசு அந்த மக்களுக்கான அச்சேவையை மிகத் துரிதமாகவும் சரியாகவும் செய்ய வேண்டும் என்று இந்த இடத்திலே குறிப்பாகக் கூறுகின்றேன்.

தற்பொழுது அம்பாறை மாவட்டத்திலே திருக்கோவில், ஆலையடிவேம்பு போன்ற பிரதேசங்களிலே நெல் அறுவடை நடைபெற்றுக் கொண்டிருக்கின்றது. அந்த விவசாயிகள் மிகவும் கஷ்டப்பட்டு தங்களது நெல்லை அறுவடை செய்திருக்கின்றார்கள்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
Give me one more minute, please.

ஆனால், அதனை விநியோகிப்பதற்கோ அல்லது அதனை விற்பனை செய்வதற்கோ ஒழுங்கான களஞ்சியசாலை வசதிகளோ அல்லது அந்த நெல்லைக் கொள்வனவு செய்வதற்கான சரியானதொரு விலை நிர்ணயமோ இல்லாத மிகவும் துர்ப்பாக்கிய நிலைக்குள் விவசாயிகள் தள்ளப்பட்டிருக்கின்றார்கள். அத்துடன், அண்மையில் ஏற்பட்ட 'தித்வா' புயல் அனர்த்தத்தினால் இந்த விவசாயிகளுடைய விளைச்சல் குறைவடைந்திருக்கின்றது. கிடைக்கப்பெற்ற கொஞ்ச விளைச்சலையும்கூட சரியான விலைக்கு விற்க முடியாத ஒரு துர்ப்பாக்கிய நிலை காணப்படுகின்றது. இதனால் அந்த விவசாயிகள் மிகவும் நட்டமடைந்திருக்கின்றார்கள். இந்தப் பிரச்சினை தொடர்ச்சியாக இந்த அரசின் காலத்திலும் நீடித்து வருகின்றது. எனவே, இந்த அரசு இதனைக் கவனத்தில் எடுத்து, நெல்லுக்கான சரியான, நீதியான, நியாயமான விலையை நிர்ணயித்து, உடனடியாக அந்த விவசாயிகளுடைய நெல்லைக் கொள்வனவு செய்ய நடவடிக்கை எடுக்க வேண்டும் என்று கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.21]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද විවාදය පැවැත්වෙන්නේ හදිසි අවස්ථා රෙගුලාසි දීර්ඝ කිරීම සඳහායි. මේ විවාදයේදී විපක්ෂය පැහැදිලි කළා එතුමන්ලාගේ ස්ථාවරය. ඒ ස්ථාවරය තමයි එතුමන්ලා හදිසි අවස්ථා රෙගුලාසි දීර්ඝ කිරීමට විරුද්ධයි කියන එක. ඒ දීර්ඝ කිරීමට විරුද්ධ නම්, දීර්ඝ කිරීමට විරුද්ධ කරුණු කාරණා මේ සභා ගර්භය ඇතුළේ කියන්න ඕනෑ. හැබැයි, මට හිතෙනවා එහෙම විරුද්ධ වෙන්න එතුමන්ලාගේ හෘදය සාක්ෂිය ඇතුළේ බල කිරීමක් ඇති කියලා. මොකද, ඉතිහාසය තුළ අපි හදිසි අවස්ථා රෙගුලාසි හඳුනා ගන්නේම ප්‍රජාතන්ත්‍ර විරෝධී විධියට, මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ලෙස. ඉතිහාසය තුළ අපි මේක තේරුම් අරගෙන තිබෙන්නේ එහෙමයි.

මම නීති පීඨයේ සිටියදී එවකට නීතිපති සුනිල් ද සිල්වා මහතා හදිසි අවස්ථා රෙගුලාසි විස්තර කළේ මෙන්න මේ විධියටයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඔහු කියන්නේ, හදිසි අවස්ථා රෙගුලාසි තිබෙන වෙලාවක පයිප්ප බාස් කෙනෙක් පයිප්ප බටයක් අරගෙන පාරට ආවොත් එය ගිනි අවියක් කියලා ඔහු සම්බන්ධයෙන් ක්‍රියා කරන්න, ඔහුට වෙඩි තියන්න සාම නිලධාරියෙකුට පුළුවන් කියලායි. ඉතිහාසය තුළ එහෙම වෙලා තිබෙනවා. පයිප්ප බාස් උන්නැහේලා මාරු කර ගත්ත ඉතිහාසයක් ඔවුන්ට තිබෙනවා, ප්‍රජාතන්ත්‍ර විරෝධී විධියට.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම එක ප්‍රශ්නයක් අහනවා. විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ කථිකයන් කිහිපදෙනෙකුම මේ වෙනකොට කථා කරලා තිබෙනවා. ජනාධිපතිවරයා මේ හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කරලා තිබෙන්නේ "දිට්වා" සුළි කුණාටුවට අදාළව සහන සලසන්නයි. අපි ඒ නිශ්චිත අරමුණට පමණයි හදිසි අවස්ථා රෙගුලාසිය උපයෝගී කරගෙන තිබෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එයින් පරිබාහිර වූ එක දෙයක්, එක උදාහරණයක් මේ දක්වා විපක්ෂය කියා නැත. එහෙම නම් ඔවුන් විරුද්ධ වන්නේ ඇයි? අපට තව පොඩි සහන කාලයක් අවශ්‍යයි, අත්‍යවශ්‍ය කොමසාරිස්වරයාට අවශ්‍ය මැදිහත්වීමේ පහසුව තකා. කොළඹ නොවෙන්න පුළුවන්. නමුත් ඔහුට මැදිහත්වීමේ පහසුව තකා ජනාධිපතිවරයා මේ වරම ඉල්ලනවා. අපේ ජනාධිපතිවරයාත් එක්ක අපට ඕනෑ දෙයක් කථා බහ කර ගන්න පුළුවන්. හැබැයි කලින් කොහොමද තර්ක ගෙනාවේ? That is President's mandate, ඒක ජනාධිපතිවරයාගේ mandate එක, අපට ප්‍රශ්න කරන්න, කථා කරන්න බැහැ කියලායි. අපි දන්නවා නේ මෙගොල්ලන්ගේ හැටි, ඒ දවස්වල. හැබැයි, මේ "දිට්වා" සුළි කුණාටුව සම්බන්ධ කාරණාවට අදාළව අපට තව කාලයක් අවශ්‍යයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ වෙනුවෙන් තමයි අපි මේ විවාදය ගෙනැල්ලා අවස්ථාවක් ඉල්ලා සිටින්නේ.

අද දවස මේ පාර්ලිමේන්තුවේ එක්තරා ඓතිහාසික දවසක් බව මම මතක් කරන්න කැමැතියි. මොකද, අපේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය බලගැන් වුණු දවසක්. ඇයි ඒ? අපි ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියලා තිබෙනවා, "පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වසර 5කින් පසුව ලබා දෙන විශ්‍රාම වැටුප අහෝසි කරනු ලැබේ" කියලා. ඒකට අදාළ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව අද ඇවිල්ලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවෙන් මොකක්ද කියන්නේ? අපි ඒකට ජන වරමක් අපේක්ෂා කරලා තිබෙනවා. ඒ ජනවරම ඇතුළේ අපි කියපු දේ අද ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගෙන තිබෙනවා. මම මේ රටේ ජනතාවගේ පහසුව හා දැනගැනීම තකා ඒ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙන් උපුටන දෙකක් ඉදිරිපත් කරන්නම්. ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්කරුවන් පස්දෙනෙකු ගියා. ගිහිල්ලා කිව්වා, විරුද්ධවාදීන්ගෙන් පළිගන්න තමයි මේ හදන්නේ කියලා. මොකක්ද ශ්‍රේෂ්ඨාධිකරණය කියන්නේ? මෙන්න අහගන්න, I quote:

> "The Petitioners sought to argue that the Government has arbitrarily brought this piece of legislation to punish its opponents."

"Punish its opponents"; විරුද්ධවාදීන්ට දඬුවම් කරන්න. Supreme Court එකෙන් - ගරු අග්‍ර විනිශ්චයකාරතුමා - මොකක්ද කියන්නේ?

> "However, as pointed out by the learned Additional Solicitor General, we observe that the impugned legislative initiative is not arbitrary..."

ඒක එහෙම එකක් නොවෙයි කියනවා. එහි තවදුරටත් මෙසේ කියනවා:

> "...but is rooted in a clear electoral mandate conferred upon the present Government by the people at the Presidential Election and the General Election."

ජනාධිපතිවරණයේදී සහ මහ මැතිවරණයේදී පැතු ජනවරම අනුව තමයි මේ කියන්නේ, ඒක නීතියක් විය යුතුයි කියලා. ශ්‍රේෂ්ඨාධිකරණයත් ඒකම තහවුරු කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍ර විනිශ්චයකාරතුමා මෙසේ කියනවා:

> "Thus, it is clear that the people of this country have given a mandate to the present Government to repeal the Parliamentary Pensions Law No. 1 of 1977. It is on that mandate from the people..."

ජන වරමෙන් ආපු එක, නීතියක් බවට පත් කරන්න කියලා කියා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයත් කියනවා, "ඔව් ඒක අපි පිළිගන්නවා" කියලා. පිළිගන්නවා විතරක් නොවෙයි, එහි සඳහන් කර තිබෙන කාරණාවත් කියන්නම්. එහි මෙසේ සඳහන් වනවා:

> "For the above reasons, we hold that no provision in the Bill titled 'Parliamentary pensions (Repeal) Act No. ... of 2026' which was published in the Gazette on 29-12-2025 and was placed on the Order Paper of Parliament on 07-01-2026, is inconsistent with any provision of the Constitution. We are of the view that the Bill titled 'Parliamentary Pensions (Repeal) Act No. ... of 2026' can be enacted by Parliament with a simple majority."

මේ පාර්ලිමේන්තුවේ simple majority එකකින් එම පනත අයින් කරන්න පුළුවන් කියලා අද ගරු කථානායකතුමා විසින් මේ ගරු සභාවේදී ඒ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය ප්‍රකාශයට පත් කළා. ඒ නිසා අපි මේ රටේ මිනිස්සුන්ට කියනවා, අද දවස ජනවරමේ අභිලාෂය ඉෂ්ට කරපු දවසක් කියලා.

[ගරු නිතිඥ සුනිල් වටගල මහතා]

මම තව කාරණා දෙකක් කියන්නම්. ඊයේ මෙතැන වේට්ටියක් ඇඳගෙන, සාටකයක් දමාගෙන මාර විධියට බුද්ධාගම වෙනුවෙන් පෙනී හිටියා නේ කෙනෙක්. වේට්ටියක් ඇඳගෙන, සාටකයක් දමාගෙන කථා කරන්නේ බුද්ධාගම ගැන. තව කෙනෙක් මෙතැන, කථා කළා. දෙව්දත් තෙර බණ කිව්වාට පසුව තමයි මට මේ කථාව දැන් කියන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ අය දැන් මාර ප්‍රාඥයෝ. බුද්ධාගම වෙනුවෙන් පෙනී ඉන්නේ ඒගොල්ලන් තමයි. වේට්ටියයි, කරවටේ එකයි දැම්මාට පසුව ඒක තමයි බුද්ධාගම කියලා හිතන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මහ මැතිවරණයයි, ජනාධිපතිවරණයයි ඇතුළේ අපිට මොනවාද නොකිව්වේ? පන්සල්, බුද්ධාගම සම්බන්ධ කරලා විපක්ෂය පැත්තේ එහා කෙළවරේ ඉන්න අජිත් පෙරේරා මහත්තයා මොනවාද කිව්වේ? "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වෙනි ව්‍යවස්ථාව ඉවරයි. එයිද මේගොල්ලන් බලයට? එන්නේ නැහැ නේ. ඒක හින්දා ප්‍රශ්නයක් නැහැ" කිව්වා. අපි ආවොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වෙනි ව්‍යවස්ථාව - බුද්ධාගම - ඉවරයි කිව්වා. ඊට පසුව කැලණි නයි ගෙනාවා, විවිධ දේවල් උස්සාගෙන ආවා. සිල් ගන්න එපා කිව්වා. එවැනි දේවල් මෙතැනදී කිව්වා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? ඇත්තටම බුද්ධාගම සහ අනෙකුත් ආගම් රකින්නේ ඒගොල්ලන් නොවෙයි, ජාතික ජන බලවේගය විතරයි කියලා අද තහවුරු වෙලා තිබෙනවා. අද එය යථාර්ථයක් වෙලා තිබෙනවා. අද ප්‍රායෝගිකව දළ දා ප්‍රදර්ශනය කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ප්‍රායෝගිකව දැක්කා මිහින්තලේ හාමුදුරුවන්ට පෙරහැර පවත්වා ගන්න බැරිව හිටියා කියලා. මිහින්තලේ හාමුදුරුවෝ පෙරහැර පවත්වා ගන්න බැරිව ඉන්නකොට 2025 වර්ෂයේ - පසුගිය වර්ෂයේ - ජනාධිපතිවරයා මැදිහත් වෙලා තමයි ඒ පෙරහැර පැවැත්වූවේ. ජනාධිපතිවරයාට ප්‍රදානය කළා, "මහා මහේන්ද්‍ර ප්‍රසාදිනී" කියලා ගෞරව නාමයක්. ඒ විතරක් නොවෙයි. අපි නුවරඑළියේ වෙසක් උත්සවය පැවැත්වූවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ ජනාධිපතිවරයාත්, ඉන්දීය අග්‍රාමාත්‍යවරයාත් රාජ්‍ය තාන්ත්‍රිකව කථා කරලා අද ගංගාරාම පන්සලට සර්වඥ ධාතූන් වහන්සේලා වැඩම කරවලා තිබෙනවා. ඉතින්, අපි බුද්ධාගමට විරුද්ධව වැඩ කරපු එක සිද්ධියක් අපට කියන්නකෝ. අපට එක උදාහරණයක් කියන්නකෝ, අන්‍ය ආගම්වලට විරුද්ධව වැඩ කරපු. ඒ නිසා කවුද, දෙව්දත් තෙර කියලා හොඳට බලා ගන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අවසාන වශයෙන් තව කාරණයක් කියන්න තිබෙනවා. දැන් කෙනෙක් කැඳෙව්වා CID එකට. කාට සම්බන්ධයි කියලා ද? කෙහෙල්බද්දර පද්මෙට සම්බන්ධ ද, නැද්ද කියලා බලන්න CID එකට කැඳෙව්වා. කෙහෙල්බද්දර පද්මෙගේ පාතාලයට සම්බන්ධ කාරණාවලට සම්බන්ධ ද කියලා බලන්න නාමල් රාජපක්ෂව කැඳෙව්වා. ඊට පස්සේ දුවගෙන ඇවිල්ලා, ගිරවා වාගේ කිව්වේ මොකක්ද? "කන්ටේනර් 323ක්", "කන්ටේනර් 323ක්", "කන්ටේනර් 323ක්" කිව්වා. මොකක්ද, මේ කථාව? එතුමාගෙන් අහන්නේ පාතාලයට සම්බන්ධ ද කියලායි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කියපු ප්‍රකාශයකට මීට කලින් අවස්ථාවක - 2025 සැප්තැම්බර් 10වැනි දා - නාමල් රාජපක්ෂ මට එන්තරවාසියක් එවලා තිබුණා, එතුමා පාතාලයට සම්බන්ධයි කියලා මම ප්‍රකාශයක් කරලා තිබෙනවා කියලා. එතකොට මම හැරෙන තැපැලෙන් ඒ මාසයේ 22වන දා ලිපියක් යැව්වා, "පුළුවන් නම් නඩුවක් දාන්න, ඔබතුමා කොහොමද පාතාලයට සම්බන්ධ කියලා මම ඇවිල්ලා කරුණු කියන්නම්" කියලා. අන්න, ඊයේ පෙරේදා ගියා CID එකට. එතුමාගෙන් පැය 4කට ආසන්න කාලයක් ප්‍රශ්න කළා, කෙහෙල්බද්දර පද්මෙට සම්බන්ධ ද කියලා. ඉතින් 9 වන මාසයේ 10වෙනි දා එන්තරවාසි එවලා, අද 2026 පෙබරවාරි මාසය අවසන් වෙමින් යනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. නමුත් අද වෙනතුරු මට විරුද්ධව නඩුවක් දැම්මේ නැහැ, නාමල් රාජපක්ෂ. මම බලාගෙන ඉන්නේ. මම බලාගෙන ඉන්නේ එතුමා දිසා අධිකරණයේ නඩුවක් දානකම් ගරු මැතිනියනි. මගෙන් රුපියල් බිලියන 500ක් ඉල්ලලා නාමල් රාජපක්ෂ එන්තරවාසි එවලා තිබෙනවා. මම කියන්නේ විගහට නඩුවක් දාන්න. එතකොට CID පරීක්ෂණත් එක්කම මට මේ නඩුව ඔප්පු කර ගන්න පුළුවන්. පාතාලය එක්ක ලැග්ගේ, පාතාලයට කිරි පෙව්වේ, පාතාලයත් එක්ක ගිහිල්ලා මේ රට පාලනය කළේ කොහොමද කියන එකට රාජපක්ෂවරුන් තරම් කජ් ගහපු මිනිස්සු නැහැ. මේක පැහැදිලි කාරණාවක් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අවසාන වශයෙන් තව එක point එකක් තිබෙනවා, කියන්න. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් ලොකුවට සද්දයක් දානවා. මොකක්ද? මේ ආණ්ඩුව කුලී පනතක් ගෙනැල්ලා මාර ප්‍රශ්නයක් ඇති කරලා තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේ රටේ ජනතාවට ඇහෙන්න ඇත්ත කියන්න ඕනෑ. අපි ඉදිරිපත් කරලා තිබෙනවා එක්තරා පනත් කෙටුම්පතක්, පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත කියලා. එතකොට මොහොමඩ් අලි සබ්රි, විජයදාස රාජපක්ෂ එළියේ තප්පුලන්න පටන් ගත්තා. මම බැලුවා, මේ මොකද කියලා. මාර වැඩක් නේ මේක. හොයාගෙන, හොයාගෙන යනකොට මේ Bill එකම 2024දීත් මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. මේකම; මේ Bill එකම. මේ Bill එකම ඉදිරිපත් කරපු මිනිස්සු අද එළියේ තප්පුලනවා. ඇයි මේ? පටු පෞද්ගලික දේශපාලන වාසි වෙනුවෙන්. අලි සබ්රි මහත්මයා එවකට විදේශ කටයුතු ඇමති. එතුමා ඒ කැබිනට් එකේ හිටියා. අධිකරණ ඇමති විජයදාස රාජපක්ෂ. එතුමා තමයි මේ Bill එක ගෙනැල්ලා ඉදිරිපත් කළේ. එහෙම ඉදිරිපත් කරලා ඊයේ voice-cut එකක් දෙනවා, "අධිකරණ පද්ධතිය ඉවරයි. මාර වැඩක් වෙන්නේ, මාර සිද්ධියක් දැන් මේ වේගෙන යන්නේ" කියලා. හැබැයි, ඒ වෙලාවේ දැක්කේ නැද්ද? 2023 කුලී පනතට සාපේක්ෂව තමයි එතුමා මේ සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම එක දෙයක් කියන්නම්. අලි සබ්රි මහත්මයා ෆේස්බුක් ගිණුමේ මොකක්ද කියලා තිබෙන්නේ? එතුමා කියලා තිබෙනවා, එතුමා ඒ වෙලාවේ කැබිනට් එකේ හිටියේ නැහැ කියලා. ඒ Bill එක ගෙනෙන වෙලාවේ කැබිනට් එකේ හිටියේ නැහැ කියනවා. දැන් විජයදාස රාජපක්ෂ වෙන කථාවක් කියනවා. මේකට කියන්නේ මොන දේශපාලනය ද කියලා මම දන්නේ නැහැ. කියන්නකෝ, මේකට හොඳ වචනයක්. මොන දේශපාලනය ද මේකට කියන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ජන වරමට ගරු කරන රජයක්. අපේ පනත් කෙටුම්පත් දෙකකට යම් විරෝධයක් ආවා. විෂයභාර ඇමතිතුමිය වන අපේ සරෝජා පෝල්රාජ් මැතිනිය අද වනතුරු ඒ පනත් කෙටුම්පත ගෙනාවේ නැහැ. මේ පනත් කෙටුම්පතටත් විරෝධයක් ආවා. අපි මහජන අදහස් සඳහා ඒවා විවර කර තිබෙනවා. අන්න, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු! ඒවාට තමයි ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පනත් කෙටුම්පතේ Title එකේ තිබෙන එක විතරක් කියන්න මට තත්පර කිහිපයක් ලබා දෙන්න. මම මේක මේ රටේ ජනතාවට ඇහෙන්න කියන්න ඕනෑ. මෙහෙමයි තිබෙන්නේ.

"පොදු නීතිය යටතේ හෝ කුලී නීතිය යටතේ කුලී නිවැසියකු නෙරපා හැරීම සඳහා හෝ බදු නීතිය යටතේ ලබා දී ඇති පරිශ්‍රයේ සන්තකය නැවත ලබා ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට බදු හිමියාට ඇති අවස්ථා මේ පනත් කෙටුම්පත මඟින් වළක්වනු නොලැබේ."

ඔන්න, Title එකේ තිබෙන කථාව. හැබැයි, මේකට විකෘති කථාවක් ඒගොල්ලන් එළියේ කියනවා. අපි මේ පනත් කෙටුම්පත දැනට යටපත් කර තිබෙනවා. අනෙකුත් නීතිමය කාරණා පදනම් කරගෙන තමයි අපි ඒ පනත් කෙටුම්පත ඉදිරියේදී ඉදිරිපත් කරනවාද නැද්ද කියන කාරණාව තීරණය කරන්නේ. ඒ නිසා බංකොලොත් විපක්ෂයට අපි කියනවා, තර්ක ගෙනෙනවා නම් ගෙනෙන්න. යමක් උල්ලංඝනය කර තිබෙනවා නම් විතරක් මේ පාර්ලිමේන්තුවේ කරුණු කියන්න. අද විපක්ෂයට ඇඬෙන දවසක්, අද විපක්ෂයට කට උත්තර නැති දවසක්. අද තමයි විපක්ෂය මේ ගරු සභාවේ ඇන ගත්තේ කියන එක මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.38]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හදිසි නීතිය දීර්ඝ කිරීමේ යෝජනා සම්මතය පිළිබඳව මට පෙර කථා කළ මන්ත්‍රීතුමාත් ඇතුළුව මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් දැනට කථා කර තිබෙනවා. පීඩාවට පත් ජනතාවට යථා සේවය ලබා දීම සඳහා හදිසි ආපදා රෙගුලාසි පැනවීම පිළිබඳවත්, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයකු පත් කිරීම පිළිබඳවත් වූ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් අපි මේ හදිසි තත්ත්වය තවත් දීර්ඝ කිරීමට අවශ්‍ය වන බව කියා සිටියා. නමුත්, ආපදා කළමනාකරණ පනත යටතේ ආපදා තත්ත්වයක් ප්‍රකාශයට පත් කළා නම්, පනතේ 10වන, 11වන, 12වන වගන්ති යටතේ, මේ වාගේම අවශ්‍ය දේවල් කිරීමට ඉඩකඩ තිබෙන බව අපි කලින්ුත් අවධාරණය කළා. මොකද, හදිසි තත්ත්වයක් - emergency situation එකක් - ප්‍රකාශයට පත් කිරීමේදී මේ රෙගුලාසි අවභාවිත කිරීමෙන් වැළකී සිටීම සඳහා තමයි ආපදා කළමනාකරණ පනත යටතේ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරමින් අවශ්‍ය කටයුතු එලෙසම කිරීම සඳහා විධිවිධාන යොදා තිබෙන්නේ. නමුත්, ඒවා පාවිච්චි නොකර හදිසි නීතිය පැනවීමෙන් විවිධාකාරයේ මර්දන සිදු වීමට හැකි බව අපි අවධාරණය කළා. හදිසි නීතිය පනවලා අවශ්‍ය පරිදි මේ සේවා ලබා දීම සඳහා, එහෙම නැත්නම් හානියට පත් වූ ජනතාව පීඩාවෙන් ගලවා ගැනීම සඳහා කටයුතු කිරීමට තමයි අපි මේවා ඔක්කොම කරලා තිබෙන්නේ කියලා කොච්චර පුරසාරම් දෙඩෙව්වත්, සාමාන්‍ය නීතිය යටතේ කළ යුතු දේවල් පවා හදිසි නීතිය තියාගෙනත් නොකෙරෙන තත්ත්වයක් තිබෙන බව මම පෙන්නුම් කරන්න උත්සාහ කරනවා.

විශේෂයෙන්ම එක සිද්ධියක් මම උදාහරණයකට ගන්නම්. මේ ප්‍රදේශවාසී ජනතාව දෙසැම්බර් මාසයේ 05වැනි දා ජනාධිපතිතුමාට ලියුමක් ලියලා තිබෙනවා. මේ ලියුම ලියා තිබෙන්නේ, ජීවිත හා දේපළවලට තර්ජන සිදු කරනු ලැබූ ගල් කොරියක් නවතා ගැනීම සඳහා සහාය ඉල්ලීමක් විධියටයි. මේ ගල් කොරිය තිබීම හේතුවෙන් උරුලැවත්ත සිට ඉළුක්වත්ත දක්වා මාර්ගය සම්පූර්ණයෙන්ම ගිලා බැහැලා තිබෙනවා. කිරිවවුල වසමේත් ගල් වළක් තිබෙනවා. උරුලැවත්ත, අලදුවක වසම තිබෙන්නේ උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ. මොණරකන්ද සහ සින්දුරන්කන්ද කියන කඳු දෙක පාමුල විශාල ගල්වළවල් දෙකක් තිබෙනවා. ඒවා ක්‍රියාත්මක වෙමින් පවතින නිසා මේ ගම්වාසීන්ට විශාල හානි සිදු වෙලා තිබෙනවා. ගෙවල් තිබුණු තැන් සම්පූර්ණයෙන්ම නාය ගිහිල්ලා තිබෙනවා. අවතැන් වීම නිසා දැන් ඔවුන් වෙනත් තැන්වලට ගිහිල්ලා තිබෙනවා. ගෙවල් විතරක් නොවෙයි, ගස් කොළන්, ඇළ, දොළ වාගේ හැම දෙයක්ම විනාශ වන තත්ත්වයක් දැන් උදා වෙලා තිබෙනවා. මෙහෙම තිබියදීත් වගකිවයුතු නිලධාරින් කවුරුවත් ඒ පළාතට ගිහිල්ලාවත් නැහැ. විශේෂයෙන්ම එතැන පෞරාණික විහාරයක් තිබෙනවා, පොත්ගුල් රජමහා විහාරය කියලා. ඒ විහාරයට යන මාර්ගය පවා සම්පූර්ණයෙන්ම ගිලා බැහැලා. කවුරුවත් ඒ පිළිබඳව තවම අවධානය යොමු කරලා නැහැ. ඉතින් මේ පිළිබඳවත් අවධානය යොමු කළ යුතු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගෙවල් 24ක් එතැනින් අයින් කළ යුතුයි කියන තත්ත්වයක් ඇති වෙලා ඒ මිනිස්සු දැන් ඒ ගෙවල්වලින් ඉවත් වෙලා ඉන්නවා. හතරදෙනෙක් ජීවිත පූජා කරලාත් තිබෙනවා. ගහුල්දෙණිය ප්‍රදේශයේ ජීවන් කියන 38 හැවිරිදි තරුණයෙක් සහ ඔහුගේ බිරිඳ, ළමයි දෙන්නෙක් ජීවිතක්ෂයට පත් වුණා. ඒ ගල්කොරිය ළඟ සම්පූර්ණයෙන්ම ගිලා බැහැලා ගේ උඩට ගල් වැටිලා සම්පූර්ණයෙන්ම විනාශ වෙලා. ඉතින් මේ සිදුවීමට පෙර 2016දී රම්මලක කියන ගම්මානයේ මේ වාගේම සිදුවීමක් වෙලා හයදෙනෙක් නැති වුණා. එහිදී මේ ගල්වළ ක්‍රියාත්මක කිරීම නවත්වාලමින් නියෝගයක් දී තිබුණා. දැන් ඒකත් ඉවතට දාලා තිබෙනවා. උඩුනුවර පළාතේ නිලධාරින්, විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම්, අනෙක් නිලධාරින්, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ මහත්වරුන් මේවාට අවසර දීම පිළිබඳව දැන් විශාල ප්‍රශ්නයක් මතුව තිබෙනවා. මේක සාමාන්‍ය ප්‍රශ්නයක් නොවෙයි. පොත්ගුල් විහාරයට වෙලා තිබෙන මේ හානිය බලන්න. ඒත් එක්කම දැන් මොනරකන්ද, සින්දුරන්කන්ද වැනි ප්‍රදේශවල තිබෙන ගල්කොරි ක්‍රියාත්මක කරන්න ඉඩ දෙන්නේ කොහොමද කියන ප්‍රශ්නයත් මතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද "Daily Mirror" පත්තරයේ ප්‍රධාන ශීර්ෂ පාඨයේ, "Sri Lanka still among the worst in the world to protect the environment?" කියා සඳහන් වෙලා තිබෙනවා. පරිසරය රැකීමේ ක්‍රියාවලියේදී ශ්‍රී ලංකාව ලෝකයෙන් ඉතා ම පහළ තැනක ඉන්න රටක් හැටියට ප්‍රකාශයට පත් වෙලා තිබෙනවා. ඉතින් පරිසරයට හානි කරන, ජීවිතවලට හානි කරන ගිලා බැසීම්වලට, නායයෑම්වලට තුඩු දෙන මෙවැනි ගල්කොරිවලට අවසර ලබා දීමේ ක්‍රියාදාමය පිළිබඳව සොයා බලන්න ඕනෑ. නමුත් තවමත් නිලධාරින් ඒ පැත්ත පළාතට ගිහිල්ලා නැහැ. මම යනතෙක් මන්ත්‍රීවරුන් කවුරුවත් ඒ ප්‍රදේශවලට ගිහිල්ලා තිබුණේත් නැහැ. ඉතින් ඒ වාගේ තත්ත්වයක් තිබියදී මේ හදිසි නීතිය පාවිච්චි කරගෙන තියා, සාමාන්‍ය නීතිය යටතේ කළ හැකි දේවල් පවා නොකර ඉන්න ආණ්ඩුවක් හැටියට මෙ ආණ්ඩුවට විවේචනයක් තිබෙනවාය කියන එකත් ඔබතුමන්ලා තේරුම් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ විතරක් නොවෙයි. මේ ප්‍රදේශයේ රමණීය උද්භිද උද්‍යානයක් නිර්මාණය කිරීම සඳහා LRC ඉඩමක් පාවිච්චි කරලා තිබෙනවා. ලංකාතිලක විහාරය, ඇම්බැක්කේ දේවාලය, ගඩලාදෙණිය විහාරය පෞරාණික වැදගත්කමකින් යුත් බෞද්ධ විහාරස්ථාන කිහිපයක් බව කවුරුත් දන්නවා. ලංකාතිලක, ඇම්බැක්ක, ගඩලාදෙණිය විහාර මැද තිබෙන පැරණි විහාරයක් වන පොත්ගුල් රජමහා

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

විහාරයට ඇතුළු වෙන්න බැරි තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා. ඒ පාර සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. මේවා ඔක්කෝටම වග කියන්න ඕනෑ, මේ ගල් වළ කරගෙන යන්න ඉඩ දුන් නිලධාරින්. නමුත්, ඒ නිලධාරින් දැන් ඒ පැත්ත පළාතටවත් ගිහිල්ලා නැහැ. ඒ විතරක් නොවෙයි. NBRI එකේ නිලධාරින් පවා තවමත් ඒ පැත්ත පළාතට ගිහිල්ලා නැහැ. ඒ පළාතේ ජනතාවට සිදු වූ අලාභය වෙනුවෙන් වන්දි ලබා ගැනීමට තිබෙන අවස්ථා පිළිබඳව තවම නිශ්චිත තත්ත්වයක්, කිසිම පැහැදීමක් නැති තත්ත්වයක් තිබෙනවා. ඒ පිළිබඳවත් මම මේ සභාවේ අවධානය යොමු කරවනවා. ඒ පිළිබඳව මේ ප්‍රදේශවාසී ජනතාව ජනාධිපතිතුමාට ලබා දීලා තිබෙන සන්දේශයක් සහ ඊට අදාළ තවත් ලේඛන කිහිපයක් මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා. මේ වෙනුවෙන් යම් දෙයක් කරයි කියලා මම බලාපොරොත්තු වනවා.

ඒ වාගේම උඩුනුවර ප්‍රදේශයට යාබදව තිබෙන තවත් ප්‍රදේශයක් තමයි, කළුගමුව. කළුගමුව ප්‍රදේශයේ විශාල උද්ඝෝෂණයක් කරන්න මිනිස්සු ලැහැස්ති වුණා. ඒ පිළිබඳව දැනගත් සමහරු සන්දේශයක් රැගෙන ගිහිල්ලා ජනාධිපතිතුමාගේ ගමන් වාරයකදී එතුමාට බලහත්කාරයෙන්ම ලබා දුන්නාට පස්සේ එතැනට නිලධාරින් ආවා. ඔවුන් ඇවිල්ලා ලබා දීලා තිබෙන්නේ මීට කලින් ලබා දීපු report එකක පිටපතක්. ඒ කියන්නේ, නාය ගිය ප්‍රදේශයකට අදාළව කලින් ලබා දුන් report එකක්ම නැවත වාරයක් ලබා දීලා තිබෙනවා. නමුත් ඒ හානියට පත් වූ ගෙවල් පිළිබඳව තක්සේරුවක් කරලා නැහැ. ගඟට යාබදව තිබෙන ගෙවල් සම්පූර්ණයෙන්ම හානියට පත් වෙලා තිබෙනවා. අර්ධ හානි, පූර්ණ හානි වෙච්ච ගෙවල් ගැන කිසිම තක්සේරුවක් තවමත් කරලා නැහැ. ඒ පිළිබඳව ජනතාව උද්ඝෝෂණය කරන්න සැරසීමේදී තමයි සමහර නිලධාරින් ඒ පැත්තට යන්නේ. ඒ වාගේම තවම කවුරුවත් පරණ ඇල්පිටිය ප්‍රදේශයට -ඒ පැත්ත පළාතට- ගිහිල්ලා නැහැ. හදිසි නීතිය පාවිච්චි කරගෙන රජය මොකක්ද කරන්නේ? මේවාට හදිසි නීතිය අවශ්‍ය නැහැ. හදිසි නීතිය නැතුව සාමාන්‍ය නීතිය යටතේ කළ යුතු දේවල් පවා මේ ආණ්ඩුව නොකරන තත්ත්වයක් දකින්න තිබෙන බව මම අවධාරණය කරනවා.

නැඟෙනහිර පළාතේ තවත් ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම මාදැල් ධීවර කර්මාන්තය කරන ධීවරයන්ට මාදැල් කටයුතු කිරීමට අවශ්‍ය සේවකයන් සොයා ගැනීමේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරලා මාදැල් ව්‍යාපාරයේ යෙදෙන්න අවසරයක් ඉල්លුවාම ඒ පිළිබඳවත් හරි අවසරයක් නොලැබෙන තත්ත්වයක් තිබෙනවා. "දිට්වා" සුළි කුණාටුව නිසා මාදැල්වලට සිදු වූ හානිය පූරණය කිරීම සඳහා වන්දි ලබා දීමේදීත් කළ යුතු අවශ්‍ය කටයුතු පරක්කු වන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා කියලා මම අවධාරණය කර සිටිනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මේ වාගේ නොයෙකුත් ප්‍රශ්න අපි නැවත නැවත අවධාරණය කළත්, ඒවා පිළිබඳව රජය කටයුතු නොකිරීම ගැන අපේ අප්‍රසාදය පළ කරන අතර, මේ හදිසි නීතිය දීර්ඝ කිරීමේ ප්‍රයත්නය සම්පූර්ණයෙන්ම අවශ්‍ය නැති වැඩක්, ඒක ඉවත් කළ යුතුයි කියා පවසනවා. එම නිසා ඉදිරියටත් හදිසි නීතිය පැනවීම පිළිබඳව අපේ විරෝධය පාමින් මගේ කථාව සමාප්ත කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අරවින්ද සෙනරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.49]

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන්නේ හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳවයි. "දිට්වා" සුළි කුණාටුවත් සමඟ අපේ රටේ ඇති වෙච්ච ආපදා තත්ත්වය කළමනාකරණය කර ගැනීම සඳහා අපට විවිධ වූ ක්‍රියාමාර්ග, විවිධ වූ අණ පනත් පාවිච්චි කරන්න පුළුවන්කම තිබුණත්, මේ ඇති වෙච්ච ආපදා තත්ත්වය හොඳින්ම කළමනාකරණය කර ගැනීම සඳහා වඩාත් සුදුසු ක්‍රමය විධියට හදිසි නීතිය බලාත්මක කරමින්, ඒ යටතේ ජනතාවට උපරිම සේවාවක් සැලසීම සඳහා අවශ්‍ය ආයතන, නිලධාරින් ඒකාබද්ධ කර ගනිමින් ඒ කටයුත්ත සාර්ථක කර ගැනීම තමයි ආණ්ඩුව විධියට අපේ අරමුණ බවට පත් වුණේ.

හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයේදී ආණ්ඩුව විධියට, නැත්නම් ජනාධිපතිතුමා විධියට මේ ඉල්ලීම කරන්නේ, "දිට්වා" සුළි කුණාටුව නිසා ඇති වෙච්ච තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා පමණක්ය කියන කාරණය තමයි අපේ පැත්තෙන් අපට ඉදිරිපත් කරන්න පුළුවන්කම තිබෙන්නේ.

හැබැයි, විපක්ෂය ඒක විවිධ විධියට දකිනවා. හදිසි නීතිය කියන කාරණය විපක්ෂය ආණ්ඩු කරපු කාලයේ පාවිච්චි කරපු විධිය පිළිබඳව අපි ඉස්සරහ ඉඳගෙන ඉන්න මහත්වරු හොඳටම දන්නවා. මූලික අරමුණුවලට පිටින් ගිහිල්ලා, ප්‍රතිවාදී දේශපාලනය, නැත්නම් තමන්ට විරුද්ධ වෙච්ච දේශපාලනය, තමන්ට අභියෝග කරපු කණ්ඩායම්, දේශපාලන ව්‍යාපාර මර්දනය කිරීම සඳහා තමයි ඉතිහාසය පුරාම හදිසි නීතිය ඔය මහත්වරු පාවිච්චි කර තිබෙන්නේ. ප්‍රජාතන්ත්‍රවාදය ගැන, මානව හිමිකම් ගැන කථා කරන හැම මහත්තයාම ඒ අය බලය හොබවපු කාලයේ, මේ හදිසි නීතිය පාවිච්චි කරලා මිනිස්සුන්ට පාරේ බැහැලා නිදහසේ ගමන් කරන්න ඉඩ දුන්නේ නැතුව ආණ්ඩු කරපු අය. ගුරුවරු වේවා, රාජ්‍ය සේවකයන් වේවා, වෘත්තිකයන් වේවා, සාමාන්‍ය පුරවැසියන්, තරුණයන්, ශිෂ්‍යයන්, භික්ෂූන් වහන්සේලා ඇතුළු සියලුදෙනාම එදා තිබුණු ආණ්ඩුවලින් මොනවා හරි ඉල්ලීමක් කළා නම්, බලපෑමක් කළා නම්, ඒක යට කරලා පාගන්න පාවිච්චි කළේ මේ හදිසි නීතිය තමයි. එම නිසා ඒ මහත්වරු මේ හදිසි නීතියේ තිබෙන බැරෑරුම්කම හොඳටම

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දන්නවා. හැබැයි, රටේ ජනතාවටත්, විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ටත් අපි මේ දේ කියන්න ඕනෑ. හදිසි නීතිය කොතරම් භයානක වුණත්, ඒ භයානකකම ඉවත් කරලා ජනතාව වෙනුවෙන් ඉතාම සාධාරණව සේවා සැලසීම සඳහා පමණක් මේ අවස්ථාවේදී එය උපයෝගී කර ගන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒක තමයි අපේ ආණ්ඩුවේ තිබෙන වෙනස. එකම පනතක්, එකම නීතියක් එක කාලයකදී ජනතාව මර්දනය කරන්න යොදා ගන්නකොට, අපේ කාලයේදී අපි ඒක ජනතාවට සහන සලසන්න, සේවා සලසන්න යොදාගෙන තිබෙනවා. ඒක තමයි අපේ වෙනස. නමුත් විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායම අද උදේ ඉඳලාම මේකට එරෙහිව තර්කයක් ගොඩනඟන්න උත්සාහ කරනවා. හැබැයි, මේකට එරෙහිව සාධාරණ විවේචනයක් කරන්න ඔවුන් සමත් වුණේ නැහැ. ජනාධිපතිතුමා ඇතුළු අපේ ආණ්ඩුව ජනතාවාදී ආණ්ඩුවක් විධියට මේ හදිසි නීතිය ගෙනෙන්නේ සත්‍ය ලෙසම "දිට්වා" සුළි කුණාටුවෙන් අවතැන් වෙච්ච, ආපදාවට ලක් වෙච්ච ඒ ජනතාවට සාධාරණයක් කරන්නයි, ඔවුන්ගේ ජීවිත නඟාසිටුවීම සඳහායි කියන එක ජනතාව විශ්වාස කරමින් ඉන්නවා. අපි ඒ බව සහතික කරලා තිබෙනවා. අපි විපක්ෂයටත් කියනවා, මෙන්න මේක තමයි අපේ අරමුණ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුව කියන්නේ ලංකා ඉතිහාසයේ මෑත භාගයේදී ඇති වෙච්ච දැවැන්තම ඛේදවාචකයක්. මේ ආපදාවෙන් සිදු වුණු හානිය සහ බලපෑම තවම නිශ්චිත ලෙස අවසන් කරලා ඉලක්කමක් විධියට තක්සේරු කර ගන්න අපි අපොහොසත් වුණත්, දළ වශයෙන් ඇස්තමේන්තු කරලා රුපියල් බිලියන ගණනින් ඒ හානිය කොපමණද කියා විවිධ සංවිධාන කරුණු ඉදිරිපත් කරමින් තිබෙනවා. ඒ වාගේම, මේ හානිපූරණය අපි රටක් විධියට කළමනාකරණය කර ගනිමින් ඉක්මනින් කළ යුතු වෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී අපි මේ සියලු ආයතන කළමනාකරණය කරන්න ඕනෑ. මේ ව්‍යසනය නිසා කෘෂිකර්මය, වැව්, ඇළ වේලි, කුඩා කර්මාන්ත, කර්මාන්ත, පාසල්, පන්සල්, අනෙකුත් ආගමික ස්ථාන ඇතුළු සියලු ක්ෂේත්‍ර ආපදාවට සහ හානියට ලක් වෙලා තිබෙනවා. හානි නොවුණු ප්‍රදේශ මෙන්න මේවා කියලා කියන්න බැරි තරමට ඒ ප්‍රදේශ බරපතළ හානියකට, බරපතළ ආපදාවකට ලක් වෙලා තිබෙනවා. මේ තත්ත්වය කළමනාකරණය කරන්න නම් ආයතන විධියට රටේ සමස්ත අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සැලකිය යුතු ප්‍රමාණයක් මේ වෙනුවෙන් ඒකාබද්ධ කරන්න ඕනෑ. විශේෂයෙන්ම ඉඩම්, මිනින්දෝරු, වාරිමාර්ග, ආරක්ෂක, ආපදා කළමනාකරණ, ගොඩනැඟිලි පර්යේෂණ, භූ විද්‍යා, පොලීසිය, සෞඛ්‍ය, ආරක්ෂක අංශ ඇතුළු මේ සමස්ත ආයතන පද්ධතියම එකට එකතු කරන්න ඕනෑ. එහෙම සමස්ත ආයතන පද්ධතියම එකට එකතු කරලා සාමූහිකව පොදු අරමුණකට මෙහෙවා ගත්තොත් තමයි මේ "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වෙච්ච ආපදා තත්ත්වය තුරන් කරලා, අපට ජයග්‍රහණයෙන් කෙළවර කර ගන්න පුළුවන් වන්නේ. අපේ ආණ්ඩුවට එවැනි සැලැස්මක් තිබෙනවා. ඒ සඳහා තමයි අපි මේ හදිසි නීතිය දීර්ඝ කරලා, ඒකේ ඇතුළේ තිබෙන ප්‍රතිපාදන පාවිච්චියට ගන්නේ.

අද පැවැත්වෙන මේ විවාදයේදී මෙහි තිබෙන සාධනීය පැත්ත නොවෙයි විපක්ෂයට මතු කර ගන්න ඕනෑ වුණේ. එක මන්ත්‍රීවරයෙක් ලීසිං ගැන කිව්වා. ලීසිං හරියට ලබා දෙන්නේ නැහැ කියන එක තමයි මේ හදිසි නීතියත් එක්ක ගළපන්න හදන්නේ.

මීට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා මම හිතන විධියට කාලයක් කැබිනට් ඇමතිවරයකු ලෙසත් හිටියා. එතුමා ගල් කොරියක් ගැන කථා කළා. ඒ ගල් කොරිය ගැන පැහැදිලිවම සොයා බැලුවොත් ඒක ඒ මන්ත්‍රීතුමන්ලා අමාත්‍යාංශ දරපු කාලයේදී දීපු බලපත්‍රයක් අනුව කරන එකක් වෙන්න පුළුවන්. ඒ නිසා ප්‍රශ්නයක් තිබෙනවා. අපි මේ පිළිබඳව සාකච්ඡා කරමින් යනවා. මේ සියල්ල වෙනස් වෙන්න ඕනෑ. පරිසරය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කළා. අපේ රට පාලනය කරපු පාලකයෝ මේ රටේ පරිසර පද්ධතියට අවධානය යොමු කරලා නොවෙයි රට පාලනය කළේ, සංවර්ධන ව්‍යාපෘති ගෙනාවේ කියන එක අපි පිළිගන්නවා. එම නිසා අපි පරිසරය පැත්තෙන් මුහුණ දෙමින් තිබෙන ආපදාවක් තිබෙනවා. හැබැයි, ඒකේ වගඋත්තරකරුවෝ වර්තමාන ආණ්ඩුව නොවෙයි. ඒකේ වගඋත්තරකරුවෝ වෙන්නේ දැන් ඔය විපක්ෂයේ ඉන්න, එහෙම නැත්නම් ඒ කාලයේ ආණ්ඩු කරපු මහත්වරු. නමුත්, අද එතුමන්ලා ඇවිල්ලා අවුරුද්දයි මාස හතරක් වන අපේ ආණ්ඩුවට කියනවා, පරිසරය හානි වෙලා, ලෝකයේ රටවල් ගත්තාම ඉතා දූෂිතම පරිසර තත්ත්වයක් තමයි අපේ රටේ තිබෙන්නේ කියලා. එහෙම කියන මහත්වරු ඒවාට වග කියන්න ඕනෑ. අපි පරිසර හානිය තුරන් කිරීම සඳහාත් කටයුතු කරමින් ඉන්නවා. අපි මේ සියල්ල පිළිබඳව සැලසුම්සහගත මැදිහත්වීමක් කරමින් තමයි මේ ඇති වුණු තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා කටයුතු කරමින් සිටින්නේ. එම නිසා දැන් ඉතාම හොඳ තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙවැනි ආපදා තත්ත්වයක් ඇති වෙලා ඉක්මනින්ම ජන ජීවිත යථා තත්ත්වයට පත් කරපු රටක් තිබෙනවා නම් මම හිතන විධියට ඒ අපේ රටයි. ඒ, මෙන්න මේ "දිට්වා" සුළි කුණාටුව ඇති වෙච්ච අවස්ථාවයි. ලෝකයේ සමහර දියුණු රටවලට, ආර්ථික වශයෙන් හයිය තිබුණු රටවලට මේ වාගේ ආපදා ඉක්මනින්ම කළමනාකරණය කර ගන්න බැරි වුණා. හැබැයි, අපි මේ ආපදා තත්ත්වයෙන් හානියට පත් වුණු අපේ රට ඉක්මනින්ම යථා තත්ත්වයට පත් කළා. අද වනකොටත් ප්‍රශ්න තිබෙන්න පුළුවන්. වන්දි මුදල් ටික සියයට සියයක් දීලා, නිවාස ටික සියයට සියයක් හදලා, විනාශ වුණු කුඹුරු ටික සියයට සියයක් හදලා, විනාශ වුණු වැව් අමුණු ටික සියයට සියයක් හදලා හමාර කර ගන්න අපට තවම බැරි වුණා. ආපදා තත්ත්වය ඇති වෙලා තවම ගත වුණේ මාස තුනකට ආසන්න කාලයක්. හැබැයි, අපි "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට ලක් වුණු රටක් වුණාට, එහෙම දෙයක් වුණේ නැති ගාණට සාමාන්‍ය ජනතාවගේ ජීවිතය අද වනකොට යථා තත්ත්වයට පත් කරලා තිබෙනවා. ගම්පොළ ගත්තත්, නුවරඑළිය ගත්තත්, බදුල්ල ගත්තත්, හැම තැනකම ජනතාව අද වනකොට සාමාන්‍ය විධියට තමන්ගේ ජීවිතය ආරම්භ කරලා තිබෙනවා. අපි කියන්නේ නැහැ, මේ මාස තුන ඇතුළත අපි ඒ කටයුතු සියයට සියයක් කළා කියලා. හැබැයි, ආණ්ඩුවක් විධියට කළ හැකි උපරිම මැදිහත්වීම කරලා, තමන් රැක බලා ගන්න ආණ්ඩුවක් ඉන්නවා, තමන් රැක බලා ගන්න පාලකයෙක් ඉන්නවා කියන විශ්වාසයෙන් ජනතාවට ජීවත් වෙන්න පුළුවන් වටපිටාව අපි මේ ගත වුණු කාලය ඇතුළත නිර්මාණය කරලා තිබෙනවා. අද දවසේත් ගරු ජනාධිපතිතුමා ඒ සඳහා මැදිහත් වෙමින් සිටිනවා. ආණ්ඩුව සැලසුම් කරලා තිබෙනවා, ඉක්මනින්ම ඒ ජනතාව යථා තත්ත්වයට පත් කරන්න. විපක්ෂයට "දිට්වා" සුළි කුණාටුව පිළිබඳව කථා කරන්න තිබෙන කාලය අපි අවම කරනවා. අපි ඉක්මනින්ම මැදිහත් වෙලා ජනතාවගේ ප්‍රශ්න විසඳුවා නම්, ඔය මහත්වරුන්ට තව ප්‍රශ්නයක් අල්ලා ගන්න වෙනවා. ඔබතුමන්ලා දවසේ ප්‍රශ්නත් එක්කයි යන්නේ. "දිට්වා" සුළි කුණාටුව නිසා ඇති වෙච්ච තත්ත්වයේදී ජනතාව වෙනුවෙන් කිසිවක් නොකරපු මහත්වරු තමයි ඔය කයිවාරු ගහන්නේ. එම නිසා අපි ඔය මහත්වරුන්ට කියන්න කැමැතියි, වගකිව යුතු ආණ්ඩුවක් විධියට ඒ ආපදාවෙන් නැති වුණු ජීවිත හැර අනෙකුත් සියල්ල දෙන්න අප සියලු සැලසුම් හදමින් තිබෙන බව. එම නිසා මේ හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳව විපක්ෂය ගොඩනඟන තර්ක සම්පූර්ණයෙන්ම වැරදි සහ පරාජිත දේශපාලනඥයන්ගේ තර්ක බවට පත් වෙලා තිබෙනවා.

[ගරු අරවින්ද සෙනරත් මහතා]

මාධ්‍ය මර්දනය ගැන කථා කරනවා, මාධ්‍ය මර්දනය කරන්නම හදිසි නීති ගෙනාපු මහත්වරු. හදිසි නීතිය පාවිච්චි කරලා මාධ්‍ය ආයතන ගිනිබත් කරපු මහත්වරු අද ඇවිල්ලා මාධ්‍ය නිදහස පිළිබඳව කථා කරනවා. මාධ්‍ය නිදහස හොඳට හදාරපු, මාධ්‍ය නිදහසට හොඳට ගරු කරන, මාධ්‍ය නිදහස තමන්ගේ දේශපාලන ව්‍යාපාරයට සහ ජනතාවට ජයග්‍රහණ ගෙනැල්ලා දෙන්න පාවිච්චි කරපු දේශපාලන ව්‍යාපාරයක් තිබෙනවා නම් ඒක තමයි, ජාතික ජන බලවේගය. එම නිසා මාධ්‍ය නිදහස පිළිබඳව විපක්ෂයේ කයිවාරුවලට මේ රටේ ජනතාව සවන් දෙන්නේ නැහැ කියන පණිවුඩයත් මම කියන්න ඕනෑ. දවස පුරා බොරු කියමින් යන්නේ. උදේ 11 වෙනකල් show එකක් තිබෙනවා. Voice-cut එකක් දෙනවා. මේ, voice-cut විපක්ෂයක්. මාධ්‍ය ඉලක්ක කරලා කයිවාරු ගහන විපක්ෂයක් හැර ජනතාව වෙනුවෙන් පෙනී සිටින විපක්ෂයක් නොවෙයි. ආණ්ඩුවට විරුද්ධව එන්න. හැබැයි, අපි ඔය මහත්වරුන්ට කියනවා, මේ රටට විරුද්ධ වෙන්න එපා කියලා. විපක්ෂයේ මහත්වරුන්ට අපි කියනවා, රටට විරුද්ධ වෙන්න එපා කියලා. රටට විරුද්ධ වෙලා යන්න පුළුවන් තැනක නොවෙයි රට තිබෙන්නේ. ඒ නිසා විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ සියලුදෙනාට අපි කියනවා, ඔය ජනතා විරෝධී විපක්ෂයේ සතුරු දේශපාලනය අයින් කරන්න කියලා. මේ රට ඉල්ලා සිටින්නේ නව සියවසට ගැළපෙන ඒකාබද්ධ වූ, ඒකමතික, ජාතික අරමුණක් කරා යන දේශපාලනයක්. ඒ සඳහා අපි ආරාධනා කරනවා. ඒ වාගේම විපක්ෂයේ මඩ, අවලාද, බොරු සියල්ල ජනතාව ඉස්සරහ පරාජය කරන්න අපිත් සූදානම් කියන පණිවුඩය ලබා දෙමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (MRS.) SAGARIKA ATHAUDA took the Chair.*

[අ.භා. 2.00]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දවසේ හදිසි අවස්ථා රෙගුලාසි දීර්ඝ කිරීම පිළිබඳව විවාද කරන මොහොතේ, මට පෙර කථා කරපු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මීට පෙර පැවැති ආණ්ඩු හදිසි නීතිය පාවිච්චි කළේ ජනතාව මර්දනය කරන්නයි කියලා. ඒක එතුමන්ලාගේ තර්කය. නමුත් ඒක අපට ඒ විධියට පිළිගන්න බැහැ. හැබැයි, හදිසි නීතිය පාවිච්චි කරලා තමයි එදා පැවති ආණ්ඩුව තිස්වසරක කුරිරු ත්‍රස්තවාදී යුද්ධය නිමා කළේ. ඒ කුරිරු ත්‍රස්තවාදී යුද්ධය නිමා කරන්න එදා පාවිච්චි කළේ මේ හදිසි නීතිය. එදා මේ හදිසි නීතිය පාවිච්චි කරලා ජනතාව මර්දනය කළාය කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වාට, එදා ඒ අය ජනතාව මර්දනය කළේ තුවක්කුවේ නීතියෙන් කියන එක අමතක කරලායි අද කථා කරන්නේ. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඒ පිළිබඳව දීර්ඝව කථා කරන්න උත්සාහ ගන්නේ නැහැ.

අද ජනාධිපතිතුමා මහනුවර ප්‍රදේශයේ "දිට්වා" සුළි කුණාටුවෙන් අවතැන් වුණු අපේම ආදරණීය ජනතාවට වන්දි සඳහා චෙක්පත් ලබා දීමට සම්බන්ධ වෙලා තිබුණා. අපි දැක්කා, ජනාධිපතිතුමා මීට පෙර පූර්ව සූදානමකින් තොරව චෙක්පත් ලබා දීම තුළින් සිදු වුණු ගැටලුව. අපි මේ මොහොතේ විශ්වාස කරනවා, අද චෙක්පත් ලබා දීමේදී එවැනි ගැටලුවක් ඇති නොවෙයි කියලා; ජනතාව අපහසුතාවට පත් නොවෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සාමාන්‍ය නීතිය යටතේ කළ හැකි කාරණා ඉෂ්ට කරන්නවත් නොහැකි වුණු ඔබේ ආණ්ඩුව අද හදිසි නීතිය පාවිච්චි කරලා ඒවා ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳවත් අපට ප්‍රශ්නයක් තිබෙනවාය කියන එක මා මේ මොහොතේ සිහිපත් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය දවස්වල සංවර්ධන නිලධාරි මහත්ම මහත්මීන් මාරාන්තික උපවාසයක් කරපු නිසා දැන් ගුරු විභාගය පවත්වන්න සූදානම් කරලා තිබෙනවා. ඒ මාරාන්තික උපවාසය අතරතුරේදී හෝ එවැනි තීන්දුවක් ගැනීම පිළිබඳව අපි ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා. සංවර්ධන නිලධාරීන් ගුරු සේවයට බඳවා ගැනීමේ විභාගය සඳහා වන ගැසට් පත්‍රය නිකුත් කර තිබෙන වෙලාවේ මම සිහිපත් කරන්න ඕනෑ, එහි අඩුපාඩුකම් විශාල ප්‍රමාණයක් තිබෙන බව. ඒ පිළිබඳව මේ සභාව දැනුවත් කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ ගැසට් පත්‍රයට අනුව විභාගයට ඉල්ලුම් කිරීමට අවස්ථාව දුන්නත්, පුරවැසි අධ්‍යාපනය හෝ ප්‍රජා පාලනය යන විෂයයන් සඳහා අද ලංකාවේ කිසිම විශ්වවිද්‍යාලයකින් විශේෂවේදී උපාධියක් ලබා දෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමියනි, අපි ඒ පිළිබඳව සොයා බැලුවා. UGC එකෙන් තහවුරු කර ගත් තොරතුරු මත තමයි අපි මේ කථා කරන්නේ. ඒ උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීමේදී මේ විධියට නොමඟ යවන්නේ ඇයි කියන කාරණය අපි මේ මොහොතේ අහනවා. ඒ වාගේම ඉතා වැදගත් විෂයයක් සඳහා කොළඹ විශ්වවිද්‍යාලයෙන් උපාධියක් ලබා දෙනවා. ඒ තමයි, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ උපාධිය. මේ උපාධිය හදාරන අයට ලෝක දේශපාලනය, ගෝලීය ප්‍රවණතා, ලෝක ඉතිහාසය වාගේ වෙනත් විෂයයන් හැදෑරීමට හොඳ අවස්ථාවක් තිබෙනවා.

හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පුරවැසි අධ්‍යාපනය, දේශපාලන විද්‍යාව, ජාත්‍යන්තර සබඳතා උපාධිය හදාරණ අයට අයදුම් කරන්න පුළුවන්. ඒ වාගේම බොහෝ පළාත් සභා මේ උපාධි හදාරපු අයට ගුරු සේවයට එන්න අවස්ථාව දීලා තිබුණා. හැබැයි, දකුණු පළාත් සභාවේ ඒ අවස්ථාව තිබුණේ නැහැ. මෙවර ගැසට් පත්‍රයේ, කොළඹ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා විෂය හදාරපු අයට, කැලණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර අධ්‍යයනය හදාරපු උපාධිධාරින්ට ගුරු සේවයට එන්න අවස්ථාව ලබා දීලා නැහැ. ඒක විශාල ගැටලුවක්.

ඒ වාගේම පුරාවිද්‍යා උපාධිය ලැබූ අයට ශ්‍රී ලංකා ගුරු සේවයට ඇතුළත් වීමට අවස්ථාවක් මේ ගැසට් එක මඟින් ලබා දීලා නැහැ. විශේෂයෙන් ඉතිහාසය වැනි විෂයයක් පුරාවිද්‍යාව හදාරපු අයට උගන්වන්න පුළුවන්. පළාත් සභා ගුරු සේවයට බඳවා ගැනීමේදී ඒ ක්‍රමය අනුගමනය කරලා තිබෙනවා. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාත් ඒ සඳහා අවස්ථාව දෙන්න කියලා ලිපියකින් අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. නමුත් මේ ගැසට් පත්‍රය තුළ ඒ කාරණා අඩංගු කරලා නැහැ කියන කාරණය මම මේ සභාව හමුවේ තබනවා. අධ්‍යාපන ඇමතිතුමිය එවකට විශ්වවිද්‍යාල ආචාර්යතුමියක විධියට කටයුතු කළා. ඒ නිසා එතුමිය මේ ගැටලුව පිළිබඳ හොඳ අවබෝධයකින් කටයුතු කරයි කියලා විශ්වාස කරනවා. ඒ වාගේම ඒ ගැටලුව විසඳලා ඒ උපාධි හදාරපු අයට, අද ඒ අවස්ථාව නැති වෙච්ච කණ්ඩායමට ඒ අවස්ථාව ලබා දෙයි කියා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තවත් එක් ගැටලුවක් මම මේ මොහොතේ සභාව හමුවේ තබන්න කැමැතියි. පසුගිය කාලයේ රාජ්‍ය සේවය තුළ දේශීය සහ විදේශීය නිවාඩු ලබා ගැනීමට තිබූ චක්‍රලේඛය දැන් තහනම් කරලා තිබෙනවා. දේශීය හා විදේශීය නිවාඩු ගන්න තිබුණු අවස්ථාව නැති කළා. ඒ නැති කිරීම තුළ ඒ වනවිට රාජ්‍ය සේවයේ නිවාඩු අයදුම්කර තිබූ බොහෝ දෙනෙක් දැඩි අපහසුතාවට පත් වෙලා තිබෙනවා. ඒ චක්‍රලේඛය නිකුත් කළ අවස්ථාවේ මූලික අවශ්‍යතා සපුරාපු, නිවාඩු ඉල්ලුම් පත්‍ර දීපු, ඒ සඳහා වන අවශ්‍යතා සපුරාපු කණ්ඩායම අද අපහසුතාවට පත් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපි දන්නවා, රාජ්‍ය සේවකයෙක් නිවාඩුවක් ගන්නකොට, නිවාඩු ගන්න ඉල්ලුම්පත්‍රය භාර දෙනකොට ණය අරගෙන තිබුණා නම්, ඒ සියලු ණය ගෙවන්න ඕනෑ කියලා. මේ අය ලබා ගත්ත ණය විවිධාකාරයෙන් තවත් ණය අරගෙන ගෙවලා. ඒ නිසා අද ඔවුන් විශාල අර්බුද රාශියකට පත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ තුළින් ඔවුන් අද විශාල වශයෙන් අපහසුතාවට පත් වෙලා තිබෙනවා. නිවාඩු අයදුම් කරලා තිබුණත්, අද ඔවුන්ට පිළිතුරක් නැතිව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විදෙස් නිවාඩු ගත්ත සමහර රජයේ සේවකයන් අත්සන් කළ විදෙස් රැකියා ගිවිසුම් පවා මේ තුළින් අවලංගු වෙලා තිබෙනවා. විදෙස් නිවාඩු ගන්න ගිවිසුම්ගත වෙනකොට ඔවුන් ඒ සඳහා මුදල් වියදම් කරන්න ඕනෑ කියලා අපි දන්නවා. ඒ සඳහා මූලික සූදානමක් වෙන්න ඕනෑ. මේ චක්‍රලේඛය තුළින් අද විශාල පිරිසකට ඒ අවස්ථාව අහිමි වෙලා ඒ තුළින් ඔවුන්ට යම් යම් පීඩා තත්ත්ව ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, රාජ්‍ය සේවයේ දේශීය විදේශීය නිවාඩු ලබා ගැනීමේ චක්‍රලේඛය නිකුත් කිරීමේදී මූලික කටයුතු ආරම්භ කළ පිරිසට යම් අවස්ථාවක් ලබා දෙන්න කියලා. මොකද, ඔවුන් ඒ සඳහා විශාල වැයමක්, විශාල කටයුතු ප්‍රමාණයක් ඉෂ්ට කරලා විශාල අපහසුතාවකට පත් වෙලා තිබෙන නිසා. ඒ පිළිබඳවත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට 2025 සඳහා ප්‍රතිපාදන ලබා දෙනවා කියලා ආණ්ඩුව කිව්වා. 2026 සඳහාත් ප්‍රතිපාදන දෙනවා කිව්වා. අපි විශ්වාස කරනවා 2025දී කියපු බොරුව 2026දී කරන එකක් නැහැ, විපක්ෂයට ප්‍රතිපාදන දෙයි කියලා. පසුගිය අවුරුද්දේ ගාල්ල දිස්ත්‍රික්කයේ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හත්දෙනාට මන්ත්‍රී ප්‍රතිපාදන විධියට රුපියල් ලක්ෂ 70ක් ලැබුණා. මටත්, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාටත් ප්‍රතිපාදන ලැබුණේ නැහැ. හැබැයි, ඒ ප්‍රතිපාදන තුළත් ගැටලුවක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ ප්‍රතිපාදන තුළින් අද අවස්ථාව ලැබිලා නැහැ, විහාරස්ථානයකට උදවු කරන්න; දහම් පාසලකට උදව් කරන්න; ක්‍රීඩා සමාජයකට උදවු කරන්න; ග්‍රාම සංවර්ධන සමිතියකට උදවු කරන්න; පෙර පාසලකට උදව් කරන්න. මීට පෙර පාර්ලිමේන්තුවල කටයුතු කළ මන්ත්‍රීතුමන්ලාට තිබුණු ඒ වරප්‍රසාදය අද අහිමි කරලා තිබෙනවා. අපට මේ මන්ත්‍රී ප්‍රතිපාදන තුළින් ගමක පන්සලකට, කෝවිලකට, පල්ලියකට උදවු කරන්න බැරි නම්, අපේ ගමේ ක්‍රීඩා කරන දරුවෙකුට බැට් එකක්, බෝලයක් ලබා දෙන්න බැරි නම් මේ මන්ත්‍රී ප්‍රතිපාදන ලබා දීමේ තේරුමක් නැහැ කියලා මම විශ්වාස කරනවා. අපට පාරවල් හදන්න ඕනෑ නම් ඔබගේ ආණ්ඩුව හරහා, ප්‍රාදේශීය සභා හරහා, පළාත් සභා හරහා, වෙනත් උපමාන ශීර්ෂ හරහා කටයුතු කරන්න පුළුවන්. විමධ්‍යගත ප්‍රතිපාදන ලබා දීම පිළිබඳව අපි සතුටු වෙනවා. ඒක යථාර්ථයක් වෙයි කියා අපි විශ්වාස කරනවා. හැබැයි අවශ්‍යතා අනුව, ගමේ අවශ්‍යතා අනුව, අපේ ප්‍රදේශවල තිබෙන අඩුපාඩුකම් අනුව ඒ ලැබෙන ප්‍රතිපාදන යොමු කරන්න පුළුවන් වටපිටාවත් ගොඩනඟලා දෙන්න කියන ඉල්ලීමත් මේ මොහොතේ කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.09]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දවස අපේ රටේ ඉතිහාසය අලුතින් සාකච්ඡා වන දවසක්. ඉතිහාසය පුරා මේ රටේ පැවැති ආණ්ඩු හදිසි නීතිය පාවිච්චි කරපු ආකාරය ගැන හොඳට මතක තිබෙන විපක්ෂයේ මහත්වරු කල්පනා කරමින් ඉන්නවා, අපේ වර්තමාන ජනතාවාදී මහජන ආණ්ඩුවත් ඒ විධියටම හදිසි නීතිය පාවිච්චි කරාවි කියලා. Sorry! අපේ කථිකයෝ උදේ සිට අභියෝග කළා, පුළුවන් නම් මේ රටේ ජනතාවට එරෙහිව හදිසි නීතිය පාවිච්චි කරපු එක අවස්ථාවක් කියන්න කියලා. එකක්? එකක්? කිසිවක් නැහැ. මේ හදිසි නීතිය පැනෙව්වාට පසුවත් ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහා උද්ඝෝෂණ ගණනාවක් පැවැත්වුණා. ඒ වාගේම, තවත් විවිධ උද්ඝෝෂණ පැවැත්වුණා. ඒ කිසිවකදී ජනතාව මර්දනය කරන්න අපි හදිසි නීතිය පාවිච්චි කරලා නැහැ. මේ ආණ්ඩුව මාස දෙකක් වැනි කෙටි කාලයක් ඇතුළත මේ රටේ ඉතිහාසයේ සිද්ධ වෙච්ච දරුණුතම ස්වාභාවික ව්‍යසනය කළමනාකරණය කළා. ඉතිහාසයේත් නාය යෑම් සිදු වෙලා තිබෙනවා. නාය යෑම් අවස්ථා තුනක්, හතරක් තමයි අපේ රටේ තිබිලා තියෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ව්‍යසනයෙන් 1,400කට වඩා ස්ථාන නාය ගියා. අපි සමත් වෙලා තිබෙනවා, ඉතාම කෙටි කාලයක් තුළ ඒ ජනතාවගේ ජීවිත සාමාන්‍ය තත්ත්වයට පත්

[ගරු මහින්ද ජයසිංහ මහතා]

කරන්න; යථාවත් කරන්න. අපට තිබෙනවා, මේ රට යළි ගොඩනඟන්න. ඒකයි අපි මෙවර නිදහස් දිනයේත් නැවත නැඟිටින, ගොඩනඟන ශ්‍රී ලංකාවක් - Rebuilding Sri Lanka - වෙනුවෙන් මේ රටේ සියලු ජාතිකත්ව පෙළගස්වන්න කටයුතු කළේ. අද මේ ආණ්ඩුව එක පැත්තකින් රටේ ආර්ථිකය ස්ථාවර කරලා 2025 වසරේ හැම ආර්ථික දර්ශකයක්ම ඉහළට ඔසවා තිබෙනවා. විපක්ෂයට ඒ ගැන කිසි විවේචනයක්, නැහැ. ඒ ගැන කිසි කථාබහක් නැහැ. අපි ගමට සංවර්ධනය ගෙන යනවා. තවත් සංවර්ධන ව්‍යාපෘති දියත් කරමින් තිබෙනවා. අපි පසුගිය වසරේ බොහෝ තැන්වල අපේ සංවර්ධන වැඩවල භෞතික ප්‍රගතිය සියයට 100ක් අත්පත් කරගෙන තිබෙනවා. බොහෝ දිස්ත්‍රික්කවල සියයට 90කට එහා මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ විධියට රටේ සංවර්ධනය ගමට යමින් තිබෙනවා.

අද මේ රටේ ජාතිවාදය අවුස්සන්න උතුරේ සහ නැඟෙනහිර ඉතා සුළු පිරිසකුත්, දකුණේ තව සමහරෙකුත් උත්සාහ කරනවා. හැබැයි අද රටේ ජාතිවාදයට හිස ඔසවන්න මේ ආණ්ඩුව ඉඩක් දීලා නැහැ. අපි අපේ රටේ ජනතාවට සහතික වෙනවා, නැවත මේ රටේ ජාතිවාදයට හිස ඔසවන්න මේ ආණ්ඩුව ඉඩ තියන්නේ නැහැ කියලා. අද විපක්ෂයේ මහත්වරු ආණ්ඩුවට විරුද්ධව විවිධ චෝදනා නඟන්න උත්සාහ කරමින් ඉන්නවා. ඒවා හැම එකක්ම පුස් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තවත් කාරණයක් මතක් වුණා. විපක්ෂ නායකතුමා පසුගිය දවස්වල ගිහිල්ලා සංවර්ධන නිලධාරීන් ඉදිරියේදී කිව්වා, "ලේ වලින් ලියලා දෙනවා" කියලා. එතකොට මට මතක් වුණා, ගෝඨාභය රාජපක්ෂ. "මගේ වචනය තමයි චක්‍රලේඛය" කියලා එතුමා කිව්වා. ඒකට වඩා දෙයක් මේ ප්‍රකාශයේත් නැහැ. මේ ප්‍රකාශය කළේ මේ රටේ ජනාධිපතිකමට ඉල්ලපු, ඊළඟට ජනාධිපතිකම ඉල්ලන මහත්මයා. රටක නීතිය කියලා කියන්නේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පමණක් නොවෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වාගේම රටේ තිබෙනවා, ඒ ඒ සේවාවලට අදාළ ව්‍යවස්ථා. ගුරු සේවයට තිබෙනවා, ගුරු සේවා ව්‍යවස්ථාව. අනෙකුත් හැම සේවාවකටම තිබෙනවා, සේවා ව්‍යවස්ථා. මොකක්ද සජිත් ප්‍රේමදාස කිව්වේ? "මට ව්‍යවස්ථා වැඩක් නැහැ, මම නීති කඩනවා" කියලායි එතුමා කිව්වේ. ලේවලින් ලියා දෙනවා කියලා කිව්වේ ඒක. නීති කඩලා, ලේවලින් ලියා දීලා උස නම් අ.පො.ස. (උසස් පෙළ), මිටි නම් ප්‍රාථමික පන්ති කියලාද දන්නේ නැහැ එතුමා කිව්වේ. එතුමා ඒකද දන්නේ නැහැ, ලේවලින් ලියා දෙන්න හැදුවේ? ලේවලින් ලියා දෙන්න හැදුවේ උස නම් අ.පො.ස. (උසස් පෙළට), මිටි නම් ප්‍රාථමික පන්තිවලට කියන එකද? මේ ජාතියේ විහිළු සපයන විපක්ෂ නායකවරයෙකු බවට අද ගරු විපක්ෂ නායකතුමා පත් වෙලා තිබෙනවා.

"දිට්වා" සුළි කුණාටුව සම්බන්ධයෙන් සාකච්ඡා වන විට මට තව කාරණයක් මතක් වුණා. එතුමා පසුගිය දවස්වල ඒ ව්‍යසනයෙන් පීඩාවට පත් වුණු ජනතාව සිටින සුරක්ෂා මධ්‍යස්ථානවලට පොතක් අරගෙන ගිහිල්ලා ලියාගන්නවා - වාර්තා කරනවා - මම දැක්කා. මම විපක්ෂ නායකතුමාට කියනවා, ඒ වාර්තාව සභාගත කරන්න කියලා. එතුමා හරිම දක්ෂයි නේ, සභාගත කරන්න. එම නිසා එතුමා ඒ පොතේ ලියාගත් වාර්තාව සභාගත කරන්න කියලා මම කියනවා. එතකොට අපටත් පුළුවන්, අපේ පැත්තේ අඩු පාඩුවක් තිබෙනවා නම් ඒවා ගැනත් සොයා බලා තවදුරටත් සහන සපයන්න.

ඒ වාගේම මේ සාකච්ඡාව ඇතුළේ කරුණු මතු වුණා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැනත්. මෙතුමන්ලාට "බෑග් මෑන්" කෙනෙක් ඉන්නවා නේ. ඒ තමයි විපක්ෂ නායකතුමාගේ මාධ්‍ය ප්‍රකාශක. උන්නැහැ පසුගිය දවස්වල බෙරිහන් දුන්නා, ඉතිහාසය පුරාම මේ අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධ වුණා කියලා. ඔව්, අපි විරුද්ධ වුණා. මොනවාටද විරුද්ධ වුණේ? එතුමන්ලාගේ ආණ්ඩු අධ්‍යාපනය සම්බන්ධ රජයේ වගකීම අත් හැරලා, අධ්‍යාපනය පෞද්ගලීකරණය කරන්න හදන කොට, අධ්‍යාපනයට වෙන් කරන මුදල් කපන කොට අපි ඒවාට විරුද්ධ වුණා. හැබැයි, අපි ගෙන එන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඒවා නොවෙයි. රජයේ වගකීම ශක්තිමත් කරන, දුප්පත් පොහොසත්, උස් මිටි භේදයකින් තොරව, ඇති හැකි, නැති බැරි භේදයකින් තොරව මේ රටේ හැම දරුවෙකුටම ඉහළට යන්න පුළුවන්, හැකියාව, දක්ෂතාව, විභවතාව මත ඉදිරියට යන්න පුළුවන් අධ්‍යාපන ක්‍රමයක් ගේනකොට ඒකට විරුද්ධ වෙනවා; "අසභ්‍යකරණය" කියලා විරුද්ධ වෙනවා. ඒ විරුද්ධ වීමට එරෙහිව රටේම ජනතාව පෙළ ගැහෙන කොට, අපි දැක්කා විපක්ෂ නායකතුමා කියනවා, "නැහැ, අපි විරුද්ධ වුණේ නැහැ, අපි නතර කරන්න කිව්වේ නැහැ" කියලා. හැබැයි, එතුමා මතුගම ගිහිල්ලා කන්නන්ගර පිළිරුව ඉස්සරහා ඉඳගෙන මොනවාද කිව්වේ? පොල් ගහලා මොනවාද කිව්වේ? හෝමාගම ප්‍රාදේශීය සභාවේ සජබයේත්, පොහොට්ටුවේත්, යූඑන්පී එකේත් මන්ත්‍රීවරු ඔක්කෝම එකතු වෙලා මොකක් කියලාද මහා හයියෙන් හඬ නැඟුවේ? ඊට පස්සේ හම්බන්තොට නියෝජනය කරන විපක්ෂ මන්ත්‍රීතුමා මහා ලොකුවට උද්ඝෝෂණයක් කළේ මොනවාටද? මේ ප්‍රතිසංස්කරණවලට විරුද්ධව. එදා විරුද්ධ වෙලා, ඒක නතර කරන්න අවශ්‍ය මතවාදය ඇති තරම් රටේ හදලා, ඒක බූමරංගයක් වුණාට පස්සේ දැන් කියනවා, "අපි විරුද්ධ වුණේ නැහැ" කියලා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධ වෙච්ච විපක්ෂය අද උස්සලා පොළොවේ ගහලා තිබෙනවා. ඒක තමයි ඇත්ත වශයෙන්ම සිද්ධ වෙලා තිබෙන්නේ.

ඒ වාගේම විපක්ෂ නායකතුමාට දැන් ලොකු අභියෝගයක් බවට පත් වෙලා තිබෙනවා, විපක්ෂ නායකකම රැක ගැනීම. විපක්ෂයේ එක එක අය විපක්ෂ නායකකම ගන්න පොරකමින් ඉන්නවා. ඒ නිසා අද එතුමාට සිද්ධ වෙලා තිබෙනවා, එතුමාගේ විපක්ෂ නායකකම රැක ගන්න. අපි ඉතින් ප්‍රාර්ථනා කරනවා, තවත් චිරාත් කාලයක් විපක්ෂ නායකතුමා ඔය පුටුවේ වැජඹේවා කියලා.

ඒ වාගේම අර ආටක නාටක සාටක නාමල් රාජපක්ෂ අද හිටියා නම් හොඳයි. මොකද, එතුමා හරිම වණ්ඩියෙක් වෙලා තිබෙනවා, වෙලාවකට පාර්ලිමේන්තුව ඇතුළේත්, එළියේත් දෙකේම. අපි දැක්කා, CID එකට යනවා, පිරිස් අරගෙන. අර ගම්වල කථාවක් තිබෙනවා නේ, සොහොනක් ළඟින් යන කොට-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

මට තව පොඩි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

සොහොනක් ළඟින් යනකොට "ඉතිපි සෝ..." ගාථාව කිය කියා යන්නේ, සින්දු කිය කියා යන්නේ? මේකත් ඒ වාගේම තමයි. CID එකට එන්න දිනය දුන්නාම ඊට කලින් දවස් දෙකතුනක ඉඳලා තමයි කෙඳිරි ගාන්න පටන් ගන්නේ. දවස් දෙකතුනක ඉඳලා එයාගේ ගෝල බාලයෝ ටික social mediaවල කෙඳිරි ගාන්න පටන් ගන්නවා. ඊට පස්සේ එනවා කණ්ඩායමකුත් අරගෙන CID එක ඉස්සරහට. පව්! අහනවා, "ඇයි ඔයගොල්ලන් ආවේ" කියලා. "අපි නම් දන්නේ නැහැ, මොකට ආවාද කියලා. අපිව ගෙනාවා. අපි නාමල් බලන්න ආවා. සිරිලිය, නාමල්ගේ අම්මා බලන්න ආවා" කියලා තමයි ඒ ආපු අය කිව්වේ. අපි දැක්කා රූපවාහිනී නාළිකාවල ඒගොල්ලන්ගේ කථා යනවා. ඒ වාගේම අපි කියන්න ඕනෑ, ඔව්, නාමල් රාජපක්ෂ ඉස්සරහට තවත් කෙඳිරි ගාන බව. තවත් කෙඳිරි ගානවා. මොකද, කෙඳිරි ගාන්න වෙනවා. මේ කථා කරන වෙලාවේත්, මේ කථා කරන මොහොතේත් චමිත්‍රි රඹුක්වැල්ල අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් - Bribery Commission එකෙන් - අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ නිසා කෙඳිරි ගැවෙනවා; ඇඳගෙන ඉන්න ඇඳුම් ටික තෙත් වෙනවා. ඒක තමයි ඇත්ත. ඔව්, රටේ ජනතාව බොහෝ දෙනෙක් යම් යම් විවේචන එල්ල කරනවා, මේ ආණ්ඩුවට. මොනවාද විවේචන? මම දැක්කා නාමල් කියනවා, පොරොන්දු ඉටු කරන්න ලු. පොරොන්දු තමයි ඉටු කරමින් යන්නේ. අපි බලයට එනකොට දීපු ප්‍රධාන පොරොන්දුවක් තමයි වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් කරනවා කියන එක. අපි ඒ පොරොන්දු එකින් එක එකින් එක ඉටු කරමින් යනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

උගන්ඩා සල්ලි කෝ?

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

සද්ද නැතුව ඉන්න, ඔබතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

උගන්ඩා සල්ලි කෝ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට අමතර විනාඩි දෙකක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

சும்மா, சும்மா கத்த வேண்டாம். නාමල් ගැන කියන කොට අර්ච්චුනාට ඇයි වුන් වෙන්නේ? අර්ච්චුනාට ඇයි වුන් වෙන්නේ නාමල් ගැන කියන කොට? *[බාධා කිරීමක්]* சும்மா, சும்மா கத்த வேண்டாம். ඒ නිසා අපි කියන්න ඕනෑ අර්ච්චුනා මන්ත්‍රීතුමා, අපි කියන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් රටේ ජනතාව ඇත්තටම අප ප්‍රශ්න කරන්නේ ඇයි කියලා. මේ දඬුවම් කිරීම වේගවත් නැහැ, වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් කරන එක ප්‍රමාණවත් නැහැ, වේගවත් නැහැ කියලායි ඒ අය ප්‍රශ්න කරන්නේ. නමුත් මම මතක් කරලා දෙන්නම්. මොකද, ගොඩක් අයට අමතකයි නේ. අද වනකොටත්, මේ වනකොටත් සැලකිය යුතු පිරිසක් දඬුවම් ලබා ඉන්නවා. හිටපු ඇමති මහින්දානන්ද අලුත්ගමගේ සහ නලින් ප්‍රනාන්දු දූෂණ චෝදනා මත දැන් අවුරුදු 20කට, 25කට හිරේට ගිහිල්ලා ඉන්නවා. හිටපු මහ ඇමති එස්.එම්. රංජිත් අද හිරේ. ඔහුගේ නෑනා, අද හිරේ. ඒ විතරක් නොවෙයි. රනිල් වික්‍රමසිංහ ඇප මත ඉන්නේ රජයේ මුදල් ලක්ෂ 160ක් වංචා කළා කියලා. කෙහෙලිය රඹුක්වැල්ල ඇතුළු පවුලටම නඩු. මා කලින් කිව්වා වාගේ චමිත්‍රි රඹුක්වැල්ල Bribery Commission එකෙන් අද අත්අඩංගුවට ගත්තා. ඩග්ලස් දේවානන්දා රිමාන්ඩ් කළා. එතකොට චාමර සම්පත්? අද නැහැ නේද? චාමර සම්පත් රැස්වීමකදීත් මහා උජාරුවෙන් කියනවා මම දැක්කා, "මට නඩු පහක් තිබෙනවා" කියලා. ඊයේ පෙරේදා, එළියේ කොහේ හරි රැස්වීමකදී කියනවා මම දැක්කා, "මට නඩු පහක් තිබෙනවා" කියලා. හරි උජාරුවෙන් කියන්නේ. මේ රටේ ජනතාව පොලීසියකට, උසාවියකට යන එක ලජ්ජාවක්, අවමන්සහගත දෙයක් ලෙස තමයි සලකන්නේ. හැබැයි චාමරලාට උසාවි යන එක, නඩු වැටෙන එක අභිමානයට කරුණක්. ඒ වාගේම, ලක්ෂ්මන් යාපාට අල්ලස් නඩුවක් තිබෙනවා; ඇප පිට ඉන්නේ. නාමල් රාජපක්ෂට ක්‍රිෂ් නඩුව එනවා, ලබන 16වන දා. තව තව ඒවා එනවා. ඒ නිසා කලබල වෙලා ඉන්නේ. රාජිත සේනාරත්න දික්ඕවිට වරායේ නඩුවට ඇප පිට ඉන්නේ. චන්ද්‍රානි බණ්ඩාර ඇප පිට ඉන්නේ. මේ ආණ්ඩුව අධිකරණ පද්ධතිය හරහා ක්‍රමානුකූලව දඬුවම් කරමින් තිබෙනවා. ඉතින් විපක්ෂය කලබල වෙන එක ගැන අහන්න දෙයක් නැහැ. ඒ නිසා මෙතැන සහ මෙතැනින් එළියේ සද්ද දමන එක වැඩි වැඩියෙන් කරනවා. සොහොනක් ළඟින් යනකොට, වැඩි වැඩියෙන් කලබල වෙනවා වාගේ කලබල වෙන එක ගැන අහන්න දෙයක් නැහැ.

අපට කියන්න ඕනෑකම තිබෙන්නේ මේකයි. දැන් මේ ආණ්ඩුව හරි පැහැදිලිව, ක්‍රමානුකූලව වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් කරමින් අධිකරණ පද්ධතිය හරහා නීතිමය කටයුතු කරමින් යනවා. ඒ නීතිමය කටයුතුවලට ආණ්ඩුව ලෙස අපි ඇඟිලි ගහන්නේ නැහැ. මාදුගොඩ මන්ත්‍රීතුමනි, ඔයගොල්ලන් සරත් ෆොන්සේකා කුදලාගෙන ගිහින් දැම්මා වාගේ අපි අනීතික වැඩ කරන්නේ නැහැ. නීත්‍යානුකූලව, විධිමත්ව අපි එම ක්‍රියාවලියට අවතීර්ණ වෙලා ඉන්නවා.

ඒ වාගේම කිව යුතු තව දෙයක් තිබෙනවා. ඔව් ඇත්ත, රටේ ජනතාව අපේක්ෂා කරන වේගයට ඒ කටයුතු නොවන එක ගැන පමණයි ඔවුන්ට ගැටලුව තිබෙන්නේ. ඒ නිසා අපි මේ රටේ ජනතාවට කියන්න ඕනෑ, ඔබ අප කෙරෙහි තැබූ විශ්වාසය ඒ අයුරින් රකිමින්, අප මේ රට ක්‍රමානුකූලව ඉහළට ඔසවමින් යන බව. අපි ගිය වසරේ ආර්ථිකය ශක්තිමත් කරන්න සමත් වුණා. අපි ගමට සංවර්ධනය ගෙනිහින් තිබෙනවා, ජාතිවාදය තුරන් කර තිබෙනවා, ජාතික සමඟිය ගොඩනඟමින් මේ රටේ ජනතාව එක මිටකට පෙළ ගස්වමින් රට ඉදිරියට ගෙන යමින් තිබෙනවා. ඉතින්, විපක්ෂය කලබල වෙන එක ගැන පුදුම වෙන්න දෙයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට විනාඩියක් තිබෙනවා; හරියටම විනාඩිය බලාගන්න.

අපේ ආදර සහෝදරයා කිව්වා, නාමල් රාජපක්ෂගේ නම කිව්වාම මට චූන් වෙනවා කියලා. හැබැයි, නාමල් රාජපක්ෂ නෙවෙයි, එයාගේ තාත්තාගේ නම කිව්වාම, ඔයගොල්ලන් ගොඩක් අයට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා මම දන්නවා. ගිහින් සෙරෙප්පු දෙක ගලවලා, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉන්න, ඉන්න. One minute, please. One minuteවලින් ඉවර කරන්නම්. One minute බලා ගන්න හරියට.

එතැනදී කිව්වා නේ, පැහැදිලිවම. ඔයගොල්ලන්ගේ කට්ටිය එතෙන්ට ගිහිල්ලා, සපත්තු දෙක ගලවගෙන ගියා නේද? *[බාධා කිරීම්]* ලජ්ජා නැද්ද? *[බාධා කිරීම්]* ඇයි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කෑ ගහන්නේ? සපත්තු දෙක ගලවගෙන ගියා නේද? *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, කථා කරන්න.

[අ.භා. 2.24]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවුරුදු 25ක් ගරු වෘත්තියෙන් බැහැර වෙලා වීදි සටන් කරපු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා අද කටින්ද දන්නේ නැහැ කථා කරන්නේ. *[බාධා කිරීම්]* එතුමා චෝදනා කළා, රාජපක්ෂවරුන්ට. හැබැයි, මහින්ද ජයසිංහ මැතිතුමනි, මහින්ද රාජපක්ෂ හැදුවේ, නිර්මාණය කළේ ඔබතුමන්ලා. *[බාධා කිරීම්]* ඒ නිසා ඔබතුමන්ලා ඒවා අල්ලන්න ඕනෑ. මොකද, ඔබතුමන්ලා තමයි ඒ "රාජපක්ෂ දිව්වා" ගෙනාවේ. ඒ රාජපක්ෂ භීතිකාවත් එක්ක, රාජපක්ෂවරුන් අල්ලනවා කියලා දේශපාලනය රැක ගන්න අද රාජපක්ෂවරුන් අල්ලන්න හදනවා. රාජපක්ෂවරුන් ළඟට ගිහිල්ලා වැඳලා කියලා, චන්දිහට්ටකම් කරලා 2005දී රාජපක්ෂලා බලයට ගෙනැල්ලා අද කියනවා- *[බාධා කිරීම්]* ඉස්කෝලෙකට ගිහිල්ලා ඉගැන්නුවාද මහත්තයෝ, ඔයා? සජිත් ප්‍රේමදාස මහත්මයා ලේවලින් අත්සන් කරලා දෙන එක ගැන ඔයා කථා කරනවා. ඇහුවාද, සංවර්ධන නිලධාරින් ජනාධිපතිතුමා හමු වෙන්න ගිහිල්ලා එළියට ඇවිල්ලා කියපු දේ? *[බාධා කිරීම්]* ඔයාලට එන්න කිව්වා, පන්ති කරන්න. ඔයාලට පන්ති කරනවා කිව්වා, ඇවිල්ලා. ඔබතුමන්ලා අද ඒ වෘත්තීය සමිතිත්, රටේ ජනතාවත්, ඒ වෘත්තීය අරගළත් පාවා දීලා වරප්‍රසාද භුක්ති විඳිමින් ඉන්නවා කියන කාරණය හැමෝම දන්නා බව මතක තියා ගන්න.

අද ඔයගොල්ලන් හදිසි නීතිය ගෙනෙන්නේ ඇත්තටම මොකටද කියලා මම කියන්නම්. මාසයකට දෙකකට නේ, ඔයගොල්ලන් හදිසි නීතිය ගෙනෙනවා කියන්නේ. ඒ, දිව්වා නිසා තමයි. ජනාධිපතිතුමා ඇවිල්ලා මෙතැන කිව්වා, ටකරමක් ගියත් ලක්ෂ 10ක් දෙනවා කියලා. නමුත් දෙන්න බැරි වුණා. දෙන්න බැරි වුණා නේ. දුන්නේ නැහැ නේ. ඊළඟට, ලක්ෂ 25ක්. ලක්ෂ 25 cheques ටික return වුණා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
50යි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ලක්ෂ 25යි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
25 ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
25ක් දුන්නා. තව 25ක් දෙන්නම් කිව්වා. දැන් කියනවා, "නැහැ, එයාලාට සම්පූර්ණ ගෙයක් ගන්න අපි ලක්ෂ 50ක් දෙනවා" කියලා. එහෙම නම් 25ක් දීලා ඉතුරු 25 දෙන්න තිබුණා නේ.

දැන් මොකටද මේ අයට හදිසි නීතිය ඕනෑ? මම දැක්කා, අර පොලීසිය භාර නියෝජ්‍ය ඇමතිවරයා කියපු දෙයක්. සාමාන්‍යයෙන් එයා අධිකරණයේ පඩිපෙළේ නීතිඥ මහත්මයා, මේ ආණ්ඩුවේ එක එක ආණ්ඩුවල ඉන්නවා, පඩිපෙළ නීතිඥ මහත්තුරු. එයා කියනවා, පොල්ලක් ගත්තත් හදිසි නීතිය යටතේ අත්අඩංගුවට ගන්න පුළුවන් කියලා. ඔව්, දැන් ඔයගොල්ලන්ට විරුද්ධව පොලු අරගෙන පාරට බහිනවා. මාස දෙකයි කිය කියා ඔබතුමන්ලා මේ හදිසි නීතිය තියාගන්නේ, දීර්ඝ කර ගන්නේ වෙන මොකටවත් නොවෙයි, අර දෙන්න බැරි වෙච්ච ඒවා ගැන කියපු බොරු නිසායි. සංවර්ධන නිලධාරින් එළියට ආවා, වෛද්‍යවරුන් එළියට ආවා. ඊළඟට, සියලුදෙනාම එළියට එන්න ඉන්නවා. අන්න ඒ වෙනුවෙන් තමයි මේ හදිසි නීතිය. පසුගිය

කාලයේ කිව්වා නේ, "අපි ආපු ගමන් chopperවලින් ගිහිල්ලා ඔක්කෝම කළා" කියලා. එහෙම කළා නම් ඇයි මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, මේක දීර්ඝ කරන්නේ?

ජනතාවට දෙනවා කියපු දේවලට අපි විරුද්ධ වුණේ නැහැ. අපට විරුද්ධ වෙන්න ඕනෑත් නැහැ. ඒ කියපු දේවල් ඔබතුමන්ලා දුන්නේ නැති නිසා, දෙන්න දන්නේ නැති නිසා, බොරු කියන නිසා ඔයගොල්ලන්ට ජනතාවගෙන් එල්ල වන පීඩනය, ජනතාවගෙන් එල්ල වන විරෝධය, ඉදිරියේ එන ඒ වීදි සටන් සියල්ල නතර කරන්න තමයි ඔබතුමන්ලා මෙය දීර්ඝ කර ගන්නේ. ඔබතුමන්ලා ඔක්කෝම කරලා ඉවරයි කියලා කිව්වා නේද? පසුගිය කාලයේ ඇවිල්ලා කිව්වා නේද, "උදේ පාන්දර 8.30ට ජනාධිපති ගුවනින් ඇවිල්ලා ජනාධිපතිට තිබෙන හෙලිකොප්ටර් දෙකත් යවලා -පැය 24න්- අපි මේ සියල්ල ඉවර කළා" කියලා. එහෙම කියපු උදවිය ඒ කටින්ම කියනවා, "නැහැ තවත් තියෙනවා, තව කරන්න ඕනෑ" කියලා. ඉස්සරහට රටේ ජනතාව තව හොඳට දෙයි ඔයගොල්ලන්ට. ඒක මතක තියා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, සංවර්ධන නිලධාරින්ගේ ගැටලුව ගැනත්. සංවර්ධන නිලධාරින්ට බලාපොරොත්තු දීපු උදවිය අද කොහේද ඉන්නේ? අද මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, අපි පසුගිය කාලයේ අධ්‍යාපන වැඩ පිළිවෙළ නැවැත්තුවා කියලා. නැවැත්තුවේ ජනාධිපති. ඒ, ඇයි? ඒ තුළ අසහ්‍යකරණය තිබෙන බව ජනාධිපති ඔබතුමන්ලාට වඩා හොඳින් කියවා දැනගත්තා. අපි නවත්වන්න කියපු දේ, ජනාධිපති නැවැත්තුවා. සමස්ත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව නොවෙයි අපේ විරෝධය ආවේ. එක එක්කෙනාගේ කණ්ඩායම්වල තිබුණු පෞද්ගලික අවශ්‍යතා අප පෙන්වා දුන්නාට පසු අනුර කුමාර ජනාධිපති ඒවා දැකපු නිසා තමයි නැවැත්තුවේ. මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියපු කථාව ගිහින් ජනාධිපතිට කියන්න. අපට කියන්න ඕනෑ නැහැ. ඔබතුමන්ලා ගිහින් ඔබතුමන්ලාගේ ජනාධිපතිගෙන් අහන්න, "ඇයි ඒක නැවැත්තුවේ?" කියලා. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහත්මයා නොවෙයි ඒක නැවැත්තුවේ.

විපක්ෂ නායකතුමා ගිහිල්ලා රටේ ජනතාවගේ ප්‍රශ්න ඔබතුමන්ලාට වඩා හොඳට විසඳපු බව මතක තබා ගන්න. "දිට්වා" සුළි කුණාටුවෙන් අසරණ වුණු ජනතාව ඉන්න හැම පළාතකටම ගිහිල්ලා දෙන්න ඕනෑ දේවල් එතුමාගේ පෞද්ගලික ධනයෙන් ලබා දුන්නා. ඒ නිසා රටේ ජනතාව දන්නවා එතුමා හදවතේ තිබෙන දේ ලෙයින් ලියා දෙන්න පුළුවන් කෙනෙක් කියන කාරණය. අපි ඔබතුමන්ලාගෙන් අහනවා, "එතුමා ලෙයින් ලියා දෙනවා කිව්ව එකට ඔබතුමන්ලාට පාන් ද?" කියලා. ඔබතුමන්ලා මොනවාද කළේ? ඔබතුමන්ලා අදත් බොරු කියනවා; හෙටත් බොරු කියනවා; බොරුවෙන් දේශපාලනය ඉදිරියට ගෙන යනවා.

ඊළඟට, පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කිරීම කියන කාරණය ගනිමු. ඒ විශ්‍රාම වැටුප අහෝසි කිරීමේ පොරොන්දුවට ජන වරමක් ලැබුණු බව මහජන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා. ඔව්. හැබැයි, ඒ ජන වරම ලැබෙන්න කාරණයක් වුණා, මන්ත්‍රී වැටුප් ගන්නේ නැහැ කියපු එකත්, වාහන ගන්නේ නැහැ කියපු එකත්. එහෙම නම් ඒවාත් ඉටු කරන්න. එතකොට රටේ ජනතාව පිළිගනියි ඔබතුමන්ලා කියපු දේවල් හරියටම කරනවා කියලා. විශ්‍රාම වැටුප තිබුණත්, නැතත් අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අපි දැන් කාරණය දන්නවා. අද මේ පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කළාට, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ වැටුප ජනතා විමුක්ති පෙරමුණේ අරමුදලට අරගෙන ඒ අරමුදල හරහා තමුන්නාන්සේලාට වැටුප් ගෙවන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. ඒ විතරක් නොවෙයි, ඉදිරියේදී විශ්‍රාම වැටුපත් ගෙවන්න අවශ්‍ය සැලසුම තමුන්නාන්සේලා හදාගෙනයි තිබෙන්නේ. මේ රටේ ජනතාව බොරුව දකීවි, නියමිත වෙලාවට. අපි ඒක ගාණට පෙන්වා දෙන්නම්. ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් 159දෙනාගේ වැටුප් අද ජනතා විමුක්ති පෙරමුණේ අරමුදලට යන්නේ. ඒ අරමුදලින් තමයි ඔබතුමන්ලාට වැටුප් ගෙවන්නේ. වැටුප් ගෙවලා ඉතිරි වන මුදලින් ඔබතුමන්ලා විශ්‍රාම වැටුපක් හදාගෙන ඉවරයි. රටේ ජනතාව මේවා තේරුම් ගත්තාම ඔබතුමන්ලාට ගහලා පන්නනවා. අන්න ඒ ගහලා පන්නන දවස ළඟඑන නිසා තමයි තමුන්නාන්සේලා මේ හදිසි නීතිය දීර්ඝ කර ගන්න හදන්නේ. හදිසි නීතියේ අවශ්‍යතාව ඒකයි. ඔබතුමන්ලා කල් යල් බලනවා. ඔබතුමන්ලාට එන විරෝධය මැඩ පවත්වන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදා ගන්න තමයි හදිසි නීතිය දීර්ඝ කිරීමට කටයුතු කරන්නේ කියන කාරණය මම මතක් කරන්න ඕනෑ.

මම මේ මොහොතේ, මූලසුනට මේ කාරණයත් කියන්න ඕනෑ. පාර්ලිමේන්තුව කියන්නේ, කථානායකත්, සභානායකත් නොවෙයි. පාර්ලිමේන්තුවේ හැම දාම උදේ වරුවේ තිබෙන්නේ කථානායකට සහ සභානායකට අවශ්‍ය වැඩ පිළිවෙළ. එම නිසා සමස්ත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කාලය වෙන් වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒක බරපතළ කාරණයක්. එය අපි හැම දාම, හැම වෙලාවේම, හැම මොහොතේම කිව්වත් අපට මඩ ගහන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදනවා. පාර්ලිමේන්තුවේ පසු පෙළ ඉන්න සමහර මන්ත්‍රීවරියන් කාන්තාවන් වෙනුවෙන් කථා කරනවා. ඔබතුමියලාගේ සභානායකවරයා සංවර්ධන නිලධාරින්ගේ ප්‍රශ්නයේදී මාධ්‍යයට ගිහින් මොකක්ද කිව්වේ? ඒ කාලයේ ගුරුවරු -ගුරුවරියෝ- රස්සාව ගත්තේ හොටෙල් කාමරවලයි කිව්වා. ගුරුවරියන් ඇතුළු සමස්ත ගුරු ක්ෂේත්‍රයට ඒ වාගේ අපහාස කරන කොට ආණ්ඩුවේ මොන මන්ත්‍රීවරියද නැඟිටලා කිව්වේ, "එහෙම කියන්න එපා, ඒක වැරැදියි" කියලා? එහෙම කිව්වේ නැහැ. ඉතිහාසයේ හොටෙල් කාමරවලට ගිහිල්ලා රස්සා ගත්තු ආදර්ශය ඇති එයාලාට. රාජපක්ෂලාගේ තුරුලේ නැළවිච්ච උදවිය අද රාජපක්ෂවරුන්ට බැන්නාට, රාජපක්ෂවරුන් නැත්නම් අද ඕතැන නැහැ කියන කාරණයත් මම කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට මඩ ගහන්න ආවොත් ඒ උදවියගේ ජන්මේ මොකක්ද කියන කාරණය කියන්නත් අපි පසුබට වෙන්නේ නැහැ කියන කාරණයත් මතක් කරමින්, කාල වේලාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා මගේ නම සඳහන් කළා.

මන්ත්‍රීකම් සල්ලිවලට පාවා දීපු අයගෙන් අපට චරිත සහතික ඕනෑ නැහැ. මොකද, අපි දන්නවා, මේ රටේ කුමක්ද කරන්නේ කියන එක. ඒ නිසා එතුමාට අපි කියන්න ඕනෑ, මහින්ද රාජපක්ෂට අපි උදවු කළේ ඔබතුමන්ලාගේ නායකයන් මේ රට ත්‍රස්තවාදයට පාවා දෙන්න කටයුතු කළ වෙලාවක, රට විකුණන්න කටයුතු කළ වෙලාවක බව.

ඒ වාගේම තමයි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙනුත් විපක්ෂය මේ රටේ ඇති තරම් වැරැදි මත හැදුවා. අදත් ඒක කරමින් ඉන්නවා. "නැහැ අපි එහෙම කිව්වේ නැහැ" කියලා දැන් විපක්ෂ නායකතුමා කියද්දී, මෙතුමන්ලා ඒක වැරැදි විධියට විග්‍රහ කරමින් ඉන්නවා.

බොහොම ස්තුතියි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ස්ථාවර නියෝග 91 (ඌ) යටතේත්, 86 (ආ) යටතේත් ඇති කාරණා අනුවයි මෙය කියන්නේ. එම අයුතු ආරෝපණය කරන්න මූලසුනෙන් එතුමාට අවසරය දීම පිළිබඳව මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. එතුමන්ලාට චෝදනා කරන්න පුළුවන්. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා අද ආණ්ඩුවේ නේ ඉන්නේ. ලජ්ජයි නේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව නේ තිබෙන්නේ. *[බාධා කිරීම්]* ඔබතුමාගේ නම කිව්වේ මම.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නොවී වාඩි වෙනවා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මගේ අවස්ථාව දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේක විවාදයක් කරගන්න එපා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේක විවාදයක් කරගන්න අවශ්‍ය නැහැ, ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, - *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ස්ථාවර නියෝග 86(අ) යටතේ මම කියන්නේ. එතුමා වැරදියට තේරුම් අරගෙන මම කියපු දේ. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තත්පර 15ක කාලයක් දෙනවා, කථා කරන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
තත්පර 15ක් නොවෙයි, විනාඩියක් තිබෙනවා. තත්පර 15න් කියන්නම්. මෙතුමා වෘත්තීය සමිතිය නියෝජනය කරලා, ඉඩම් ටික ඔක්කොම විකුණලා අද නඩු තිබෙනවා. නඩුවලට යන්නේ නැතිව හැංගිලා ඉන්නේ. කෝට් බෝට් දාගෙන හිටියාට තමුන්නාන්සේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කථා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොහොම සන්තෝෂයි, - *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ කාරණය විවාදයක් බවට පත් කරගන්න අවශ්‍ය නැහැ.

ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ කථාව කරන්න.

[අ.භා. 2.33]

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ හදිසි අවස්ථා රෙගුලාසි දීර්ඝ කිරීම සම්බන්ධයෙන් පවත්වන මෙම විවාදයේදී ඇත්තටම ඉතාම කනගාටුදායකයි, - *[බාධා කිරීම්]* මට හරිම සන්තෝෂයි විශ්‍රාම වැටුප් හදන්නේ කොහොමද කියලා විපක්ෂයෙන් අහගන්න ලැබුණු එක ගැන. දැන් හිතට අමාරු වෙලා, මේ කලබල වෙන්න පටන් අරගෙන තිබෙන්නේ, විශ්‍රාම වැටුප නැති වුණු නිසා. ඇයි? අවුරුදු 5ක් පාර්ලිමේන්තුවේ ඉඳලා ඉතිරි කාලය ජනතාවගේ මුදලින් ජීවත් වෙන්න දැකපු හීනය අවසන් වුණු නිසා ආණ්ඩුවත් එක්ක වෛර බැඳගෙන මේ සූදානම් වෙන්නේ වෙනම දේකට.

පසුගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ 26වැනි දා අපේ ප්‍රදේශවලට වහින්න ගත්ත වර්ෂාව එක දිගට දින ගණනාවක් වැස්සා. නොවැම්බර් මාසයේ 27වැනි දා මේ "දිට්වා" සුළි කුණාටුව නිසා මධ්‍යම කඳුකරය සම්පූර්ණයෙන්ම ආපදාවට ලක් වුණා. ගම්මාන වශයෙන් අපි වෙන් වෙලා සිටියේ. ජනතාවට එකිනෙකාට සම්බන්ධ වෙන්න කිසිම ක්‍රමයක් තිබුණේ නැහැ. දුරකථන සම්බන්ධතා පවා ඇනහිටියා. මේ විපක්ෂයේ මන්ත්‍රීවරු මේ අවස්ථාවේ උත්සාහ කරන්නේ මොකටද? මේ "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට පත් වෙච්ච ජනතාවට සහන ලබා දෙන්න අපේ ආණ්ඩුවෙන් කරගෙන යන වැඩකටයුතු සඳහා උදවු කරන්නම් කිය කියා කකුලෙන් අදින වැඩක් තමයි දැන් මේ කරගෙන යන්නේ. ඇහුවොත් කියයි, ඔබතුමන්ලාට ඔය යෝජනා ගෙනෙන්න අපි උදවු කරනවා කියලා. මේ උදවු කරන හැටිද? මහනුවර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමෙක් වන හිටපු ඇමතිවරයෙක් මෙතැනදී කිව්වා ඉලුක්වත්ත, උරුලෑවත්ත, උඩුනුවර ප්‍රදේශයේ තිබෙන ගල් වළක් ගැන. ඒ ගැන සඳහන් කරලා මේක පරිසරය රකින ආණ්ඩුවක්ද කියලා ඇහුවා. ඒ ගල් වළ මේ අවුරුද්ද ඇතුළත බලපත්‍ර දීලාද පටන් ගත්තේ? නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒක ඉතා දීර්ඝ කාලයක සිට පැවැති ගල් වළක්. විපක්ෂයේ සිටින තමුන්නාන්සේලා එක් එක්කෙනාගේ මුහුණු බලාගෙන සොයා ගන්න, ඒකට අවසර ලබා දුන්නේ කවුද, කොයි කාලයේද කියලා. මේ ආණ්ඩුව පත්වෙලා නොවෙයි ගල් වළක් පවත්වාගෙන යන්න අවසර දීලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඔව්, එතැන විහාරස්ථානයකටත් බලපෑමක් සිද්ධ වෙලා තිබෙනවා. එක් ගම්මානයකටම එයින් බලපෑමක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ ගම්මානයේ බහුතරයක් ජීවත් වෙන්නේ අපේ මුස්ලිම් ජනතාව. ඒ අය විපතට පත් වෙලා තිබෙන බව අපි දන්නවා. ඒ කාරණය සිද්ධ වුණේ තමුන්නාන්සේලාගෙන්. ඒ කොයි ආණ්ඩුව කාලයේද කියලා ඔය ලිපිගොනු බලලා තමුන්නාන්සේලාම සොයාගන්න එක හොඳයි, මේ ආණ්ඩුවට චෝදනා නොකර. හැබැයි, ගම්පොල ප්‍රදේශයේ, නාවලපිටිය ආසනයේ ඉතාම දුෂ්කර ප්‍රදේශ ගණනාවක් ආපදාවට ලක් වුණා. මහනුවර සිට නාවලපිටිය ආසනයේ කුරුඳුවත්ත ප්‍රදේශයට යන පාරට සිංහපිටිය ප්‍රදේශයෙන් විශාල ගල් ඇවිල්ලා තිබුණා. අම්බුළුවාව උඩ තිබුණු ජලාශ කඩාගෙන විශාල ගල් කුට්ටි ඇවිත් තිබුණා. ඒවා ස්වාභාවික ගල් කුට්ටි නොවෙයි, හරි හතරැස් වට කපලා හදලා තිබෙන ගල්. ඒවා කවුරු හෝ ගිහින් තියලා මිසක් කන්ද උඩ තිබුණු ඒවා නොවෙයි කියන එක ඇසින් දකින ඕනෑ කෙනෙකුට පෙනෙනවා. ගම් ගණනේ, කොට්ඨාස ගණනේ පයින් ගිහින් ඇවිදලා සොයා බලා තමයි අපි මේ කරුණු කථා කරන්නේ. ඒ වාගේ දේවල් කඩාගෙන ඇවිල්ලා විශාල වශයෙන් නිවාසවලට හානි වුණා, මහාමාර්ග කඩාගෙන ගියා, විශාල අලාභ හානියක් සිද්ධ වුණා. ලොකු මුදලක් වැය කරලා ඒ දේවල් ප්‍රතිසංස්කරණය කරන තරමට රටට බරක් වුණේ ඒ නිසායි. එක එක පවුල්වලට, එක එක්කෙනා කරගෙන යන ව්‍යාපාරවලට තමුන්නාන්සේලා දුන් සහාය නිසා තමයි මේ තත්ත්වය ඇති වුණේ. තමුන්නාන්සේලා එකතු වෙලා වංක ප්‍රයෝගයෙන්, වංක සහයෝගයෙන් කටයුතු කරමින් එකිනෙකා විසින් කරගෙන ආපු ව්‍යාපාර නිසා තමයි ඒ තත්ත්වය ඇති වුණේ. ඒ වාගේම, මාවතුර ප්‍රදේශයේ ඉහළගම මුළු ගම්මානයක්ම නාය ගියා. අද ඒ ගමේ එක කොටසක පවුල් කිහිපයක් ඉතිරි වෙලා ඉන්නවා. ඒ කොටසේ ඉන්න අයට යන්න එන්නවත් පාරක් නැහැ. ජනතාව පවුල් පිටින් මිය ගිහිල්ලා තිබෙනවා. ඔබතුමන්ලා ඔය විධියට කථා කරනකොට, සහන සලස්සන්න මේ ප්‍රතිපාදන අවශ්‍ය නැහැ කියනකොට, පවුලේ සියලුදෙනා මිය ගිහිල්ලා ඉතිරි වෙච්ච එකම එක ඥාතියෙකුගේ දුක අඳෝනාව අහලා තිබෙනවා ද? ඒ අය ඉල්ලන්නේ මොනවාද කියලා ඔබතුමන්ලා අහලා තිබෙනවාද? මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියලා ඒ අයගේ ළඟට ගිහිල්ලා අහලා කථා කරලා තිබෙනවාද? තමුන්නාන්සේලා බලයේ හිටපු කාලවල ඉහළගම ප්‍රදේශයේ අත්පත් කර ගත්ත ඉඩම්වල වැව් හදලා තිබෙනවා. අහලා බලන්න, ඒ ජනතාව කියන දේවල්. ඒ ජනතාව මොනවාද කියන්නේ? ඒ වැවක් කඩාගෙන ඇවිල්ලා තමයි ඉහළගම නාය ගියේ කියලා ඒ ජනතාව කියනවා. ඒ ජනතාව ළඟට යන්න බැරි කාටද? ඒ ජනතාව ළඟට යන්න බැරි මේ ආණ්ඩුවේ අපට නොවෙයි. ඒ වාගේ විනාශවලට මුල්ගල් තියපු තමුන්නාන්සේලාට තමයි ඒ ජනතාව ළඟට යන්න බැරි. එහෙම ඉඳගෙන මේ ජනතාව උසිගන්වන්න ඔබතුමන්ලා උත්සාහ දරනවා. අපට ඒක හොඳට පැහැදිලියි. ඒ ගම්වල ජනතාව අපට ඒවා කියනවා.

ඔබතුමන්ලාගේ නාය ගිය දේශපාලනය යථාවත් කර ගන්න ඔබතුමන්ලා උත්සාහ දරන්නේ ඒ ජනතාව කුපිත කිරීමෙන්. ඒ ජනතාවට ලැබෙන සහන හෙට දෙනවා නම්, අද ඔබතුමන්ලා එතැනට ගිහිල්ලා කලබල කරනවා. ඔබ කොහෙන් හරි තොරතුරක් හොයා ගන්නවා, හෙට මේ සහනය ජනතාවට ලබා දෙන්න සූදානම් කියලා. අද ගිහින් ඒ ජනතාවට කියනවා, මෙන්න මෙහෙම කරන්න, මෙහෙම කරන්න කියලා. ඒ යට ඉන්නේ කවුද කියලා ජනතාවම අපට කියනවා. තමුන්නාන්සේලාට වඩා ජනතාව අපිත් එක්ක සමීපයි. ගමේ බිමේ ඉන්න, අදටත් කඩේට යන, පොළට යන, ජනතාව එක්ක ඉන්න මන්ත්‍රීවරු අපි. අපේ පක්ෂයේ ඉන්න හැම කෙනෙක්ම දන්නවා ජනතාවගේ හදගැස්මේ රාවය. කොයි දේද ජනතාව වෙනුවෙන් කෙරෙන්න ඕනෑ කියලා අපි දන්නවා. අපි ඒ හැමදේම අවබෝධ කරගෙන තමයි ඒ කටයුතු

[ගරු නිතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය]

කරන්නේ. එහෙමයි කියලා "මේ ආපදාව නිසා මෙහෙම සිද්ධ වුණා, දැන් ඔය ළමයි ගිහින් නිදා ගන්න" කියන්නේ නැතිව, අපි කොයි තරම් වැඩ කරනවා ද? අද ගරු ජනාධිපතිතුමා මහනුවර ප්‍රදේශයට ගිහින් ඉන්නවා. ජනාධිපතිතුමා කරන්නේ මොනවාද? මහනුවර දිස්ත්‍රික්කයේ "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් ජනතාවට සහන සැලසීම සහ සංවර්ධන ව්‍යාපෘති කිහිපයක වැඩ ආරම්භ කිරීමට අද දිනයේත් මුල් ගල් තියනවා. දැන් ඒ වැඩ කටයුතු පටන් ගන්නවා. ඒ මුදල් වෙක්පත් ලබාදීම් සිදු කෙරෙනවා. නැවත පදිංචි කිරීම් සඳහා ඉඩම් හා වන්දි ප්‍රදානය අද දින සිද්ධ වෙනවා.

ඊට අමතරව, අපේ "Rebuilding Sri Lanka" වැඩසටහන අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කර තිබෙනවා. අපි ඒ පටන් ගත්ත වැඩසටහන තුළින් ආපදාවෙන් පූර්ණ හානි සිදු වූ නිවාස සඳහා වන්දි ප්‍රදානය සහ නව නිවාස ඉදිකිරීමේ වැඩ පිළිවෙළේ මහනුවර දිස්ත්‍රික් සමාරම්භය අද ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිද්ධ වෙනවා. කුණ්ඩසාලේදී නිවාස ආධාර බෙදා දීම සිදු වුණා. මේ වාගේ ආපදාවක් සිද්ධ වුණා, අපට දැන් වෙන කරන්න දෙයක් නැහැ, මහනුවර දිස්ත්‍රික්කය ඇතුළු මධ්‍යම පළාතේ ජනතාව මේක දරාගෙන ඉන්න, මේක ආපදාවක්, මේක ස්වාභාවික විපතක්, ඒ නිසා මේ දේවල් දරාගන්න කියලා අපි කියන්නේ නැහැ. අපි සංවර්ධන ව්‍යාපෘති කල් තබන්නේ නැතිව ඒ ආකාරයටම ක්‍රියාත්මක කරනවා. අද මහියාව උමං මාර්ගයේ වැඩ ආරම්භ කරනවා. ඒ ව්‍යාපෘති වියදම රුපියල් මිලියන 699.6ක්. ඒ වාගේම තමුන්නාන්සේලා නිකමට අහලා බලන්න. මේ ආපදාව සිද්ධ වෙච්ච අවස්ථාවේ නාවලපිටිය නගරයේ ජල සැපයුම බින්දුවයි. මේ ආපදාව නිසා ජලනල පද්ධතිවල බට කඩාගෙන ගිහිල්ලා 28වැනි දා තමයි ජලය නැතිව ගියේ. 29වැනි දා රාත්‍රී 12.30 වෙනකොට ඒ නල පද්ධති සකස් කළා. 30වැනි දා උදේ වෙනකොට නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහලට වතුර ලබා දෙන්න පුළුවන් වුණා. අපි ඒක කළේ කොහොමද? ප්‍රජා සහභාගිත්වයෙන් තමයි අපි ඒ දේවල් කළේ.

ඒ වාගේම හදිසි අවස්ථා රෙගුලාසි යටතේ අපි කරපු වැඩ කටයුතු කිහිපයක් මම කියන්නම්. නාවලපිටිය ආසනයේ ගඟඉහළ කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කියන්නේ ඉතාම අඩු ආදායම් ලබන ජනතාවක් ජීවත් වන ප්‍රදේශයක්; ප්‍රාදේශීය සභාවක තිබෙන අවම පහසුකම් පමණක් තිබුණු ප්‍රාදේශීය සභාවක්. මේ අභියෝගය ජය ගන්න ඒ ප්‍රාදේශීය සභාවට තිබුණේ එකම එක බැකෝ යන්ත්‍රයක් විතරයි. නමුත් ඒ සියලු යන්ත්‍ර සූත්‍ර කොළඹ මහ නගර සභාවෙන් ලබාගෙන, ඒ අයගේ ශ්‍රමයත් යොදාගෙන ඒ ප්‍රදේශය වහාම යථා තත්ත්වයට පත් කරන්න හැකියාව ලැබුණා. ඒ වාගේම, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගැනත් මම කියන්න ඕනෑ. පොඩි වැස්සකටත් අකුරණ නගරය යට වෙනවා. එහෙම වුණාම ජනතාවට මොන තරම් අපහසුතාවක් සිද්ධ වෙනවා ද කියලා අපි දන්නවා. ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙනිය, ඇල්පිටිය සහ වැලිවිටිය-දිවිතුර ප්‍රාදේශීය සභා එකතු වෙලා ඒ ප්‍රාදේශීය සභාවල එකඟත්වයෙන් මේ ප්‍රදේශය වහාම යථාවත් කිරීමට කටයුතු කළා. බැකෝ යන්ත්‍ර දෙකක්, එක්ස්කැවේටර් යන්ත්‍ර 4ක්, ටිපර් යන්ත්‍ර 3ක් සහ ට්‍රක් එකක් ගෙනැල්ලා, ඒ නිලධාරින්, සේවකයන් ගෙන්වා අපි ඒ වැඩ කටයුතු කරලා තිබෙනවා.

ඔබතුමන්ලා මේ ආපදාවෙන් නැවතත් ආපදාවට පත් වෙලා ඒකේ වාසිව ආණ්ඩුවෙන් ගන්න හදන්න එපා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.42]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

හදිසි නීතිය පනවන්නේ ඇයි? දැන් කථා කරපු මන්ත්‍රීතුමිය කිව්වා, අතිගරු ජනාධිපතිතුමා නුවර ගියා කියලා අනාථ වූ අයට ආධාර කරන්න. ඒ ගැන පොඩ්ඩක් හිතලා බලන්න, කල්පනා කරලා බලන්න. මොකද, චොපර් දෙකක තමයි ගියේ. එක චොපර් එකක යනවා, ජනාධිපතිතුමා. අනෙක් චොපර් එක යනවා, බැරි වෙලාවත් හදිසියක් වුණොත් ඒ චොපර් එකට පනින්න. ඒ නිසා මේවා ගැන පොඩ්ඩක් කල්පනා කරලා බලන්න. මම හිතන්නේ හදිසි නීතිය යටතේ ඒක හරි, ඒ කරපු දේ හරි. අපි කිව්වා, එහෙම කරන්න ඕනෑ කියලා. හැබැයි අපට කිව්වා, ඒක නොවෙයි කරන්න ඕනෑ කියලා. දැන් ඔන්න අපි කියපු දේ කරනවා.

ඒකම තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලටත් වුණේ. අපි කිව්වේ අසහායකරණය කරන්න එපා කියලා. ඒකවත් තේරුම් ගන්න බැහැනේ, ඔළුවක් නැහැ නේ. අපි කිව්වේ අසහායකරණයකට අපි විරුද්ධයි, හැබැයි ප්‍රතිසංස්කරණවලට එකඟයි කියලා. ඒකවත් තේරුම් ගන්න බැරි නම් කොහොමද දේශපාලනය කරන්නේ? ආණ්ඩුවක් කරන්නේ? ඉස්සෙල්ලා ඒක තේරුම් ගන්න. පරණ වෙන්න පුළුවන්, අලුත් වෙන්න පුළුවන්, තව තව දේවල් වෙන්න පුළුවන්, තව තව දේවල් ඉස්සරහටත් වෙයි, යමුකෝ ඔහොම.

ඔබතුමන්ලාගේ නායකතුමා, JVP එකේ හිටපු නායක සෝමවංශ අමරසිංහ මහත්තයා කිව්වා, ඉඳලා ඉඳලා වර්චස් වැඩක් කර ගන්නවා කියලා. අපි හිතුවා, ඉඳලා ඉඳලා වර්චස් වැඩක් කර ගන්නවා කියලා. හැබැයි ඉඳලා ඉඳලා නොවෙයි, හැම මොහොතකම වර්චස් වැඩ කරනවා. දැන් ඒ ඔක්කෝටම අපි කොහොමද උත්තර දෙන්නේ කියලා කියන්නකෝ? දැන් මේවා ඔක්කෝම දෙන්නේ ඔබතුමන්ලා, අපි නොවෙයි. *[බාධා කිරීමක්]* හැම දාම අලුත් එකක්. ඒ ඔක්කෝටම උත්තර දෙන එක ඇත්තටම ප්‍රශ්නයක්නේ. *[බාධා කිරීමක්]* අපට දරාගන්න බැරි තරම් ප්‍රශ්න දැන් එනවා.

ඊළඟ ප්‍රශ්නය මොකක්ද? පසුගිය නිදහස් දවසේ ඔබතුමන්ලා රණ විරුවන් පෙළපාළි ගෙනිච්චා. හැබැයි ඔබතුමන්ලා කිව්වා, ණයට ගෙනා යුද උපකරණ පෙන්වන්න බැහැ කියලා. මතක තබාගන්න, මේ රටේ රණ විරුවන්ට ගරුත්වයක් එන්නේ ඒ යුද උපකරණත් එක්ක පෙළපාළි යනකොට කියලා. තමුන්නාන්සේලා අද ඔය පුටුවල වාඩි වෙලා ඉන්නේ මේ රට බේරා ගත් රණ විරුවන්ට පින් සිද්ධ වෙන්න. හැබැයි රණ විරුවන්ට එහෙම කරලා, රණ විරුවන් ශත පහකට ගණන් ගන්නේ නැතිව තමුන්නාන්සේලා මොනවාද කිව්වේ? නිදහස් උත්සවයේදී අපි දැක්කා ඒ කථා කරන කෙනා කියන්න යනවා, "මේ රණ විරුවෝ යුද්ධය ජයග්‍රහණය කළා, මෙන්න මේ වාගේ පරිත්‍යාග කළා, තමුන්ගේ අත් පා නැති කර ගත්තා, ජීවිත නැති කර ගත්තා" කියලා. හැබැයි ටක් ගාලා ඒක නතර කර ගන්නවා. කවුරු හරි කෙනෙක් පිටුපසින් ඉඳලා කොනිත්තනවා වෙන්න ඇති. ඊට පස්සේ කියන්නේ දිට්වා සුළි කුණාටුව ගැනයි, ඒ

සම්බන්ධව කරපු වැඩ ගැනයි. *[බාධා කිරීමක්]* සරත් ෆොන්සේකා මැතිතුමා අපිත් එක්කනේ හිටියේ. තමුන්නාන්සේලා හිටියේ අනෙක් පැත්තේ. ඒක තමයි කියන්නේ මොළේ කවල් වෙලා කියලා. ඕකට හොඳට තෙල් දාලා මසාජ් කර ගන්න. පාර්ලිමේන්තුවේ තිබෙනවා, ඒ සඳහා තැනක්. එතැනට ගිහිල්ලා මසාජ් කර ගන්න. එතකොට තේරෙයි. මොකද, සරත් ෆොන්සේකා මහත්තයා අපි ළඟ ඉන්නකොටයි ඒ ප්‍රශ්නය වුණේ. දැන් අමතක වෙලා, ඒක දන්නේ නැහැ.

රණ විරුවන්ට එහෙම කරලා, පොලීසියට එහෙම කරලා තමුන්නාන්සේලා ප්‍රභාකරන්ගේ නිවස හදලා දෙනවා. හැබැයි, දිට්වා සුළි සුළඟින් අනාථ වුණු අයට ගෙවල් ටික හදලා දීලා තිබෙනවාද? රණ විරුවාට, "රණ විරුවා" කියන්න බැහැ. හැබැයි අපේ අර්ච්චුනා මන්ත්‍රීතුමා කියනවා වාගේ ප්‍රභාකරන්ගේ නිවස හදලා දෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අපට ඕනෑ නැහැ, අපට ඕනෑ නම් අපි ගේ හදා ගන්නම්. *[බාධා කිරීමක්]*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ප්‍රභාකරන්ගේ නිවස හදලා දෙනවා. *[බාධා කිරීමක්]* අන්න, තමුන්නාන්සේලා ලජ්ජා වෙන්න ඕනෑ. ඒ මන්ත්‍රීතුමා කියන කථාව හොඳට අහගන්න. ලජ්ජා වෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]*

දැන් බලන්න, ඉන්දියානු නාවික හමුදාව අපේ ධීවරයන්ට අපේ මුහුදේදී ගැහුවා. තමුන්නාන්සේලාගේ කොන්ද පණ නැද්ද, ඉන්දියාවත් එක්ක ඒ ගැන කථා කරලා ඒක බේරාගන්න? තමුන්නාන්සේලා බුදියගෙනද හිටියේ ඒ සම්බන්ධව වැඩ කටයුතු කරද්දී? තමුන්නාන්සේලා ඒකට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළාද? තමුන්නාන්සේලා එහෙම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළේ නැහැ. තමුන්නාන්සේලා අද වන විටවත් අඩුම ගානේ ඒ ධීවරයන් බලන්නවත් ගිහිල්ලා නැහැ. රටක් හැටියට තමුන්නාන්සේලා ඉස්සෙල්ලාම ඕනෑම රටක් ඉස්සරහ කොන්ද කෙළින් තියාගන්න පුළුවන් කණ්ඩායමක් වෙන්න.

පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධව ගත්තත්, තමුන්නාන්සේලා තමයි කිව්වේ, සාරා ඉන්දියාවේ ඉන්නවා කියලා. ඊට පසුව කිව්වා ඉන්දියාවේ නැහැ, හැබැයි සාරා ඉන්නවා කියලා. සාරා ඉන්නවා නම් සාරා හංගලා තිබෙන්නේ තමුන්නාන්සේලාද? අපි දන්නවා, නඩු ටික ඉතා ඉක්මනින් ඉවර කරන්න හදනවා කියලා. හැබැයි, මහ මොළකාරයා හංගලා අධිකරණ කටයුතු අවසාන කරන්න එපා කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලනවා. ඒ වැඩේ කරන්න සූදානම් වෙන්න එපා. මේ රටේ ජනතාව රවට්ටන්න හදන්න එපා. හදිසි නීතිය ක්‍රියාත්මක කරද්දි විශේෂයෙන්ම මෙන්න මෙවා සම්බන්ධ වැඩකටයුතු නිවැරදිව කරන්න මතක තබාගන්න. එහෙම නැතුව තමුන්නාන්සේලාගේ එක එක දේවල්වලට හදිසි නීතිය පාවිච්චි කරලා, එක එක්කෙනා බය කරලා, social media බය කරලා, සමහර මන්ත්‍රීවරු බය කරලා වැඩ කටයුතු කරගන්න හිතනවා නම්, එතැනදි තමුන්නාන්සේලාට විශාල ප්‍රශ්නයක් මතු වනවා.

මේ කාරණයත් මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. අපි දැක්කා, ඊයේ-පෙරේදා social media හරහා පළ වුණු ප්‍රවෘත්තියක්. පුත්තලම දිස්ත්‍රික්කයේ, තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරයෙක් සම්බන්ධ හඬ පටයක් ගැන කියනවා, ඒ මාධ්‍ය හරහා. යම් මන්ත්‍රීවරයෙක් සම්බන්ධවයි මේ කියන්නේ. මතක තියාගන්න, මගේ මේ mobile phone එකේත් ඒ හඬ පටය තිබෙනවා. හැබැයි මම ඒ මාධ්‍ය ආයතනයටත් කියනවා, ඒ හඬ පටය තබාගත්තාට පෞද්ගලිකව මන්ත්‍රීවරයෙකුට මඩ ගහලා විනාශ කරන්න අපි සූදානම් නැහැ කියලා. අපි තමුන්නාන්සේලාගේ අතිගරු ජනාධිපතිතුමාටත් කියනවා, තමුන්නාන්සේලා බොහොම සුපිරිසිදු කණ්ඩායමක් හැටියට තමයි ආවේ, එහෙම නම් ඒක බේරාගන්න එතුමා කටයුතු කළ යුතුයි කියලා. මේ කණ්ඩායම කවුද, මොකක්ද මේ සිද්ධ කළේ කියලා සොයා බැලිය යුතුයි. මම අනෙක් අයට ඇඟිල්ල දික් කරන්නේ නැහැ. හැමකෙනාටම ඇඟිල්ල දික් කරන්නත් අපට බැහැ. ඒ මාධ්‍යකරුවන්ටයි අපි මේ දේ කියන්නේ. ඒ මාධ්‍ය අහනවා, මේක බලලා මන්ත්‍රීවරුන් හැටියට අපි මොනවාද කළේ කියලා. මේක අපේ ෆෝන්වලටත් ලැබුණාද, නැද්ද කියලා අහනවා. අපටත් ලැබුණා, ඒ හඬ පටය. හැබැයි, අපි ඒක එහෙම එළියට දමන්නේ නැහැ. ඒකට ක්‍රම තිබෙනවා. මතක තබාගන්න, ඔබතුමන්ලාගේ මල් පැළ දැන් වල් පැළ වෙමින් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ මල් පැළ වල් පැළ වෙනකොට ඒකට එකතු වෙච්ච තව කරුණු-කාරණා ගොඩක් තිබෙනවා. තව ඉස්සරහට යමු. ඉස්සරහට යද්දි තමුන්නාන්සේලාට හොඳ හොඳ සෙල්ලම් දැකගන්න හැකිවේවි කියලා මම කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
කාලය අවසානයිද, එහෙම නැත්නම් තව මිනිත්තු දෙකක් තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
අවසාන වශයෙන් මම මේ කථාව කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හොඳ කථාවක් තිබෙනවා. "එනපොට හොඳ නැහැ; සාංචියේ කෙල්ල ගෙට ගන්" කිව්වලු කියලා. මතක තියාගන්න, මේ රටේ සිද්ධ වෙන ඊළඟ කාරණාව මොකක්ද? එහෙම නැත්නම් ඊළඟට කියන එක තමයි, "අන්න, මාලිමාවේ 159න් එකෙක් එනවා, ගනින් කොල්ලා ගෙට" කියලා. එහෙම කියලා රටේ ජනතාව ගෙවල්වල දොරවල් ලොක් කර ගනීවි. ඒකෙන් ප්‍රවේශම් වෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.50]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. *[බාධා කිරීම්]*

[ගරු මුනීර් මුලාෆර් මහතා]

මට කලින් කථා කරපු මන්ත්‍රීතුමාගේ කථාව ඇහුවා නම් තේරෙනවා, තමන් කොතරම් පාරිශුද්ධයිද, අනෙක් සියලුදෙනා කොහොමද කියලා. ඇත්තටම හදිසි නීතිය පිළිබඳව ඇයි මෙතරම් කෑ කෝ ගැසීම්, ඇයි මෙතරම් බිය පළ කරන්නේ කියන එක ප්‍රශ්නයක්. නමුත්, විපක්ෂය නියෝජනය කරන සියලුදෙනාම හදිසි නීතිය පිළිබඳව මෙතරම් බියකින් කථා කරන එක සාධාරණයි. ඉතිහාසය පෙරළා නිවැරදිව කියවා බැලුවා නම් පෙනේවි, ඔය විපක්ෂයේ ඉන්න සියලුදෙනා බලයේ ඉන්නකොට හදිසි නීතිය මුවාවෙන් මොන තරම් කැත විධියට, මජර විධියට ඒ නීති කඩාගෙන මේ රටේ වැඩ කළාද කියන එක. ඒක සිහිබුද්ධියක් තිබෙන, සාධාරණව හිතන ඕනෑම කෙනෙකු දන්නා දෙයක්. අපේ රටේ නිදහස් මාධ්‍යවේදීන්ගෙන් විමසා සිටියා නම් කියාවි, අතීතයේ තිබුණු ආණ්ඩු හදිසි නීතිය පාවිච්චි කරලා ඒ අයගේ බලය රැකගන්න ක්‍රියා කළ ආකාරයෙ සහ බලය අවභාවිත කළ ආකාරය. බලය රැකගැනීම සඳහා තමයි ඉතිහාසය පුරාවටම හදිසි නීතිය පාවිච්චි කළේ. ඒක ජේ.ආර්. ජයවර්ධනගේ කාලය වෙන්න පුළුවන්, 88-89 කාලය වෙන්න පුළුවන්, 83 ජූලි වෙන්න පුළුවන්.

දිට්වා සුළි කුණාටුව නිසා මුළු රටම විශාල විනාශයකට ගොදුරු වුණු බව අපි හැම කෙනාම පිළිගන්නවා. ඒ නිසා අපේ රට ආපදා තත්ත්වයකට පත් වුණා. අපේ රජය බලයට පත් වෙලා පළමුවන වතාවට හදිසි නීතිය මේ වෙලාවේ සම්මත කර ගන්නේ ඇයි? ඒ, ආපදා තත්ත්වය හේතුවෙන් බිඳ වැටුණු, කඩා වැටුණු, ආපදාවට පත් වුණු මේ රටේ ජනතාව නැවත ක්ෂණිකව, ශීඝ්‍රයෙන් නඟාසිටුවීම සඳහා අවශ්‍ය පරිසරය ගොඩනඟා ගැනීමටයි. මෙතැන කථා කරන හැම කෙනාම දන්නවා, අදටත් ඒ හදිසි නීතිය පාවිච්චි කරලා, දිට්වා සුළි කුණාටුව නිසා ආපදාවට පත් වුණු, හානියට පත් වුණු උදවිය නැවත ගොඩනැඟීම සඳහා අවශ්‍ය පියවර අපි කොතරම් දුරට ගනිමින් ඉන්නවාද කියලා. ඒ නිසා තමයි ගාල්ලෙන් මහනුවරට, කළුතරින් නුවරඑළියට වාගේම හම්බන්තොටින් තවත් ප්‍රදේශවලට ජනතාව යවලා, පළාත් පාලන ආයතන හරහා ඒ අයගෙන් වැඩ ගනිමින් ඉතා ඉක්මනින්ම ඒ ආපදාවට ලක් වුණු ජනතාව යථා තත්ත්වයට පත් කරන්න අපට පුළුවන් වුණේ. ඒ නිසා විපක්ෂයට කවදාවත්, කිසිම අවස්ථාවක දැත් දිගු කරලා, ඇඟිලි දිගු කරලා අපට චෝදනා කරන්න බැහැ. මොකද, හදිසි නීතිය පාවිච්චි කරලා එදා පැවති රජයන් වැරදි විධියට මාධ්‍ය මර්දනය කරලා, ජනතාව මර්දනය කරලා තමන්ගේ බලය රැක ගන්න වැඩ කළා සේ අපේ ආණ්ඩුව කිසිම අවස්ථාවක කටයුතු කළේ නැහැ කියන එක විපක්ෂය විතරක් නොවෙයි, මේ රටේ හෘදය සාක්ෂියක් තිබෙන හැම කෙනාම වාගේ දන්නවා.

ඒ වාගේම අද හදිසි නීතිය පිළිබඳව කලබල වෙලා කථා කරන අයට මම කියන්න කැමැතියි, 2017 යහ පාලන ආණ්ඩුව පැවති සමයේ මීතොටමුල්ල කුණු කන්ද කඩා වැටෙනකොට මුළු රටම දිට්වා සුළි කුණාටුවෙන් වාගේ ආපදා තත්ත්වයකට පත් වුණේ නැහැ කියන එක. මීතොටමුල්ල කුණු කන්ද කඩා වැටුණු ගමන් රටේ හදිසි නීති තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන තත්ත්වයට පත් වුණා. එම නිසා මේ මොහොතේදී ඒ හදිසි නීතිය පිළිබඳව මතක් කරන්න කොතරම් සදාචාර සම්පන්න අයිතියක් තිබෙනවාද කියන කාරණය මම ඉතාම ගෞරවයෙන් මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි, මේ සභාවේදී විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් මතු කළා, අද වනකොට අපේ රට පරිසර දූෂණය අතින් ලෝකයේ ඉහළම තැනක වැජඹෙනවාය කියන කාරණාව. ඒ පිළිබඳව එතුමන්ලාගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා බලන්න අවශ්‍යයි. මොකද, එතුමන්ලා බොහෝ කාලයක් බලයේ සිටියදී පරිසරය විනාශ කරන එවැනි තීන්දු - තීරණ අරගෙන තිබෙනවාද කියන එකත්, තමන් නියෝජනය කරපු ආණ්ඩු කටයුතු ඒ පිළිබඳව කරපු ආකාරය පිළිබඳවත් සලකා බලන එක ඉතා වැදගත් කියා මම කියනවා. පරිසරය විතරක් නොවෙයි, අපේ රටේ බලය ඉතාම දූෂිත විධියට පාවිච්චි කරලා වංචාව, දූෂණය අතින් රට ඉහළම තැනකට ඔසවා තිබුණු යුගයක් පසුගිය කාලයේ පැවතුණා. නමුත්, අපි බලයට පත් වෙලා ගත වුණු අවුරුද්දක වාගේ කාලය තුළ ඒ වංචාවෙන්, දූෂණයෙන් තොරව අපේ රට පිරිසිදු කරන්න අපට පුළුවන් වුණා. ඒ නිසා හදිසි නීතිය ඔස්සේ අදටත් වර්තමාන ආණ්ඩුව උත්සාහ දරන්නේ ඒ ආපදාවට පත් වුණු ජනතාව නඟාසිටුවීමයි කියන කාරණාව මම මතක් කරන්න කැමැතියි.

அதேபோன்று, இந்தச் சந்தர்ப்பத்தில் இன்னுமொரு விடயத்தைக் குறிப்பிட வேண்டும். நேற்றைய தினம் இந்தச் சபையிலே கௌரவ உறுப்பினர் ஒருவர் குறிப்பாக, மன்னார் - புத்தளம் பாதையைத் திறப்பது சம்பந்தமாகக் கூக்குரலிட்டு, எமக்கு அரசியல் மனச்சாட்சி இருக்கின்றதா? என்று கேட்டிருந்தார். ஆனால், அந்த அரசியல் மனச்சாட்சி அவருக்கு இருக்கின்றதா, இல்லையா என்பதை இந்த நாட்டிலுள்ள அனைவரும் நன்றாக அறிந்திருக்கின்றார்கள் என்பதை நான் அவருக்குப் பணிவாகத் தெரிவித்துக் கொள்கின்றேன். இன்று எமது அரசாங்கம் அந்தப் பாதையை மூடியதாகக்கூறி, இந்த நாட்டு மக்களைப் பிழையாக வழிநடாத்த முயற்சிக்கின்ற அவரால், கடந்த காலங்களில், அதாவது 25 வருடமாக பாராளுமன்றத்தில் பலமான Cabinet அமைச்சுப் பதவியைப் பொறுப்பேற்றுச் செயற்பட்டபோது, ஏன் அந்தப் பாதையை சிறந்த முறையில் செப்பனிட்டுத் திறக்க முடியாமற் போனது? இந்த நாட்டிலுள்ள அனைவரும் அறிந்த விடயம்தான், இவர்கள் பசில் ராஜபக்ஷ அவர்களுடன் இணைந்து எவ்வாறு, என்னென்ன விடயங்களை மேற்கொண்டார்கள் என்பது. அவற்றை எல்லாம் இன்று மக்கள் சமூக வலைத்தளங்களிலே மிகத் தெளிவாக வெளிப்படுத்திக் கொண்டிருக்கின்றார்கள். இந்தச் சந்தர்ப்பத்திலே குறித்த பாதை சம்பந்தமான வழக்குத் தொடர்பில் அவரின் நிலைப்பாடு என்னவாக இருந்தது என்ற விடயத்தை நான் வாசிக்கின்றேன்: "இத்தகைய சூழ்நிலைகளில், நான்காவது பதிலளிப்பாளர் சார்பில் முன்னிலையான கற்றறிந்த சட்டத்தரணி, முதல் பதிலளிப்பாளரால் எடுக்கப்பட்ட தீர்மானத்திற்குத் தாம் எந்தவிதத் தடையும் ஏற்படுத்தவில்லை என நீதிமன்றத்திற்கு அறிவித்தார்." எனவே, இவர் நீதிமன்றுக்கு ஒரு விடயத்தைக் கூறிவிட்டு, இந்தச் சபையிலே இன்னுமொரு விடயத்தைக் கூறுகின்றார்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நேற்றைய தினம் காலையில் அமைச்சர் கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள், பாராளுமன்ற உறுப்பினர் கௌரவ காதர் மஸ்தான் அவர்களால் நிலையியல் கட்டளை 27(2) இன்கீழ் எழுப்பப்பட்ட வினாவுக்குப் பதிலளித்தபோது, குறித்த புத்தளம் - மன்னார் பாதை சம்பந்தமாக அரசாங்கத்தின் நிலைப்பாடு என்ன, உண்மையிலேயே அந்தப் பிரதேசத்தில் வாழுகின்ற மக்களுடைய பிரச்சினைகள் என்ன என்பது பற்றி மிகத் தெளிவாகவும் விரிவாகவும் இந்தச் சபையிலே எடுத்துரைத்தார். அந்தச் சந்தர்ப்பத்தில் பாராளுமன்ற உறுப்பினர் கௌரவ காதர் மஸ்தான் அவர்கள்கூட அரசாங்கத்துக்கு நன்றி தெரிவித்திருந்தார்.

எனவே, இவர்கள் இந்த விடயம் பற்றி கதைப்பதற்கு முன்னரே நாங்கள் சகல விடயங்களையும் எமது அரசாங்கத்தில் கதைத்திருக்கின்றோம். இன்று சிலர் அரசியல் ரீதியாக அநாதைகளாக்கப்பட்டிருப்பதால், கடந்த 20 வருடங்களுக்கும் மேலாக இந்தப் பாதைப் பிரச்சினையை வைத்துச் செய்த அரசியலைத் தொடர்ந்தும் செய்யும் நிலைக்கு இவர்கள் தள்ளப்பட்டிருப்பது வேதனைக்குரிய விடயமாக இருக்கின்றது.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
Madam, I rise to a point of Order.

**ගරු මුනීර් මුලාෆර් මහතා**
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
கௌரவ உறுப்பினர் அவர்களே, நான் பேசி முடித்த பின்னர் நீங்கள் point of Orderஐக் கேளுங்கள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ பிரதி அமைச்சர் அவர்களே, உங்களிடம்தான் எனது கேள்வி! இந்தப் புத்தளம் - மன்னார் பாதை தொடர்பாக நீதிமன்றத்தினால் வழங்கப்பட்ட தீர்ப்புப் பற்றி நீங்கள் சொன்னீர்கள். அதிலே முதல் பதிலளிப்பாளரால் எடுக்கப்பட்ட தீர்மானத்திற்கு இணங்கியது யார்? *[இடையீடு]* நீங்கள் பெயரைச் சொல்லித்தானே கதைக்க வேண்டும். அப்போதுதான் அது யாரென்பது மக்களுக்குத் தெரியவரும்.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ றிஸாட் பதியுதீன் என்று பெயரைச் சொல்லலாம்தானே! ஏன் பெயரைச் சொல்ல உங்களுக்குப் பயமா? றிசாட் என்று சொல்லுங்கள்!

**ගරු මුනීර් මුලාෆර් මහතා**
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
எனக்குப் பெயர் சொல்லவேண்டிய தேவை கிடையாது. நான் குறித்த விடயத்தைச் சொல்கின்றபோதே அது யாரோடு தொடர்புபட்டது என்பது இந்த நாட்டில் உள்ள அனைவருக்கும் மிகத் தெளிவாகத் தெரியும்! மீள்குடியற்ற அமைச்சுப் பொறுப்பைக் குறித்த பாராளுமன்ற உறுப்பினர் கடந்த காலத்தில் பெற்றிருந்த சந்தர்ப்பத்தில்கூட, அந்தப் பாதை சம்பந்தமான விடயங்களைச் சிறப்பான முறையில் அவர் செய்திருக்கலாம், ஆனால் செய்யவில்லை!

அதேபோன்று, இன்னொரு விடயத்தையும் இந்தச் சந்தர்ப்பத்திலே கூறிக் கொள்கின்றேன். சவூதி அரசாங்கத்தின் நிதியுதவியின் மூலமான நுரைச்சோலை வீட்டுத் திட்டத்தில் வழங்கப்பட்ட 500 வீடுகளை மக்களுக்கு வழங்குவதற்குத் தடையாக மீண்டும் கிழக்கிலே இருக்கக்கூடிய ஓர் அரசியல்வாதி சூழ்ச்சி செய்கின்றார். அவருடைய பெயரை நான் குறிப்பிட வேண்டிய அவசியம் கிடையாது; அனைவரும் அறிந்த ஒருவர்தான். கடந்த காலத்தில் அமைச்சுப் பதவியில் இருந்த பேரியல் அஷ்ரஃப் அவர்களிடம்கூட இது சம்பந்தமான விடயத்தை நான் கேட்டறிந்தேன். அப்போது, உண்மையிலே அந்த மக்களுக்குக் கிடைக்க வேண்டிய அந்த வீடுகளைக் கிடைக்கவிடாமல் தெற்கிலுள்ள இனவாதிகளைத் தூண்டி, அங்கு போராட்டங்களை மேற்கொண்டு, அதற்குத் தடையாக யார் இருந்தார்கள் என்பதை அறிந்து கொண்டேன்.

மீண்டும் அந்த வீட்டுத் திட்டத்தைப் பற்றி இந்த அரசாங்கம் பல்வேறு இடங்களிலும் கதைத்து, அந்த மக்களுக்குக் கிடைக்க வேண்டிய அந்த வீடுகளை நியாயமாகப் பெற்றுக் கொடுப்பதற்கான முயற்சிகளை மேற்கொள்கின்றபோது, அந்த வீடுகள் அந்த மக்களுக்குச் சென்றடைந்தால் மீண்டும் தனக்கு அரசியல் செய்ய முடியாதோ என்ற அச்சத்தின் காரணமாக, அதற்கெதிராக மீண்டும் இனவாத ரீதியாகச் சில செயற்பாடுகளை குறிப்பிட்ட அந்த அரசியல்வாதி மேற்கொண்டு வருகின்றார். எனவே, முஸ்லிம் சமூகத்தில் எப்போதும் தம்மை அரசியல் காவலர்களாக, தலைவர்களாகக் காட்டிக்கொண்டு, சமூகத்தை எப்போதும் பிழையான இடத்துக்கு, பிழையான முறையிலே இட்டுச் சென்று, சமூகத்திற்குக் கிடைக்கவேண்டிய விடயங்களைக் கிடைக்கப் பெறாமல் செய்கின்ற ஒரு நிலைப்பாட்டை அவர்கள் மேற்கொண்டு வருகின்றார்கள்.

அதேபோன்று, நான் பொறுப்பாக இருக்கும் அமைச்சின் கீழ் இயங்கும் முஸ்லிம் சமய, பண்பாட்டலுவல்கள் திணைக்களம் தொடர்பான விடயமொன்றை இன்று இங்கு குறிப்பிடுகின்றேன். பொதுவாக, பள்ளிவாசல்கள் என்பது அரசியல் சார்ந்து இருக்கக்கூடாது. ஆனால், துரதிருஷ்ட வசமாக அரசியல்வாதிகள் தங்களது பலத்தைப் பிரயோகிப்ப தற்கு மத ஸ்தலங்களைப் பயன்படுத்துகின்ற ஒரு கேடுகெட்ட நிலை இங்கு காணப்பட்டது. எனவே, இந்த ஆட்சியின் ஊடாக கண்டிப்பாக அதனை மாற்றுவதற்கான முயற்சிகளை நாம் மேற்கொள்வோம் எனக் கூறி விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON.(MRS.) SAGARIKA ATHAUDA left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[பி.ப. 3.02]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ பிரதி அமைச்சர் முனீர் முலாபர் அவர்கள் கூறிய ஒரு சில கருத்துக்கள், குறிப்பாக கௌரவ பாராளுமன்ற உறுப்பினர் றிஸாட் பதியுதீன் அவர்கள் சம்பந்தமான

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

தென்றுதான் நான் நினைக்கிறேன். எனக்குப் பக்கத்தில் இருக்கும் மன்னார் மாவட்டத்தைச் சார்ந்த கௌரவ பாராளுமன்ற உறுப்பினர் அமிர்தநாதன் அடைக்கலநாதன் அவர்கள், இதுவும் தன்னுடைய தலையில் வந்து சேர்ந்து விழப் போகின்றதா என்றுதான் கொந்தளித்துக் கொண்டிருந்தார். அவருக்கு ஏற்கனவே நிறையப் பிரச்சினைகள் இருக்கின்றன. இதையும் தன்னுடைய தலையில் போடக்கூடாது என்பதற் காகத்தான் அவர் அதைச் சொன்னார். நீங்கள் பெயரைக் குறிப்பிட்டுச் சொல்லியிருக்க வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அவசரகாலச் சட்டத்தின் பிரகாரம் கொண்டுவரப்பட்டுள்ள இந்தத் தீர்மானத்தை நாங்கள் எதிர்க்கின்றோம். அந்த வகையில் நான் இந்த விவாதத்தின் இறுதியில் divisionஐக் கோரவிருக்கின்றேன். நடைபெறவுள்ள வாக்கெடுப்பில், இந்த அவசரகாலச் சட்டத்தை நீடிப்பதற்கு எதிராக எங்களுடைய வாக்குகளைச் செலுத்தவிருக்கின்றோம். ஏன், நாங்கள் அதனை எதிர்க்க வேண்டுமென்பது பற்றி, தமிழர்களின் வரலாற்றை எடுத்துப் பார்த்தால் புதிதாக எதையும் இங்கு பதிவுசெய்யத் தேவையில்லையென நான் நினைக்கின்றேன். இன்றைக்குக்கூட தையிட்டியில் சட்டவிரோதமாக விகாரை அமைக்கப்பட்டுள்ளதற்கு எதிராக ஒவ்வொரு மாதமும் பௌர்ணமி தினத்தில் பொதுமக்களும், பாதிக்கப்பட்ட மக்களும், அரசியல் பிரமுகர்களும், சிவில் சமூகச் செயற் பாட்டாளர்களும் போராடுகின்றபொழுது, பொலிசார் வழமையாக நீதிமன்றத்திற்குச் சென்று அந்தப் போராட் டத்தைத் தடை செய்வதற்கு நடவடிக்கை எடுக்கின்றார்கள். ஆனால், இந்த அவசரகாலச் சட்டம் பிரகடனப்படுத்தப்பட்ட பிற்பாடு, அவசரகால நிலை என்ற விடயத்தையும் சுட்டிக்காட்டி, அவ்வகையான ஒரு காலகட்டத்தில் இவ் வகையான செயற்பாடுகள் எதனையும் முன்னெடுக்கக் கூடாது என்ற கருத்தையும் பதிவுசெய்து, அந்தப் போராட்டத்தைத் தடுப்பதற்குத் தடை உத்தரவைப் பெற முயற்சிக்கின்றார்கள். நீதிமன்றம் அதனை மறுக்கின்றதே தவிர, இந்த நிர்வாகம் அந்தச் சட்டங்களை எந்த வகையில் பாவிக்கின்றதென்பது வட, கிழக்கில் இருக்கக்கூடிய அனைத்து மக்களுக்கும் நன்றாகத் தெரியும்!

அதுபோல், "பயங்கரவாதத் தடுப்புச் சட்டம் என்பது கொடூரமான ஒரு சட்டம்; அதனை நாங்கள் நீக்கப் போகின்றோம்" என்று சொல்லிக்கொண்டு, ஆட்சிக்கு வந்த இந்த அரசு, இன்றைக்கு வட, கிழக்கில் அரசியல் ரீதியாக மக்கள் இந்த அரசாங்கத்தை எதிர்க்கின்ற ஒவ்வொரு சந்தர்ப்பத்திலும் அதனை முறியடிக்க அதே பயங்கரவாதத் தடுப்புச் சட்டத்தையே பயன்படுத்துகின்றது. ஆகவே, நாங்கள் இதனைக் கடுமையாக எதிர்க்கின்றோம்; நிச்சயமாக இந்தச் சட்ட நீடிப்புக்கு எதிராக வாக்களிப்போம்.

ஆனால், தற்பொழுது இந்த அவசரகாலச் சட்டத்தை நீடிப்பதற்காகச் சொல்லப்படுகின்ற காரணம் என்ன வென்றால், 'தித்வா' புயல் காரணமாக ஏற்பட்ட பாதிப்புக்களைச் சரியான வகையில் கையாண்டு, அதனை நிவர்த்தி செய்வதற்குத் தேவைப்படுகின்ற செயற்பாடுகளை உறுதிப்படுத்துவதற்கு இது தேவை; ஏனென்றால், எதிர்ப்பு நடவடிக்கைகளை மேற்கொண்டோ, மக்கள் குழப்பமடைந்தோ அந்தத் திட்டங்கள் குழம்பக் கூடாது, தாமதிக்கப்படக்கூடாது என்பதாகும். அதற்காகத்தான் உங்களுக்கு இந்த அவசரகாலச் சட்டம் தேவையென்று நீங்கள் சொல்கின்றீர்கள். இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்து ஒரு வருடத்துக்கும் மேலாகி விட்டது. நாங்கள் இந்தப் பாராளுமன்றத்துக்கு வந்த பின்பு இந்த "தித்வா" புயலால் ஏற்பட்ட சேதங்கள் போன்று, இதற்கு முன்னரும் எத்தனையோ புயல்களால் வட மாகாணத்தில், குறிப்பாக யாழ்ப்பாணத்தில், பெரும் சேதங்கள் ஏற்பட்டிருக்கின்றன.

2020ஆம் ஆண்டு டிசம்பர் மாதம் நெடுந்தீவில் 'புரேவி' புயல் தாக்கியதால், நெடுந்தீவு மக்களுக்கு 20 மில்லியன் ரூபாய் பெறுமதியான சேதம் ஏற்பட்டது. அந்த விடயங்கள் பற்றி இந்தப் பாராளுமன்றத்தில் இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னரும் பல தடவை பேசப்பட்டது. நான் நினைக்கிறேன், கௌரவ சிறீதரன் அவர்களும் இந்த விடயத்தைப் பற்றி இங்கே பேசியிருக்கிறார் என்று. ஆனால், இதுவரைக்கும் ஒரு சதம்கூட அவர்களுக்கு நிவாரணம் கொடுக்கப்படவில்லை. "2020ஆம் ஆண்டு ஆட்சி செய்தவர்கள் தவறு செய்தவர்கள், காசு அடித்தவர்கள், அதனைச் செய்தவர்கள், இதனைச் செய்தவர்கள்" என்று சொல்லிக்கொண்டு இருக்கின்றவர்கள், ஆட்சிக்கு வந்து இன்று ஒரு வருடத்துக்கும் மேலாகியும், ஒவ்வொரு மாதமும் நடைபெறும் District Coordinating Committee கூட்டங்களில் இந்தப் பிரச்சினைகள் எழுப்பப்பட்டும்கூட, பாதிக்கப்பட்ட மக்களுக்கு எந்தவித நிவாரணமும் கொடுக்கப்படவில்லை. இதற்கு முன்னர், 2021ஆம் ஆண்டு ஆட்சியில் இருந்தவர் களால் வட மாகாணத்துக்காக 58 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருந்தும் நெடுந்தீவுக்கு ஒரு சதமும் ஒதுக்கப்படவில்லை.

ஆகவே, இவற்றைத்தான் நீங்கள் செய்ய வேண்டும். இவற்றுக்கு அவசரகாலச் சட்டம் தேவையில்லை. இவை எப்போதே செய்திருக்க வேண்டிய விடயங்கள்! இவற்றைச் செய்யாமல், இன்று நீங்கள் இந்த அவசரகாலச் சட்டம் ஏதோ 'தித்வா' புயலுக்காகத்தான் கொண்டுவரப்பட்டது என்று சொல்லி எங்களைப் பேய்க்காட்ட இயலாது. நிச்சயமாக, உங்களுடைய அரசியல் செயற்பாடு காரணமாக மக்கள் மத்தியில் வளர்கின்ற எதிர்ப்பை மறுப்பதற்கும் அதை அடக்குவதற்கும் உங்களுக்குத் தேவைப்படுகின்ற அதிகார மாகத்தான் நாங்கள் இதைப் பார்க்க வேண்டியிருக்கின்றது.

இந்திய மீனவர்களுடைய trawlers இங்கே வந்து எங்களுடைய மீனவர்களுடைய சொத்துக்களை அழிக்கின்ற பிரச்சினைகள் பற்றி ஒவ்வொரு மாதமும் இந்தப் பாராளு மன்றத்தில் குறிப்பாக, வட மாகாணத்தைச் சார்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் அவ்வப்போது கேள்வி எழுப்பியிருக்கிறார்கள். குறிப்பாக, நானும் வரவு செலவுத்திட்ட விவாதங்களின்போது ஒவ்வொரு முறையும் இந்த விடயம் பற்றி கேட்டிருக்கிறேன். ஆனால், இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்து ஒன்றரை வருடங்களாகப் போகின்ற நிலையிலும்கூட, இதுபற்றி எந்தவிதமான ஆக்கபூர்வமான நடவடிக்கையையும் எடுக்கவில்லை. 2025ஆம் ஆண்டில் வெறுமனே 16 trawlersஐ மட்டும்தான் நீங்கள் கைப்பற்றியிருக்கிறீர்கள். இந்த வருடம் இதுவரைக்கும் 6 trawlersஐ மட்டுமே கைப்பற்றியிருக்கிறீர்கள். ஆனால், இன்றைக்கு ஆயிரக்கணக்கான trawlers ஒவ்வொரு நாளும் வட மாகாணக் கடற்பரப்புக்குள் அத்துமீறி வந்து எங்களுடைய மீனவர்களுடைய சொத்துக்களை முற்றுமுழுதாக அழிக்கின்றன. இந்த விடயத்தில் இதற்கு முன்னர் இருந்த ஆட்சியாளர்களும் இதே மாதிரித்தான் செயற்பட்டார்கள்.

2013ஆம் ஆண்டிலிருந்து சுமார் 500 இந்திய trawlers பிடிபட்டிருக்கின்றன; அவற்றில் 319 trawlers எந்தவிதமான பிரச்சினையும் இல்லாமல் விடுவிக்கப்பட்டிருக்கின்றன.

இன்றைக்கும் 115 trawlers அரச கட்டுப்பாட்டில் இருக்கின்றன. இந்த 115 trawlers தொடர்பிலும் 30 வழக்குகள் மட்டும்தான் நீதிமன்றங்களில் தாக்கல் செய்யப்பட்டிருக் கின்றன. அத்தோடு, 2,871 இந்திய மீனவர்கள் கடற்படை யினரால் கைதுசெய்யப்பட்ட நிலையில், எந்தவிதமான நடவடிக்கையும் எடுக்காது 2,779 மீனவர்கள் விடுவிக்கப் பட்டிருக்கிறார்கள். மிகுதி 92 பேர் மட்டுமே நான் சொன்ன அந்த 30 வழக்குகளில் சம்பந்தப்பட்டு இருக்கிறார்கள். இப்படியான ஒரு நிலைமைதான் இருக்கின்றது. நான் உங்களை மாத்திரம் சொல்லவில்லை; இதற்கு முன்பிருந்த அரசாங்கங்களையும் சேர்த்துத்தான் சொல்கிறேன். ஆனால், சாதாரண மக்களுடைய உணர்வுகளைப் புரிந்து கொண்டவர்கள் என்று உங்களைப் பற்றி சொன்ன நீங்கள், ஏன் இப்படி நடந்து கொள்கிறீர்கள்? என்றுதான் நான் கேள்வியெழுப்புகிறேன். நாங்கள் இந்தப் பிரச்சினையை எழுப்பினால், உடனே "இராஜதந்திரம்" - "இந்தியாவைப் பகைக்கக் கூடாது" என்று சொல்கிறீர்கள். ஆனால், தெற்கில் இதே மாதிரியான ஒரு சம்பவம் நடந்தால் நீங்கள் இப்படிப் பார்த்துக்கொண்டு இருப்பீர்களா? இல்லை!

வடக்கு, கிழக்கு மாகாணங்களிலே இருக்கின்ற பெரும் பான்மையான மக்கள் தமிழ் பேசும் மக்களாக இருக்கின்ற படியினால், உங்களுக்கு அவர்கள்மீது அக்கறை இல்லை. அங்கிருக்கின்ற மீனவர்கள் தொழில் செய்ய முடியாமல் வெளிநாடுகளுக்குச் சென்றால், நீங்கள் அவர்களின் நிலத்தைப் பிடிக்கலாம் என்றுதான் யோசிக்கிறீர்களே தவிர, அந்த மக்களுடைய வாழ்வாதாரத்தைப் பாதுகாக்க எந்தவிதமான நடவடிக்கையும் எடுக்கத் தயாரில்லை; ஒரு நட்ட ஈடாவது வழங்குவதில்லை. சரி, உங்களால் இந்தக் கப்பல்களைக் கட்டுப்படுத்த முடியாவிட்டால், அதனால் பாதிக்கப்படுகின்ற மீனவர்களுக்கு நட்ட ஈடு வழங்குவதற்கு நீங்கள் தயாரா? அவ்வாறு எதுவும் செய்ய நீங்கள் தயாரில்லை. ஆகவே, உங்களுக்கும் இதற்கு முன்னிருந்த ஆட்சியாளர்களுக்கும் இடையிலே எந்தவித வேறுபாடும் இல்லை!

கடைசியாக, நான் ஒரேயொரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். இது கடந்த பெப்ருவரி முதலாம் திகதி திருகோணமலையிலே நடந்த சம்பவம். Sir, I will say this in English because I do not want to be misunderstood and I think the Hon. Members opposite must understand it in its proper context. On the 01st of February, a cremation took place in Trincomalee, that of Chief Incumbent or Nayaka Thera of Gokanna Rajamaha Viharaya. His cremation took place at the Municipal Council's McHeyzer ground. Sir, that ground is a ground used almost entirely by Tamil Children. Tamils have a culture that when somebody is cremated - it is almost a holy thing to do - and when they go to the crematorium, they go barefoot.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am winding up, Sir.

That is because they do not like treading on where their dead are either cremated or buried. That is part of our culture. So, when an honourable and a venerated Bhikkhu is cremated in such a public place, which people normally use, then our culture suggests that they cannot go there, that they must not step in there.

The same thing happened when the military took over LTTE cadres' gravesites. We wanted those gravesites to be returned to us because, today, those sites are camps and people walk over those graves. So, it is with the same sentiment that we are saying this.

After this incident happened, a gentleman called Rajkumar Rajeevkanth raised this matter on Facebook.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am concluding, Sir.

He raised this matter on Facebook and said that you must understand the sentiments of the Tamil people. That was not to disrespect the cremation a venerated Buddhist monk should receive. He must be cremated in a public place, yes, indeed.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මීට වඩා කාලය දීමට අපහසුයි. කථාව අවසන් කරන්න.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am finishing up, Sir.

But, the place chosen must be such that it must not, in any way, harm other people's sentiments. Now, Rajeevkanth is hounded and I appeal to the Government that that hounding must stop.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.14]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

හදිසි නීතිය නැවත දීර්ඝ කර ගැනීම සම්බන්ධ මේ විවාදයේදී අද උදේ ඉඳලා අදහස් ඉදිරිපත් කරපු විපක්ෂයේ බොහෝ දෙනෙකු කොහෙන් හරි වචන එකතු කරගෙන ඇවිල්ලා සුපුරුදු විධියටම මඩ, අවලාද මේ සභාවේ දිග හරින ස්වභාවයක් තමයි අපට පෙනුණේ.

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

2025 වර්ෂයේ ඒ ඇති වෙච්ච ස්වාභාවික විපත ඉතිහාසයේ අපට ගෙනැල්ලා දුන්නු බරපතළ ව්‍යසනය බවට පත් වෙලා තිබෙනවා. එය රටක් විධියට අපට බරපතළ ලෙස ආර්ථික පාඩුවක් ගෙනැල්ලා දීලා තිබෙනවා; ජීවිත විශාල ප්‍රමාණයක් අපට අහිමි කරලා තිබෙනවා. ඒ වාගේම අපි දැක්කා, මධ්‍යම කඳුකරයේ නිවාස පස් කඳුවලට යට වෙලා තිබෙනවා. මාර්ග විශාල ප්‍රමාණයක් බරපතළ ලෙස විනාශ වෙලා තිබෙනවා, යථාවත් කරන්න බැරි මට්ටමට. පාලම් විශාල ප්‍රමාණයක් හානියට පත් වෙලා තිබෙනවා; විනාශ වෙලා තිබෙනවා. පාසල් විශාල ප්‍රමාණයක් විනාශ වෙලා තිබෙනවා. ඒ වාගේම, ආගමික ස්ථාන ද විශාල වශයෙන් විනාශයට පත් වෙලා තිබෙනවා. ඒ ස්වාභාවික විපත ඇවිල්ලා දැනට මාස දෙකයි.

හදිසි නීතිය ගෙනාවේ රටේ සමස්ත ජනතාව ඒ ව්‍යසනයෙන් මුදා ගැනීම වෙනුවෙන් වැඩ කරන්න ඕනෑය කියන අරමුණින්. ඒ ව්‍යසනය අවසන් වෙලා, ඒ ආපදාව අවසන් වෙලා මාස දෙකක් ගත වෙනකොටත් -තවමත්- අපට යථාවත් කරන්න බැරි වුණු, ආපදාවට ලක් වෙච්ච ප්‍රදේශ තිබෙනවා. තවමත් ඒ බොහෝ ජනතාව ඉන්නවා, කුලී ගෙවල්වල. ඒ ජනතාවට නිවාසයක් හදා දෙන්න තමයි ගරු ජනාධිපතිතුමා ඇතුළු මේ ආණ්ඩුව ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තේ, රුපියල් ලක්ෂ 50ක් දෙන්න - අර්ධ හානිය වෙනුවෙන් සාධාරණ වන්දියක් ගෙවන්න. විපක්ෂයේ අය තවමත් මේ පාර්ලිමේන්තුවේ කියනවා, ඒ වන්දි දුන්නේ නැහැ කියලා. මොනවාද විපක්ෂයේ අය කියන මේ කථා? රුපියල් ලක්ෂ 50ක් දීමට සුදුසු කට්ටියට එය ලබා දීමේ වැඩසටහන ආණ්ඩුව විධියට අපි මේ වන කොට ආරම්භ කරලායි තිබෙන්නේ.

අපි මේ හදිසි නීතිය නැවත දීර්ඝ කරන්නේ ඇයි? මේ ගතවන කාල සීමාව ඇතුළේ නැවත නැවතත් වේගයෙන් මැදිහත් වීම් කරන්න අපට සිදු වෙලා තිබෙනවා, ඒ ආපදාවෙන් පීඩාවට පත් වෙච්ච ජනතාවට ජීවත් වීමේ අයිතිය නැවත ලබා දෙන්න; හොඳ සමාජ ජීවිතයක් නැවත අත්පත් කරලා දෙන්න; පාසල් යන්න බැරි වෙච්ච දරුවන්ට නැවත පාසලක් ඉක්මනින් හදලා දෙන්න; අධ්‍යාපන පහසුකම් ටික හදලා දෙන්න. සමහර තැන්වල ජනතාවට සෞඛ්‍ය පහසුකම් ටික නැති වුණා. ඒ ජනතාව වෙනුවෙන් සෞඛ්‍ය පහසුකම් ටික යථාවත් කරන්න ඕනෑ. ඒ වුවමනාව අනුව, ගත වන මේ මාස කිහිපය තුළ අපි ඒ කටයුතු ටික ඉටු කරනවා. රටේ බහුතර ජනතාවත් ඒක අනුමත කරනවා. හදිසි නීතිය දීර්ඝ කරලා රට නැවත තිබුණු තැනට වේගයෙන් ගෙනෙන්න ඕනෑය කියන පණිවුඩය අපි ලබා දෙමින් තිබෙනවා. වෙන කිසිදු වුවමනාවක් අපට නැහැ. අපි විපක්ෂයේ අයගෙන් අහනවා, හදිසි නීතිය පැවතුණු පසුගිය කාල සීමාව ඇතුළේ හදිසි නීතිය පාවිච්චි කිරීම නිසා මොන සිවිල් පුරවැසියාගේ අයිතිවාසිකම් ද උල්ලංඝනය වුණේ කියලා. පුළුවන් නම් එහෙම දෙයක් කියන්න බලන්න. කිසිදු තැනක එහෙම සිදුවීමක් වෙලා නැහැ. ජනතාවට අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට අපි ඉඩ දීලා තිබෙනවා.

තැන තැන විවිධ ප්‍රශ්න වෙනුවෙන් ජනතාව පාරට ඇවිල්ලා සටන් කරනවා; උද්ඝෝෂණය කරනවා. අපි ඒ අයිතිය ලබා දීලා තිබෙනවා. හැබැයි, අපි හදිසි නීතිය පාවිච්චි කරලා නැහැ. තව මොනවාද කථා කරන්නේ? අපි සද්භාවයෙන්ම හදිසි නීතිය දීර්ඝ කරනු ලබන්නේ, ආපදාවෙන් ඒ ව්‍යසනයට පත් වෙච්ච ජනතාවට අවශ්‍ය පහසුකම් සලසන්නයි, රට යථාවත් කරන්නයි කියන පණිවුඩය අපි ලබා දෙනවා. NBRO එක කියනවා, සමහර තැන්වල ජනතාවට ඔවුන් පදිංචිව හිටපු තැන්වලට යන්න බැහැ කියලා. නිවාස 20,000කට වඩා වැඩි ප්‍රමාණයකට ලක්ෂ 50 වන්දි දීලා හදලා දෙන්න ඕනෑ කියලා ආණ්ඩුව විධියට අපි තීන්දු කරලා තිබෙනවා. මේ ආපදා තත්ත්වය ඇතුළේ අපට කරන්න බොහෝ වැඩ කටයුතු ඉතිරි වෙලා තිබෙනවා.

අනෙක් පැත්තෙන් ගත්තොත්, අපි මේ කාරණාවත් කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම මූලාසනයේ සිටින ඔබතුමා ම තමයි මීට පෙර අදහස් ඉදිරිපත් කරනකොට ප්‍රකාශ කළේ, පන්සල්වලට, එහෙම නැත්නම් අවශ්‍ය තැන්වලට විමධ්‍යගත මුදල් දෙන්න පහසුකම් ලබා දෙන්න ඕනෑ කියලා. ඔව්, අපේ රටේ අමාත්‍යාංශ 25ක් ස්ථාපිත කර තිබෙන බව අපි දන්නවා. ඒ අමාත්‍යාංශ 25 ඇතුළේ ඔබතුමා මතු කළ විහාරස්ථාන වෙන්න පුළුවන්, අනෙකුත් කටයුතු වෙන්න පුළුවන්, ඒවාට අපි ඇති තරම් අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. රටක් විධියට ඉතිහාසය පුරා පැවති අපේ නිෂ්පාදන ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා. විමධ්‍යගත මුදල් පාවිච්චි කරලා මන්ත්‍රීවරු ඉතිහාසයේ මොකද කළේ කියලා අපි දන්නවා. ඕනෑ නම් අපට ඒවාත් කියන්න පුළුවන්. පසුගිය කාලයේ සමහර ජනාධිපතිවරු, සමහර අගමැතිවරු විමධ්‍යගත මුදල් තමන්ගේ හිතවතුන්ට බෙදුවේ කොහොමද කියලා අපි දැක්කා. හැබැයි, අපි ආණ්ඩුවක් විධියට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන 225ටම විමධ්‍යගත මුදල් ලබා දෙන්න තීරණය කර තිබෙනවා. අපි එහෙමයි වැඩ කරන්නේ. අපි ඒ අවස්ථාව සලසා දී තිබෙනවා.

ඒ වාගේම මතක් කරන්න ඕනෑ, 2026 වර්ෂය සඳහා අපි ඉදිරිපත් කරපු අය වැය පිළිබඳව. 2026 වර්ෂය සඳහා අය වැය තුළින් ඉදිරිපත් කළ සංවර්ධන යෝජනා, සංවර්ධන වැඩසටහන් සියල්ලම මේ ආපදා තත්ත්වය ඇතුළේත් ආපස්සට හරවන්නේ නැතිව එලෙසම කරගෙන යන්න ආණ්ඩුවක් විධියට අපි තීරණය කර තිබෙනවා. ආපදාවෙන් අපට විශාල පාඩුවක්, හානියක් සිද්ධ වුණා. ඔව්, ඇත්ත. හැබැයි, අපි අය වැයෙන් යෝජනා කළ කිසිදු සංවර්ධන යෝජනාවක් ආපස්සට හරවන්න තීරණය කරලා නැහැ. අපි රටක් විධියට රටේ ආර්ථිකය ශක්තිමත් කර ගනිමින් ඉස්සරහට යමින් සිටිනවා. මේ ආපදාව නිසා අපේ රටේ ජනතාවට ඉතිහාසයේ නොලැබුණු බොහෝ වන්දි ලබා දෙන්න ආණ්ඩුවක් විධියට අපි තීරණය කළා. ගොවි ජනතාවට ලබා දෙන වන්දි මුදල් අපි වැඩි කළා. ගොවි ජනතාවට කුඹුරු හෙක්ටෙයාරයකට ලබා දෙන වගා සහනාධාරය රුපියල් 150,000 දක්වා වැඩි කළා. සත්ව හානි සඳහා මේ වතාවේ වන්දි ලබා දෙන්න තීරණය කළා. මේ ව්‍යසනයෙන් පීඩාවට පත් වෙච්ච ජනතාවට සාධාරණ ලෙස, දිය යුතු කෙනාට වන්දි ලබා දෙන්න ආණ්ඩුවක් විධියට අපි තීරණය කර තිබෙනවා.

ඒ වාගේම සමහර අයගෙන් අදහස් ආවා, කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන්න කියලා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට, ඒ කථා කියන මන්ත්‍රීවරුන්ට අපි කියනවා, ආණ්ඩුවක් විධියට ගරු ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය වාගේම මේ මන්ත්‍රීවරු සියල්ල, ඒ වාගේම ප්‍රාදේශීය සභාවල සභාපතිවරු, මන්ත්‍රීවරු සමාජ ව්‍යාපාරයක් විධියට කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන බව. කොන්ද කෙළින් තියාගෙන තීරණ ගන්න ඕනෑ තැනදී තීරණ ගන්නත් අපි පැකිළෙන්නේ නැහැ කියන පණිවුඩය ලබා දෙමින් මම නවතිනවා.

මටමේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.22]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இயற்கை அனர்த்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்குத் தொடர்ந்து சேவையாற்றும் நோக்கில் அவசரகாலச் சட்டத்தை நீடிப்பதற்கான இன்றைய விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மட்டற்ற மகிழ்ச்சி அடைகின்றேன். எல்லோரும் கேட்கின்ற கேள்வியை நானும் கேட்கின்றேன். அதாவது, அனர்த்தத்தால் பாதிக்கப்பட்டவர்களுக்கு நிவாரணம் வழங்குவதற்கு, மீள்கட்டுமான நடவடிக்கைகளை மேற்கொள்வதற்கு ஏன் அவசரகாலச் சட்டம் நீடிக்கப்பட வேண்டுமெனக் கேட்கின்றேன்.

இன்று எங்களுடைய பிரதேசங்களில் கிராம சேவகர்களுக்கும் மக்களுக்கும் இடையில் முறுகல் நிலை ஏற்படுகின்றது. ஏனெனில், அரசாங்கம் வழங்குகின்ற நிவாரணக் கொடுப்பனவுகள் தங்களுக்கும் தேவையென வீட்டுக்குள் வெள்ள நீர் புகாத மக்களும் கிராம சேவகர்களிடம் கேட்கின்றார்கள். இதனால் பல பிரச்சினைகள் ஏற்படுகின்றன. அரசாங்கம் இந்த விடயங்களில் கவனம் செலுத்துகின்ற நிலையில், ஏன் அவசரகாலச் சட்டத்தை நீடிக்க வேண்டும்? என்ற சந்தேகம் எழுகின்றது. உண்மையிலே அரசாங்கம்தான் இந்த விடயங்களைக் கையாளப் போகின்றது.

புயலால் பாதிக்கப்பட்ட மக்களுக்கான உதவிகளை எல்லோரும் சேர்ந்து மிகத் துரிதமாகச் செய்தார்கள். அதனை நாங்கள் உண்மையிலே பாராட்ட வேண்டும். இந்த நிலை இன்னும் இருக்கின்ற சூழலில், ஏன் அவசரகாலச் சட்டம் தேவை என்பதை இந்த அரசாங்கம் விளங்கப்படுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இங்கு பேசியவர்களில் எவரும் இந்தச் சட்டம் எதற்காகப் பயன்படுத்தப்படப் போகின்றது என்பதைத் தெளிவுபடுத்தவில்லை. பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரணம் வழங்குதல், மீளெழுச்சி போன்ற விடயங்களை மேற்கொள்வதற்கு அவசரகாலச் சட்டம் தேவைதானா? அவசரகாலச் சட்டத்தால் பாதிக்கப்பட்ட உங்களுடைய கட்சி அங்கத்தவர்களும் இருக்கிறார்கள்; எங்களுடைய மக்களும் இருக்கிறார்கள்; போராட்டத்தில் ஈடுபட்ட போராளிகளும் இருக்கிறார்கள். அவசரகாலச் சட்டத்தால் மட்டுமல்ல, பயங்கரவாதத் தடைச் சட்டத்தின் ஊடாகவும் தண்டிக்கப்பட்ட எங்களுடைய இளைஞர்கள் இன்றைக்கும் சிறையில் இருக்கிறார்கள். இதனால் அவசரகாலச் சட்டம், பயங்கரவாதத் தடைச் சட்டம் என்றாலே எங்களுடைய மக்களுக்கு அச்சம் ஏற்படுகின்றது. அவசரகாலச் சட்டம் எதற்காக நீடிக்கப்படுகின்றது? என்ற கேள்வியை எங்களுடைய மக்களும் கேட்கிறார்கள்; எங்களுடைய உறுப்பினர்களும் கேட்கிறார்கள். இந்தச் சூழ்நிலையில், அவசரகாலச் சட்டம் தேவைதானா? என்ற கேள்வியை நானும் கேட்க விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இணையத்தளங்கள் ஊடாக குற்றச் செயல்களில் ஈடுபடுபவர்களைக் கண்டறிந்து, அவர்களுக்குத் தண்டனை வழங்குகின்ற செயற்பாடுகளைச் செய்து வருகின்றோமென்று 2-3 தினங்களுக்கு முன்னர் - IGP - பொலிஸ்மா அதிபர் அவர்கள் சொன்னார். இதில் ஒரு விடயத்தைக் கவனத்தில் எடுக்க வேண்டும். அதாவது, முகவரியற்ற இணையத்தளங்களில் செயற்படுகின்றவர்கள் பல மோசமான செயற்பாடுகளைச் செய்கின்றார்கள். இவ்வாறான விடயங்களைத் தட்டிக் கேட்கின்ற பெண்களை விபச்சாரிகளென விமர்சிக்கிறார்கள். அதுமாத்திரமல்ல, பல புகைப்படங்களை ஒன்றிணைத்துப் பதிவேற்றுகின்றார்கள். இவ்வாறான செயற்பாடுகளால் பாதிக்கப்படுகின்றவர்கள் பொலிசாரிடம் முறையிடும்போது, இந்த விடயங்களைக் கையாளுவதற்கான வசதி வாய்ப்புகள் தங்களிடம் இல்லையெனச் சொல்கின்றார்கள். இவ்வாறான குற்றச்செயல்களில் ஈடுபடுபவர்கள் உள்நாட்டைச் சேர்ந்தவர்கள் என்றால் அவர்களைக் கைதுசெய்ய முடியுமெனவும், வெளிநாட்டில் இருப்பவர்கள் என்றால் தங்களால் ஒன்றும் செய்ய முடியாதெனவும் கூறி, கைவிரிக்கின்ற நிலைமைதான் காணப்படுகின்றது. எனவே, அரசாங்கம் இணையவழிக் குற்றச் செயல்களைச் சரியான முறையில் கையாள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். கௌரவ அமைச்சர் அவர்கள் சிரித்துக்கொண்டு ஏதோ கூற முயல்கிறார்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමාත්‍යතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමා, කාලයකදී ඩයස්පෝරාව ඔබතුමාට උදව් කළා. දැන් ඩයස්පෝරා එකේ සමහරු කරදර කරනවා වාගේ කියලා තමයි මට හිතෙන්නේ.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ அமைச்சர் அவர்களே, இந்த விடயத்தை நகைச்சுவையாகப் பார்க்கக் கூடாது; seriousஆக எடுத்துக் கொள்ள வேண்டும். ஏனெனில், சாதாரண குடும்பப் பெண்களை அவமானப்படுத்துகின்ற செயற்பாடுகளை அவர்கள் செய்கிறார்கள். இவ்வாறான குற்றச்செயல்களில் ஈடுபடுகின்றவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுப்பதற்குரிய வசதி வாய்ப்புகளை பொலிசாருக்குக் கூடுதலாக ஏற்படுத்திக்கொடுக்க முன்வர வேண்டும். அப்பொழுதுதான் இணையவழிக் குற்றங்களைத் தடுக்க முடியும் என்பது என்னுடைய ஆலோசனையாக இருக்கின்றது.

இன்னுமொரு விடயத்தைச் சொல்லி எனது உரையை முடித்துக் கொள்கின்றேன். தடைசெய்யப்பட்ட மீன்பிடி முறைகளை நிறுத்துவதற்கான வழிமுறைகளை அரசாங்கம் கையாளுகின்றது. தடைசெய்யப்பட்ட எந்த மீன்பிடி முறையாக இருந்தாலும், அதை நிறுத்துவதற்குக் கால அவகாசம் கொடுக்க வேண்டும். எங்களுடைய மன்னார் மாவட்டத்தில் குறிப்பாக தலைமன்னார், பேசாலை, புதுக்குடியிருப்பு, தாழ்வுப்பாடு, வங்காலை, கரிசல், பள்ளிமுனை, முள்ளிக்குளம் போன்ற பிரதேசங்களில் machineஐப் பயன்படுத்தியே கரைவலை மீன்பிடி மேற்கொள்ளப்படுகின்றது. இதில் பல்லாயிரக் கணக்கான தொழிலாளர்கள் வேலை செய்கின்றார்கள். இந்த மீன்பிடி

[ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

முறையை நிறுத்துவதாக இருந்தால், குறிப்பிட்டதொரு கால அவகாசத்தைக் கொடுத்து நிறுத்துங்கள்! உடனடியாக நிறுத்துமாறு சொன்னால் தொழிலாளர்கள் பாதிக்கப் படுவார்கள். அவர்கள் மாத்திரமன்றி, அதில் முதலீடுகளை மேற்கொண்டவர்களும் பாதிக்கப்படுவார்கள். குறைந்தது 6 மாத கால அவகாசத்தைக் கொடுத்து, அவர்கள் தமது தொழிலை மாற்றுவதற்குரிய வாய்ப்பை அரசாங்கம் வழங்க வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.29]

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටක් විධියට අපි මුහුණ දී තිබෙන්නේ ඉතා සරල සැහැල්ලුවෙන් ගත හැකි අභියෝගයකට නොවෙයි කියන එක මුළු රටේම ජනතාව ඇතුළු අපි හොඳින්ම දන්නා කරුණක්. අපි මුහුණ දී තිබෙන්නේ බොහොම ගැඹුරු සමාජ ආර්ථික දේශපාලන පරිවර්තනයක් අවශ්‍ය සංක්‍රාන්තික මොහොතකටයි. විපක්ෂය හැම තිස්සේම අපට චෝදනා කරනවා, ආණ්ඩුවේ ඉඳගෙන අපි අවුරුදු 76ක ශාපය ගැන පුනරුච්චාරණය කරනවා කියලා. හැබැයි, මේ වෙලාවේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අපට මේ ගැනත් අහන්න සිද්ධ වෙනවා. පසුගිය දශක කිහිපය පුරාම මේ රටේ ව්‍යුහාත්මක දුර්වලකම් එකපිට සිද්ධ වුණා. ආයතන පද්ධතිය කඩා ගෙන වැටුණා, මහජනතාවගේ විශ්වාසය පලුදු වුණා. අද අපි මේ මුහුණ දෙන අභියෝගයට හේතුව ඒක නොවෙයි ද කියන එකත් අපට අහන්න සිද්ධ වෙනවා. 2026 වසරේ නව අය වැයක්, නව සැලසුමක් එක්ක අපි මේ අභියෝගවලට මුහුණ දෙන්න නව ආණ්ඩුව විධියට සූදානම් වෙනකොට, අපේක්ෂා කරපු අභියෝගවලටත් අභියෝගයක් කරමින් තමයි අපට පසුගිය මාසයේ දිට්වා සුළිකුණාටුවට මුහුණ දෙන්න සිද්ධ වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අම්මලා විධියට දන්නවා මේ වාගේ ආපදාවක් වුණාම කඩා ගෙන වැටෙන්නේ ගෙදරක බිත්ති හතර විතරක් නොවෙයි කියලා. ගොඩනැඟිල්ලක, ගෙයක බිත්ති හතර විතරක් නොවෙයි මේ ආපදාව නිසා කඩා ගෙන වැටුණේ. මේ කඩා ගෙන වැටුණේ පවුලක ආරක්ෂාව. මේ කඩා ගෙන වැටුණේ පවුලක ආර්ථිකය. ඒ වාගේම තමන්ගේ දරුවන්ගේ අනාගතය ගැන පවුලක් විධියට දැකපු හීන, බලාපොරොත්තු තමයි මේ වාගේ ස්වාභාවික ආපදාවකදී කඩාගෙන වැටිලා සැඩ පහරට අහු වෙලා යන්නේ. එහෙම අවස්ථාවක, අපි රටක් විධියට මුහුණ දීපු මේ ආපදා තත්ත්වයෙන් ගොඩ එන්න නව ආණ්ඩුව විධියට අපි බොහොම සැලසුම් සහගතව උපායශීලිව මේ පවතින නීතිරීති හා රෙගුලාසිත් එක්ක හැප්පෙමින් මේ මොහොත වනවිටත් සටන් කරමින් ඉන්නවා. අපි රටක් විධියට මුහුණ දීපු පළමු ආපදාව මෙය නොවෙයි. හැබැයි, මේ වාගේ ස්වාභාවික ආපදාවක දී තත්ත්වය ඇති සැටියෙන් තේරුම් අරගෙන ඒ ආපදාවට සාර්ථකව මුහුණ දීලා ජන ජීවිත යථාවත් කර ගොඩ ගන්න සමත් වෙච්ච, ඒ කළමනාකරණය නිසි ලෙස කරපු ආණ්ඩුව විධියට අපි ඉතිහාසගත වෙනවාය කියන එක විතරක් මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි.

මේ වාගේ විපත් අවස්ථාවක දී අපි රජයක් විධියට හරියට හැසිරෙන එකෙන් ජනතාවට ඒත්තු ගන්වන්නේ අපි රජයක් විධියට කොච්චර ශක්තිමත්ද කියන එක විතරක් නොවෙයි. අපි මේ රටේ මහජනතාවටත්, අපි දිහා බලාගෙන ඉන්න ජාත්‍යන්තරයටත් ඔප්පු කරන්න අවශ්‍යයි අපි ශක්තිමත් රජයක් විතරක් නොවෙයි, අපි රාජ්‍යයක් විධියටත් ඒ රාජ්‍යයේ ජීවත් වෙන පුරවැසියන් අතර තිබෙන බැඳීම කොච්චර ගැඹුරු එකක්ද, කොච්චර විශ්වාසවන්ත එකක් ද කියන එක. අපි එය ඔප්පු කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ වාගේම විපතකින් පස්සේ ජනතාවගේ ජීවිතය නැවත නඟා සිටුවන්න ඒ ජනතාවට නිවාස දෙන්න ඕනෑ, ඉඩකඩම් දෙන්න ඕනෑ, ද්‍රව්‍යමය සහ මූල්‍යමය ආධාර දෙන්න ඕනෑ. හැබැයි, මේක පරිපාලන ක්‍රියාවලියක් විධියට මේ රටේ මහජනතාව වාගේම විපක්ෂය දැක්කාට, එතැනින් එහාට අපි මේ රටේ මහජනතාවත් එක්ක තිබෙන සම්මුතිය, බැඳීම, ගිවිසුම කොච්චර ගැඹුරු එකක් ද, කොච්චර සජීවී එකක්ද, කොච්චර විශ්වාසයෙන් පිරුණු එකක් ද කියලා ඔප්පු කරන්න රජයක් විධියට, ආණ්ඩුවක් විධියට අපි සමත් වෙලා තිබෙනවා

අන්න, ඒ නිසා තමයි මේ විපත හමුවේත් අවස්ථාවාදී දේශපාලනය කරන කුහක විපක්ෂය මේකේ ඇද පලුදු හොය හොයා පාර්ලිමේන්තුවටත් ඇවිල්ලා කථා කරන්නේ. පාර්ලිමේන්තුවේත්, එළියේත් මයික් එකක් අල්ලනකොට, කැමරාවක් අල්ලනකොට අඩුපාඩු ගැන විතරක් කථා කරනවා. අද මේ හදිසි නීති රෙගුලාසි යටතේ තවදුරටත් ජනාධිපතිතුමාට පැවරී තිබෙන බලතල ප්‍රකාරව මේ තත්ත්වය කළමනාකරණය කරගෙන, තවදුරටත් ගොඩගන්න අවශ්‍ය ජීවිත ගොඩ නඟන්න අවශ්‍ය නීතිරීති, රෙගුලාසි තමයි මේ පනවාගෙන යන්නේ; සම්මත කරගෙන යන්නේ. මේ තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියන එක විතරක් කල්පනා කරලා බලලා, විපක්ෂයට පුළුවන් ඒකට සහයෝගය දක්වන්න. හැබැයි, විනයක් නැතුව විනයානුකූල රටක් හදන්න කථා කරන, එහෙම නැත්නම් තමන්ගේ දේශපාලන උප්පරවැට්ටි ඉටු කරගන්න බැරි වුණාම "කෝ ආර්ථිකය ස්ථාවරයිද" කියලා ප්‍රශ්න කරන විපක්ෂයක් තමයි අපි දකින්නේ.

පසුගිය නිදහස් දිනයේදී අපේ තේමාව බවට පත් වුණේ "ගොඩනඟමු ශ්‍රී ලංකා" කියන සංකල්පයයි. ඒක භෞතික අර්ථයෙන් දකින්න එපා. භෞතික අර්ථයෙන් එහාට ගිහිල්ලා අපි මේ රටේ නීතියේ ආධිපත්‍ය, වගකීම්සහගත පාලනය කියන එක, පාරදෘශ්‍යභාවයකින් යුක්ත රාජ්‍ය ක්‍රියාවලිය කියන එක ගොඩනඟන්න අවශ්‍යයි. ඔව්, අපට මේ හදිසි නීතිය තවදුරටත් දීර්ඝ කරගන්න අවශ්‍යයි. මේ හදිසි නීතිය දීර්ඝ කරගන්න අවශ්‍ය වෙන්නේ වෙන මොනවත් නිසා නොවෙයි. දේපළවලට, ජීවිතවලට වෙච්ච ඒ උග්‍ර අනතුරෙන් පසු ජන ජීවිත නැවත වතාවක් ගොඩගන්න අපට අවශ්‍යතාවක් තිබෙනවා. ඒකට නිලධාරිවාදය නිසා, වෙන මොනවා හරි නිසා, අකාර්යක්ෂමතා නිසා බාධා පමුණුවලා තිබෙනවා නම් ඒවා ඉවත් කරගෙන මේ යාන්ත්‍රණය සුමටව කරගෙන යන්න අපට තවදුරටත් අවශ්‍යතාවක් තිබෙනවා. අන්න, ඒ නිසා තමයි අපි මේ හදිසි නීතිය තවදුරටත් දීර්ඝ කරගෙන, පදනමක් හදාගෙන යන්න උත්සාහ කරන්නේ.

අපි මේ වරප්‍රසාද එකින් එක ලිහනකොට, කලින් සමහර අය කරපු වැරැදි එකින් එකට නීතිය ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නකොට, කෝපයට, වියරුවට, එහෙම නැත්නම් වේදනාවට පත් වෙලා අවලාද කරන එක, අපහාස කරන එක, කකුලෙන් අදින එක තමයි දේශපාලනය කියන්නේ. අපි ඔය තත්ත්වය හොඳින් හඳුනාගෙන තමයි ඉන්නේ. හැබැයි, ඒක මේ තරම් අවර ගණයට, පහත් තත්ත්වයට පත් වෙයි කියන එක විතරක් අපි බලාපොරොත්තු වුණේ නැහැ. එම නිසා තැනට ගැළපෙන, නැත්නම් විවාදයට ගැළපෙන කරුණුවලින් විතරක් සන්නද්ධව දවසේ විවාදයට සූදානම් වෙලා විපක්ෂය එනවා නම් හොඳයි කියන එක තමයි අපි විශ්වාස කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිලෝමීටර් ගණන්, සැතපුම් ගණන් මහා පස් කඳු කඩාගෙන වැටිලා තවම අපට ඒ මළමිනී හොයාගන්නත් බැරි වෙලා තිබෙනවා. අවසන් ගෞරවය දැක්වීමට බිරිඳගේ, සැමියාගේ, දරුවන්ගේ මිනියවත් හොයාගන්න බැරිව මේ පස්කඳු යට තිබෙනවා. මේවා අපට රටකජු නොවෙයි. මේවා ජුජුබ්ස්, සීනි බෝල නොවෙයි. මේ ප්‍රශ්න, ප්‍රශ්න විධියට දැකලා ඒවාට සැලසුම්සහගතව, උපක්‍රමශීලීව මුහුණ දීලා, අවශ්‍ය තැනට, අවශ්‍ය ආකාරයට අරමුදල් දීලා මේ රට ඉදිරියට අරගෙන යන්න අපට වුවමනාවක් තිබෙනවා.

කාරණා තුනක් තිබෙනවා. මෙන්න, මේ කාරණා තුන කුහක විපක්ෂය දකින්න කැමති නැහැ. මොකක්ද කාරණා තුන? එකක් තමයි මානුෂීය නායකත්වය. නායකයා කොළවලට අත්සන් කරන්න විතරක් ඉන්නේ නැහැ. නායකයා විපත වෙච්ච තැනට යනවා; මිනිස්සුන්ව සජීවීව මුණ ගැහෙනවා; ඇහුම්කන් දෙනවා. ඒකෙන් කියන්නේ මොකක්ද? නායකයා රටේ මිනිස්සුන්ට ගෞරව කරනවා. නායකයාට ලබා දුන් ජනවරමට නායකයා ගරු කරනවා. ඒ තමයි මානුෂීය නායකත්වය. ඒක තමයි රටකට අවශ්‍ය වන්නේ. ඒක කුහක විපක්ෂය දකින්න ලැහැස්ති නැහැ. ජනතාවට ඇහුම්කන් දෙන ආණ්ඩුවක් ඉන්නවා. ඒකත් කුහක විපක්ෂය දකින්න ලැහැස්ති නැහැ. ඒ ගැන සාධාරණ විවේචනයක් ගෙනෙන්න සූදානම් නැහැ. අපි ඒ ගැන කනගාටුවට පත් වෙනවා. ඒ වාගේම ප්‍රතිපත්තිවල, තීන්දු තීරණවල, උපායමාර්ගවල තිබෙන විනිවිදභාවය ගැන කියනවා නම්, පීඩාවට පත් වෙච්ච මිනිස්සුන්ට ආයතනවලට ගිහිල්ලා දොරට තට්ටු කරලා මට මොනවාද ලැබෙන්නේ කියලා අහන්න වුවමනා වුණේ නැහැ. මොකද, නිලධාරින් එක්ක හරි හරියට ඔට්ටු වෙලා ගමේ නායකයා පවා මිනිස්සු ළඟට ගිහිල්ලා ඔබට මෙන්න මේ දේ ලැබෙනවා කියලා දැනුවත් කරලා තමයි ජනතාවට අවශ්‍ය දේ දුන්නේ. ඒ එක්කම මේ රටේ සමස්ත පුරවැසියන්ට ස්තුති කරන්න, ගෞරවයක් දෙන්න මේක අවස්ථාවක් කරගන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හේතුව, වගකීම්සහගත පුරවැසියෝ මේ රටේ ජීවත් වෙනවා. තමන්ට අවශ්‍ය දෙයක් තිබෙනවා නම්, ඒ අවශ්‍ය දේ විතරයි ඔවුන් ඉල්ලුම් කළේ. අනවශ්‍ය ඉල්ලීම් කරලා මේ රටේ පොදු මහජන මුදල් අවභාවිත කරන්න මේ රටේ මහජනතාව මේ අවස්ථාව පාවිච්චි කළේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එම නිසා මේ රට නැවත ගොඩගන්න දේශපාලන නායකත්වය, රාජ්‍ය නිලධාරින්, ඒ වාගේම මේ රටේ සමස්ත පුරවැසි ප්‍රජාව කියන මේ තුන්ගොල්ලෝම එකතුවෙලා වැඩ කරනකොට, විපක්ෂය විතරක් පැත්තකට වෙලා මේ විධියට මේ ගමනට බාධා කරනවා නම්, සදා විපක්ෂයේ ඉන්න වෙයි කියන එක තමයි කියන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.38]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට විනාඩි 8ක කාලයක් තිබිලා, ඒක විනාඩි 7ක් වුණා. දැන් විනාඩි 6ක් කරලා තිබෙනවා. කමක් නැහැ, කමක් නැහැ, Thank you, Sir.

මම දෙමළ භාෂාවෙන් වචන දෙකක් කියලා කථාව පටන් ගන්නම්. උගන්ඩා අක්කා යන්න එපා, ඉන්න. මම දෙමළ භාෂාවෙන් වචන දෙකක් කියන්නම්.

கிளிநொச்சியிலே கௌரவ பாராளுமன்ற உறுப்பினர் சிறீதரன் அவர்கள் செய்த இன்னுமொரு மிகப்பெரிய ஊழல் பிடிபட்டிருக்கின்றது. அது என்னவென்றால், கிளிநொச்சி கண்டாவளைப் பிரதேசத்தில் மணல் தாராளமாகக் கடத்தப்படுவதாகவும், அதற்குக் காரணம் கௌரவ பாராளுமன்ற உறுப்பினர் சிறீதரன் அவர்களுடைய அடியாட்கள் என்றும் சொல்லப்பட்டு, முறைப்பாடுகள் முன்வைக்கப்பட்டு, பாராளுமன்றத்திலே அந்த விடயம் கதைக்கப்பட்டிருக்கின்றது. அதுபோல், கிளிநொச்சி விவசாய சம்மேளத்தினால் மேற்கொள்ளப்பட்ட ஊழல்கள் தொடர்பிலும் சொல்லப்பட்டிருக்கிறது. அங்கே அரச காணிகள் மற்றும் வன இலாகாவினுடைய காணிகள் எடுக்கப்பட்டு, அவை ஆராயப்பட்டு அடையாளப்படுத்தப்பட்டு இருப்பதுபற்றி COPAஇல் வெளிப்படுத்தப்பட்டிக்கிறது. இதுவும் தமிழரசுக் கட்சியினுடைய அரசியல்!

இன்னும் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். இன்றைக்கு ஒரு document எனக்கு வெளிநாட்டிலிருந்து அனுப்பப்பட்டிருக்கின்றது. அதில் உள்ள விடயம் என்னவென்றால், முன்னாள் பாராளுமன்ற உறுப்பினர் சுமந்திரன் அவர்களின் மச்சான் - cousin - என்று சொல்லப்படுகின்ற D.B.S. ஜெயராஜ் அவர்கள் சந்திரிகா பண்டாரநாயக்க குமாரதுங்க காலத்தில் இருந்து டக்ளஸ் உடன் சேர்ந்து ஒரு துணை ஆயுதக் குழுவாகச் செயற்பட்டவராம் என்று அந்த documentஇல் குறிப்பிடப்பட்டிருக்கின்றது; அந்த document முழுவதையும் நான் வாசித்துக் கொண்டிருக்கிறேன். இப்படியானவர்கள்தான் எங்களுடைய தமிழீழ மண்ணை நாசமாக்கிக் கொண்டிருக்கின்றார்கள். 'தமிழீழம்' என்று சொல்லுகின்றபோது, தேசியத் தலைவர் பிரபாகரன் அவர்களைப்பற்றி இன்றைக்கு ஒருசில விடயங்கள் கதைக்கப்பட்டது. நான் அதைப்பற்றிச் சிங்கள மக்களுக்குச் சொல்ல வேண்டும். ஆகவே, சிங்களத்தில் கதைக்கிறேன்.

මම දැක්කා, අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කිහිපදෙනෙක් කථා කළා, අපේ ප්‍රභාකරන් නායකතුමාට මේගොල්ලෝ ගෙවල් හදලා දෙනවා කියලා. ගෙවල් නොවෙයි, අපි රට හදපු මිනිස්සු. තමුන්නාන්සේලා කොහේ හරි ගිහිල්ලා ගෙවල් හදාගන්න. හැබැයි ඔබ ඇවිල්ලා පොඩි ගෙයක් හැදුවා කියලා අපට වැඩක් වෙන්නේ නැහැ. මම පැහැදිලිව එක කාරණයක් මම දන්න සිංහලෙන් කියන්නම්. උගන්ඩා අක්කා කොහේද යන්නේ? ඉන්නකෝ පොඩ්ඩක්. ඔයා ගැන කථා කරන්නයි යන්නේ.

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ගැන මම වෛරයකින් නැහැ. ඒ කියන්නේ, එයා සිංහල ජනතාවගේ නායකත්වය අරගෙන සිටියා. අපි දෙමළ විධියට සිටියා. රටවල් දෙකක් විධියට අපි රණ්ඩු වුණා. ඉන්දියාවත් මැදිහත් වුණා. ඒත් අදටත් මගේ හිතේ වෛරයක් නැහැ. කවුරුවත් මරන්න ඕනෑ, කවුරුවත් නැති

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

කරන්න ඕනෑ කියලා වෛරයක් නැහැ. හැබැයි, මම අපේ මිනිස්සු පාවා දෙන්නේ නැහැ. සිංහල දන්නවාද උගන්ඩා අක්කි? ඇයි කොහේද දුවන්නේ? ඉන්න, ඉඳලා අහලා යන්න. අපි කවුරුවත් පාවා දෙන්නේ නැහැ. අපේ මිනිස්සුන්ට ඔයගොල්ලන් ත්‍රස්තවාදීන් කිව්වාට, ඒ මොනවා කිව්වත් ඒ මිනිස්සු 44,000ක් නැති වුණා කියන්නේ, ඒ මිනිස්සුන්ගේ ජීවිතය දුන්නා කියන්නේ, ඒගොල්ලන් දෙමළ මිනිස්සු විධියටයි කියලා ඒක මම පිළිගන්නවා. මගේ හිතේ තිබෙන්නේ ඒක. මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නිසා මම කවදාවත් අපේ මිනිස්සු පාවා දෙන්නේ නැහැ.

මම දැක්කා, තමුන්නාන්සේලාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගිහිල්ලා මෙන්න මෙහෙම ඉන්නවා. ඊට පස්සේ කියනවා, මේවා ණයට ගත්තේ කියලා. මම දන්නේ නැහැ, ඔය underwear එකේ ඉඳලා ඔක්කෝම අරගෙන තිබෙන්නේ ණයට නේද? ඔයගොල්ලන් කොහෙන්ද ඒවාට සල්ලි ගෙනාවේ? ඔයගොල්ලන්ගේ රණ විරුවෝ, අපට "වෛරයෝ". මම දෙමළ. ඒ වුණාට මට "වෛරයෝ". හැබැයි, ඔයගොල්ලන්ගේ රණ විරුවෝ.

මම දැක්කා කියනවා, ණයට ගත්ත ඒවා පෙන්වන්නේ නැහැ කියලා. මට තේරෙන්නේ නැහැ, 2005, 2009, 2010 කාලයේ ඔයගොල්ලන් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් එක්ක එකතු වෙලා ඉන්නකොට ඒවා ණය කියලා තේරුණේ නැද්ද? දැන් ඒගොල්ලන්ගේ මොකක් හරි පාපිස්සක් අල්ලාගෙන ඉස්සරහට ඇවිල්ලා 159කුත් අරගෙන ඡන්දය දීපු මිනිස්සු අමතක කරලා දැන් මේ දේවල් කියනවා. මට මතකයි තව කවුරු හරි කිව්වා, ඔයගොල්ලන් සෙරෙප්පු දෙකත් ගලවාගෙන ඔළුවේ තියාගෙන එයාව හම්බ වෙන්න ගියා කියලා. අදත් මට මිනිස්සු කථා කරනවා, සිංහල ජනතාවගේ නායකයා විධියට එයා ගැන. හැබැයි, මම පිළිගන්නේ නැහැ. මම ඒක accept කරන්නේ නැහැ. මම සිංහල නොවෙයි. මට කවුරු හරි ජීවිතය දීලා තිබෙනවා නම්, මම බලන්නේ එයා ගැන විතරයි.

මම තව එකක් කියන්න ඕනෑ. අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමා කිව්වා, "නාමල්ගේ නම කිව්වාම මට වුන් යනවා" කියලා. අනේ මට වුන් යන්නේ නැහැ;

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හැබැයි මම දන්නවා, ඔයගොල්ලන්ගේ උගන්ඩා අක්කා ගිහිල්ලා මෙහෙම ළඟින් හිටියා නේද? ඒ පින්තූරය ඔයගොල්ලන් දැක්කාද? මෙහෙම ළඟින් හිටියා දැක්කාද? ඒකට ඔයගොල්ලන් ලජ්ජා වෙන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ පින්තූර නේද තිබුණේ? අපි කොටි. මට කියනවා, "කොටි, කොටි" කියලා. මම සතුටු වෙනවා. ඇයි?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you. මම වෙනුවෙන් කවුරු හරි මරලා තිබුණා නම්, ඒගොල්ලන්ට කොටි කිව්වාට මට සතුටුයි. මම සතුටු වෙනවා. හැබැයි, තමුන්නාන්සේලා තමයි තමුන්නාන්සේලාගේ රණවිරුවන්ට සෙබළියෝ කිව්වේ. මම ඒක කියන්නත් කැමැති නැහැ. "පොංගල්" දුන්නා. දැක්කාද? "පොංගල්" එක මාරු කරලා දාගන්න. මෙහෙම ගිහිල්ලා "පොංගල්" දෙනකොට කිසි අවුලක් නැහැ. හැබැයි, ඔයගොල්ලන්ගේ රණවිරුවන්ට මෙහෙම කියන්න ඔයගොල්ලන්ට ලජ්ජා නැද්ද?

මම තව එකක් කියන්න කැමැතියි. අපේ දයාසිරි මන්ත්‍රීතුමාට අක්කා කෙනෙක් ඇවිල්ලා කියනවා, "දයාසිරි කික්කි, කික්කි කිව්වා" කියලා. එයා බණිනවා. මට තේරෙන්නේ නැහැ. මම වුණත්, දයාසිරි මන්ත්‍රීතුමා වුණත්, කවුරු වුණත් කවදාවත් ගැහැනු ළමයින්ට විරුද්ධව කථා කරන්නේ නැහැ. ඒ කියන්නේ නම් හදන්නේ නැහැ. හැබැයි ඊට පස්සේ මම දැක්කා, මාධ්‍යයට, අරහෙට මෙහෙට ගිහිල්ලා ඇර ගන්නවා.

Speaker ගැන මම ඒ කාලේ කථා කරනකොට මට කිව්වා, පිස්සු කියලා. මම ඉතින් අංගොඩ වැඩ කරලා තිබෙන නිසා මේ වාගේ පිරිසත් එක්ක වැඩ කරලා තිබෙනවා, බෙහෙත් දීලාත් තිබෙනවා. ඒ නිසා මම කට වහගෙන හිටියා. ලජ්ජා නැද්ද, ආ? PHI කෙනෙක් ගෙනැල්ලා, ගිහිල්ලා දෙනවා. ලජ්ජා නැද්ද අනේ? ඔයගොල්ලන් මාරු කරන්නකෝ අනේ එයාව. කරුණාකරලා අපට අසෝක අයියා දෙන්න. එයාගේ සහතිකයත් එපා, මොකුත් එපා, එයා තියන්න අතැනින්. කරුණාකරලා ඔයගොල්ලන්ගෙන් ඉල්ලන්නේ අසෝක අයියා නැවත දෙන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දැන් බලන්නකෝ කරන වැඩේ. කරුණාකරලා අසෝක අයියා දමන්න, එතැනට. Speaker ගන්න මෙතැනින්. ලජ්ජා නැද්ද? PHI කෙනෙක් අරගෙන ගිහින්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

පාර්ලිමේන්තුවේ මිනිස්සු ඉන්නේ මොකටද? මම මේවා දැකලා නැහැ, ඉතිහාසයේ කවදාවත්. මම ඉතිහාසය දැන් ඉගෙන ගන්නේ. ඉතිහාසයේ හිටපු කථානායකවරු කවුරුවත් staff එකත් එක්ක ඇරගෙන නැහැ. අර චමින්ද කුලරත්න අයියා එළියට දාලා. ලජ්ජා නැද්ද? හිටපු තුන්දෙනාගෙන් හොඳම, දැනුම තිබෙන පුද්ගලයා එයා. එයා කථා කළා කියලා පෙට්‍රල් දෙන්නේ නැහැ කියලා, ඊට පස්සේ ගෙවල් -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තත්පර 30ක් දෙන්න.

මේවාට ගෙවල් මොකටද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේකත් අරගෙන. ඔයගොල්ලන් මොනවාද කිව්වේ? *[බාධා කිරීමක්]* මම ඉවර කරනවා.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මූලාසනයෙන් අවසරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 91(උ) සහ (ඌ) යටතේ මම ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා. ඕනෑම භාෂාවක් පාවිච්චි කරලා මේ සභාවේ කථා කරන්න, අදහස් ප්‍රකාශ කරන්න අයිතියක් තිබෙනවා, මේ ස්ථාවර නියෝගවලට අනුව. හැබැයි මතක තියාගන්න ඕනෑ, කට තිබුණාට නන්දොඩවන්න පුළුවන් තැනක් නොවෙයි මෙතැන කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, විවාදයකට යන්න එපා. කරුණු විතරක් ඉදිරිපත් කරන්න.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ සභාවේ මන්ත්‍රීවරියන්ගේ ගෞරවය ආරක්ෂා කරන්න කියලා. පත්තරේ ගිය බොරු මෙතැන රඟපාලා මන්ත්‍රීවරියන්ගේ ආත්ම ගරුත්වය නැති කරන්න දෙන්න බැහැ. ඒ වාගේම අනවශ්‍ය දේවල් වහාම ඉවත් කරන්න කියලාත් මම ඉල්ලීමක් කරනවා. මේ විධියට සභාවේ හැසිරෙන්න දෙන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය පැහැදිලියි. ගරු මන්ත්‍රීතුමනි, සභාව පිළිබඳව අවබෝධයෙන් කථා කරන්න. දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාට වෙන් වූ කාලය අවසන් වෙලා තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මන්ත්‍රීතුමන්ලාගේ ආත්ම ගරුත්වය නම් අපි කවදාවත් සවුත්තු කරන්නේ නැහැ. හැබැයි, මේ ඉන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ආත්ම ගරුත්වයක්, - *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්. කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අවසන් කරනවා. *[බාධා කිරීමක්]* මොන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කථා කරන්නේ? අර පාර්ලිමේන්තුවේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒකට විරුද්ධව නැඟිටලා කථා කරනකොට, - *[බාධා කිරීමක්]* ඔයා lady කෙනෙක් නේද, Madam.

Thank you so much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දීප්ති වාසලගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.46]

**ගරු දීප්ති වාසලගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே)
(The Hon. (Mrs.) Deepthi Wasalage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව කරන්න කලින් යම් කාරණාවක් මතක් කරන්න කැමැතියි. සිංහල ජනයාගේ ජනාධිපති, දෙමළ ජනයාගේ ජනාධිපති, මුස්ලිම් ජනයාගේ ජනාධිපති කියලා ජනාධිපති කෙනෙක් ලංකාවේ නැහැ. ජාතිවාදය පදනම් කරගෙන දේශපාලනය කරන්න ඉන්න විපක්ෂයට

[ගරු දීප්ති වාසලගේ මහත්මිය]

කියනවා, කරුණාකරලා හරියට දේශපාලනය කරන්න කියලා. ඒ වාගේම මම ඉතාම දැඩි ලෙස හෙළා දකිනවා, පිළිකුල් කරනවා, මිනිස්සු අතර තිබෙන ආදරණීය මානව සම්බන්ධතා මොනවාද කියලා විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන් දන්නේ නැති එක. ඒගොල්ලන් දන්නේ මිනිස්සු දෙදෙනෙකු අතර තිබෙන්නේ කායික සම්බන්ධතාවක් කියන එක විතරයි. ඒගොල්ලන් දන්නේ ඒ වාගේ අසභ්‍ය දේ කියන්න විතරයි.

අද දින මේ විවාදය අහගෙන ඉන්නකොට මේ විවාදය පුරාම මට දැනුණු දෙයක් තමයි, මෙතැන ඉන්න විපක්ෂයේ මන්ත්‍රීවරු බොහොමයක් ආණ්ඩු හොබවපු අය කියන එක. 2024දී අපි පළමු වතාවට ජාතික ජන බලවේග ආණ්ඩුවක් පිහිටුවද්දි අපට භාර දුන්නේ බංකොලොත් රටක්. මට පුදුම හිතෙනවා, එතුමන්ලා කථා කරනකොට කියපු දේවල් ගැන. ඒ කියන දේවල් එදා ඒගොල්ලන් කළා නම් අපට භාර දෙන්න ඕනෑ, සංවර්ධනය වෙච්ච රටක්. ලෝකය ඉදිරියේ හැල්ලුවට ලක් වුණු, බංකොලොත් රටක් අපට භාර දීලා අද පුරාජේරු කථා කියනවා, අපට උපදෙස් දෙනවා, මෙන්න මෙහෙම වැඩ කරන්න, මෙහෙම කරන්න කියලා. අපි කැමැතියි, මතවාදීව ගැටෙන්න. අපේ වැරදි තිබෙනවා නම් ඒවා පෙන්වා දෙන්න. හැම වෙලාවේම අපේ මන්ත්‍රීවරියන් ඉලක්ක කරමින්, අසභ්‍ය දේ කියමින් අප බය කරන්න ඔබතුමන්ලාට බැහැ. එම නිසා අපි දේශපාලනය කරන එක නවත්වන්නේත් නැහැ කියන එක වගකීමෙන් යුතුව මේ වෙලාවේ මම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පසුගිය නොවැම්බර් 27වැනි දා පාර්ලිමේන්තුවේ කථාවක් කරලා අපේ මාතලේ දිස්ත්‍රික්කයට ගිහිල්ලා ගෙදරට යනකොට පාන්දර දෙකයි. මම පාරවල් තුනකින් යන්න ගිහිල්ලාත් බැරිව බොහොම අමාරුවෙන් තමයි ගෙදරට ගියේ හවස පාර්ලිමේන්තුව ඉවර වෙලා. පහුව දා උදේ නැඟිටලා මාතලේ දිස්ත්‍රික්කය දිහා බලනකොට ඇත්තටම මගේ හදවතේ ඇති වුණේ බොහොම තිගැස්මක්, කම්පාවක්, මොකක්ද අපට මේ වුණේ කියලා. පසුගිය නොවැම්බර් 25, 26, 27 යන දිනවල කාලගුණය ක්‍රමයෙන් අයහපත් තත්ත්වයට පත් වුණු නිසා මුළු දිස්ත්‍රික්කයම බිඳ වැටිලායි තිබුණේ. අපේ දිස්ත්‍රික්කය පුරාම විදුලි බලය ඇනහිට තිබුණා. මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග 25කින් 16ක්ම ආපදාවට පත් වෙලා තිබුණා. විදුලි බලය අක්‍රිය වීම නිසා කලාප 14ක සන්නිවේදන කටයුතු ඇනහිට තිබුණා. කනගාටුම දේ තමයි, අපේ දිස්ත්‍රික්කයේ ජීවිත 29ක් අපට නැති වුණු එක. මේ ආපදා තත්ත්වය කළමනාකරණය කර ගන්නේ කොහොමද කියලා අපි කල්පනා කළා. ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා සහ මා ඇතුළු මන්ත්‍රීවරුන් හතරදෙනායි අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ. අපට බොහොම තිගැස්මක් ඇති වුණා, අපේ දිස්ත්‍රික්කය නැවත යථා තත්ත්වයට පත් කරන්නේ කොහොමද කියලා.

අපි දන්නවා, රාජ්‍ය නිලධාරින්, දේශපාලන අධිකාරිය, අපේ පක්ෂයේ සංවිධායකවරු, මේ රටේ පුරවැසියන් ඇතුළු සියලුදෙනාම මෙහෙයවමින් අපේ ජනාධිපතිතුමා පසුගිය නොවැම්බර් 28වැනි දා රට පුරා හදිසි තත්ත්වයක් ප්‍රකාශ කළ බව. අද දින මේ විවාදය කරන්නේ ඒ හදිසි නීතිය තවදුරටත් දීර්ඝ කිරීමේ යෝජනාව සම්මත කර ගන්නයි. අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් අද මෙතැන ඉන්නවා, ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමා සහ මම. අප දෙදෙනාගේ ආසන දෙක තමයි වැඩිපුරම බලපෑමට ලක් වුණේ. ඒ වාගේම ඒ ආසන බල ප්‍රදේශ පුරා වැඩිපුරම ඉන්නේ ද්‍රවිඩ ජනතාව. ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමා, මා ඇතුළු අපි හතරදෙනාම වැඩිපුරම කටයුතු කළේ අපේ රටේ අහිංසක වතු ජනතාවගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කර ගන්නේ කොහොමද කියන එක ගැනයි. අපට ජාතිවාදයක් තිබුණේ නැහැ, ආගම්වාදයක් තිබුණේ නැහැ, කුලවාදයක් තිබුණේ නැහැ. අපට තිබුණේ ඒ සියලුදෙනා අපේ රටේ මිනිස්සු කියන හැඟීම විතරයි.

ඒ වාගේම අපි ලොකු ආදර්ශයක් අපේ රටට පෙන්නුවා. අපි කොහොම මහජන නියෝජිතයන්ද කියලා අපි මේ රටට පෙන්නුවා. මෙම සභාවේ මා ඉදිරියෙන් ඉන්න ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා, ගරු සපුමල් රන්වල මන්ත්‍රීතුමා, ගරු ප්‍රගීත් මධුරංග මන්ත්‍රීතුමා, ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා වාගේම ගම්පහ, කළුතර වැනි ප්‍රදේශවල ප්‍රාදේශීය සභාවල මන්ත්‍රීවරුන්, සභාපතිවරුන් ඔවුන්ගේ ශක්තිය අරගෙන අපේ මාතලේ දිස්ත්‍රික්කයට ආවා. මා මෙය අවස්ථාවක් කර ගන්නවා, එතුමන්ලා සියලුදෙනාටම ස්තුති කරන්න. ඒ වාගේම ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා මාතලේ දිස්ත්‍රික්කයේ අපේ ජනතාව සමඟ පන්සලක තමයි රෑ නතර වෙලා හිටියේ. ඒවායෙන් මිනිස්සු හඳුනාගත්තා, මහජන නියෝජිතයෝ කියන්නේ කවුද කියන එක. ප්‍රාදේශීය සභාවල මන්ත්‍රීවරුන් හාල් මුට්ට, ගෑස් සිලින්ඩර් කර තියාගෙන අපේ දිස්ත්‍රික්කයේ ගම්මඩුව ප්‍රදේශයේ ඇති වී තිබුණු ආපදා තත්ත්වය කළමනාකරණය කරගන්න එකාවන්ව වැඩ කටයුතු කළා. ජනතාව පුදුම වෙනවා, මෙවන් දේශපාලනඥයන් මීට පෙර දැකලා නැහැ කියලා. විපක්ෂයේ කලබල වීම ඒකයි. විපක්ෂය දන්නවා, මේ ජනතාවාදී ආණ්ඩුවේ මහජන නියෝජිතයන් එක්ක මහ පොළොවට බැහැලා දේශපාලනය කරන්න බැහැ කියන එක. ඔය කියන තරමට අපට කොහේවත් තැනක විරෝධයක් ගොඩනැඟෙන්නේ නැහැ. මම අදටත් යනවා, වතු ආශ්‍රිතව ජීවත් වන ද්‍රවිඩ ජනතාව හමු වෙන්න. ඔවුන් බොහොම ආදරයෙන් අපත් එක්ක කථා කරන්නේ. ඔවුන් අපත් එක්ක ඔවුන්ගේ ගැටලු කථා කරන්නේ ආදරයෙන්. අපට පෙනෙන්නේ නැහැ ඒ කොහේවත් තැනක අපට විරෝධතාවක් පැන නඟිනවාය කියලා. අපි දැනටත් ඒ ප්‍රදේශවලට ගිහිල්ලා මේ ප්‍රශ්න කළමනාකරණය කර ගන්න සාකච්ඡා කරනවා.

අපේ දිස්ත්‍රික්කය මේ ආපදා තත්ත්වය නිසා සම්පූර්ණයෙන් බිඳ වැටුණා. ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු ජල ව්‍යාපෘති 10න්, 8ක්ම මේ නිසා බිඳ වැටුණා. හැබැයි, දවස් 10ක් ගත වනකොට අපේ නගරය, දිස්ත්‍රික්කය සාමාන්‍ය ජන ජීවිතයට ඔරොත්තු දෙන පරිදි සම්පූර්ණයෙන් යථාවත් කරන්න අපට පුළුවන් වුණා. නමුත්, තවම ඒ කටයුතු සියයට සියයක් කළමනාකරණය වෙලා නැහැ. මාර්ග සංවර්ධන අධිකාරියට අදටත් ඇල්කඩුව - උකුවෙල මාර්ගය යථාවත් කරන්න තිබෙනවා. ඒ වාගේම බඹරකිරිඇල්ල ජල ව්‍යාපෘතිය ස්ථාපිත කර ගන්න තිබෙනවා. නාය ගිය ගම්මඩුව හින්දු ජාතික විද්‍යාලය ද්‍රවිඩ දරුවන් ඉගෙන ගත්ත පාසලක්. එම නිසා ඒ පාසල වෙනත් ස්ථානයක ස්ථාපිත කරන්න තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයේ තව බොහෝ කටයුතු කර ගැනීමට තිබෙනවා. එම නිසා ඒ සම්බන්ධයෙන් තීන්දු - තීරණ ගන්නා රාජ්‍ය නිලධාරීන් ආරක්ෂාකාරී විය යුතුයි. මාර්ග සංවර්ධනය සඳහා ඉඩම් පවරා ගන්න අපට සිදු වෙනවා. ඒ වාගේම ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අපට කටයුතු කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා අපේ දිස්ත්‍රික්කයට බලපෑ ආපදා තත්ත්වය සම්පූර්ණයෙන් කළමනාකරණය කර ගැනීමට තවත් බොහෝ කටයුතු කරන්න තිබෙනවා.

විපක්ෂයේ අය අහනවා, ආපදා තත්ත්වය කළමනාකරණය කර ගත්තා නම් හදිසි නීතිය මොකටද කියලා. අපි හදිසි නීතිය භාවිත කරන්නේ නැහැ කිසිම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියකට විරුද්ධව. මාස දෙකක් හදිසි නීතිය තිබුණා. පුළුවන් නම් කියන්න, අපි ඒ හදිසි නීතිය ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධව භාවිත කළේ කොතැනදී ද කියලා? අනාගතය ගැන ජේන කියන්න එපා. ජනතාව තීන්දු කරලා ඉවරයි, අපත් එක්ක මේ ගමන යන්න පුළුවන් කියන එක. විපක්ෂයේ ඔබ ඔහොම ප්‍රකාශ කළාට අපට

කිසිම භයක් සැකක් නැතුව මහ ජනතාව මැදට යන්න පුළුවන්. ඒ නිසා අපි ඉදිරියටත් භය වෙන්නේ නැහැ. මොකද, වැරදි කරනවා නම් තමයි භය වෙන්න ඕනෑ. අපි දිස්ත්‍රික්කය නඟාසිටුවනවා. තිබුණාට වඩා හොඳ ජීවිතයක් අපි දිස්ත්‍රික්කයේ ජනතාවට ලබා දෙනවා. අපට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන සිහිනය තිබෙනවා. ඒ ලස්සන ජීවිතය උරුම කර ගැනීම වෙනුවෙන් 159දෙනාම ජනාධිපතිතුමාත් එක්ක එක්ව පොර බදලා, මේ රට තිබුණු තැනට වඩා හොඳ තැනකට ඔසවා තබන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.55]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ අද ජනාධිපතිතුමා වාර්තාවක් තැබුවා. එතුමා පළමුවැනි වතාවට හෙලිකොප්ටරයෙන් නුවර ගියා. බොහොම සතුටුයි. ඒ වෙනුවෙන් මම අත්පුඩියක් ගහනවා. එතුමා හෙලිකොප්ටරයෙන් යන්නේ නැහැ කිව්වා. නමුත්, අද පළමුවැනි වතාවට එතුමා හෙලිකොප්ටරයක් පාවිච්චි කළා. ඒ කාලයේ අනෙක් ජනාධිපතිවරු යනකොට ඇහුවා, හෙලිකොප්ටර දෙකක් යන්නේ එකකින් අනෙක් එකට පනින්නද කියලා. කොහොමත් security system එක අනුව එහෙම තමයි. එක හෙලිකොප්ටරයක් විතරක් යන්නේ නැහැ. මේ ජනාධිපතිතුමා යනකොටත් හෙලිකොප්ටර දෙකක් යන්න ඕනෑ. ඒ නිසා ජනාධිපතිතුමා හෙලිකොප්ටරයෙන් ගිය එක ගැන අපි සතුටුයි. රටේ ජනාධිපතිට හෙලිකොප්ටරයේ යන්න අයිතියක් තිබෙනවා; එහෙම යන්නත් ඕනෑ. ඒ ගැන මම සතුටු වෙනවා.

ඊළඟ කාරණය මේකයි. චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා නම් 1988 වනකොට පොඩියි. එතකොට චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට අවුරුදු 8යි, මට අවුරුදු 18යි. අද ඔය ඉස්සරහ ඉන්න පේළියම, ඔය ජවිපෙ සෙට් එකම 1988-89 කාලයේ අපිවත් ටයර්වලට දමන්න බලාගෙන හිටපු කට්ටිය. අපිවත් ඒ දවස්වල හොයාගෙන එනවා, ටයර්වලට දමන්න._එදා ඉන්දියානු ව්‍යාප්තවාදය ගැන කිව්වා. ඒ පන්ති පහෙන් එකක් තමයි, ඉන්දියානු ව්‍යාප්තවාදය. පන්ති පහෙන් එකක් වුණු ඉන්දියානු ව්‍යාප්තවාදය ගැන එදා එහෙම කිව්වාට, ටිල්වින් සිල්වා ඇතුළු කණ්ඩායම අද ඉන්දියාවට ගිහිල්ලා ජොලි කරනවා. අද ඉන්දියාව නැතුව බැහැ.

බලශක්ති ඇමතිතුමනි, 1988-89දී 60,000ක් මැරුණා. අපේ පන්තිවල අපිත් එක්ක එකට හිටපු 60,000ක් මේ පොළොවේ නැති වුණා. හැබැයි, ඒ මැරුණු මිනිස්සු බලාගෙන ඉන්නවා ඇති, වළවල්වල ඉඳලා. ඒ මිනිසුන්ට ඉගැන්නුවේ ඉන්දියානු ව්‍යාප්තවාදය පිළිබඳව. ඉන්දියානු ව්‍යාප්තවාදය ගැන කිව්වාට නිදහසින් පසුව අද ඉන්දියාවත් එක්ක වැඩියෙන්ම ලව් කරන එකම ආණ්ඩුව, මේ ආණ්ඩුව. ජේ.ආර්.ගේ ආණ්ඩුවවත්, ප්‍රේමදාසගේ ආණ්ඩුවවත්, චන්ද්‍රිකාගේ ආණ්ඩුවවත්, මහින්දගේ ආණ්ඩුවවත් -කිසිම ආණ්ඩුවක්- කළේ නැති විධියට රෙද්ද අස්සේ රිංගාගෙන නැත්නම් රෙද්ද පල්ලේ වැටිලා වැඩ කරන්නේ මේ ආණ්ඩුව බව මම මේ වෙලාවේදී කියනවා. ලජ්ජයි, ලජ්ජයි. මේ ආණ්ඩුව ගැන කියන්න ලජ්ජයි. ඉන්දියානු ව්‍යාප්තවාදය නිසා කොල්ලෝ 60,000ක් මැරුණා. මේ රටේ කොල්ලෝ 60,000ක් මැරුණා, ටයර් උඩ. ඒ කාලයේත් මේ විධියට තමයි රන්ජන් විජේරත්නලා හදිසි නීතිය දීර්ඝ කර ගත්තේ. හරි නම් මේ ආණ්ඩුව එක දවසක්වත් හදිසි නීතිය දීර්ඝ කර ගන්න හොඳ නැහැ. හදිසි නීතිය දීර්ඝ කරගෙන තමයි ඒ දවස්වලත් එහෙම වුණේ. ඉන්දියානු ව්‍යාප්තවාදය උගන්වලා තමයි ඒ කාලයේ කොල්ලෝ ටික පාරට දැම්මේ. මම ඒ ගැන වැඩිය කථා කරන්න කැමැති නැහැ. මොකද, මේ රටේ මිනිස්සු ඒවා දන්නවා.

ඊළඟ කාරණය මේකයි. ජනාධිපතිතුමා නිදහස් උත්සවයේදී කිව්වේ මොකක්ද? හැම කෙනාම නීතියේ රූලෙන් පහළ ඉන්නේ කිව්වා. රූලෙන් පහළ නීතිය තිබෙන්නේ කාටද? චාමර සම්පත්ලාට රූලෙන් පහළ නීතිය. නීතියේ රූලෙන් පහළ ඉන්න ඕනෑ, විපක්ෂයේ අය. නමුත්, ආණ්ඩු පක්ෂය? නීතියේ රූලෙන් පහළ කුමාර ජයකොඩි ඉන්නවාද? නීතියේ රූලෙන් පහළ වසන්ත සමරසිංහ ඉන්නවාද? නීතියේ රූලෙන් පහළ ඉන්නවාද, ඉස්සෙල්ලා කෑ ගහපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හිටපු කථානායක නීතියේ රූලෙන් යට ඉන්නවාද? දැන් ඉන්න කථානායක නීතියේ රූලෙන් යට ඉන්නවාද? ශානි අබේසේකර නීතියේ රූලෙන් යට ඉන්නවාද? අර පීරිස් ඉන්නවාද, නීතියේ රූලෙන් යට? එහෙම නැත්නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ DG නීතියේ රූලෙන් යට ඉන්නවාද? මේ ඔක්කෝම අය නීතියේ රූලෙන් උඩ ඉඳගෙන වැඩ කරන්නේ. ලජ්ජයි, ජනාධිපතිතුමා. රට හදන්න, නීතිය හදන්න නිදහස් උත්සවයේදී කථා කරනකොට කල්පනා කරලා කථා කරන්න. මේ විපක්ෂයේ අපි තමයි නීතියේ රූලෙන් යට ඉන්නේ. නීතියේ රූලෙන් යට ඉඳලා වැඩ කරන්නේ අපි. ජනාධිපතිතුමා නිදහස් උත්සවයේදී කිව්වා, හැමෝම නීතියේ රූලෙන් යට ඉඳගෙන වැඩ කරන්න ඕනෑ, නීතියේ රූලෙන් උඩට යන්න බැහැ කියලා. එතකොට ආණ්ඩුවට එකක්, අපට තව එකක්.

ඊළඟට, මම සභාවේ නැති වෙලාවේ මගේ නම කියලා තිබුණා. මුට්ට කාසිවලින් ජීවත් වුණු, ඉස්කෝලයක එක දරුවෙකුටවත් උගන්වන්නේ නැතුව අවුරුදු 20ක් පඩි ගත්ත එක ඇමති කෙනෙක් කිව්වා, චාමර සම්පත්ට නඩු 5ක් තිබෙනවා කියලා. ඔව්, නඩු 5ක් නොවෙයි, මට නඩු 14ක් තිබෙනවා. ඕනෑම නඩුවකට මම මුහුණ දෙනවා. ඕනෑම දෙයකට මම භය නැතුව මුහුණ දෙනවා, ඇමතිතුමා. හැබැයි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දෙහිවල තිබෙන රුපියල් කෝටි ගණනක් වටිනා අනුන්ගේ ඉඩමක් බලෙන් අල්ලාගෙන ඉන්නේ. ඔයගොල්ලන්ටත් ඒ නඩු එනවා. ඔයගොල්ලන් ඒ ගැන හොඳට මතක තියා ගන්න.

ඊළඟ කාරණය මේකයි. සිවිල් ආරක්ෂක බලකායේ උතුරු සහ නැඟෙනහිර හිටපු අහිංසක කොල්ලෝ ගෙනැල්ලා දකුණේ අරහේ මෙහේ දමලා පන්සල් අතු ගාවනවා. නැත්නම් ඒ අය වෙන වෙන වැඩවලට දමනවා. ඒ අයට ඕටී දෙනවා කිව්වා. බටා දෙනවා කිව්වා. නමුත්, ශත 5ක් දීලා නැහැ.

ඊළඟ කාරණය තමයි, උපාධිධාරින්ගේ ප්‍රශ්නය. දැන් ගුරු විභාගය ගැසට් කරලා තිබෙනවා. හැබැයි, ඒ ප්‍රශ්නය තවම විසඳිලා

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

නැහැ. නැඟෙනහිර ජනතාව බණිනවා; දකුණේ ජනතාව බණිනවා; ඌවේ ජනතාව කෑ ගහනවා. උපාධිධාරීන්ට රක්ෂා දෙන එකට ගැසට් එකත් ගහලා තිබෙනවා. ලංකාවේම උපාධිධාරීන් දැන් ඇවිස්සිලා තිබෙනවා. නමුත්, ඒ ගැටලුව විසඳා ගෙන නැහැ.

ඊළඟට, ආපදා ණය ගැනත් මම කියන්න ඕනෑ. ජනාධිපතිතුමා ඔය ජනාධිපති අසුනේ ඉඳගෙන තමයි ආපදා ණය ගැන කිව්වේ. ආපදා ණය විධියට රුපියල් ලක්ෂ 4ක් දෙනවා කිව්වා. ඒ වුණාට දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරි ලියුමක් ගහලා තිබෙනවා, ආපදා ණය හැටියට රුපියල් ලක්ෂ දෙකහමාරයි දෙන්නේ කියලා. මම මෙතැන ඉඳන් ඒ ලියුම පෙන්වන්නම්. ආපදා ණය හැටියට රුපියල් ලක්ෂ දෙකහමාරයි දෙන්නේ කියලා දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරි ලියුමක් ගහලා තිබෙනවා. Budget එකේදී කිව්වා, ආපදා ණය විධියට රුපියල් ලක්ෂ 4ක් දෙනවා කියලා. ඒ නිසා ඔය පොත් වීසි කරන්න. ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි, දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයන්ට incentive එක වැඩි කර දෙනවා කිව්වා. මිනිස්සුන්ට මොන තරම් බොරු කියලාද මේ ආණ්ඩුව ගත්තේ? මේවා හැම තැනම කිය-කියා යන්න පුළුවන්. දුම්රිය දෙපාර්තමේන්තුවේ වාගේම සිවිල් ආරක්ෂක බලකායේ ගොඩක් ප්‍රශ්න තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඒවා කථා කරන්න ඕනෑ. ඒවා ගැන කථා කරනකොට අපට නඩු දමනවා කියනවා. නඩු දැම්මාට නඩුවලට භයේද අපි ඉන්නේ? නැහැ. හිර ගෙදර යන්න වුණොත් අපි යනවා. සමහර ඇමතිතුමන්ලා කථා කරන්නේ හරියට ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්, නැත්නම් මහෙස්ත්‍රාත්වරුන්, එහෙම නැත්නම් අධිකරණවල විනිශ්චයකාරවරුන් විධියට තමයි. මේගොල්ලන් තමයි නඩු විසඳන්නේ, හිරේ දමන්නේ, ඔක්කෝම කරන්නේ. ඒවාට නම් අපි අල්ලා ගන්න වෙන්නේ නැහැ. ඒවාට අපි භයත් නැහැ.

මේ වෙලාවේදී හදිසි නීතිය ගැනත් මම කියන්න ඕනෑ. ඇයි, හදිසි නීතිය මේ රටට? මොකටද දැන් හදිසි නීතිය? හදිසි නීතිය තිබුණාම- *[බාධා කිරීමක්]* එහෙම නම් හදිසි නීතිය ඕනෑ අපිව මරන්නද? ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා. දැන් කියනවා, රටේ ප්‍රශ්න නැහැ කියලා. එහෙම නම් මොකටද හදිසි නීතිය? වෙන මොකටවත් නෙවෙයි, තරහාකාරයන්ගෙන් පළිගන්න තමයි මේ හදිසි නීතිය ගේන්නේ. වෙන මොනවටවත් නොවෙයි, ආණ්ඩුවට විරුද්ධව වැඩ කරන මිනිසුන්ට පහර දෙන්න තමයි හදිසි නීතිය ගෙනැල්ලා තිබෙන්නේ.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට, ගරු සුන්දරලිංගම් ප්‍රදීප් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[பி.ப. 4.03]

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இடம்பெறும் அவசரகாலச் சட்டம் நீடிப்புத் தொடர்பான விவாதத்திலே முக்கியமான சில விடயங்களைக் கூற நினைக்கின்றேன். கடந்த காலங்களில் இந்த அவசரகாலச் சட்டம் நாட்டில் எதற்காகப் பயன்படுத்தப்பட்டது, எதற்காகக் கொண்டுவரப்பட்டது என்பது முழு நாட்டு மக்களுக்கும் தெட்டத்தெளிவாக தெரிந்த விடயம். கடந்த காலங்களில் மக்கள் தங்களின் கோரிக்கைகளை முன்வைத்துப் போராடியபோது, அந்தப் போராட்டத்தை நசுக்குவதற்காக இந்தச் சட்டத்தைப் பயன்படுத்தினார்கள். பொதுமக்கள் குடிநீருக்காகப் போராடியபோது அவர்களைச் சுட்டுக் கொலைசெய்தார்கள். உண்மையை உரத்துச் சொன்ன ஊடக நிறுவனங்களுக்குத் தீ வைத்தார்கள்; ஊடகவியலாளர்களைச் சுட்டுக் கொன்றார்கள். ஒட்டுமொத்தமாக, கடந்தகால ஆட்சியாளர்கள் ஜனநாயகத்தைப் பாதுகாப்பதாகக் கூறிக் கொண்டு, இதனைப் பயன்படுத்தி ஜனநாயக விரோதச் செயற்பாடுகளையே மேற்கொண்டதை இந்த உலகம் அறியும்.

அதேபோன்று, இந்த அவசரகாலச் சட்டம் தொடர்பாக பொதுவாக இந்த நாட்டிலுள்ள சிறுபான்மை மக்கள் மத்தியில் எப்போதும் ஒரு பயம் இருக்கும். தங்களுக்கு எதிராக ஏதோவொரு வகையில் இந்தச் சட்டத்தைப் பயன்படுத்து

வார்களா? தங்களுடைய குரல்வளையை நசுக்குவார்களா? என்று மக்கள் மத்தியில் எப்போதும் ஓர் அச்சம் இருக்கும். ஆனால், எங்களுடைய மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் கடந்த 53 நாட்களுக்கு முன்பு ஏன் இந்த அவசரகாலச் சட்டத்தை நடைமுறைப்படுத்தினார் என்பதைப் பற்றி நாம் அனைவரும் சிந்திக்க வேண்டும். 'தித்வா' புயல் காரணமாக முழு நாடும் துன்பத்திலே துயருற்ற வேளையிலே, மனிதநேய அடிப்படையிலே மக்களுடைய உயிர்களையும் உடைமைகளையும் பாதுகாக்கவும் பாதிக்கப் பட்ட மக்களுக்கு உணவு, உடை போன்ற அத்தியாவசியத் தேவைகளையும் மருத்துவச் சேவைகளையும் விரைந்து செயற்படுத்துவதற்காகவுமே மாண்புமிகு ஜனாதிபதி அவர்கள் இந்த அவசரகாலச் சட்டத்தைப் பிரகடனம் செய்தார். அன்று அவசரகாலச் சட்டத்தைப் பிரகடனம் செய்யுமாறு கோரியதே இந்த எதிர்க்கட்சியினர்தான். ஆனால், இன்று அவர்கள் அதைப்பற்றி பல்வேறு கருத்துகளைப் பேசிக்கொண்டு இருக்கிறார்கள்.

இன்று எதிர்க்கட்சியில் இருப்பவர்கள், தாங்கள் செய்த பிழைகள், தாங்கள் செய்த கொலைகள், தாங்கள் செய்த ஊழல்கள், தாங்கள் செய்த மக்கள் விரோதச் செயற்பாடு களுக்காக நீதியின் முன்பு செல்லவேண்டிய நிலை ஏற்பட்டுள்ளதால், அவர்களுக்கு ஓர் அச்சம் ஏற்பட்டிருக்கிறது. விசேஷமாக, இந்த அரசாங்கம் முன்னெடுக்கின்ற விடயங்கள் நீதியின் செயற்பாடுகளாக இருக்கின்றது. நீதித்துறையானது நாட்டிலே உள்ள அனைவருக்கும் சமன் என்பதை நாங்கள் இன்று நடைமுறைப்படுத்தி வருகிறோம். கடந்த கால ஆட்சியாளர்களாக இருக்கலாம் அல்லது உயர் பதவிகளில் இருந்தவர்களாக இருக்கலாம் அல்லது பணக்காரர்களாக இருக்கலாம் அல்லது இந்த நாட்டிலே உள்ள சாதாரண பொதுமகனாக இருக்கலாம், யாராக இருந்தாலும் சட்டம் என்பது எல்லோருக்கும் சமமாக நடைமுறைப்படுத்தப் படுவதையும், கடந்த காலத்தில் கொள்ளையடித்த கள்வர் கூட்டம் இதனைப் பொறுக்க முடியாமல் இன்று எங்களைப் பார்த்து விமர்சனம் செய்துகொண்டு இருப்பதையும் நாங்கள் பார்த்துக் கொண்டிருக்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களது பிரதேசங்களில் மலைப் பிரதேசம், பள்ளத்தாக்குகள், சரிவான பகுதிகள் போன்ற இடங்களிலே மக்கள் குடியிருக் கிறார்கள். இதனால் அண்மையில் ஏற்பட்ட 'தித்வா' புயலின் காரணமாக அதிகமாகப் பாதிக்கப்பட்ட பிரதேசங்களாக மலையகப் பகுதிகள் காணப்படுகின்றன. இந்தப் புயலினால் பாதிக்கப்பட்ட மக்களை மீட்டெடுப்பதற்கு அவசரகாலச் சட்டம் பெரிதும் உதவியாக அமைந்தது என்பதை நாங்கள் தெரிவித்துக் கொள்கின்றோம். அங்கு ஒரு கிராமசேவகர் பிரிவுக்கும் இன்னொரு கிராமசேவகர் பிரிவுக்கும் இடையே புவியியல் அடிப்படையிலே மிக நெருங்கிய தொடர்பு இருக்கிறது. அதேபோல, ஒரு பிரதேச செயலகத்திற்கு உரிய ஒரு கிராமம் தூரமாகவும் அதற்கான போக்குவரத்துப் பாதைகள் துண்டிக்கப்பட்ட நிலையிலும் இருந்த காரணத்தினால் அவசர உதவிகளை வழங்க முடியாதிருந்த நிலையில், பக்கத்தில் இருந்த மற்றைய பிரதேச செயலகத்தின் உதவியைப் பெறுவதற்கு அது சாதகமாக இருந்தது. அந்த வகையில், இந்த அவசரகாலச் சட்டமானது அரச ஊழியர்கள் எல்லைகளைக் கடந்து பாதிக்கப்பட்ட பொதுமக்களுக்குச் சேவை செய்வதற்கு மிகமிக அவசியமானதாகவும் பயனுள்ள தாகவும் அமைந்தது என்பதை நான் கூறிக்கொள்ள விரும்புகின்றேன். அதேபோல, மலையக மக்களுக்குக் காணிகளைப் பெற்றுக் கொடுப்பதற்கும், அங்குள்ள ஆபத்தான மரங்களை வெட்டுவதற்கும், அந்த மக்களுக்கு அத்தியாவசிய சேவைகளைப் பெற்றுக் கொடுப்பதற்கும் இந்த அவசரகாலச் சட்டம் மிகவும் பயனுள்ளதாக அமைந்தது. எனவே, ஒட்டுமொத்தமாக 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மக்களின் வாழ்க்கையை மேம்படுத்துவதற்கும், அதன்மூலம் இந்த நாட்டிலே மனித நேயத்தை நிலை நிறுத்துவதற்கும் இந்தச் சட்டம் என்பது மிக அத்தியாவசியமானதாகக் காணப் படுகின்றது.

இவர்கள் கூறியதுபோல, கடந்த 53 நாட்களில் இந்த அவசரகாலச் சட்டத்தைப் பயன்படுத்தி எங்களுடைய அரசாங்கம் சிறியதொரு தவறேனும் செய்திருக்கிறதா? உதாரணம் கூற முடியுமா? என்று எதிர்க்கட்சியினரிடம் நாங்கள் கேட்டுக் கொள்கின்றோம். மக்கள் விரோதச் செயற்பாடுகளிலோ ஜனநாயகத்துக்கு எதிரான செயற்பாடு களிலோ நாங்கள் ஈடுபடவில்லை. இந்தச் சட்டத்தை முழுமையாக மக்களுக்காகத்தான் பயன்படுத்திக்கொண்டு இருக்கின்றோம், கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இந்தச் சட்டத்தின் மூலமாக எங்களுடைய நாட்டு மக்களைப் பாதுகாக்கவேண்டிய தேவை எங்களுக்கு இருக்கிறது. ஆனால், எதிர்க்கட்சியினர் தங்களுடைய இருப்பைப் பற்றி பேசிக்கொண்டிருக்கிறார்கள். மக்கள் என்ன கூறுகிறார்கள் என்று இந்த நாட்டினுடைய சிறுபான்மை மக்கள் மத்தியில் சென்று கேட்டுப் பாருங்கள்! எந்தச் சட்டத்தைக் கொண்டுவந்தாலும் பரவாயில்லை, நாட்டு மக்களுடைய சனநாயகத்தைப் பாதுகாக்க வேண்டும்.

இன்று சிலர் இனவாதத்தைப் பேசிக்கொண்டு, மீண்டும் இந்த நாட்டிலே தமிழ், சிங்கள, முஸ்லிம் மக்களைப் பிரிக்கின்ற செயற்பாடுகளிலே ஈடுபடுகின்றார்கள். பாராளுமன்றத்தில் இருக்கின்ற சில கூலிகள் வெளிநாட்டில் உள்ளவர்களின் நிகழ்ச்சிநிரலுக்கு ஏற்றவாறு இங்கு உரையாற்றிக் கொண்டிருக் கின்றார்கள்; செயற்பட்டுக் கொண்டிருக்கின்றார்கள். ஆனால், மக்கள் தெளிவாக இருக்கின்றார்கள். எனவே, அடுத்த தேர்தலில் இந்தக் கூலிகளுக்கு மக்கள் சரியான பாடத்தைக் கற்பிப்பார்கள் என்பதை நாங்கள் கூறிக்கொள்ள விரும்புகின்றோம்.

அதேபோல, பாராளுமன்றத்தில் நாங்கள் பேசுகின்ற பொழுது, கருத்துக்களைத் தெரிவிக்கின்றபொழுது, விசேடமாக இங்குள்ள பெண் பாராளுமன்ற உறுப்பினர்களுடைய கௌரவம் பாதுகாக்கப்பட வேண்டும். ஆனால், இவர்கள் வாய்க்கு வந்த மாதிரி என்னென்னவோ எல்லாம் சொல்லி பெண்களை நிந்தனை செய்கின்ற செயலில் ஈடுபடுகின் றார்கள். இதனை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம், கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

அதேபோல, கடந்த காலத்திலிருந்து மலையக மக்களின் வீட்டுப் பிரச்சினை மிக நீண்டகாலப் பிரச்சினையாகக் காணப்படுவது உங்களுக்குத் தெரியும். இன்று நாங்கள் அதற்கான தீர்வுவைப் பெற்றுக்கொடுப்பதற்காக பல்வேறு பட்ட செயற்றிட்டங்களில் ஈடுபட்டு வருகின்றோம். கடந்த 2025ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கப்பட்ட நிதியிலிருந்து கட்டப்பட்ட வீடுகள், இன்று மலையக மக்களுக்குக் கையளிக்கப்பட்டு வருகின்றது. அதேபோல, சம்பள உயர்வையும் நாங்கள் பெற்றுக் கொடுத்திருக் கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் இறுதியாக ஒன்றைக் கூறிக்கொள்ள விரும்புகின்றேன், இன்று மலையகத்தில் எத்தனையோ அரசியல்வாதிகள் இருக்கின் றார்கள். அவர்களுக்குச் சொந்தமான எத்தனையோ

[ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා]

தோட்டங்கள் இருக்கின்றன; அவர்களுக்குச் சொந்தமான எத்தனையோ ஏக்கர் காணிகள் இருக்கின்றன. இன்று மலையக மக்களைப் பற்றி பேசும் அவர்கள், பாதிக்கப்பட்ட மலையக மக்களுக்காக ஒரு துண்டுக் காணியைக் கொடுப்பார்களா? என்று கேட்க விரும்புகின்றேன். எனவே, முதலைக் கண்ணீர் வடிப்பதை விட்டுவிட்டு, மக்களுக்காக களத்தில் இறங்கிச் சேவை செய்யும்படி அவர்களுக்கு அறிவுரை கூறிக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.12]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாங்கள் அவசரகாலச் சட்டத்தை நீடிப்பது சம்பந்தமாக விவாதித்துக் கொண்டிருக்கின்றோம். உண்மையிலேயே இந்த அவசரகாலச் சட்டத்தை நீடிக்க வேண்டுமா? என்ற விடயம் கேள்விக்கு உட்படுத்தப்பட்டிருக்கின்றது. காரணம், ஆளும் தரப்பினர் இன்று நாட்டில் மக்கள் நிம்மதியாக வாழக்கூடிய சந்தர்ப்பத்தைத் தாங்கள் ஆட்சிக்கு வந்த இந்த ஒரு வருட காலத்திலேயே ஏற்படுத்திக் கொடுத்திருக்கின்றோம் என்று கூறுகின்ற அதே சந்தர்ப்பத்தில், இவ்வாறான ஓர் அதிகாரத்தைக் கோருவது என்பது கவலைக்கிடமான ஒரு விடயமாகக் காணப்படுகின்றது. மனிதர்களைப் பாதுகாக்க வேண்டும் அல்லது நாட்டினுடைய செயற்பாடுகளைத் தடையின்றி முன்னெடுக்க வேண்டுமென்ற அடிப்படையில் தான் கடந்த காலங்களில் அவசரகாலச் சட்டம் தொடர்ச்சியாக ஒவ்வொரு அரசாங்கத்தினாலும் ஒரு வருடத்துக்கோ அல்லது ஆறு மாத காலங்களுக்கோ மாதாந்தம் கால நீடிப்புச் செய்யப்பட்டு வந்த வரலாற்றை நாங்கள் பார்த்திருக்கின்றோம்.

இந்தச் சட்டத்தினால் எங்களுடைய முஸ்லிம் சமூகத்தினரே மிக அதிகளவில் பாதிக்கப்பட்டுள்ளனர். கடந்த 'ஈஸ்ரர்' குண்டுத் தாக்குதலின்போது, அகில இலங்கை மக்கள் காங்கிரஸ் கட்சியினுடைய தலைவர் கௌரவ றிஸாட் பதியுதீன்அவர்கள் இந்த PTA சட்டத்தின்மூலம் கைது செய்யப்பட்டு, மிக நீண்ட நாட்களாகச் சிறைத் தண்டனையை அனுபவித்தார். அவ்வாறான ஒருவர் இந்த சமூகத்துக்கு என்ன செய்தார்? எனக் கேள்வி கேட்கின்ற அவல நிலையையும் கேவலத்தையும் இன்று நாங்கள் பார்க்கின்றோம். அவர் கைதுசெய்யப்பட்டது 'ஈஸ்ரர்' குண்டுத் தாக்குதலில் சம்பந்தப்பட்டதற்காக அல்ல, இந்த சமூகத்துக்காக - மக்களுக்காக இரவு பகல் பாராமல் ஓடோடிப் பணி செய்ததற்காக. அவர் முஸ்லிம் சமூகத்துக்கு மாத்திரமல்ல, தமிழ், சிங்கள, கத்தோலிக்க சமூகத்தினர் எல்லோருக்குமாக அவருடைய அமைச்சின் கீழ் இருந்த எல்லா விடயங்களையும் மிகவும் நிதானமான முறையில் கையாண்டார். அந்தக் கோபத்தில்தான் இந்தச் சமூகத்திலிருந்து அவரின் குரலை நசுக்க வேண்டும் என்பதற்காக அவரையும் குடும்பத்தினரையும், அவர் சார்ந்த ஏனையவர்களையும் கைதுசெய்த வரலாறு இருக்கின்றது. அவற்றையெல்லாம் மறைத்துவிட்டு, அவருக்கு எதிராகச் சேறு பூசுகின்ற விடயங்களை இன்று ஆளும் கட்சியில் இருப்பவர்கள் செய்வதனைப் பார்க்கின்றோம்.

நாங்கள் இன்று பல விடயங்களை உங்களுக்குச் சுட்டிக் காட்டுகின்றோம். ஜனாதிபதித் தேர்தலின்போதும் பாராளுமன்றத் தேர்தலின்போதும் இந்த நாட்டுக்காக, சமூகத்துக்காகப் பல விடயங்களைச் செய்து தருவதாக நீங்கள் வாக்குறுதிகளை முன்வைத்திருந்தீர்கள். ஆனால், தற்பொழுது அதனை மறந்தவர்களாகச் செயற்பட்டுக் கொண்டிருக்கின்றீர்கள். அவ்வாறான சந்தர்ப்பத்தில் நாங்கள் உங்களுக்கு ஞாபகமூட்டுதலைச் செய்கின்றபொழுது, உங்களுடைய குறைகளை நாங்கள் சுட்டிக்காட்டுகின்றோம் என்று நீங்கள் கோபப்படுகின்றீர்கள், ஆவேசப்படுகின்றீர்கள். எனக்கு முன்பு பேசிய பாராளுமன்ற உறுப்பினர் அவர்கள், "இந்த ஒரு வருடத்தில் நாங்கள் ஏதாவது தவறு செய்திருக்கின்றோமா? உங்களால் சொல்ல முடியுமா?" என்று கேட்டார். 159 பேர் உங்கள் தரப்பில் இருக்கத்தக்கதாகவே நீங்கள் இந்த அவசரகாலச் சட்டத்தை நீடிப்பதற்கான அதிகாரத்தைக் கேட்கின்றீர்கள். ஆனால், 'பிரஜாசக்தி' என்ற திட்டத்தின் தலைவர் பதவியை உங்களுடைய கட்சி சார்ந்தவர்களுக்கும், உங்களுக்கு வால்பிடிப்பவர்களுக்கும் வழங்குவதற்காக, யாரிடத்திலும் எந்தக் கேள்வியும் கேட்காமல் அமைச்சரவைப் பத்திரத்தின்மூலம் அனுமதி வழங்கியுள்ளீர்கள். பிரதேச செயலாளர், பிரதேச சபையினுடைய தவிசாளர், கௌரவ உறுப்பினர்கள், EDOமார்கள், அதேபோன்று கிராம சேவை உத்தியோகத்தர்கள், சமுர்த்தி உத்தியோகத்தர்கள், ஏன் பாராளுமன்ற உறுப்பினர்களால் முன்வைக்கப்படுகின்ற அபிவிருத்தித் திட்டங்களைக்கூட அதன் தலைவர்கள் அனுமதிக்க வேண்டுமென்ற ஓர் அதிகாரத்தை எழுத்துமூலமாக நீங்கள் வழங்கியிருப்பதனை என்னவென்று கூறுவது? இதன்மூலம் எந்த ஒரு சட்டத்திலும் இல்லாத, ஏற்றுக்கொள்ள முடியாத ஓர் அதிகாரத்தை நீங்கள் அவர்களுக்குக் கொடுத்திருக்கின்றீர்கள். இவ்வாறான விடயங்களை உங்களுக்குச் சுட்டிக்காட்ட வேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது. அதனடிப்படையிலே நாங்கள் அந்த விடயங்களைக் கூறுகின்றபோது, அரசாங்கத்தினுடைய அத்தகைய செயற்பாடுகளைப் பாதுகாக்கும் வகையில் நீங்கள் நடந்து கொள்கின்றீர்கள்.

எங்களது பிரதேசத்தில் ஏற்படுகின்ற கடலரிப்புத் தொடர்பாகத் தொடர்ச்சியாக நாங்கள் பேசுகின்றோம்; அதை யாரும் காதில் போட்டுக்கொண்டதாகத் தெரியவில்லை. இப்போது நெல் அறுவடைக் காலம்! நெற் சந்தைப்படுத்தல் திணைக்களத்தின் கொள்முதல் நிலையங்கள் பழுதுபார்க்கப்பட வேண்டிய தேவையிருக் கின்றது; அதற்கான நிதியை ஒதுக்கீடு செய்யுங்கள்! அரசாங்கத்தினால் நிர்ணயிக்கப்பட்ட நெல்லுக்கான கொள்வனவு விலை 120 ரூபாயாக இருந்தாலும், 80-90 ரூபாய்க்குமேல் நெல்லை யாரும் கொள்வனவு செய்வ தில்லை. எனவே, அதற்குரிய வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், நிந்தவூர் ஆதார வைத்தியசாலையில், வைத்திய அத்தியட்சகர் ஒருவர் இல்லாமையால் அந்த வைத்திய சாலையின் விடயங்கள் தொடர்ச்சியாக இழுபறி நிலையில் காணப்படுகின்றது. எனவே, அந்த வைத்தியசாலைக்குப் பொருத்தமான ஒருவரை நியமிக்க வேண்டும். முன்னாள் சுகாதார இராஜாங்க அமைச்சர்கள் இருவரினால் குறித்த வைத்தியசாலையின் அபிவிருத்தி நடவடிக்கைகள் முன்னெடுக்கப்பட்டபோதும், அங்கு தொடர்ந்தும் பல

குறைபாடுகள் காணப்படுகின்றன. அதேபோன்று, அக்கரைப்பற்று ஆதார வைத்தியசாலையில் அண்மையில் செய்யப்பட்ட வைத்திய அத்தியட்சகரின் இடமாற்றம்! அவரை இடமாற்றம் செய்யமாட்டோம் என்று கூறிவிட்டு அதனைச் செய்திருக்கின்றீர்கள். இவ்வாறான விடயங்களை உங்களுக்கு நாங்கள் சுட்டிக்காட்டுகின்ற போது நீங்கள் கோபமடைவதை விடுத்து, மக்களுக்கான பணிகளைச் செய்வதில் உங்களுடைய கவனத்தைச் செலுத்த வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ භා. 4.17]

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර මේ පාර්ලිමේන්තුව තුළදී ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා. එතුමා කිව්වා, අපේ බහුදින යාත්‍රා ධීවරයන් පිරිසකට පහර දීමක් වෙලා තිබෙනවා කියලා. එතුමන්ලා උපකල්පනය කරනවා ඒක Indian Coast Guard එක විසින් කරන ලද පහරදීමක් කියලා. ඇත්තටම ධීවර අමාත්‍යාංශය විධියට අපේ ගරු අමාත්‍යතුමාත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් ඒ ගැන සොයා බැලුවා. අවශ්‍ය කටයුතු සඳහා අපි මේ වෙද්දී මැදිහත් වෙලා තිබෙනවා. අපි ඉන්දියාවෙන් විමසුවාම, ඉන්දීය රජයෙන් පැහැදිලිවම කියනවා ඔවුන් ඒකට සම්බන්ධ නැහැ කියලා. ඔවුන් ලිඛිතවත් ප්‍රකාශයක් කර තිබෙනවා ඔවුන් ඒකට සම්බන්ධ නැහැ කියලා. ඇත්තෙන්ම ගත්තොත්, පහර දීමක් වෙලා තිබෙනවා; ඒ ධීවරයින් අසරණ වෙලා තිබෙනවා. නමුත්, ඒ සිදුවීම කොහොමද වුණේ කියන ප්‍රශ්නයත් තිබෙනවා. අපි විශේෂ විධියට මැදිහත් වෙලා නාවික හමුදා යාත්‍රා යවලා ඒ ධීවරයන් ගොඩබිමට ගෙන්වා රෝහල්ගත කළා. ගරු අමාත්‍යතුමාත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් රෝහලට ගිහින් ඔවුන්ගේ සුව දුක් විමසුවා. ඒ වෙනුවෙන් එතුමන්ලාගේ මැදිහත්වීම කර තිබෙනවා. ඒ වාගේම, නීත්‍යනුකූල පැත්තෙන් මේ සම්බන්ධව කරන්නේ කුමක්ද කියා සොයා බලා තිබෙනවා. ඊට අදාළව පරීක්ෂණ පවත්වන්න කියා අපි ඉන්දීය රජයෙන් ඉල්ලා තිබෙනවා. ඒ වාගේම, අපිත් මේ සම්බන්ධව කටයුතු කරමින් සිටිනවා. ඇත්තටම කුමක්ද වුණේ, කවුද ඒ පහර දීම කළේ, කුමන කණ්ඩායමක්ද ඒ පහර දීම කළේ කියා සොයා ගැනීමට තවම අපට නොහැකි වෙලා තිබෙනවා. මේක පරීක්ෂණ මට්ටමේ තිබෙන්නේ. ඔවුන් හිතනවා නම්, ඒ ධීවරයන්ව අත් හැරලා ඉන්නවා, ධීවර අමාත්‍යතුමන්ලා ඒ අය ගැන බලන්නේ නැහැ, රජය බලන්නේ නැහැ කියලා, ඒක එහෙම නොවෙයි. රජය ක්ෂණිකව මැදිහත් වෙලා ඊට අදාළව ක්‍රියාත්මක වෙලා තිබෙන බව කියන්න ඕනෑ.

ඒ වාගේම තමයි, මාදැල් කර්මාන්තය සම්බන්ධයෙනුත් දැන් ප්‍රශ්නයක් තිබෙනවා. අපි දැක්කා, ඊයේ දිනයේදීත් යම් විරෝධතාවක් ඇති වෙනවා. කුමක්ද, මේ විරෝධතාව? කුමක්ද, මේ කියන්නේ? අපේ රටේ මාදැල් 899ක් තිබෙනවා. සුළු පිරිසක් ට්‍රැක්ටර් භාවිත කරමින් මේ කර්මාන්තය අවිධිමත්ව කරන්න අවසර ඉල්ලනවා. හිටපු අමාත්‍යවරයෙකු වූ මහින්ද අමරවීර මහත්මයාලා පනතකින් දෙන්න බැරි අවසරයක් 183දෙනෙකුට දීලා තිබෙනවා. මේවා සාධාරණ නැහැ. මොකද, මේ මාදැල් කර්මාන්තය අපේ සාම්ප්‍රදායික කර්මාන්තයක්. එය විධිමත්ව නියාමනය කරන්න ඕනෑ. එදා වගේ නොවෙයි, අද වනකොට සුළුපන්න ධීවරයින් විශාල ප්‍රමාණයක් මේ මහ මුහුදෙන් ජීවත් වෙනවා. හැබැයි, මත්ස්‍ය සම්පත කිහිපදෙනෙකු නෙළාගන්න ගියොත් එහෙම අසරණ වෙන්නේ අර අසරණ සුළුපන්න ධීවරයින්. එම නිසා මේ සඳහා විධිමත් නියාමන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නයි යන්නේ. මේක අපි හදපු එකක් නොවෙයි. පනතට අදාළව හදපු 1984 මාදැල් නියෝග මාලාව දැනටත් තිබෙන එකක්. ඒවා ක්‍රියාත්මක කිරීමට අපි සූදානම් වෙලා ඉන්නවා. කිසිසේත්ම මාදැල් කර්මාන්තයට, මාදැල් හිමියන්ට කිසිම බලපෑමක් වෙලා නැහැ. මොකද, ඒ සැම මාදැලක්ම වට කරන්න පුළුවන්. ඇයි, මේ යාන්ත්‍රික කරලා තිබෙන්නේ? හැම දෙයක්ම යාන්ත්‍රික කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යාන්ත්‍රික කරන්න පුළුවන් ඒවා තිබෙනවා වාගේම යාන්ත්‍රික කරන්න බැරි ඒවාත් තිබෙනවා. මොකද, මුහුදු සම්පතත්, වෙරළ තීරයත් ආරක්ෂා කර ගන්න ඕනෑ. හිතුණු හිතුණු කෙනාට එක් එක් යන්ත්‍ර සූත්‍ර පාවිච්චි කරමින් මේ හැම දෙයක්ම කරන්න පුළුවන්ද? ඔවුන් කියනවා ශ්‍රමය නැහැ කියලා. ශ්‍රමය නැතිකම නොවෙයි. අවිධිමත් ක්‍රමයකට ගිහිල්ලා තිබෙනවා.

මාදැල් අටසිය ගණනක් තිබෙනවා. හැබැයි, ඒවා භාවිත කරන අයගෙන් යම් පිරිසක් ට්‍රැක්ටර් භාවිත කරලා වෙරළත් විනාශ කරමින්, මුහුදු සම්පතත් විනාශ කරමින්, මුහුදු පතුළත් විනාශ කරමින් කටයුතු කරනවා නම් අපට නිහඬව ඒ දෙස බලාගෙන ඉන්න පුළුවන්ද? සැමට නීතිය සාධාරණයි කියන ආණ්ඩුවක්, රජයක් විධියට ඒ හැම කෙනාටම එය අවිධිමත්ව කරන්න දෙන්න බැරිකම තමයි අප කියන්නේ. නමුත්, ඔවුන්ට තිබෙන ගැටලු සම්බන්ධව සාකච්ඡා කරන්න අපි සූදානම්. අප කියන්නේ, ඒ කර්මාන්තය සාම්ප්‍රදායික කර්මාන්තයක්. අපේ රටේ මාදැල් කර්මාන්තය කිව්වාම විදේශිකයන් ඇවිල්ලා බලනවා. සාම්ප්‍රදායික කර්මාන්තයක් විධියට ඒ පිළිබඳව අපේ පොතපතේ ලියැවිලා තිබෙනවා. ඇයි, ඒවා violate කරන්නේ? නීති විරෝධී ක්‍රියාවලට යන්න එපා. අපි සූදානම් වෙන්නේ හැම මොහොතේම මේ තිබෙන සම්පත් සාධාරණව බෙදෙන ආකාරයට කටයුතු කරන්නයි. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන වැඩ පිළිවෙළේ තිබෙන්නේ මේ සම්පත් සාධාරණව බෙදෙන්න ඕනෑ, එහි ප්‍රතිලාභ ජනතාවට ලැබෙන්න ඕනෑ කියන එක. අපි ඔවුන්ගෙන් ඉල්ලන්නේ ඔබ අවිධිමත් ක්‍රමයට යන්න එපා, මත්ස්‍ය සම්පත සාධාරණව සියලු දෙනාට ලැබෙන ක්‍රමයකට යන්න කියලායි. අපි දැක්කා, තලවිල ප්‍රදේශයේ පෙරේදා දිනයේදීත් රුපියල් ලක්ෂ 80ක මාළු අහු වුණා අතින් අදින මාදැලෙන්. කොළඹ සිට දකුණු වෙරළ තීරයේම අතින් තමයි මාදැල් අදින්නේ. හැබැයි, පුත්තලම සිට උතුරු කලාපයේ තමයි මෙසේ අවිධිමත් ලෙස ට්‍රැක්ටර් දාලා මාදැල් අදින්නේ. ට්‍රැක්ටර් 4ක් දාලාත් මාදැල් අදිනවා. ඒ තුළින් ගොඩබිම ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා, මුහුදු සම්පතට හානියක් වෙලා තිබෙනවා, අර සුළුපන්න ධීවර ජනතාවට හානියක් වෙලා තිබෙනවා. අපි කිසිසේත්ම ඔවුන්ට කියලා නැහැ, මාදැල් කර්මාන්තය නවත්වන්න කියලා, මාදැල් අදින්න එපා කියලා. ඒ මාදැල් අදින ශ්‍රමිකයන්ට අසාධාරණයක් වෙලා නැහැ. හැබැයි, ඔවුන් අධිකරණයට ගියා. 2026 ජනවාරි 01වැනි දා සිට මේ නීතිය ක්‍රියාත්මක කරනවා, ට්‍රැක්ටර් භාවිත කරලා මේ කර්මාන්තය කරන්න එපා, ඔවුන්ට වෙනස් වෙන්න කියලා 2025.06.30වැනි දා අපි ඔවුන් එක්ක සාකච්ඡා කරලා, ඔවුන් ඒකට එකඟ වෙලා තිබුණා. ඊට පසුව අධ්‍යක්ෂ ජනරාල්තුමා 2025.07.14වැනි දා සහකාර අධ්‍යක්ෂ ජනරාල්තුමාට ලිඛිතව දැනුම් දීලා තිබෙනවා, මාදැල් හිමියන් දැනුවත් කරන්න කියලා. නමුත්, මාදැල් හිමියන් ට්‍රැක්ටර් භාවිත කරන්න අවසර ඉල්ලමින් අධිකරණයට ගිහින් තිබෙනවා. දැන් අධිකරණයේ මේ සම්බන්ධයෙන් නඩුවක් විභාග වනවා. නඩුව විභාග වන අතරේ තමයි උද්ඝෝෂණය කරන්නේ, ට්‍රැක්ටර් භාවිත කරන්න අවසර දෙන්න කියලා. පනත්, අණ පනත්, රෙගුලාසි තිබෙනවා, ට්‍රැක්ටර් භාවිතය තහනම් කියලා. මාදැල් අදින්න ක්‍රමයක් කියලා තිබෙනවා. එහෙම තිබියදීත් ඔවුන්

[ගරු අජිත් ගිහාන් මහතා]

අධිකරණයට ගිහින් ට්‍රැක්ටර් භාවිතයට ඉල්ලීම් කරනවා. එය සාධාරණ නැහැ. ආණ්ඩුව විධියට - රජය විධියට - අපි රටේ තිබෙන නීතියට අනුගත වෙන්න ඕනෑ. අපි නීතියට යටත්. එම නිසා ට්‍රැක්ටර් යොදාගෙන මාදැල් අදින්න දෙන්නය කියලා ඔවුන් ඉල්ලුවාට අපට ඒකට ඉඩ දෙන්න විධියක් නැහැ. එම නිසා අපි ඔවුන්ගේ අදහස් හා යෝජනා අරගෙන, සාකච්ඡා මාර්ගයෙන් කටයුතු කරන්න සූදානම්. නමුත්, නීතිය අනුව ක්‍රියාත්මක වන දෙයකට පිටින් අපට කිසිවක් කරන්න බැරි බව පැහැදිලිව කියන්න ඕනෑ.

මේ තුළින් මාදැල් කර්මාන්තයට බලපෑමක් ඇති වෙලා නැහැ. මාදැල් වට කරලා මාළු අල්ලන්න පුළුවන්. මත්ස්‍ය සම්පත මේ රටට නෙළාගන්න ඕනෑ. හැබැයි, නීති විරෝධී විධියට දියඹට ගිහිල්ලා, සීමාවෙන් එහා වට කරලා, ඒ පරිසරය විනාශ කරලා, මුහුදු සම්පත විනාශ කරලා, පොදුවේ ධීවර ජනතාවට හානි වන විධියට වැඩ කරන්න එපා. පරිසර සංවිධාන විසිනුත් ඒ සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගන්න සූදානම් වෙලා තිබෙනවා. එම නිසා අපට මේ සම්බන්ධව දෙවතාවක් හිතන්න වෙලා තිබෙනවා. මේ රටේ සම්පත් කළමනාකරණය කරමින් සහ ආරක්ෂා කරමින් සැමට සාධාරණය ඉටු වන ක්‍රමයකට කටයුතු කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මාදැල් හිමියන්ගෙන් අපි නැවත ඉල්ලනවා, ඔබ වැරදි දෙයට යොමු වෙන්න එපා, ඔබට සහයෝගය දෙන්න අපි සූදානම්, ඔබට කුමක්ද අපෙන් වෙන්න ඕනෑ, අනවශ්‍ය, අවිධිමත් පන්න ක්‍රමයකට නොගිහින් ඔබට අවශ්‍ය සාධාරණ ඉල්ලීම් ඉදිරිපත් කරන්න කියලා. ඒ සම්බන්ධව ඔබ සමඟ සාකච්ඡා කරන්න අමාත්‍යතුමා හා අමාත්‍යාංශයේ නිලධාරීන් සූදානම්. අපි ඔබෙන් ඉල්ලන්නේ, සාධාරණ විධියට මේ ක්‍රියාව කරන්න, ඊට අපි සහයෝගය ලබා දෙන්නම් කියලා.

බොහොම ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.24]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීම සඳහා අද පාර්ලිමේන්තුවට යෝජනාව ඉදිරිපත් කර විවාද කෙරෙනවා. මට තිබෙන බරපතළම ප්‍රශ්නය තමයි, හදිසි නීතිය දීර්ඝ කරන්නේ මොකටද කියන කාරණය. අපි දන්නවා, ඔබතුමන්ලා පරිපූරක ඇස්තමේන්තු අනුමත කර ගත්තා, අණ පනත් ඇතුළු අවශ්‍ය නීති ගෙනාවා. ඒ වාගේම ගෙවිය යුතු වන්දි මුදල් සහ වන්දි කොහොමද ගෙවන්නේ කියලා තීන්දු කළා. අගමැතිතුමිය කිව්වා, සියයට 75කට ගෙවලා තිබෙනවා, සියයට 80කට ගෙවලා තිබෙනවා, සියයට 90කට ගෙවලා තිබෙනවා කියලා. ඒ වාගේම එක එක ස්තරවලට ගෙවන ගණනත් එතුමිය කිව්වා. ඒවා බොහොම හොඳයි. ඒවාට මුදල් මදි නම් ඒකත් කියන්න, ඒ ගැනත් අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, දැන් හදිසි නීතිය දීර්ඝ කරන්නේ ඒකට නොවෙයි.

නමුත්, හදිසි නීතිය ඕනෑ වෙලාවේ ගෙනාවාද? ගම්පොල නගරය යට වනකොට, පේරාදෙණිය යට වනකොට, ගෙලිඔය යට වනකොට, හලාවත යට වනකොට, මහියංගනය රෝහල යට වනකොට හදිසි නීතිය පැනෙව්වේ නැහැ. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ත්‍රිවිධ හමුදාවට හා පොලීසියට හදිසි නීතිය උපයෝගී කරගෙන අවශ්‍ය වැඩකටයුතු කරන්න අවස්ථාවක් තිබුණේ නැහැ. එහෙම නේද, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමනි? ඒ වෙලාවේ හදිසි නීතිය පැනෙව්වේ නැහැ. "යුද්දෙට නැති කඩුව කොස් කොටන්නද?" කියනවා වාගේ දැන් මේ මොනවාටද හදිසි නීතිය ගේන්නේ? ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, දැන් මේ හදිසි නීතිය ගෙනැල්ලා තිබෙන්නේ වෙන මොනවටවත් නොවෙයි, තමන්ට විරුද්ධව නැඟෙන බලවේග යටපත් කරන්න. ඒ වාගේම මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට තිබෙන මහජන විරෝධතාවෙන් ගැලවෙන්න. අපි දැක්කා නේ, මන්ත්‍රීවරුන්ට කියපු දේවල්. බිමල් රත්නායක ඇමතිතුමාටත් පාරේදි කවුද ඉස්සරහට හම්බ වුණාම බැණගෙන බැණගෙන ගියා. ඒ, අපේ අය නම් නොවෙයි. මාලිමාවට ඡන්දය දුන් ඔබතුමන්ලාගේම අය. ඉතින් පැහැදිලිව අපට පෙනෙනවා, තමන්ට තිබෙන මහජන විරෝධතාව යටපත් කර ගන්න තමයි හදිසි නීතිය මෙවලමක් විධියට ආණ්ඩුව පාවිච්චි කරමින් ඉන්නේ කියලා.

දැන් කයිය ගැහුවා, බයිලා කිව්වා. අපි දැක්කා නේ, උඩරට දුම්රිය මාර්ගයේ බදුල්ලේ ඉඳන් අඹේවෙල දක්වා කොටස විවෘත කළේ dance කරලා. මම හිතන විධියට, ඒ දෙක අතර ලොකු ඉදිකිරීමක් කරන්න තිබුණේ නැහැ. පස් කණ්ඩි දෙකක් අයින් කරන්න තිබුණේ. එතැනින් පස්සේ ටික කෝ? දැන් අඹේවෙල ඉඳන් හැටන්වලට දුම්රිය ධාවනය වනවාද? රඹුක්කන ඉඳන් පේරාදෙණියට දුම්රිය ධාවනය කරන්න පුළුවන්ද? පේරාදෙණියේ ඉඳන් මහනුවර හරහා මාතලේට දුම්රිය ධාවනය කරන්න පුළුවන්ද? මම හිතන විධියට පේරාදෙණියේ ඉඳන් නාවලපිටියට යන්න බැහැ. නාවලපිටියේ ඉඳන් හැටන් දක්වා විතරක් පොඩි කොටසක එක දුම්රියක් ධාවනය වෙනවා. අද එක ඉදිකිරීමක් වෙනවාද? අඩුම ගාණේ පේරාදෙණියේ කළු පාලම හදාගන්න පුළුවන් වුණාද? ඇමතිවරයා visit කරන එක TV එකේ දානවා. හැබැයි, හදලා ඉවර නැහැ. මේගොල්ලන්ට වික්ටෝරියා වාගේ dam එකක් හදන්න වුණා නම් කොහොමද? කළු පාලමට කොන්ක්‍රීට් ටික දාලා ඒක ශක්තිමත් කරලා ස්ථාවර කර ගන්න බැරි ආණ්ඩුවක්, පේරාදෙණියේ ඉඳන් හතරමුල්ලට කෝච්චි පාර හදාගන්න බැරි ආණ්ඩුවක්, අනේ, දැවැන්ත ව්‍යාපෘති ගැන කථා කරන්නේ කොහොමද? අපි කියන්නේ නැහැ, මේවා එක පාරට අවසන් කරන්න පුළුවන් කියලා. අඩු ගාණේ වැඩ පටන් අරන් තිබෙනවාද? ඔයගොල්ලන්ට රතු බලකාය, අර බලකාය, මේ බලකාය කියලා නොයෙක් බලකායන් තිබුණා නේ. දැන් රඹුක්කන ඉඳන් කඳුකරයට යන දුම්රිය මාර්ගය හදාගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ කෝ? කිසිම වැඩක් වෙන්නේ නැහැ. අඩුම ගාණේ තමන්ට මේක කරන්න බැරි නම්, අපේ රටට මේක කරන්න බැරි නම්, විදේශ රටකටවත් මේක බාර දෙන්න තිබුණා. අපේ උතුරු දුම්රිය මාර්ගය හදපු ඉන්දියානු සමාගම තිබෙනවා. ඉන්දියානු රජයේ ආධාර අරගෙන හෝ මේ දුම්රිය මාර්ග පද්ධතිය හදන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් කෝ? චාමර සම්පත් මන්ත්‍රීතුමනි, දැන් මට පෙනෙන විධියට මේවා හදන්න පෘතුගීසින්, ලන්දේසින්, ඉංග්‍රීසින් ගේන්න වෙයි ද දන්නේත් නැහැ. මේවා හදපු සුද්දොත් මැරිලා දැන් අවුරුදු එකසිය ගණනක් වෙනවා. ඒ අය ආපහු උත්ථානය කරලා ගෙනැල්ලා තමයි මේවා හදන්න වෙන්නේ. මොකද, මේ ආණ්ඩුවට මේ සම්බන්ධයෙන් කිසිම වැඩ පිළිවෙළක් නැහැ. මේ ආණ්ඩුවට මේවා ගැන චුවමනාවක් නැහැ. මේ ආණ්ඩුවට මේ සම්බන්ධයෙන් මැදිහත්වීමක් නැහැ. බයිලා කියන්න විතරයි ඉන්නේ. ඒ නිසා මේ වාගේ ආපදාවකදී අවශ්‍ය වෙලාවේදී තීන්දු තීරණ ගන්නේ නැතිව සියල්ල විනාශ වුණාට පසු, එහෙම නැත්නම් ඒ ආපදාවෙන් පස්සේ යොදා ගත් හදිසි නීතිය පාවිච්චි කරලා දැන් උත්සාහ කරනවා, තමන්ට තිබෙන මහජන විරෝධතාව මැඩපවත්වා ගන්න.

මේ යන්නේ මේ ආණ්ඩුවේ අවුරුදු එකහමාර, අවුරුදු දෙක නොවෙයි. ඒ නිසා මට පෙනෙන විධියට නම් මේ 2026 අවුරුද්ද මේ ආණ්ඩුවට ඉතාම අඳුරු කාලපරිච්ඡේදයක් බවට පත් වෙයි. මෙහෙම ගියොත් මේ විරෝධතාව බොහොම නරක පැත්තට හැරෙන්න පුළුවන්, ගරු විජිත හේරත් ඇමතිතුමා. ඒ දේවල් අපි දැක්කා නේ. අපි දැක්කා නේ එදා ගෝඨාභය රාජපක්ෂට විරුද්ධව මිනිස්සු පාරට බැස්සේ කොහොමද කියලා. ඒ කවුද? ඒ පාරට බැස්සේ එදා ගෝඨාභය රාජපක්ෂට ඡන්දය දුන් මිනිස්සු, ගයන්ත කරුණාතිලක මැතිතුමනි. වෙන කවුරුවත් නොවෙයි. ගෝඨාභයට ඡන්දය දුන් මිනිස්සුම තමයි ගෝඨාභය රාජපක්ෂව එළෙව්වේ. අපි නොවෙයි එදා ඉස්සරහට ආවේ. අපිවත් කඩාගෙන තමයි ඒ මිනිස්සු ඉස්සරහට ගියේ. ඒක අපි දන්නවා. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමායි, මමයි බොහොම අමාරුවෙන් එදා බේරුණේ. එහෙම නේද? ගාලු මුවදොර පිටියේදී අපිවත් පෙරළාගෙන තමයි ඒ මිනිස්සු ඉදිරියට ගියේ. මතකයි නේ. ඒ නිසා ඔබතුමන්ලාටත් විරුද්ධව මේ අපේ ඉන්න විපක්ෂය නොවෙයි අද නැඟිටලා එන්නේ. ඔබතුමන්ලාට ඡන්දය දුන්නු මිනිස්සු එන්නේ. ඔබතුමන්ලා බලාපොරොත්තු දුන්නු මිනිස්සු එන්නේ. පුනරුදයක් ගැන කථා කරලා, අවුරුදු 76ක ශාපයක් ගැන කථා කරලා, අන්තිමට නරකම අවුරුද්ද වෙලා තිබෙන්නේ පසුගිය අවුරුද්ද නේ. අවුරුදු 76ක කාලය තුළ නොවෙච්ච දේවල් දැන් වෙනවා.

ගයන්ත කරුණාතිලක මැතිතුමනි, ඉතිහාසයේ අපි විදුලි බලය අපේ ජාතික පද්ධතියට එකතු කළාට පස්සේ සියයට 6ක වාගේ ප්‍රමාණයකින් වාර්ෂිකව විදුලි ඉල්ලුම වැඩි වුණා. චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, නමුත් පසුගිය 2025 වසරේදී විදුලි ඉල්ලුම වැඩි වෙලා නැහැ, අඩුවෙලා තිබෙනවා. අවුරුදු 76ක ශාපය පටන් අරගෙන තිබෙන්නේ දැන්. ඒ කියන්නේ, රට ඉදිරියට යන්නේ නැහැ. කර්මාන්ත ඇති වෙලා නැහැ; කඩයක්වත් අලුතින් හැදිලා නැහැ; ගමට අලුතින් fridge එකක් ගෙනැල්ලා නැහැ; AC කරපු ගෙයක් ගමට එකතු වෙලා නැහැ; කර්මාන්තවල දියුණුවක් ඇති වෙලා නැහැ. ඒ නිසා තමයි අද වන විට විදුලි ඉල්ලුම වැඩි වෙලා නැත්තේ.

අද සමහරුන්ගේ solar power plantsවල උදේට පැය තුනක්, හතරක් විදුලිය කපනවා. ඉරිදාට solar power plants වහනවා. Mini-hydropower plants ටික වහනවා. මේ තත්ත්වයට හේතු වෙලා තිබෙන්නේ රට අද කර්මාන්තකරණයෙන් හෝ රටේ ජනතාවගේ ආර්ථිකයෙන් ඉදිරියට එන්නේ නැති එක. ඒ නිසා තමයි දැන් රට පහළට යන්නේ. අවුරුදු 76කට නොවෙච්ච දේවල් පසුගිය 2025 අවුරුද්දේ වුණා. ඉතින් අපට පේනවා, මොකක් හරි ප්‍රශ්නයක් මෙතැන තිබෙනවා කියලා.

අද රට ඉදිරියට නොයන්නේ ඇයි? අද වන විට රට ඉදිරියට නොයන්න ප්‍රධාන හේතුව තමයි, රටේ ආර්ථිකයේ ප්‍රධාන කොටසක් වන සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයින්ගේ, එහෙම නැත්නම් ගමේ මුදලාලිගේ කොන්ද කඩලා තිබීම. ඒ අය අලුතින් ව්‍යාපාරවලට එකතු වෙන්නේ නැහැ. ඒ අය තමන්ගේ ව්‍යාපාර වැඩිදියුණු කරන්නේ නැහැ. ඒ අය තමන්ගේ ව්‍යාපාරය පුළුල් කරන්නේ නැහැ. මොකද, ආණ්ඩුව ඒ අය මත අධික බදු මුදලක් අය කරලා, ඒ අයට දාන්න පුළුවන් තාඩන පීඩන සේරම දාලා, ඒ අයව හිර කරලා තිබෙන්නේ. අපේ ව්‍යවසායකයා, ව්‍යාපාරිකයා තමයි රටේ ගාමක බලය බවට පත් වුණේ. අද ඒ අයගේ කොඳු කඩලා තිබෙන්නේ.

"දිට්වා" සුළි කුණාටුවෙන් අපේ රටට හානි වුණා. එම ව්‍යසනයෙන් විපතට පත් වෙච්ච ඒ අය නැවත ශක්තිමත් කරන කිසිම වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුවට නැහැ. ඒ නිසා රටේ ආර්ථිකය දැන් එක තැන නතර වෙලා තිබෙන්නේ. මේ එක තැන නතර වුණු ආර්ථිකය නිසා තමයි අද රැකියා ටික නැත්තේ; මිනිස්සුන්ගේ අත්වලට සල්ලි එන්නේ නැත්තේ; ගමේ ගෙයක් දොරක් හැදෙන්නේ නැත්තේ. එහෙම නම් බරපතළ ප්‍රශ්නයක් මෙතැන තිබෙනවා. අන්න ඒ බරපතළ ප්‍රශ්නයට විසඳුම් සොයන්නේ නැතිව, තමන්ට තිබෙන මහජන විරෝධතාව මැඩපවත්වන්න මේ විධියට හදිසි නීතිය දිගින් දිගටම පාවිච්චි කරන එක නවත්වන්න. ආණ්ඩුව එක්තරා තැනකදී තමන්ටම මේක බේරාගන්න බැරි තත්ත්වයකට පත් වනවා. අපට මතකයි නේ, ඔබතුමන්ලා යුද්ධය පැවති කාලයේත් හදිසි නීතියට විරුද්ධ වුණු උදවිය බව.

යුද්ධ කාලයේත් හදිසි නීතියට විරුද්ධ වුණා, ගයන්ත මන්ත්‍රීතුමනි. ඒ කියන්නේ කොටි ගහනකොටත්. දැන් කොටි ගහනවාද, එහෙම නැත්නම් දකුණේ භීෂණයක් තිබෙනවාද, දේශප්‍රේමී ජනතා බලවේග එහෙම තිබෙනවාද? නැහැ, ඒ මොකුත් නැහැ. අද හොඳ විපක්ෂයක් ඉන්නවා, *[බාධා කිරීමක්]* පොඩ්ඩක් කල්පනා කරලා බලන්න, හැම දේටම විරුද්ධ වෙන විපක්ෂයක් තිබෙනවා. හැබැයි දැන් උඩින් යනවා, හෙලිකොප්ටර්වලින් යනවා. ඒවාට නම් අපි කැමැතියි. මොකද, රටක් විධියට ඒවා වෙන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මෙලෝ රහක් නැහැ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
හෙලිකොප්ටර් දෙකක් යනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව අසාර්ථක, අසමත් ආණ්ඩුවක් කියන එක දැන් ඔබතුමන්ලාට ඡන්දය දුන් අයට තේරෙමින් යනවා. Social media දිහා බැලුවාම, ඔබතුමන්ලාගේ වීඩියෝ බැලුවාම ඔබතුමන්ලාට තිබෙන විරෝධය බලන්න පුළුවන්. ඉස්සර අපි මොකක් හරි කිව්වාම අපට දාන්නේ "haha" විතරයි, නේද මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි? "Hearts" නැහැ, "Likes" නැහැ, "නිවන් සුව" කියලා යටින් ගහනවා. දැන් ඒකේ අනෙක් පැත්ත වෙන්නේ. දැන් ගිහිල්ලා බලන්න. වෙන මොකුත් නොවෙයි, "සිරස" මාධ්‍ය ජාලයේ යන ඔබතුමන්ලාගේ කට් එකක් බලන්නකෝ. භාගයට භාගයක්, "haha" තමයි. අපි වෙන්න බැහැ නේ, අපේ කවුරුවත් සංවිධානාත්මක social media කල්ලිවල නැහැ, ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමනි. එතුමන්ලාගේ තමයි සංවිධානාත්මක social media කල්ලි ඉන්නේ. *[බාධා කිරීමක්]* අපේ ඩෝබි බලකායවල් නැහැ. ආණ්ඩුවට ඡන්දය දුන්, ආණ්ඩුව පිළිබඳව විශ්වාසයකින් කටයුතු කළ ජනතාව තුළ පැහැදිලිවම අද ආණ්ඩුව කෙරෙහි බරපතළ විරෝධතාවක් ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන් තරුණ ජනතාව තුළ ඒ විරෝධය ඇති වෙලා තිබෙනවා. අද සිටින සියලු ව්‍යාපාරිකයන් තුළත් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ රාජ්‍ය සේවකයන් තුළ ඒ විරෝධතාව ඇති වෙලා තිබෙනවා. දැන් මේ පාර්ලිමේන්තුව ඇතුළෙත් කොච්චර තරහක් තිබෙනවාද? චමින්ද කුලරත්න මහත්තයාට කළ වැඩෙන්ම රාජ්‍ය සේවය ඇතුළේ, පාර්ලිමේන්තුවේ සිටින සේවකයන් තුළ විශාල කලකිරීමක් තිබෙනවා. ඒ, පෞද්ගලික පළිගැනීම් නේ. මේ නෝනාවයි, මහත්තයාවත් එළවයිද දන්නේ නැහැ, හෙට අනිද්දා මොකක් හෝ උගුලක් දාලා. බලාගෙන, ඔබතුමන්ලා පරිස්සමින් ඉන්න.

කථානායකතුමා බොහොම හොඳයි. මම එක්කත් ස්විට්සර්ලන්තයේ සංචාරයක්; සවාරියක් ගියා. *[බාධා කිරීමක්]* හැබැයි එතුමා කළ දේ පිළිගන්න බැහැ. එතුමාට වෙන වෙන දේවල් තිබුණාට අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි එතුමා කථානායක පුටුවේ ගෞරවය, මේ පාර්ලිමේන්තුවේ කරන රාජකාරිවල

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ගෞරවය, මහ ලේකම්තුමන්ලා, මහ ලේකම්තුමියගේ කාර්යභාරය, සේවකයෝ සියලුදෙනාගේම ගෞරවය රකිමින් කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතිව තමන්ගේ පෞද්ගලික පළිගැනීම් මත මේ විධියට කටයුතු කරපුවාම ඒක පාර්ලිමේන්තුවට ගැළපෙන්නේ නැහැ. මේ රටේ ප්‍රධාන පුරවැසියෝ තුන්දෙනෙක් ඉන්නවා. ජනාධිපතිතුමා අංක එක, අගමැතිතුමිය අංක දෙක, කථානායකතුමා අංක තුන. දැන් බලනකොට මේ අංක එක, දෙක, තුනටම මොකක් හරි පටලැවිල්ලක් එක්ක නේ යන්න වෙලා තිබෙන්නේ. ඒවා විසඳාගෙන නොගියොත් අපේ රට බරපතළ ප්‍රශ්නයකට යනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.34]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් පවත්වන මේ විවාදයේදී මීට මාසයකට, මාස දෙකකට විතර කලින් කිව්වාට වඩා ටිකක් වෙනස් අදහස් කිහිපයක් විපක්ෂය පැත්තෙන් මතු වුණා. අනෙක් දේවල් නම් ඉතින් හැම දාම කියන ටික තමයි. අපි දන්නවා, හදිසි නීතිය පැනෙව්වේ පසුගිය නොවැම්බර් 27වෙනි දා සිට "දිට්වා" සුළි කුණාටුව ලංකාවට දැඩි ලෙස කඩා වැදුණාට පස්සේ බව. ඒකෙන්, ඒ අපදා ක්‍රියාවලියට මුහුණ දෙන්න අවශ්‍ය පසුබිම සැකසෙනවා. අපි දන්නවා, ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන ආකාරයට හදිසි නීතිය පාවිච්චි කරන්න පුළුවන් බව, හදිසි තත්ත්වයකට රට සූදානම් කරන්න. ඒ කියන්නේ, ඇත්ත ලෙසම හදිසි තත්ත්වයකට රට සූදානම් කරන්න, හදිසි තත්ත්වයකට රාජ්‍යය මෙහෙයවන්න, හදිසි තත්ත්වයකට රාජ්‍ය සේවකයා මෙහෙයවන්න, හදිසි තත්ත්වයකට සූදානම් විය හැකි ලෙසට රාජ්‍ය මුදල් කළමනාකරණය කරන්න. ඒ වාගේම රාජ්‍ය දේපොළ සහ අනෙකුත් ක්‍රියාවලින් සාමාන්‍ය ක්‍රියාපටිපාටියට වඩා ඉදිරියට ගෙන ගිහිල්ලා පොඩ්ඩක් වේගයෙන් ක්‍රියාත්මක කරවන්නත් මේ තුළින් පුළුවන්. ඒ සමස්තයටම තමයි හදිසි නීතිය පැනවීමක් ආපදාවකින් පස්සේ අවශ්‍ය වෙන්නේ; අවශ්‍ය වුණේ. ඒක කොච්චර අවශ්‍යද කියනවා නම්, දිස්ත්‍රික්ක 21කට බලපා, දිස්ත්‍රික්ක 4ක් විතරක් බේරුණු ආපදාවක් ඇති වුණු වෙලාවක, අනෙක් පැත්තෙන් සුනාමිය වාගේ හතර ගුණයක් දේපොළ හානි වුණාය කියලා ලෝක බැංකුව ඇතුළු සංවිධාන තක්සේරු කරලා තිබෙන වෙලාවක, ඒ බලපෑමේ තරම මොකක්ද කියලා අපට හිතා ගන්න පුළුවන්.

ඔබට මතක ඇති, මාස දෙකකට කලින් ඔය සුළි කුණාටුව එනකොට ඇති වුණු තත්ත්වය. මහා කුණාටුවක් කඩා වදිනකොට පළමුවෙනි පැයේ කළ යුතු දේවල් තිබෙනවා නේ. ඒ වාගේම පහුවෙන හැම පැයකටම කළ යුතු දේවල් තිබෙනවා. කුණාටුව ඇවිල්ලා වරුවක් දෙකක් යනකොටම විපක්ෂ නායකතුමා, තවත් අය සමඟ මාධ්‍ය ඉස්සරහට ඇවිල්ලා, මාධ්‍ය සාකච්ඡා කැඳවලා, "කෝ හදිසි නීතිය දාන්නේ නැද්ද, දාන්නේ නැද්ද?" කියලා ඇහුවා. පළමුවෙනි දවස් දෙකේම ඒක ඇහුවා. මට මතක විධියට 31වන දා ද කොහේද තමයි හදිසි නීතිය පැනෙව්වේ, දවස් කිහිපයකට පසුව. ඒ ගතවෙච්ච හැම දවසකම විපක්ෂ නායකතුමා මාධ්‍ය සාකච්ඡාවක් අරගෙන "කෝ හදිසි නීතිය දමන්නේ නැද්ද, ඒක නැතුව කොහොමද කරන්නේ" කියලා ඇහුවා. ඇත්ත, ඒ ප්‍රශ්නය සාධාරණයි. ඒක තමයි විපක්ෂයේ කාර්යභාරය. ඒක හරි. ඒකටත් ඇහුම්කන් දීලා ඒ අවශ්‍යතාව සලකා ආණ්ඩුව විසින් ඒ සම්බන්ධයෙන් කටයුතු කළා. ඒක ගැන ගැටලුවක් නැහැ. එතකොට *[බාධා කිරීමක්]* ඔව්, ඔව්, හදිසි තත්ත්වයක්. සමාවෙන්න, හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම කළා. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමාත් ඇහුවා නේ. දැන් මොකටද මේ හදිසි නීතිය දමන්නේ කියලා. මෙතුමන්ලා හිතාගෙන ඉන්නේ හදිසි නීතිය, හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමෙන් මොන වාගේ දේවල් කරනවා කියලාද? ඒක දන්නවාද? අත්‍යවශ්‍ය සේවා කොමසාරිස්තුමා පත් කිරීම ඇතුළු මේකට අදාළ දේවල් ටික කරන්න යන්ත්‍රණය හදන්න මේක ඕනෑ. මේ වෙද්දී පූර්ණ හානියට පත් නිවාස සංඛ්‍යාවක් තිබෙනවා. අවතැන් වෙච්ච ජනතාව ඉන්නවා. ඒ සියලුම තත්ත්වයන් තුළ මේ යන්ත්‍රණය ඉස්සරහට ගෙනියන්න, වේගයෙන් ක්‍රියාත්මක කරන්න හදිසි නීතිය අවශ්‍යයි. එහෙම නැතුව ගංවතුර වෙලාවේ හමුදාව යවන්න විතරක් නොවෙයි, මේ හදිසි නීතිය ඕනෑ වෙන්නේ. මම දන්නේ නැහැ, එහෙම හිතලාද ඒක කළේ කියලා. ගංවතුර බැහැලා යනකොට නේ, හදිසි නීතිය දැම්මෙත්; ඒක අවශ්‍ය වුණෙත්. හදිසි තත්ත්වයකට මුහුණ දීලා රට යම් තැනකට ගන්න ඒ කෙටි කාලය තුළ අවශ්‍ය වෙන ක්‍රමවේදයක්, ඒක. ඒකට තමයි හදිසි නීතිය දාලා තිබෙන්නේ. ඒ නිසා තමයි ඒක දීර්ඝ කිරීමක් කරන්න අවශ්‍ය වන්නේ. ඒක හරි පැහැදිලියි. මෙතුමන්ලා කියනවා, එහෙම අවශ්‍ය නැහැ කියලා. හැබැයි ඊට වඩා කරුණු දක්වනවා නම් අපි කැමැතියි.

මේ කථාව කියන්න තවත් හේතුවක් තිබෙනවා. හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම ගැන විපක්ෂය විසින් සැකයක්, අවුලක් හදන්න හදන්නේ මොකක් නිසාද? අපි දන්නවා, 1970 දශකයේ ඉඳලා අපේ රටේ හදිසි නීතිය ප්‍රකාශයට පත් කර තිබෙන බව. හදිසි තත්ත්වයන් ප්‍රකාශයට පත් කර තිබෙනවා. හදිසි නීතිය යටතේ රට පාලනය කර තිබෙනවා. ඒ පිළිබඳව අපට වඩා ඔබතුමාට මතක ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවකට අපි කුඩා අය. එහි අමිහිරි අත්දැකීමක්, අමිහිරි මතකයක් තිබෙනවා; එහිදී රට පාලනය කරපු විධියක් තිබෙනවා. ඒ ආණ්ඩුව විසින් හදිසි නීතිය පාවිච්චි කරලා මේ රටේ තරුණ තරුණියන් මහ පාරේදී පැහැර ගෙන ගිහිල්ලා, අතුරුදහන් කළා; ඝාතනය කළා. උතුරේ, දකුණේ දෙකේම හදිසි නීතිය පාවිච්චි කරපු යුගයක් තිබුණා. ඒක කළේ මේගොල්ලන්. මේගොල්ලන්ගේ ආණ්ඩුවේ නායකයන්. මේගොල්ලන් හදිසි නීතිය පාවිච්චි කරපු විධිය ඒක; හදිසි නීතිය පාවිච්චි කරන්න දන්න විධිය ඒක. ඒ වාගේම තමයි, හදිසි නීතිය පාවිච්චි කරලා මාධ්‍යවේදීන් ඝාතනය කරපු, මාධ්‍යවේදීන් පැහැර ගත් අඳුරු කාලපරිච්ඡේද මේ ඉතිහාසයේ තිබුණා. මේ රටේ ජනතාවට ඒ ගැන අඳුරු මතකයක් තිබෙනවා. එතකොට දැන්, මාස දෙකක් වෙනවා නේ, හදිසි නීතිය පාවිච්චි වුණේ කොහොමද කියලා දැක්කා නේ. ඒක මොන මොන ආකාරයටද යෙදවුණේ කියලාත් දැක්කා නේ. ඒක අත්‍යවශ්‍ය කටයුත්තකදී වෙනවා ඇරෙන්න හදිසි නීතිය කියලා පෙනෙන්නේ නැහැ. නමුත්, මේ රටේ ජනතාවට මෙතුමන්ලා සහ මෙතුමන්ලාගේ පක්ෂවල කලින් හිටපු අය විසින් ආණ්ඩු පාලනය කරලා හදිසි නීතිය යටතේ ඒ හදපු ප්‍රශ්නය, ඒ අඳුරු මතකය, ඒ ලේ වැකි ඉතිහාසය මතක නිසා, මේ රටේ මිනිසුන්ට හදිසි නීතිය කිව්වාම ඔළුවට එන දෙයක් තිබෙනවා. අන්න ඒක අවුස්සන්න, ඒ බිය හදන්න නැවත කටයුතු කරනවා. ඒ නිසා තමයි මේක ගැන දිගින් දිගටම කියන්නේ. ඒ හැර වෙන තර්කයක් ඉදිරිපත් වෙනවා අපි දැක්කේ නැහැ.

ඒ වාගේම කිව්වා, තමන්ට තිබෙන මහජන විරෝධය මැඬ පවත්වන්න මේ ආණ්ඩුව හදිසි නීතිය යටතේ කටයුතු කරනවා

කියලා. මම අහන පළමුවැනි ප්‍රශ්නය තමයි, කොහේද මහජන විරෝධය තිබෙන්නේ කියන එක. දෙවැනි ප්‍රශ්නය මේකයි. විරෝධතා, උද්ඝෝෂණ යම් යම් සිද්ධි සම්බන්ධව ක්‍රියාත්මක වුණා නේ. ඉතින් කොහේද, හදිසි නීතිය පාවිච්චි කර තිබෙන්නේ? එහෙම පාවිච්චි කර තිබුණු එක තැනක් කියන්න. මගේ වෙලාව අරගෙන හරි නැඟිටලා කියන්න, ජනතා විරෝධයක් හෝ ආණ්ඩු විරෝධයක් මර්දනය කරන්න මේ මාස දෙක තුන තුළ හදිසි නීතිය වැරදියට පාවිච්චි කර තිබෙනවාද කියලා. පළමුවෙනි ප්‍රශ්නයට පිළිතුර, විරෝධයක් නැහැ කියන එක. දෙවැනි එකට පිළිතුර පාවිච්චි කර නැහැ කියන එක. වෙනත් ප්‍රශ්නවලට උද්ඝෝෂණ කර තිබෙනවා. නිකම් කටමැත දෙඩවීමක් තමයි මේ කරන්නේ. සංවර්ධන නිලධාරින් ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහ උපවාසයක් කළා. එතැනට ඇවිල්ලා වාඩි වුණාම මේගොල්ලන් හිතුවේ, ඊළඟට අරගළයක් තමයි කියලා. මොකද, ඒගොල්ලන් ආණ්ඩුවක් විධියට උද්ඝෝෂණවලට, විරෝධතාවලට ප්‍රතිචාර දක්වා පුරුදු විධියක් තිබෙනවා. ගැහුවා; කඳුළු ගෑස් ගැහුවා; ගහලා එළෙව්වා; කඩා පැන්නා. ඒ තමයි, ඒගොල්ලන්ට පුරුදු විධිය; ඒගොල්ලන් ආණ්ඩු කරපු විධිය. හැබැයි, අපි -අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා- ආණ්ඩු කරන විධියකුත් තිබෙනවා. අපි ආණ්ඩු කරන විධිය එහෙම නොවෙයි. අදාළ නිලධාරින් එක්ක සාකච්ඡා කර උත්තර දෙන්න අපට පුළුවන් වුණා. ඔබතුමන්ලා ආඩම්බර වෙන්න ඕනෑ, විපක්ෂ නායකතුමාගේ ලේ හොල්ලන එක අපි නවත්තපු එකට. විපක්ෂ නායකතුමාගේ ලේ හෙල්ලෙන්න යද්දීවත් අපි හදිසි නීතිය පාවිච්චි කළේ නැහැ. ඒ නිසා හදිසි නීතිය කියන්නේ එහෙම පාවිච්චි කරන එකක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන විරෝධතා නොවෙයි, මේ කිසිම දේකදී මේ පාර්ලිමේන්තුවේදීත්, පාර්ලිමේන්තුවෙන් පිටත් මේ ගත වෙච්ච මාස දෙකේ කොයි තරම් අශිෂ්ට විධියට මේ රටේ ප්‍රධානීන්ට, මේ ආණ්ඩුවේ ප්‍රධානීන්ට කුණුහරුප කිය කියා අවලාද කළාද කියලා ඔබ හිතන්න. ඒ, දේශපාලන විවේචන නොවෙයි. දේශපාලනයේදී කරන්නේ දේශපාලන විවේචන නේ. ඒවා ඉතින් විය යුතු දේවල් නේ. හැබැයි, අවලාද, කුණුහරුප, අශිෂ්ට කථා කොයි තරම් කියනවාද? ඒ කොතැනකදීවත් අපි හදිසි නීතිය පාවිච්චි කරලා තිබෙනවාද? එහෙම නැහැ. අදත් ඔය කුණුහරුප කියලා පාඩුවේ වාඩි වෙලා ඉන්නවා; ඔය ඉන්නේ. ඒ නිසා, හදිසි නීතිය එහෙම පාවිච්චි කරන්නේ නැහැ. මේ ආණ්ඩුව ඊට වඩා පරිණත ආණ්ඩුවක්. කරන්න කිසිම දෙයක් නැතුව, කිසිම සැලසුමක් නැතුව, කුණුහරුප කිය කියා, අවලාද කිය කියා ඇවිදින විපක්ෂයකට විරුද්ධව හදිසි නීතිය පාවිච්චි කරන්න මේ ආණ්ඩුවට පිස්සු නැහැ.

ඊළඟට, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කිව්වොත්, ඒවාට විරෝධතා එද්දි, ගිහිල්ලා පොල් ගහද්දි අපි හදිසි නීතිය පාවිච්චි කළේ නැහැ නේ. අපි එහෙම කරන්නේ නැහැ. අඩුම තරමින් නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා අච්චර අර තෙරපි-තෙරපී ලොකු අමාරුවක වැටුණු වෙලාවේවත් අපි හදිසි නීතිය පාවිච්චි කළේ නැහැ. එහෙම හැම දේකටම හදිසි නීතිය පාවිච්චි කරන්නේ නැහැ. මේ ආපදාවෙන් ගොඩ එන්න, ඒකට අදාළ ක්‍රියාවලියට පමණයි හදිසි නීතිය පාවිච්චි කරන්නේ. ඒ සහතිකය මේ ආණ්ඩුව දීලා තිබෙනවා; ඉස්සරහටත් ඒක දෙනවා.

මම දැක්කා, හැමෝම ඉන්නේ නීතියේ රූලට පහළින් කියලා ජනාධිපතිතුමා කිව්වාට, මේ ආණ්ඩුවේ අය ඊට පහළින් නොවෙයි ඉන්නේ කියලා මන්ත්‍රීවරයෙකු ප්‍රකාශ කළා. ඒක වචනවලින් විතරක් කියලා බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කවුරු හරි කියන්න පුළුවන්, නීතිය මෙහෙමයි අරහෙමයි, ආණ්ඩුව නීතිය නවනවා කියලා. නමුත් ඒවා කරුණු සහිතව කියන්න. මෙතුමන්ලාම අවලාදයක් පතුරලා, ඒක develop කරලා, ඒක හැම තැනම කියලා, තමන්ම කියලා ඒවා තමන්ටම ඇහිලා එහෙම ආ පළියට නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. වැරැද්දක් ඇත්තටම වෙලා තිබෙනවා නම්, හොරකමක්, වංචාවක් දූෂණයක් කොහේ හරි වෙලා තිබෙනවා නම්, අදාළ තැන්වලට පැමිණිලි කෙරෙන්න ඕනෑ. අන්න ඒ පැමිණිලි සහ වෙනත් අයට තිබෙන පැමිණිලි අතර ඒවායේ විභාග කිරීමේ වෙනසක්ම් තිබෙනවා නම්, එහෙම නැත්නම් ඔය රනිල් වික්‍රමසිංහලාගේ, ගෝඨාභය රාජපක්ෂලාගේ, මහින්ද රාජපක්ෂලාගේ කාලයේ වාගේ ඒ නඩු යට ගහනවා නම්, ඔන්න එහෙම නම්, ඒක ගන්න පුළුවන්. කාටද එහෙම කරලා තිබෙන්නේ? මෙතුමන්ලා මේ නම් list එකක් කිව්වා, වසන්ත සමරසිංහ, මහින්ද ජයසිංහ, අල්ලස් කොමිසමේ DG, ශානි අබේසේකර වාගේ අය ගැන. මේ මොකක්ද කියන්නෙ? ඒ කියන්නේ, කවුද වැරැද්ද කරලා තිබෙන්නේ? ඔබතුමන්ලා ඒ අයට විරුද්ධව දාලා තිබෙන පැමිණිල්ල මොකක්ද? කොතැනද, ක්‍රියාවලිය පහුවෙලා තිබෙන්නේ? ඒ නිසා නිකම් තමන් විසින් පතුරන අවලාද අරගෙන, ඒ අවලාදවලට තව අවලාදත් අරගෙන මේ අය අවලාද මන්දිර හදනවා. හදලා නිකම් කියනවා, "කෝ, මෙහෙම නැහැ නේ" කියලා. තමන්ගේ හීන ලෝකයි, මේ දේශපාලනයයි කියන්නේ දෙකක්.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. අසහායකරණය ගැන අදත් කථා වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මට පොඩි වේලාවක් දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අසහායකරණය, කුණුහරුපකරණය කියලා ඇත්තටම රටේ ප්‍රධානීන්ට, අගමැතිතුමියට, කථානායකතුමාට බැලූ බැලූ අත කුණුහරුප ඉහිරවනවා. මට තේරෙන විධියට මේක එක ආකාරයක මානසික තත්ත්වයක්. මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් -හතරක්, පහක්- ඉන්නවා. එක්කෙනෙක්, දෙන්නෙක් මට කනෙනුත් පෙන්වන්න පුළුවන්. එහෙම කිහිපදෙනෙක් ඉන්නවා, මේක නවතින්නේම නැහැ. ඇත්තටම මේක නවතින්නේම නැහැ. ඇත්තටම මට තිබෙන දැනුම අනුව මම විශ්වාස කරනවා, මේක ඇත්තටම යම් මානසික තත්ත්වයක් කියලා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ශිෂ්ට සම්පන්න මනුෂ්‍යයෙක්. ඔබතුමා පිළිබඳව මම හොඳටම දන්නවා. ඔබතුමා ගැන ලොකු පැහැදීමක් අපි හැමෝටමත් තිබෙනවා. ඇත්තටම විපක්ෂයේ හතර පස් දෙනෙක් ඉන්නවා, දිගටම මේ වැඩේ කරන. ඒ අයව හොර රහසේ හරි අදාළ වෛද්‍යවරයෙකුට, මානසික වෛද්‍යවරයෙකුට යොමු කරලා මේ තිබෙන කුණුහරුප මානසිකත්වය, ඒ අසහනකාරීත්වයට ප්‍රතිකාර කරන්න කියලා ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. මොකද, ඒවාට ප්‍රතිකාර කරන්න පුළුවන්. ඒ නිසා ඒ අය ප්‍රතිකාරවලට යොමු කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.45]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்று இந்தச் சபையில் இடம்பெறுகின்ற அவசரகாலச் சட்ட நீடிப்புச் சம்பந்தமான இந்த விவாதத்தின்போது, குறிப்பாக ஆளுந்தரப்பில் இருக்கின்ற உறுப்பினர்கள் எல்லோரும் எதிர்க் கட்சியை விமர்சிக்கின்ற நிலைப்பாட்டில் இருந்தாலும், இந்த அவசரகாலச் சட்டம் நீடிக்கப்படுவதன் நோக்கம் என்ன? என்பதைத் தெளிவுபடுத்துகின்ற உறுப்பினர்களின் எண்ணிக்கை மிகக் குறைவாகக் காணப்படு கின்றது. நாட்டின் 76 வருட சாபத்தைப் பற்றி பேசுகின்ற, எதிர்க் கட்சியில் இருக்கின்ற உறுப்பினர்களை விமர்சிக்கின்ற, குறிப்பாக எதிர்க் கட்சித் தலைவரைச் சீண்டுகின்ற வகையான விடயங்களைப் பேசுகின்றவர்களாகவே ஆளுங்கட்சி உறுப்பினர்கள் இருக்கின்றார்களே ஒழிய, இதனுடைய நோக்கம் என்னவென்பதை விளங்கப்படுத்துகின்ற அல்லது இந்த நாட்டு மக்களுக்குத் தெளிவுபடுத்துகின்ற விதமான உரைகள் மிகக் குறைவாகக் காணப்படுகின்றன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த அவசரகாலச் சட்டம் நீடிக்கப்படுவதன் நோக்கம்தான் என்ன? என்ற கேள்வி இன்று பகிரங்கமாக எல்லாத் தரப்பினராலும் முன்வைக்கப்படுகின்றது. ஏனென்றால், இன்று ஆளுங் கட்சியினர் 159 பாராளுமன்ற உறுப்பினர்களை வைத்துக் கொண்டு, "இந்த அவசரகாலச் சட்டத்தை நீடிக்க வேண்டியதொரு நிலைப்பாடு எங்களுக்கு இருக்கின்றது. அதுவும் 'தித்வா' அனர்த்த நிவாரணச் செயற்பாடுகளை முன்னெடுப்பதற்காக" என்று சொல்லுகின்ற விடயம், எந்தளவிலே உண்மையானது என்ற கேள்வி இன்று மக்கள் மத்தியில் காணப்படுகின்றது. இந்த அவசரகாலச் சட்டம், மக்களுடைய புரட்சியை, அதாவது மக்கள் இந்த அரசாங்கத்துக்கு எதிராகத் திரண்டு ஆர்ப்பாட்டங்களைச் செய்கின்ற அல்லது மக்கள் தெளிவுபட்டு அரசாங்கத்தை எதிர்க்கின்ற செயற்பாடுகளை முடக்குவதற்காக நீடிக்கப் படுகின்றதா? என்ற குற்றச்சாட்டுகள் காணப்படுகின்றன. DOsஆக நியமிக்கப்பட்டுப் பாடசாலைகளில் கல்விச் செயற்பாடுகளில் ஈடுபட்டுவந்த பட்டதாரிகளால் அண்மையில் அவர்களது வேலைவாய்ப்புச் சம்பந்தமாக முன்னெடுக்கப்பட்ட போராட்டங்கள், வைத்தியர்களால் முன்னெடுக்கப்பட்ட போராட்டங்கள் போன்ற பல நிகழ்வுகள் இப்போது இந்த அரசாங்கத்துக்கு எதிராக இடம்பெறுவதை நாங்கள் பார்க்கிறோம். அவற்றை எல்லாம் கட்டுப்படுத்துவதற்காக இந்த அவசரகாலச் சட்டத்தை நீடிப்பதற்கு இந்த அரசாங்கம் முனைகின்றதா? என்ற கேள்விதான் இன்று எங்கள் மத்தியில் காணப்படுகின்றது.

அதேபோன்று இன்று ஆளுந்தரப்பில் இருக்கின்றவர்கள் கேட்கின்றார்கள், "இந்த அவசரகாலச் சட்டத்தை நீடிப்பது தொடர்பில் எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் ஏன் இவ்வளவு ஆக்கிரோசமடைகின்றார்கள் அல்லது ஏன் இதனை எதிர்க்கின்றார்கள்?" என்று. நாங்கள் கேட்க விரும்பு கின்றோம், சென்ற காலங்களில் இருந்த அரசாங்கங்கள் இவ்வாறு அவசரகாலச் சட்டத்தை நீடித்தபோது, இப்போது இருக்கின்ற நாட்டின் சனாதிபதி அவர்கள், அப்பொழுது எதிர்க்கட்சியில் இருந்தபோது அதனை ஆதரித்தாரா, எதிர்த்தாரா? என்று. "இன்று எங்களுடைய நாட்டில் யுத்தம் இல்லை, ஏனைய பிரச்சினைகள் இல்லை, இனவாதம் இல்லை, எல்லாமே சுமுகமாக நடைபெற்றுக் கொண்டிருக் கின்றது; மக்கள் நிம்மதியாக இருக்கின்றார்கள்; நாட்டில் காசு புரளுகின்றது" என்று சொல்லுகின்ற நீங்கள், இவ்வாறான தொரு சூழலிலே ஏன் இந்த அவசரகாலச் சட்டத்தை நீடிக்கின்றீர்கள்? என்ற கேள்வியை எதிர்க் கட்சியினர் எழுப்புகின்றபொழுது, அதற்கு நீங்கள் சரியான முறையில் பதிலளிக்காது இன்னும் அதனை விமர்சிக்கின்றவர்களாக இருந்து கொண்டிருக்கின்றீர்கள். இந்த அவசரகாலச் சட்டத்தின் அடிப்படையில் மக்கள் பல விளைவுகளை எதிர்கொண்டிருக்கிறார்கள். இன்று இனரீதியான முரண் பாடுகள் ஏற்பட்டிருக்கின்றன; இனங்களுக்கிடையிலான பிரச்சினைகள் ஏற்பட்டிருக்கின்றன; பிரதேச ரீதியான பிரச்சினைகள் ஏற்பட்டிருக்கின்றன. ஆகையால், அரசுக்கு இந்த அவசரகாலச் சட்டத்தைச் சிறந்த முறையிலே கையாளவேண்டிய பொறுப்பு காணப்படுகின்றது. இவ்வாறான ஒரு சூழலிலே, "ஏன் இதை நீடிக்க வேண்டும்?" என்று எல்லோரும் கேட்கின்ற விடயத்தையே நானும் இந்த இடத்திலே ஞாபகமூட்டிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற திருகோணமலை மாவட்டத்திலே 17 பொலிஸ் நிலையங்கள் காணப்படுகின்றன. மிக முக்கியமாக, சுமார் ஓரிலட்சத்திற்கும் மேற்பட்ட மக்கள் வாழுகின்ற கிண்ணியா பிரதேச செயலகப் பிரிவிலேயுள்ள பொலிஸ் நிலையத்திலே 2024ஆம் ஆண்டு 120 பொலிஸ் உத்தியோகத்தர்கள் கடமையாற்றினார்கள். ஆனால், இன்று அந்தப் பொலிஸ் நிலையத்திலே 47 பொலிஸ் உத்தியோகத் தர்கள்தான் கடமையாற்றுகின்றார்கள். ஆகையால், ஓரிலட்சத்திற்கு மேற்பட்ட மக்கள் வாழுகின்ற அந்தப் பிரதேசத்திலே இந்தக் குறைந்தளவான பொலிஸ் உத்தியோகத்தர்களால் கடமையாற்ற முடியுமா என்பதைப் பற்றி சிந்திக்க வேண்டும். இந்த விடயத்தைக் கௌரவ அமைச்சர் அவர்கள் கருத்திற்கொள்ள வேண்டும்; இதற்கான தீர்வை வழங்குவதற்கான நடவடிக்கை எடுக்க வேண்டும். அதேபோன்று கிண்ணியா, நடுஊற்றுப் பிரதேசத்திலே இன்னுமொரு தனியான பொலிஸ் நிலையம் அமைப்பதற்காக 2023ஆம் ஆண்டு gazette வெளியிடப்பட்டது. அதற்குப் பிறகு அது அப்படியே இடைநிறுத்தப்பட்டிருக்கின்றது. அந்தப் பிரதேசத்திலே பொலிஸ் நிலையத்தை அமைப்பதன்மூலமாக அங்குள்ள மக்களின் விடயங்களிலே கவனம் செலுத்த முடியும். ஏனென்றால், ஓரிலட்சத்திற்கும் மேற்பட்ட மக்கள் வாழுகின்ற பிரதேசத்திற்குரிய தேவைப்பாடு எவ்வாறு இருக்கும் என்பதை நீங்கள் கருத்திற்கொள்ள வேண்டும்.

கிண்ணியா பிரதேசத்தில் இருக்கின்ற பொலிஸ் நிலையம் அதற்குரிய ஒரு காணியிலே, அதற்குரிய ஒரு கட்டிடத்திலே அமைக்கப்பட்டிராத நிலை காணப்படுகின்றது. ஆகையால், புதிதாக இப்பொழுது அந்தப் பிரதேசத்திலே பொலிஸ் நிலையத்திற்கான ஓரிடம் அடையாளப்படுத்தப்பட்டிருக் கின்றது. அந்த இடத்திலே பொலிஸ் நிலையத்தை அமைப் பதற்கான நடவடிக்கை எடுக்க வேண்டும். அதேபோன்று நடுஊற்றுப் பிரதேசத்திலும் பொலிஸ் நிலையமொன்றை அமைப்பதன் ஊடாக அந்தப் பிரதேசத்திலே ஏற்படுகின்ற பல பிரச்சினைகளைத் தீர்ப்பதற்கான செயற்பாடுகளை மேற்கொள்ள முடியுமென்ற விடயத்தைக் கருத்திற்கொண்டு கௌரவ அமைச்சர் அவர்கள் உரிய நடவடிக்கைகளை முன்னெடுக்க வேண்டும்.

அதேபோன்று, கருமலையூற்று பள்ளிவாசல் சம்பந்தமான விடயங்களை நாங்கள் கடந்த அமர்வுகளிலும் ஞாபகமூட்டி யிருந்தோம். இது முஸ்லிம்களுடைய ஆன்மீகத்துடன் சம்பந்தப்பட்ட நீண்டகால விடயமாகக் காணப்படுகின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

நீண்ட காலமாக அந்தப் பள்ளிவாசல் பற்றிய விடயம் பேசப்பட்டாலும் இப்பொழுது அப்பள்ளிவாசலுக்குச் செல்லுகின்ற அல்லது அந்தப் பள்ளிவாசலைப் பார்வையிடுகின்ற வசதிகள்கூட இப்பொழுது இடைநிறுத்தப் பட்டிருக்கின்றது. இது சம்பந்தமான முழு விபரங்களையும் கௌரவ அமைச்சர் அவர்களுக்கு நாங்கள் தெளிவுபடுத்தியிருந்தோம். ஆகவே, அந்தப் பிரதேசத்திலேயிருக்கின்ற முஸ்லிம்கள் அந்தப் பள்ளிவாசலைப் பயன்படுத்தக்கூடிய சூழலை மீண்டும் உருவாக்குவதற்கான நடவடிக்கைகளையும் கௌரவ அமைச்சர் அவர்கள் எடுக்க வேண்டும் என்பதை இந்த இடத்திலே கேட்டுக்கொண்டு, முடித்துக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.51]

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කවුරුවත් නොසිතූ වේලාවක තමයි මේ හදිසි ආපදා තත්ත්වය ඇති වුණේ. ඒ ආපදා තත්ත්වය ඇති වුණු විගසම ජනාධිපතිතුමා ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය කැඳෙව්වා. ඒ වෙලාවේදී රටේ පැවතුණු "දිට්වා" සුළි කුණාටු තත්ත්වයත් එක්ක විපක්ෂයෙන් තමයි ඉස්සෙල්ලාම යෝජනා කළේ හදිසි නීතිය පනවන්න කියලා. අද ගොඩක් අයට ඒ බව මතක නැහැ. විපක්ෂය තමයි හදිසි නීතිය පනවන්න කිව්වේ. හදිසි නීතිය යටතේ තමයි හදිසි තත්ත්වය ප්‍රකාශ කළේ. ඔබතුමන්ලාට දැන් ඒක අමතක වෙලා තිබෙන නිසා තමයි නැවත මම ඒ ගැන මතක් කළේ. හොඳට මතක් කරන්න, මාධ්‍යවල ඒ ප්‍රකාශ තිබෙනවා. සජීවී ප්‍රකාශත් තිබෙනවා. මුද්‍රිත මාධ්‍යවලට කරපු ප්‍රකාශත් තිබෙනවා. ඔබතුමන්ලාගේ පැත්තෙන්ම තමයි හදිසි නීතිය පනවන්න කියන යෝජනාව ආවේ. ඒකට අපි ආණ්ඩුවක් විධියට එකඟ වුණා. ඒ අනුව එකඟතාවෙන් තමයි මේ හදිසි නීතිය පනවනු ලැබුවේ. හදිසි නීතිය පනවන්න හේතුව, ආපදා කළමනාකරණය පිළිබඳව තිබෙන පනත ශක්තිමත් නොවීමයි. ඒ පනත ප්‍රමාණවත් නැහැ, මෙවැනි ව්‍යසනකාරී තත්ත්වයකට මැදිහත් වෙන්න. ඒක විපක්ෂයේ ඔබතුමන්ලාත් පිළිගන්නවා. විපක්ෂ නායකතුමාත් කියනවා, ඒ පනත සංශෝධනය කරන්න ඕනෑ කියලා. ඒ පනත සංශෝධනය කරන්න ඕනෑය කියන එකෙන්ම අදහස බොහොම පැහැදිලියි. එතුමාත් පිළිගන්නවා, මේක පණ තිබෙන පනතක් නොවෙයි කියලා. පණ නැති පනතකින් මෙවැනි තත්ත්වයකට මුහුණ දෙන්න බැහැ. ඒ නිසා තමයි හදිසි නීතිය අවශ්‍ය වුණේ.

අපි ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව කැඳවූ වෙලාවේදී එතුමාත්, විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් ඊට සහභාගි වුණා. එතැනදී අපි තීන්දුවක් ගත්තා, දැනට පවතින මේ පනත සංශෝධනය කරන්න. ඒ සඳහා දැනට කටයුතු කරමින් යනවා. පසුගිය කාලය තුළ ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව කැඳවා තිබුණේත් නැහැ; අවුරුදු 7ක් කැඳවා නැහැ. ඒ පනතේ තිබෙන නීති ප්‍රකාරව ඇත්තටම ආපදා විෂය භාරව ඉන්න අධ්‍යක්ෂවරයා පත් කිරීම අනුමත විය යුතුයි, ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ. නමුත්, පසුගිය කාලය පුරාවටම එහෙම අනුමත කිරීමක් කරලා තිබුණේත් නැහැ. ඒ තනතුරුවල හිටපු අය දැන් විශ්‍රාම ගිහිල්ලා තිබෙනවා. ඇත්තම කිව්වොත්, ඒක නීත්‍යනුකූලත් නැහැ. එවැනි තත්ත්වයක් තමයි ඉතිහාසයේ තිබුණේ. ඒක වෙනස් කරන්න වාගේම ශක්තිමත්ව, වේගයෙන් ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න තමයි මේ හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කළේ. හදිසි තත්ත්වය අවශ්‍ය වුණේ රුපියල් 25,000, රුපියල් 50,000 දෙන්න නම් නොවෙයි. එතුමන්ලා ඇහුවා, රුපියල් 50,000 වාගේම රුපියල් 25,000 දෙන්න හදිසි නීතිය ඕනෑ නැහැ නේද කියලා. රුපියල් 25,000, රුපියල් 50,000 දෙන්න තරම් සරල තත්ත්වයක නොවෙයි මේ ව්‍යසන තත්ත්වය තිබුණේ. ඇත්තටම ගත්තොත්, අපේ රටේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය, අනෙකුත් සහන සේවා බලකා වාගේම සියලු රාජ්‍ය සේවකයින් අත්‍යවශ්‍ය සේවාවක් විධියට මේ සේවා සැපයීම සඳහා ක්ෂණිකව කැඳවිය යුතුව තිබුණා. ඒ අවශ්‍යතාව අදත් එහෙමම තිබෙනවා. ඔබතුමන්ලාම කියනවා නේ, සමහර වැඩ තවම කෙරිලා නැහැ, මදි කියලා. මදි නිසා තමයි මේ සේවාව තවත් ඕනෑ. සමහර වැඩ තවම ඉවර නැහැ. මේ හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීමත් එක්ක තමයි, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙකු පත් කිරීමේ හැකියාව ලැබුණේ. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා පත් කිරීමත් එක්ක තමයි සියලු අත්‍යවශ්‍ය සේවා එතුමාගේ මැදිහත් වීමෙන් කැඳවීමේ හැකියාව ලැබෙන්නේ. ඒ නෛතික බලය ලැබෙන්නේ එතැනින්.

ඔබතුමන්ලාට මතක ඇති, මහනුවර, බදුල්ල වැනි කඳුකර ප්‍රදේශවල පාරවල් සම්පූර්ණයෙන්ම නාය ගිහිල්ලා, ඒ ප්‍රදේශවලට යන්න පුළුවන් තත්ත්වයක් තිබුණේ නැහැ කියන එක. ප්‍රවාහන කටයුතු සම්පූර්ණයෙන්ම අඩාළ වෙලා තිබුණේ. ඒ ප්‍රදේශවල තිබෙන යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන්න විධියක් තිබුණේ නැහැ. මොකද, ඒ ප්‍රදේශවලට වාහනවලට යන්න බැරි වුණා. වැලිගම ප්‍රාදේශීය සභාවෙන්, හම්බන්තොට, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවලින්, නගර සභාවලින් ඒවායේ තිබෙන යන්ත්‍රෝපකරණ, වාහන ටික ඒ ප්‍රදේශවලට යවන්න පුළුවන් වුණේ හදිසි නීතිය නිසායි. හදිසි නීතිය නැත්නම් එහෙම කරන්න බැහැ.

ඔබතුමන්ලාගේම පාලනය යටතේ තමයි ගම්පොල නගර සභාව තිබෙන්නේ. නමුත්, ඒ ප්‍රදේශයේ තිබෙන කුණු ටික ඉවත් කර ගන්න, ඒ ප්‍රදේශය සුද්ද පවිත්‍ර කරන්න කොළඹ මහ නගර සභාවෙන් යන්න වුණා. කොළඹ මහ නගර සභාවේ වාහන ටික ගෙනියන්න පුළුවන්කම ලැබුණේ හදිසි නීතිය නිසායි. එහෙම නැත්නම් එක් ප්‍රාදේශීය සභාවක වාහනයක් තවත් ප්‍රදේශයකට ගෙනියන්න බැහැ. මොකද, ඒක පළාත් දෙකක් අතර සම්බන්ධයක්. සාමාන්‍ය නීතිය යටතේ තිබෙන නෛතික රාමුව තුළ ඒක කරන්න බැහැ. හැබැයි, ඒ තත්ත්වය වෙනස් කරලා ක්ෂණිකව ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න හැකියාව ලැබුණේ හදිසි නීතිය ප්‍රකාශ කිරීම නිසායි. එහෙම නැතුව රුපියල් 25,000, රුපියල් 50,000 දෙන්න හදිසි නීතිය අවශ්‍යයි කියලා නොවෙයි. හදිසි නීතිය අත්‍යවශ්‍ය වෙන්නේ වෙන කවරකටවත් නොවෙයි. මේ ආපදා තත්ත්වයෙන් ජනතාව මුදා ගැනීම, විනාශයට පත් වුණු පාරවල් ටික, ගොඩනැඟිලි ටික යථා තත්ත්වයට පත් කිරීම, අනතුරුදායක ලෙස හඳුනා ගත් කඳු ප්‍රදේශවලින් ඒ ජනතාව ඉවත්

[ගරු විජිත හේරත් මහතා]

කරලා, ඒ අයට අවශ්‍ය කරන පහසුකම් ලබා දෙන්න වෙනත් ආයතනවල සහාය ලබා ගැනීම කියන ඒ සියල්ල කරන්න පුළුවන් වෙන්නේ හදිසි නීතිය යටතේයි. ඒකයි මේ හදිසි නීතිය අවශ්‍ය වෙලා තිබෙන්නේ. ඒ නිසා හදිසි නීතියේ අවශ්‍යතාව මේ රටේ ජනතාව කවුරුත් පිළිගන්නවා. ඔබතුමන්ලා ඒක දැන් දේශපාලන ආයුධයක් කරගෙන විවේචනය කරන්න හැදුවාට, ඔබතුමන්ලාම යෝජනා කරලා ඔබතුමන්ලාගේම යෝජනාවක් විධියට තමයි හදිසි නීතිය අපි පනවනු ලැබුවේ. මේක පවත්වාගෙන යන්නෙත් ඔබතුමන්ලා එදා කරපු යෝජනාවට අනුව. ඒ නිසා මේ හදිසි නීතිය අනියත බයක් ඇති කර ගත යුතු එකක් නොවෙයි. අපි ඉතා පැහැදිලිව කියන්න කැමැතියි, මේ හදිසි නීතිය මේ තාක් කිසිදු ආකාරයක ජනතා මර්දනයකට අපි පාවිච්චි කරලා නැහැ කියන එක. ඉදිරියටත් අපි ඒක එහෙම පාවිච්චි කරන්නේ නැහැ. ඒ ගැන අපි සහතික වෙනවා.

වැඩ වර්ජන, උද්ඝෝෂණ ඕනෑ තරම් තිබෙනවා. වෛද්‍යවරු විවිධ වෘත්තීය ක්‍රියාමාර්ග ගත්තා. විවිධ ක්ෂේත්‍රවල අය විවිධ ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. දැනුත් රටේ විවිධ තැන්වල උද්ඝෝෂණ ක්‍රියාත්මක වෙනවා. මේ කිසිවකට හදිසි නීතිය පාවිච්චි කරලා නැහැ. හදිසි නීතිය යටතේ නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව තිබෙනවා, වගන්ති තිබෙනවා. අර කිව්වා වාගේ, 29 වන වගන්තියේ ඒවා තිබෙනවා. යම් ස්ථානවලට ඇතුළු වීමේදී ඒ බලතල තිබෙනවා. හැබැයි, අපි පාවිච්චි කරලා තිබෙන්නේ NBRI එකේ ඒ නිලධාරි මහත්වරුන්ට ඒ ස්ථානවලට යන්න. ඉන් එහා අපි එහෙම වෙනස් විධියට පාවිච්චි කරලා තිබෙනවාද? නැහැ.

මේකේ තිබෙන 19වන වගන්තිය අපි පාවිච්චි කරලා තිබෙන්නේ කොහේද, මාධ්‍ය මර්දනයට? මාධ්‍ය තුළ අදත් ආණ්ඩුවට එරෙහිව විවිධ විවේචන, චෝදනා, අවලාද, අපවාද නඟනවා. බොරු අවලාද පවා නඟනවා. මේ පාර්ලිමේන්තුවේම කොච්චර කියනවාද? මාධ්‍යවල කොච්චර කියනවාද? ආණ්ඩුව ඒ කිසිවකට මර්දනකාරී ක්‍රියාමාර්ග අරගෙන නැහැ. 19වන වගන්තිය අපි මාධ්‍ය මර්දනයට පාවිච්චි කරලා නැහැ. කොහේද, පාවිච්චි කරලා තිබෙන්නේ? පාවිච්චි කළ හැකියි කියලා කියනවා. ඒ කියන්නේ අනාගතයේ එහෙම විය හැකියි කියලා බිල්ලෝ මවනවා. එහෙම බිල්ලෝ මවලා යථාර්ථය වහන්න බැහැ. යථාර්ථයේ එහෙම දෙයක් නැහැ. ප්‍රායෝගික යථාර්ථය තුළ කිසිදු ආකාරයක මාධ්‍ය මර්දනය සඳහා හදිසි නීතිය, මේ 19වන වගන්තිය අපි පාවිච්චි කරලා නැහැ, පාවිච්චි කරන්නෙත් නැහැ. පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පිළිබඳ කමිටුවට කැඳවන්නේත් හදිසි නීතිය නිසා නොවෙයි. පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යම්කිසි කෙනෙක් කැඳවන්නේ ඒක සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු ක්‍රමවේදයේ සම්ප්‍රදාය අනුව. ඒක පාර්ලිමේන්තු රීතිවලට අනුව කෙරෙන්නේ. හදිසි නීතිය තිබුණත්, නැතත් ඒක කරනවා; කරන්න පුළුවන්. ඒ නිසා පාර්ලිමේන්තුවේ යම්කිසි කෙනෙක් වරප්‍රසාද පිළිබඳ කමිටුවට කැඳවීම මේ හදිසි නීතිය නිසා සිද්ධ වුණා කියනවා නම් ඒක අමූලික බොරුවක්. එහෙම දෙයක් නැහැ.

ඒ වාගේම තමයි මේ පනතේ 32වන වගන්තිය. දැන් මේ වගන්ති විධියට ගෙන හැර පෑවා මේ වගන්තිවලින් මේවා, මේවා විය හැකියි කියලා. නැහැ. කිසිසේත්ම මේ කිසිදු වගන්තියක් ජනතා මර්දනය සඳහා පාවිච්චි කරලාත් නැහැ, පාවිච්චි කරන්නෙත් නහැ. අපි ඉතා වගකීමෙන් කියන්නේ. අපි දැනට තිබෙන ජනතා මර්දන අණපනත් වෙනස් කරනවා. දැනටමත් අපි Online Safety Bill එක සංශෝධනය කරලා එය ජනතා අදහස් දැක්වීම සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. දැන් මාස දෙකක් විතර වෙනවා, ඒ පිළිබඳ ජනතාවගෙන්, විවිධ සංවිධානවලින් අපි අදහස් හා යෝජනා ගන්නවා. ඒ පැවති පනත වෙනස් කරන්න ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දුන්න තීන්දුවට අනුව ඒ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ තිබෙන කරුණුත් ඇතුළත් කරලා, ඒ වාගේම තවත් වෙනස් විය යුතු තැන් මොනවාද කියලා ජනතාවගේ අදහස් විමසලා වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයට ඒ පනත වෙනස් කරන්න අපි දැනටමත් කටයුතු කරමින් ඉන්නවා.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අතීතයේ යොදා ගත්ත විධිය අපි කවුරුත් දන්නවා. අපි කාටත් ඒ පිළිබඳ අත්දැකීම් තිබෙනවා. ඒක වෙනස් කරන්න අපි මහජනතාවට පොරොන්දුවක් දුන්නා. අපිට ජනවරමක් ලැබුණා. ඒ ජනවරමට අනුව අපි ඒ කටයුත්ත දැන් කරලා තිබෙනවා. තිබෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරලා ඒ වෙනුවට රාජ්‍යය ආරක්ෂා කිරීම පිළිබඳ පනතක් අපි හඳුන්වා දීලා තිබෙනවා. අපි ඒක ජනතා අදහස්වලට ඉදිරිපත් කරලා තිබෙනවා. විවිධ සංවිධාන, විවිධ පුද්ගලයන් ඒ ගැන පුවත්පත්වල විවිධ විවේචන කරනවා; විචාර ලියනවා; අදහස් දක්වනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ සියලු අදහස්, විවේචන ඒ සියල්ල සැලකිල්ලට අරගෙන අවසානයේ අපි ඒවාත් එක්ක ඒ පනත ජනතාවාදී විධියට වෙනස් කරනවා. ඒ ප්‍රජාතන්ත්‍රවාදය අපි දැනටමත් ප්‍රායෝගිකව පෙන්නුම් කරලා තිබෙනවා. ඒ නිසා කිසිදු ආකාරයකින් අපි මේ හදිසි නීතිය ජනතා මර්දනයට පාවිච්චි කරන්නේ නැහැ කියන එකට තවත් එක් සාධකයක් තමයි මේක.

අපට අවශ්‍ය වෙන්නේ තව තවත් ප්‍රජාතන්ත්‍රවාදී අණපනත්, නීති-රීති හඳුන්වා දෙමින් අපේ රට ආර්ථික වශයෙන් ශක්තිමත්ව ඉදිරියට ගෙන යන්න වාගේම මානව සංවර්ධනයත් ඉදිරියට ගෙනෙන්නයි. මානව සංවර්ධනය ඇති කරන්න පුළුවන් වන්නේ නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමෙන් තමයි. අපි ඒ වෙනුවෙන් කැප වුණු දේශපාලන ව්‍යාපාරයක්. විපක්ෂයේ ඔබතුමන්ලා කියන්න දෙයක් නැති වුණාම, කරන්න දෙයක් නැති වුණාම මොකක් හරි අල්ලාගෙන කෑ ගහනවා. ඒක ප්‍රශ්නයක් නැහැ. අපට ඒක තේරෙනවා. විපක්ෂයේ කාර්යභාරය විධියට මොනවා හරි කියව-කියවා ඉන්න එක, කෑ ගහන එක සාමාන්‍යයෙන් විපක්ෂය එදා ඉඳලා කරපු වැඩේ නේ. දැනුත් කරනවා. ඒ ගැන අපි කලබල වෙන්නේ නැහැ. ඒ ගැන අපි කේන්ති ගන්නේත් නැහැ. අපි සිනහමුසු මුහුණින් ඒක පිළිඅරගෙන ඕනෑ දෙයක් කියන්න කියලා ඉඩ දීලා තිබෙනවා. ඔබතුමන්ලා කියන්න, කමක් නැහැ. අපි අපේ වැඩේ කරගෙන යනවා.

අපි ආර්ථිකය හදනවා. අපි රට ගොඩනඟන කටයුත්ත කරනවා. "දිට්වා" සුළි කුණාටු තත්ත්වය ආවාට පසුව ඉතා වේගයෙන් අපි මැදිහත් වුණා. එහෙම වේගයෙන් මැදිහත් වීමේ ප්‍රතිඵලයක් විධියට ජනතාවගේ ප්‍රධාන අත්‍යවශ්‍ය අවශ්‍යතාවන් ඉතා ක්ෂණිකව, කෙටි කාලයක් තුළ සම්පූර්ණ කරන්න අපි සමත් වුණා. ඔබතුමන්ලා කෑ ගැහුවා. විවිධ දේ කියනවා. අපි ඒවා ගණන් ගන්නේ නැහැ. ඔබතුමන්ලා ඕනෑ දෙයක් කියන්න. කිය කිය ඉන්න. අපි වැඩ කරගෙන යනවා. ඒ කියන එක තුළ "ආණ්ඩුවට ඇට්ටි හැළෙන්න දුන්නා" කියලා ඔබතුමන්ලා පෞද්ගලිකව සතුටු වෙනවා නම්, සතුටු වෙන්න. ඒ ආත්ම තෘප්තිය ඔබතුමන්ලා ලබා ගන්න. හැබැයි, ජනතාව ඔතැන නොවෙයි ඉන්නේ.

මේ රජය කරන සත්ක්‍රියාවන් එක්ක ජනතාව ඉතා සුබවාදීව ඉන්නේ. අද ජනාධිපතිතුමා නුවර ගියාම පිළිගන්න විධිය, එතුමාට ජනතාවගේ තිබෙන ප්‍රතිචාරය බලන්න. ඒක තමයි ජනතාවගේ ඇත්ත ආදරය. යාපනයට ගියාම ජනතාව කොහොමද ජනාධිපතිතුමාව පිළිගන්නේ? ජනාධිපතිතුමාව වැලඳ ගන්නේ කොහොමද? ඒක තමයි ජනතා ආදරය. ඔබතුමන්ලා ඒකට පටහැනිව විකාර දොඩවන කොට ප්‍රතික්ෂේප වෙන්නේ

ඔබතුමන්ලායි කියන එක තනියෙන් කණ්ණාඩියක් ඉස්සරහා ඉඳලා හරි තේරුම් ගන්න. එච්චරයි අපට කියන්න තිබෙන්නේ. ඒ ගැන අපි කේන්ති ගන්නේ නැහැ. අපි අපේ වැඩේ, රජයේ වගකීම අපි කරනවා.

හදිසි නීතිය ඕනෑ වුණේ, අදත් ඕනෑ වෙලා තිබෙන්නේ සේවාවන් වේගවත් කරන්න. අපට මතකයි, නොවැම්බර් මාසයේ අග 25, 26, 27 - හරියටම ගත්තොත් 27වැනි දා - සුළි කුණාටු තත්ත්වය ආවා. ඒ කියන්නේ, අපේ රටට සංචාරකයෝ වැඩිපුර පැමිණෙන කාලසීමාව; නොවැම්බර්, දෙසැම්බර් කියන්නේ අපේ season එක. ඒ මොහොතේ අපට ලොකු සැකයක් තිබුණා, සංචාරකයන් පැමිණීම නතර වෙයි කියලා, bookings cancel වෙයි කියලා. හදිසි නීතිය පැනවීම නිසා අපට හැකියාව ලැබුණා, සංචාරක සේවාව අත්‍යවශ්‍ය සේවාවක් විධියට හදිසි නීතිය යටතේ නාමකරණය කරන්න. ඒකත් එක්ක සංචාරක කර්මාන්තය මුහුණ දීපු අර්බුදකාරී තත්ත්වය පියමං කරන්න ඒක පාවිච්චි කළා. අදත් ඒක තමයි කරන්නේ. ක්ෂණිකව මැදිහත් වෙලා විවිධ ඒකක පිහිටෙව්වා. දෙසැම්බර් මාසයේ සංචාරකයෝ මුළුමනින්ම නතර වෙයි කියලා තිබුණු භය සම්පූර්ණයෙන් අනෙක් පැත්තට හැරුණා.

ලංකා ඉතිහාසයේ වැඩිම සංචාරකයන් පැමිණි මාසය බවට පසුගිය දෙසැම්බර් මාසය පත් කළා. 258,000ක් වූ වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් පැමිණි දෙසැම්බර් මාසය. මේ අවුරුද්දේ ජනවාරි මාසයේ 277,000ක් සංචාරකයන් ප්‍රමාණයක් ලංකාවට පැමිණියා. ලංකා ඉතිහාසයේ සංචාරකයන් වැඩියෙන්ම පැමිණි ජනවාරි මාසය. "දිට්වා" සුළි කුණාටු තත්ත්වයක් යටතේ වුණත් මේ වර්ධනය ඇති වී තිබෙනවා. රේල් පාරවල් තවම සම්පූර්ණයෙන් හදලා නැහැ. තව කොටසක් හදන්න තිබෙනවා. සමහර පාලම් තිබෙනවා, තවම හදලා නැහැ තවමත් ඒ ප්‍රදේශවල ප්‍රවාහන කටයුතු සම්පූර්ණ කරන්න බැරි වෙලා තිබෙනවා. එහෙම තිබෙද්දීත් සංචාරකයන්ගේ පැමිණීම වර්ධනය කර ගන්න පුළුවන් වුණේ, වැඩි කර ගන්න පුළුවන් වුණේ හදිසි නීතිය ප්‍රකාශයට පත් කරලා, ඒ හදිසි නීතිය භාවිත කරලා, අපි ඒ සේවාවන් අත්‍යවශ්‍ය සේවාවන් බවට පත් කිරීම හරහා කළ කාර්යභාරය නිසා. එවැනි උදාහරණ තමයි හැම ක්ෂේත්‍රයේම තිබෙන්නේ.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වේවා, නිවාස ක්ෂේත්‍රයේ වේවා, ප්‍රවාහන-මහාමාර්ග ක්ෂේත්‍රයේ වේවා, වරාය වේවා, ඒ සියලු සේවාවන් කඩිනම්ව කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ, මේ හදිසි නීති තත්ත්වය තුළයි. ඒ විතරක් නොවෙයි. හදිසි නීතිය යටතේ තමයි ප්‍රසම්පාදන ක්‍රමවේදය - procurement ක්‍රමවේදය - ඉක්මන් කළේත්. සාමාන්‍යයෙන් ඒ සඳහා බොහෝ කල් ගත වෙනවා. ඒ සඳහා යන කාලයත් කෙටි කරගන්න හැකියාව ලැබිලා තිබෙනවා, මේ හදිසි නීති තත්ත්වය තුළ; ඒ සඳහාම වෙච්ච නීති සම්පාදනය තුළ.

ඒ නිසා මේ හදිසි නීතිය අපි පාවිච්චි කරන්නේ ඉතා පැහැදිලිව වෙන මොකකටවත් නොවෙයි, "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වූ තත්ත්වයෙන් මේ රටේ ජනතාව මුදා ගැනීම සඳහා පමණයි. එයින් සිදු වෙච්ච ආර්ථික හානිය පිළිබඳ ඇස්තමේන්තුවක් ලෝක බැංකුව ඉදිරිපත් කළා. ලෝක බැංකුව ඉදිරිපත් කළ ඒ වාර්තාව මේ තිබෙන තත්ත්වය පිළිබඳ දැනට කරන ලද ඇගයීමෙන් ලබා දී තිබෙන වාර්තාවයි. ඒක සම්පූර්ණ වියදම නොවෙයි. අපි ඒක දන්නවා. අප ඒක නොදැන ඉන්නවා කියන එක පට්ටපල් බොරුවක්. විපක්ෂ නායකතුමා කිව්වා අපේ ආණ්ඩුව ඒ ගැන දන්නේ නැහැ කියලා. නැහැ නොවෙයි, අපි දන්නවා. මෙවැනි තත්ත්වයක් ඇති වුණාම මුළුමනින්ම වෙච්ච හානිය සම්පූර්ණයෙන් ඇස්තමේන්තුගත කරන්න යම් කාලයක් ගත වෙනවා. එතෙක් අන්තර්කාලීනව ලබා දීපු ඒ වාර්තාවේ සඳහන් ප්‍රමාණය තමයි ඇමෙරිකානු ඩොලර් බිලියන 4.1 කියන්නේ. ඊට වඩා වැඩි වෙන්නත් පුළුවන්. අපට ඒ පිළිබඳ අවබෝධය තිබෙනවා. ඒ සමීක්ෂණය තවම කරමින් පවතිනවා. නමුත්, ඒ සඳහා යන වියදම පියවා ගැනීමට අවශ්‍ය කරන පරිපූරක ඇස්තමේන්තුව අපි වහාම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සම්මත කර ගත්තා. ඒ වාගේම ජාත්‍යන්තර වශයෙන් විවිධ රටවලින් අපි ආධාර උපකාර ලබා ගත්තා, ලබා ගනිමින් ද තිබෙනවා. විදේශගත ශ්‍රී ලාංකිකයෝ තවමත් අපට විවිධාකාරයෙන් උදව් උපකාර කරනවා. ඒ සියල්ල මැදින් තමයි අපි "දිට්වා" සුළි කුණාටු තත්ත්වයෙන් රට මුදා ගැනීම සඳහා වෙච්ච මේ ක්ෂණික මෙහෙයුම - operation එක - කරලා සාර්ථකව ඉදිරියට ඇවිල්ලා තිබෙන්නේ. එම නිසා ඔබතුමන්ලා ඔබතුමන්ලාගේ පැත්තෙන් සතුටු වෙන්න. මොනවා හරි කිව්වාට, අපි කිසිසේත්ම ඒවා ගණන් ගන්නේ නැහැ, අපි ඒවාට කේන්ති ගන්නේ නැහැ. ඔබතුමන්ලා සතුටු වෙන්න. එච්චරයි, අපට කියන්න තිබෙන්නේ. රට ජනතාවත් එක්ක ඉස්සරහට යනවා. ආණ්ඩුව විධියට අපි ඒ ජනතාවත් එක්ක අපේ වගකීම ඉතා පැහැදිලිව, නිරවුල්ව ඉෂ්ට කරමින් යනවා. අපි ඒ වගකීම ඉටු කරන බව ප්‍රකාශ කරමින් මා නතර වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.09]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

විශේෂයෙන්ම ආණ්ඩුව පැත්තෙන් ඇමතිතුමාත් කිව්වා, හදිසි නීතිය ගෙනෙන්න කියලා අපි යෝජනා කළා කියලා. ඔව්, අපි යෝජනා කළා "දිට්වා" සුළි කුණාටුව ඇති වෙච්ච කාලයේදී, හදිසි නීතිය ගේන්න කියලා. ඒ, එම ව්‍යසනය කළමනාකරණය කර ගන්නයි. නමුත්, ඔබතුමන්ලා ඒ වෙලාවේ එය ගෙනාවේ නැහැ. ඔබතුමන්ලා හදිසි නීති තත්ත්වය ප්‍රකාශයට පත් කළේ පමා වෙලා. ඊළඟට අපි කිව්වා, ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න කියලා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 11වැනි වගන්තිය අනුව ජනාධිපතිතුමා එය ප්‍රකාශයට පත් කරන්න ඕනෑ. නමුත්, එය ප්‍රකාශයට පත් කළේ ජනාධිපතිතුමා නොවෙයි, ආරක්ෂක ලේකම්තුමා. අදටත් තිබෙන්නේ ආරක්ෂක ලේකම්තුමාගේ **ප්‍රකාශය**. ඒක නීති විරෝධියි. මේ රටේ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න පුළුවන් ජනාධිපතිතුමාට විතරයි. ඒ ඔක්කෝම කරන්න කිව්වේ ඒ වැඩේ කළමනාකරණය කර ගන්නයි. තමුන්නාන්සේලාම දැන් කියනවා, ඒ ආපදා තත්ත්වය කළමනාකරණය කරලා තිබෙනවා කියලා. එහෙම නම් මොකටද ආයෙත් හදිසි නීතිය?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය දැන් ඕනෑ වෙලා තිබෙන්නේ මොකටද? මේ ආණ්ඩුව බලයට ගෙනාපු යම් යම් කණ්ඩායම් අද වනකොට මේ ආණ්ඩුවට විරුද්ධව යම් යම් උද්ඝෝෂණ පටන් අරගෙන තිබෙනවා. සංවර්ධන නිලධාරීන් වෙන්න පුළුවන්, වෛද්‍යවරුන් වෙන්න පුළුවන්, ධීවරයන් වෙන්න පුළුවන්, ඒ වාගේ නොයෙකුත් ක්ෂේත්‍රවල ඉන්න උදවිය, ඒ කියන්නේ ඡන්දය දීලා විශ්වාසයක් ඇතිව මේ ආණ්ඩුවට

[ගරු මුජිබුර් රහුමාන් මහතා ]

බලයට ගෙන ආපු උදවිය අද මේ ආණ්ඩුව ගැන යම් ප්‍රශ්නාර්ථ ලකුණක් ඇති කරගෙන තිබෙනවා. ඒ නිසා දැන් යම් යම් උද්ඝෝෂණ පැවැත්වෙනවා. එසේ උද්ඝෝෂණ එන හින්දා යම් ආකාරයක මර්දනයක් කරන්නයි හදිසි නීතිය ඕනෑ. එහෙම නැත්නම් මොකටද? දැන් "දිට්වා" ආපදා තත්වය ඉවරයි නේ. ආණ්ඩුව කියන විධියට ඒ තත්ත්වය දැන් කළමනාකරණය කරලා ඉවරයි; දැන් සියයට 90ක් වන්දි ගෙවලා ඉවරයි. එහෙම නම් මොකටද හදිසි නීතිය? හදිසි නීතිය අවශ්‍ය නැහැ. මා කලින් කියපු එකයි ආණ්ඩුවේ පරමාර්ථය.

ඊළඟ කාරණය මේකයි. "කෝ, අගමැතිතුමියට එරෙහි විශ්වාස භංගය?" කියලා ආණ්ඩුවේ අය හැම තිස්සේම වාගේ අහනවා. අගමැතිතුමියට එරෙහි විශ්වාස භංගයෙන් දැන් වැඩක් නැහැ. මොකද, අගමැතිතුමියව විශ්වාස නැහැ කියලා ජනාධිපතිතුමා ඒ programme එක නැවැත්තුවා. අපි නොවෙයි, ජනාධිපතිතුමා එය නවත්වලා විශේෂඥයින්ගේ කමිටුවක් පත් කළා, ඒ කමිටුව පරීක්ෂණ කළාට පසුව වැඩේ කරමු කියලා. ජනාධිපතිතුමාට විශ්වාස නැත්තේ අගමැතිතුමියවයි. විශ්වාස භංගය ගෙනාවේ ජනාධිපතිතුමායි, අපි නොවෙයි. මෙතුමියව විශ්වාස නැති හින්දා තමයි ඒ වැඩේ කරන්න එපා කිව්වේ. විශ්වාස භංගයෙන් දැන් වැඩක් නැහැ. ජනාධිපතිතුමාට විශ්වාසය ඇති වෙච්ච දවසට මෙතුමියට ඒක කරන්න දෙයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අපි ඒක දිනලා ඉවරයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්. මොකද, විශ්වාස භංගය නැවැත්තුවේ ජනාධිපතිතුමා. ජනාධිපතිතුමා කිව්වොත් ආයෙත් ගේන්නම්. ඊට කලින් ජනාධිපතිතුමා මේකට පැන්නා. පැනලා මේක නැවැත්තුවා. එතුමා නැවැත්තුවේ ඔබතුමිය ගැන විශ්වාසයක් නැති හින්දා. ඒ හින්දා මෙතැන ඇවිල්ලා ආයේ ආයේ අහන්න එපා, විශ්වාස භංග යෝජනා කෝ කියලා. ජනාධිපති මන්දිරයට ගිහිල්ලා ඒ ගැන කථා කරන්න. ගිහිල්ලා ජනාධිපතිතුමාගෙන් අහන්න, මේක නැවැත්තුවේ මොකද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට දෙන්න තිබෙන උත්තරය ඒක තමයි. ඒක ජනාධිපතිතුමාත් එක්ක විසඳා ගන්න. පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපෙන් ඒකට උත්තර අහන්න එපා. මොකද, ඒක නැවැත්තුවේ ජනාධිපතිතුමා නේ. අපි කවුරුවත් ඒක නැවැත්තුවේ නැහැ නේ. එහෙම නම්, ජනාධිපතිතුමා තමයි ඒකට උත්තරය දෙන්න ඕනෑ. අපි කවුරුවත් ඒකට උත්තර දීලා වැඩක් නැහැ. මොකද, ජනාධිපතිතුමා තමයි මැද්දට පැනලා "මේක ක්‍රියාත්මක කරන්න එපා, අවුරුද්දකින් කල් දාමු" කියලා කිව්වේ. ඒ, එතුමාට විශ්වාසයක් නැති හින්දා. එතුමාට විශ්වාසයක් ඇති කරලා වැඩේ කරන්න. අපට ප්‍රශ්නයක් නැහැ. ජනාධිපතිතුමාගේ හිතේ විශ්වාසය ඇති කරලා ඒක කරන්න. එතුමාට විශ්වාසයක් නැති හින්දා නේ ඒක නැවැත්තුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊළඟට කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ විශේෂ දෙයක් ගැනයි. අපි සියලුදෙනාම දන්නවා, මේ රටේ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාර සිද්ධිය සුවිශේෂ සිද්ධියක් බව; හදිසි නීතියත් එක්ක ගැටගහලා තිබෙන සිද්ධියක් බව. ඒ බෝම්බ ප්‍රහාර සිද්ධිය පිළිබඳව සොයන එක ගැන අපි සියලුදෙනාම උනන්දුවෙන් බලාගෙන ඉන්නවා. ඒ වාගේම තමයි, ඒ බෝම්බ ප්‍රහාර සිද්ධිය ගැන සෙවීමේ කටයුතු සාධාරණ වෙන්න ඕනෑ, සාධාරණ නඩු විභාගයක් පවත්වන්න ඕනෑ, වින්දිතයන්ට සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. එහෙම වෙයි කියලා අපි සියලුදෙනාම බලාපොරොත්තු වෙනවා. ඒ හින්දා මේක ඉතාම සංකීර්ණ නඩුවක් කියලාත් අපි ඔක්කෝම දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සැකකරුවන්ට විරුද්ධව චෝදනා 23,269ක් ගොනු කරලා තිබෙනවා. ඊළඟට, සාක්ෂිකරුවන් 2,190ක් ඉන්නවා, විත්තිකරුවන් 24දෙනෙක් ඉන්නවා. දැන් ඒ නඩුව අහන්න පටන් අරගෙන තිබෙනවා. අපි ඔක්කෝම පිළිගන්නවා, මහ මොළකාරයෙක් ඉන්නවා කියලා. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න කොටත් කිව්වා, ඒ ප්‍රහාරයේ මහ මොළකාරයෙක් ඉන්නවා කියලා. අපිත් කිව්වා, මහ මොළකාරයෙක් ඉන්නවා කියලා. නමුත්, ඒ නඩුවට තවමත් මහ මොළකාරයෙක් නැහැ. මහ මොළකාරයා නැතුව තමයි දැන් නඩුව අහන්න පටන් අරගෙන තිබෙන්නේ. සාධාරණ නඩු විභාගයක් පැවැත්වීමේ වගකීම අධිකරණයටත්, රජයටත් පැවරී තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා රජය බැඳිලා ඉන්නවා, සාධාරණ නඩු විභාගයක් ලබා දෙන්න. ඒ හින්දා, වින්දිතයන්ට සාධාරණය ඉටු වෙන්න ඕනෑ වාගේම, එම සිද්ධිය පිටුපස ඉන්න ඇත්ත මහ මොළකරුවන්ටත් දඬුවම් ලැබෙන්න ඕනෑ; ඔවුනුත් සොයා ගන්න ඕනෑ. නමුත්, දැන් සාධාරණ නඩු විභාගයක් වෙනවාද කියන ප්‍රශ්නාර්ථය නැඟෙන බව දැන් අපට පෙනෙනවා. ඇයි, මා එහෙම කියන්නේ? ඒ නඩුව හැම දවසකම අහන්න පටන් අරගෙන තිබෙනවා, උදේ 9.30 ඉඳලා සවස 4.00 වනකල්. ඒ විධියට මේ නඩුව විභාග කිරීමට තීරණය කරලා තිබෙනවා. මහ මොළකරුවා නැතුවත් දැන් ඒ නඩුව අහන්න පටන් අරගෙන තිබෙනවා.

පොලීසිය භාර ඇමතිතුමා කිව්වා, මහ මොළකරුවා හඳුනාගත්තා කියලා. අපේ ආණ්ඩුව කාලයේ හිටපු DIG මහත්මයා, දැන් නීතිය හා සාමය අමාත්‍යාංශයේ ලේකම් රවී සෙනෙවිරත්න මහත්මයා කිව්වා, මහ මොළකරුවා ගැන කොමිසමට ලියා දුන්නා කියලා. එහෙම නම්, කෝ ඒ මහ මොළකරු? ඇයි, ඒ මහ මොළකරු අත්අඩංගුවට ගන්නේ නැත්තේ? මහ මොළකරු නැතුව තමයි මේ නඩුව ඉදිරියට යන්නේ. එහෙම නම් අපට තිබෙනවා තවත් පොඩි සැකයක්. ඒක තමයි, ඒ මහ මොළකරුවා අල්ලා ගන්න බැරි හින්දා අප්‍රේල් 21වැනි දාට කලින් මේ නඩුව අවසන් කරන්න හදනවාද කියන එක. ඒ හින්දාද, හැමදාම මේ නඩුව අහන්න යන්නේ? හැමදාම නඩුව අහලා, අප්‍රේල් 21වැනිදාට කලින් තීන්දුව දීලා, ඒ මහ මොළකරුවා කවුද කියන එක යටපත් කර ගැනීමේ වුවමනාවකින්ද මේ විධියට වැඩ කරන්නේ කියන සැකය මතු වෙලා තිබෙනවා.

මේකට හදිසි ඇයි? ඇයි, මේ තරම් හදිසි? අපි දන්නවා, හැමදාම නඩු අහන කොට ඒක ප්‍රායෝගික නැති බව. මොකද, සාක්ෂිකාරයෝ 2,190ක් ඉන්නවා. චෝදනා 23,000 ගණනක් තිබෙනවා. ඒ හින්දා ඒක ප්‍රායෝගික නැහැ කියලා අපි ඔක්කෝම දන්නවා. නීතිඥ මහත්වරු දන්නවා, ඒක ප්‍රායෝගික නැහැ කියලා. මොකද, නීතිඥ මහත්වරුන්ට වෙන වෙන නඩු තිබෙනවා. ඒ ගොල්ලෝ ඒ අනෙක් නඩුවලටත් යන්න ඕනෑ. ඒ ගොල්ලන්ගේ පෞද්ගලික කටයුතු තිබෙනවා, ඒ ගොල්ලන්ගේ පවුල්වල කටයුතු තිබෙනවා. ඒ හින්දා ඒ ගොල්ලන්ට හැමදාම ඇවිල්ලා මේ නඩුවට පෙනී ඉන්න බැහැ. ඒ නිසා ඒ ගොල්ලෝ කිව්වා, සතියකට දවස් 3ක් නඩුව අහන්න කියලා. උසාවියේ විනිශ්චයකරුවන් කිව්වා, "බැහැ, එහෙම කරන්න බැහැ, අපි හැමදාම නඩු අහනවා" කියලා. එතකොට, ඒ නීතිඥ මහත්වරු ඔක්කෝම ඉල්ලා අස් වෙලා තිබෙනවා. කවුද, ඒ නීතිඥ මහත්වරු? ඒ අය ජ්‍යෙෂ්ඨ නීතිඥයින්. කේ.එස්. රත්නවේල්, එච්. ගසාලි හුසේන්, රුෂ්ඩි හබීබ් සහ නිරන්ජන් සිරිවර්ධන යන ජ්‍යෙෂ්ඨ නීතිඥ මහත්වරු "අපට හැමදාම පෙනී ඉන්න බැහැ"

කියලා මේ නඩුවෙන් අයින් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාක්ෂිකරුවන් 2,190ක් සිටින මේ සංකීර්ණ නඩුව දිනපතා අහලා කොහොමද උත්තර බඳින්නේ කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ සඳහා කාලයක් අවශ්‍ය වෙනවා. නීතිඥවරුන්ට සාක්ෂි ආඥාපනත කියවන්න ඕනෑ, අපරාධ නඩු විධාන සංග්‍රහය කියවන්න ඕනෑ, ඒ වාගේම දත්ත එකතු කරන්න ඕනෑ, කරුණු එකතු කරන්න ඕනෑ. හැමදාම නඩුව ඇහුවාම ඒ හැම දෙයක්ම කරන්න පුළුවන්ද? එහෙම කරන්න බැහැ. ඒ හින්දා තමයි නීතිඥ මහත්වරු අයින් වුණේ.

අපි දන්නවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (3) ව්‍යවස්ථාවේ තිබෙනවා, සාධාරණ නඩු විභාගයක් ලබා ගැනීමට අයිතිය තිබෙනවා කියලා. නමුත්, අද වනකොට ඒ අයිතිය පැහැරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 40වන වගන්තියෙන් සහතික කරලා තිබෙනවා, නීතිඥ නියෝජනය ලබා ගැනීම. නඩු විභාගයේදී තමන් කැමැති නීතිඥවරයා ලබා ගන්න අයිතිය තිබෙනවා. මේ තීන්දුව නිසා තමන් කැමති නීතිඥවරයා ලබා ගන්න අද බැරි වෙලා තිබෙනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් ඒ lawyersලා කියනවා, හැමදාම උසාවි එන්න බැහැ කියලා. එම නිසා, සාධාරණ නඩු විභාගයක් සඳහා වූ ඒ නිමිත්ත අද වෙනකොට අහිමි කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, සාමාන්‍යයෙන් උසාවිය තුළ නීතිඥවරුන්ගේ - lawyersලාගේ - පහසු ක්‍රියා පටිපාටියක් තිබෙන බව. විනිශ්චයකාරවරු නඩුවට දිනයක් දෙන කොට, ඒ විනිශ්චයකාරතුමා නීතිඥ මහත්මයාගෙන් අහනවා, මෙදාට නඩුව දැම්මාට කමක් නැද්ද කියලා. එවැනි එකඟතාවකින් තමයි උසාවියේ කටයුතු ඉදිරියට යන්නේ. එහෙම ක්‍රියා පටිපාටියක් තිබෙනවා. අද වනකොට මේ සියලු ක්‍රියා පටිපාටි බිඳ හෙළා තිබෙනවා. ඒ නිසා අපට අහන්න වෙන්නේ, "මේ නඩුව අහන්නේ කැලෑ උසාවියකද?" කියලායි. ඊළඟට, සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න කරන්න සූදානම් වෙන්න ඕනෑ. එතකොට, ඒ සඳහාත් යම් කාලයක් අවශ්‍ය වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත්, කාගේ හෝ වුවමනාවකට මේ නඩුව ඉක්මනින් අහලා තීන්දුව ලබා දීලා මහ මොළකරුවා බේරා ගැනීමේ project එකක් තිබෙනවාද කියන සැකය දැන් මතු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුක්තිය කියන්නේ, යුක්තිය ඉෂ්ට කිරීම පමණක්ම නොවෙයි. යුක්තිය ඉෂ්ට වෙනවා කියන එක පෙනෙන්න ඕනෑ. නමුත් අපි දන්නවා, මේ නඩුව අහන්නේ අලුත්කඩේ උසාවියේ නොවෙයි කියලා. මේ නඩුව අහන්නේ ඇමතිවරයෙකුගේ ගෙදරක, Buller's Road එකේ. ඒ ගෙදර දොරවල් වහලා, නෑදෑයින්ට යන්න නොදී, මාධ්‍යකරුවන්ට යන්න නොදී, කාටවත් එතැනට යන්න නොදී තමයි නඩුව අහන්නේ. එහෙම කොහොමද උසාවි පවත්වාගෙන යන්නේ? එහෙම නඩු අහන්න පුළුවන්ද? මාධ්‍යකරුවන්ට යන්න දෙන්නේ නැහැ. නෑදෑයින්ට යන්න දෙන්නේ නැහැ. දොරවල් ඔක්කොම වහලා. පිටස්තරයින් කාටවත් ඇතුළු වෙන්න දෙන්නේ නැහැ. අපි දන්නවා, විවෘත අධිකරණයේදී තමයි නීතියේ මූලික සිද්ධාන්තය ආරක්ෂා වෙන්නේ කියලා. වහගෙන කොහොමද නීතියේ මූලික සිද්ධාන්තය ආරක්ෂා වෙන්නේ? අපි ඔක්කොම අහලා තිබෙන දේ තමයි, විවෘත අධිකරණයේදී නඩු අහන්න ඕනෑ කියන එක. පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය සම්බන්ධ නඩුව අපි සියලු දෙනාටම වැදගත් නඩුවක්. මේ වාගේ නඩුවක් කාමර වහලා, උසාවි වහලා අහන්න පුළුවන්ද? හරි නම් මේ නඩුව අහන එක රූපවාහිනියේ සජීවීව දෙන්න ඕනෑ. මොකද, මේ රටේ මිනිස්සු ඔක්කොම දැනගන්න ඕනෑ, මේ නඩුවේ තිබෙන කරුණු; මේ රටේ වසන් කර ගත්ත කරුණු. ඒවා හෙළිදරව් වෙනකොට මේ රටේ ජනතාව ඒ ගැන දැනුවත් වෙන්න ඕනෑ. නමුත් අපට පෙනෙනවා, එහෙම තත්ත්වයක් අද වනකොට උදා වෙලා නැති බව. මේක හංගන්නේ ඇයි, මේක හංගලා අහන්නේ ඇයි, කාගේ වුවමනාවටද මේක හංගන්නේ කියන ප්‍රශ්න මතු වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම මීට කලින් තිබුණු චන්ද්‍රිකා ඝාතනයට තැත් කිරීමේ නඩුව, දළදා මාලිගාවට බෝම්බ ගහපු නඩුව, මහ බැංකුවට බෝම්බ ගහපු නඩුව, උඩතලවින්න ඝාතන නඩුව කියන නඩු මෙහෙම හදිසියේ ඇහුවේ නැහැ. ඒවාට කාලයක් දුන්නා. ඊළඟට, සරත් අඹේපිටිය නඩුව, කෑගල්ලේ බුදු පිළිමවලට ප්‍රහාර එල්ල කළ නඩුව, ක්‍රිෂාන්ති කුමාරස්වාමි නඩුව ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් ඇහුවේ. කාලයක් දුන්නා, ඒ නඩු අහන්න. කාලයක් දීලා තමයි ඒ නඩු අහගෙන ගියේ. මෙහෙම හැම දාම නඩු ඇහුවේ නැහැ. එහෙම නම් මේ නඩුව විතරක් හැමදාම අහලා ඉක්මනට තීන්දුව දෙන්න එච්චර උනන්දු වෙන්නේ ඇයි? ඒක තමයි තිබෙන සැකය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මහාධිකරණයේ විනිශ්චය මඩුල්ල දැන්වීමක් දාලා තිබෙනවා. මොකක්ද ඒගොල්ලන් දාලා තිබෙන දැන්වීම? මොකක්ද ඒගොල්ලන් කියන්නේ? ඒගොල්ලන් කියනවා, junior attorneysලාටත් ඇවිත් මේ නඩුවට පෙනී සිටින්න කියලා. පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය වාගේ නඩුවක් junior attorneysලා පුරුදු වෙන්න අහන නඩුවක්ද? මගේ ළඟ මේ තිබෙන්නේ මහාධිකරණයේ විනිශ්චය මඩුල්ල දාලා තිබෙන notice එක. මම මේ notice එක **සභාගත*** කරනවා.

මොකක්ද මේ කරන විහිළුව? Junior attorneysලාට පාස්කු බෝම්බ ප්‍රහාරය වාගේ නඩුවකට පෙනී සිටින්න පුළුවන්ද? මොකක්ද මේ කරන විහිළුව? එතකොට කෝ, මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය? නඩුවක් සාධාරණව අහනවා කියලා ඇති වන හැඟීම කෝ? ඒ හැම දෙයක්ම අද වෙනකොට අහිමි කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නඩුව manipulate කළා කියලා අපි දන්නවා. එදා ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුව කාලයේ හිටපු අය නීතිපති දෙපාර්තමේන්තුවට ගිහිල්ලා ඒගොල්ලන්ට අවශ්‍ය සැකකරුවන් ටික manipulate කරලා දැම්මා; සාක්ෂිකරුවන් ටික manipulate කළා. රොහාන් ගුණරත්න තවම පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයේ පළමුවැනි සාක්ෂිකාරයා. දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඇවිල්ලා තිබෙන්නේ. රොහාන් ගුණරත්නට මේ නඩුවට තිබෙන සම්බන්ධය මොකක්ද? කිසිම සම්බන්ධයක් නැහැ. ගෝඨාභය ගෙනාවා, ඔහු මේ නඩුවේ පළමුවැනි සාක්ෂිකාරයා හැටියට. සලේ දෙවැනි සාක්ෂිකාරයා. තමුන්නාන්සේලා විශ්වාස කරපු, දැන් CID එකේ ඉන්න අය කිව්වා, මහ මොළකාරයා සලේ කියලා. සලේ දෙවැනි සාක්ෂිකාරයා. ඇයි, ඒවා වෙනස් කරන්නේ නැත්තේ? ඇයි manipulate කරපු ඒවාම නැවත ගෙනියන්නේ? මේක manipulate කළා. කවුද manipulate කළේ? එදා ගෝඨාභයගේ කාලයේ සලේ නීතිපති දෙපාර්තමේන්තුවට ගිහින් manipulate කළා. ඒ manipulate කරපු සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවට අනුව තමයි දැන් මේ ආණ්ඩුවත් ඇවිල්ලා නඩුව අහන්න යන්නේ. රොහාන් ගුණරත්න පළමුවැනි සාක්ෂිකාරයා. ඔහුට කිසිම සම්බන්ධයක් නැහැ, පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයට. ඔහු සල්ලිවලට ලියන මනුස්සයෙක්. වැරදියට ලියලා එදා කැනඩාවෙන් ඩොලර් 50,000ක දඩයක් ඔහුට ගැහුවා, බොරු

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මුජිබුර් රහුමාන් මහතා ]

කිව්වා කියලා. එහෙම කෙනෙක්ව පළමුවැනි සාක්ෂිකාරයා කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපට තිබෙන සැකය තමයි, ඇයි මේක වහන්න හදන්නේ කියන එක. මේක වහන්නේ කාගේ වුවමනාවටද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මේ කාරණයත් කියා මගේ කථාව අවසාන කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් මේ මහ මොළකාරයා කෝ? අපි අහනවා, මහ මොළකාරයා කෝ කියලා. මහ මොළකාරයා හඳුනා ගත්තා කියලා කිව්වා. කෝ, ඒ මහ මොළකාරයා? රවි සෙනෙවිරත්න මැතිතුමා අද මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා. ඔහු පාස්කු කොමිසමට ලියලා දුන්නා, මෙයා තමයි මහ මොළකරු කියලා. එහෙම නම් රවි දන්නවා, මහ මොළකරු කවුද කියලා. ඇයි, රවි නිශ්ශබ්ද? රවි සෙනෙවිරත්න මැතිතුමනි, ඔබතුමා නිශ්ශබ්ද ඇයි? ඔබතුමා අපිත් එක්ක කියපු හුඟක් දේවල් තිබෙනවා, විපක්ෂයේ අපිත් එක්ක ඉන්නකොට. එදා ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුව කාලයේ එතුමාට අසාධාරණකම් කරනකොට සමගි ජන බලවේගයේ අපි තමයි මේ පාර්ලිමේන්තුවේ ඒවා ගැන කථා කළේ. වෙන කවුද කථා කළේ? අනුර කුමාර කථා කළාද? අනුර කුමාර කථා කළේ නැහැ. අනුර කුමාර කථා කළේ නැත්තේ එතකොට පොලිස් ඇමති ටිරාන් අලස් නිසායි. එතුමාට බැරි වුණා, ටිරාන් අලස්ට විරුද්ධව කථා කරන්න. ඒ නිසා එතුමා නිශ්ශබ්දව හිටියා. ඔහු එතුමාගේ හොඳම ව්‍යාපාරික partner. නමුත්, එතුමා රවි සෙනෙවිරත්න ගැන කථා කළේ නැහැ. නමුත්, අපි එතුමා ගැන කථා කළා. අද රවි සෙනෙවිරත්න කට වහගෙන ඉන්නවා. අපි රවි සෙනෙවිරත්න මැතිතුමාට කියනවා, ඔබතුමා මහ මොළකරු දන්නවා, ඇයි, මහ මොළකරුව අත්අඩංගුවට ගන්න ප්‍රමාද කියලා. ඇයි, මහ මොළකරුව අත්අඩංගුවට ගන්නේ නැත්තේ? ඇයි, මහ මොළකරු නැතුව මේ නඩුව ගෙනයන්න ඉක්මන් වෙන්නේ? කැලෑ උසාවියක වාගේ නඩු අහලා, ඉක්මනට මේ තීන්දුව ලබා දීලා ඔබතුමන්ලා බලාපොරොත්තු වන්නේ ඒ මහ මොළකරුවා නැතුව මේක යටපත් කරන්නද? ජනාධිපතිතුමා කියනවා නේ, කාලයේ වැලි තලාවෙන් පාස්කු බෝම්බ ප්‍රහාරයේ මහ මොළකරුවන් යට ගහන්න දෙන්නේ නැහැ කියලා. ඒ හින්දා ජනාධිපතිතුමාට අපි මේ කාරණය කියනවා. ගරු ජනාධිපතිතුමනි, පාස්කු බෝම්බ ප්‍රහාරයේ මහ මොළකරුවන්ව කාලයේ වැලි තලාවෙන් යට ගහන්න දෙන්නේ නැහැ කියලා ඔබතුමා දිගින් දිගටම කිව්වා. අපිට පෙනෙනවා, අද වෙනකොට ඔබතුමාගේ ආණ්ඩුව යටතේ මේ නඩු විභාග වෙන්න පටන් අරගෙන තිබෙන බව. නමුත්, එහි මහ මොළකරු අත්අඩංගුවට ගත්තේ නැහැ; අවශ්‍ය පුද්ගලයෝ අත්අඩංගුවට ගත්තේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඒගොල්ලන් නිදහසේ ඉන්න හින්දා හොඳට මතක තියා ගන්න, ඔය deep state කියන එක තවම වැඩ කරනවා කියලා. මේ කථා කරන අපේ ජීවිතවලටත් අනතුරු වෙන්න පුළුවන්. අපේ ජීවිතවලටත් මෙහි අනතුරුදායක තත්ත්වයක් තිබෙනවා. අපි මේ කථා කරන්නේ විහිළු නොවෙයි. මේ රටේ ජනතාවට සාධාරණත්වය සහ යුක්තිය ඉෂ්ට වෙන්න ඕනෑ කියන එක ගැනයි අපි කථා කරන්නේ. ඒ යුක්තිය සහ සාධාරණත්වය ඉෂ්ට වෙන්න ඕනෑ හින්දා තමයි මේ තරම් ප්‍රශ්න තිබියදීත් අපිත් නිර්භීතව ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ පෙනී සිටින්නේ. ඒ හින්දා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා.

අද පාර්ලිමේන්තුවේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා. මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්න ආණ්ඩුවෙන් අපි ඉල්ලා සිටිනවා, ඒ හින්දා වහාම පාස්කු බෝම්බ ප්‍රහාරයේ මහ මොළකරුවා මේ නඩුවට ඉදිරිපත් කරලා විවෘත අධිකරණයේ සාධාරණ නඩු විභාගයක් පැවැත්වීම සඳහා අවශ්‍ය පරිසරය සකස් කරලා දෙන්න කියලා. ඒ බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. SPEAKER took the Chair.*

[අ.භා. 5.25]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, අපේ විදේශ කටයුතු ඇමතිතුමා කියනවා, මූලාසනය උතුරු මැද පළාතටම ගිහිල්ලා කියලා. ගරු ජනාධිපතිතුමා 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ 2026 ජනවාරි මස 28වැනි දා නිකුත් කරන ලද ගැසට් පත්‍රයෙහි මෙසේ සඳහන් වෙනවා:

"…. 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව මෙම නිවේදනය මගින් පහත උපලේඛනයෙහි සඳහන් වන සේවාවන් සැපයීමෙහි නිරත වන ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමූපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන සේවාවන් දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වී ඇති පසු ආපදා තත්ත්වය සලකා සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වන බව සහ එකී සේවාවන්ට අවහිරයක් හෝ බාධාවක් විය හැකි බව සැලකිල්ලට ගනිමින් ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමූපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන පහත උපලේඛනයේ සඳහන් සේවාවන් පූර්වෝක්ත වගන්තියෙහි කාර්යයන් සඳහා අත්‍යවශ්‍ය සේවාවන් බවට මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි."

එහි උපලේඛනයේත් සඳහන් කර තිබෙනවා, විදුලි බලය සැපයීම සම්බන්ධව සියලු සේවාවල සිට කෘෂි සහ කෘෂි රක්ෂණ සේවා සම්බන්ධ සියලු සේවා, වාරිමාර්ග සම්බන්ධ සියලු සේවාවන්, දුරකථන, විදුලි සන්දේශ සහ මාධ්‍ය සම්බන්ධ සියලු සේවාවන්, පහත්බිම් ගොඩකිරීම සහ සංවර්ධනය කිරීම සම්බන්ධ සියලු සේවාවන්, ගිලන් රථ සේවාවන්, ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළුව සියලුම රාජ්‍ය බැංකු හා රක්ෂණ සේවා කටයුතු ඇතුළු තවත් සේවාවන්.

ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමාගේ ප්‍රකාශයේම සඳහන් කර තිබෙනවා, "දිට්වා" සුළි කුණාටුව නිසා බිඳ වැටුණු සේවාවන් ලංකාවේ ලබා ගන්න පුළුවන් කොහෙන්ද කියන එක සහ ඒ ඕනෑම තැනකින් ඒවා ලබා ගෙන "දිට්වා" සුළි කුණාටුව වෙනුවෙන් ඒ සේවා සැපයීම සඳහා තමයි මේ බලතල යොදා ගන්නේ කියන එක. හදිසි නීතිය ප්‍රකාශ කරන්නේ නැතුව ඒවා කරන්න බැහැ. එක්කෝ විපක්ෂය කියන්න ඕනෑ, මේ සේවා සපයන්න මේ නීතිය නැතුව වෙන නීතියක් තිබෙනවාද කියලා. ඒ නිසා අපිට ඒ ගැන තර්ක කරන්න දෙයක් නැහැ. ඉතාම පැහැදිලිව ගත්තාම, මෙහි අරමුණ විධියටම සඳහන් කර තිබෙනවා, " 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් ඇති වී ඇති පසු ආපදා තත්ත්වය සලකා ...." යනුවෙන්. කුණාටුව තිබුණේ දවස් දෙකයි. පසු ආපදා තත්ත්වය අඩු ගණනේ අවුරුදු දෙකක්වත් තිබෙනවා. අපි අදත් උදේ වරුවේ මහනුවර දිස්ත්‍රික්කයෙන් පටන් ගත්තා, වැඩිම වශයෙන් ආපදාවට ලක් වෙච්ච ප්‍රදේශවල ජනතාවට නිවාස හදලා දීම. කුණ්ඩසාලේ, ඊළඟට ජනාධිපතිතුමා හවස ගලගෙදර; අලුතෙන්ම නිවාස හදලා දීලා, ගම්මාන පිටින් ගෙනැල්ලා අලුත්ම ඉඩම්වල පදිංචි කිරීම, මේ ආදී වශයෙන් කටයුතු කරනවා. ඒ නිසා හදිසි නීතිය සම්බන්ධව ආණ්ඩුවේ ස්ථාවරය හරිම පැහැදිලියි. ඒක පාවිච්චි කරන්නේ ආපදා තත්ත්වය සඳහා පමණයි. ඒ හැරුණු විට වෙන කිසිම නීතියක් නැහැ මේක කරන්න.

ගරු කථානායකතුමනි, අනෙක් කාරණය මේකයි. දැන් අපේ වාර්තා අනුව අපි කියනවා, රුපියල් 25,000 දීලා තිබෙනවා සියයට 90කට; රුපියල් 50,000 දීලා තිබෙනවා සියයට 80කට; පාසල් දරුවන්ට දෙන රුපියල් 15,000 දීලා තිබෙනවා මෙච්චර ප්‍රමාණයකට කියලා. එතකොට දැන් අපට වුණත් හිතෙන දේ තමයි ඉතිරි සියයට 10ත් සම්පූර්ණ වෙන්න ඕනෑ කියන එක; ඉතිරි සියයට 15-20ත් සම්පූර්ණ වෙන්න ඕනෑය කියන එක. නමුත් ඔබතුමාත් දන්නවා, ඒ සියයට 10 හරි 15 හරි දෙන්න බැරි වෙන්නත් බොහෝ දුරට හේතු වෙලා තිබෙන්නේ මොකක්ද කියලා. මොකද, මේ අයදුම් කරපු ඔක්කෝටම දෙනවාය කියලා කරන්න බැහැ නේ, ලෝකයේ කිසිම රටක. යම් කිසි අධීක්ෂණයක් කරලා තමයි දෙන්න ඕනෑ. මේ දෙන්නේ, රටේ මහජන මුදල්. වෙන කවදාවත් නැති තරම් දුන්නා වුණත් ඒ දෙන්න වෙන්නේ වගකීමක් ඇතුව. ගරු කථානායකතුමනි, ඒ නිසා සියයට 10ක් හරි 12ක් හරි 15ක් හරි දෙන්න බැරි වුණාය කියන එකේ අර්ථය අකාර්යක්ෂමතාව හෝ අකමැතියි කියන එක නොවෙයි. සමහර ප්‍රාදේශීය ලේකම්තුමන්ලාගෙන්, සමහර ග්‍රාම නිලධාරිතුමන්ලාගෙන් අපි ඇහුවාම එතුමන්ලා කියන්නේ මොකක්ද? සමහර ඒවා ඇත්තටම දෙන්න වෙන්නේ නැහැ කියන එක. ඔබතුමාත් දකින්න ඇති, Mannarවල එක ග්‍රාම නිලධාරි මහත්මයෙක් කියනවා, වෙසක් දන්සැල වාගේ බෙදනවාය කියලා. වෙසක් දන්සල වාගේ බෙදලාත් තවම ඉවර නැහැ කියලා කිව්වා, ලැබුණු applications ප්‍රමාණයට ගෙවලා. ඒ නිසා මේ සියයට 80 හරි සියයට 85 හරි වෙලා තිබෙන්නේ අපේ අකමැත්ත නිසා නොවෙයි. සමහර අය සුදුසුකම් ලබන්නේ නැහැ. ඉතින් ඒ නිසා කුමන හෝ දෙයක් සම්බන්ධව කුමන හෝ විවේචනයක් කිරීම නම් එකම අරමුණ, ඒකට අපට කරන්න දෙයක් නැහැ. ඒක ඉතින් අර දේශපාලන කුහකත්වය මිසක් වෙනත් දෙයක් නොවෙයි.

ඔබතුමාත් දන්නවා, ළඟදී සමාජ විද්‍යාඥයන්ගේ සංගමය "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ ආණ්ඩුවේ ආපදා සහන කටයුතු පිළිබඳව දිස්ත්‍රික්ක 25හිම පුළුල් සමීක්ෂණයක් කළ බව. ඒක පුවත්පත්වලත් පළ කරලා තිබුණා. ඒක online තිබෙනවා, ඕනෑ කෙනෙකුට ගන්න පුළුවන්. මොකක්ද, ඒ සමාජ විද්‍යාඥයන්ගේ සංගමයේ වාර්තාවේ තිබෙන්නේ? සමාජ විද්‍යාඥයන්ගේ සංගමයේ වාර්තාවෙන්, එක එක කරුණු මත ප්‍රතිචාර දැක්වූවේ කොහොමද, සහනාධාර දුන්නේ කොහොමද යනාදිය සම්බන්ධව ඉතා පැහැදිලිව පෙන්වා දී තිබෙනවා. ඒ අනුව සමස්තයක් වශයෙන් ගත්තාට පස්සේ සමහර අංශ ඉතාම ප්‍රශස්ත මට්ටමකත්, සමහර අංශ ප්‍රශස්ත මට්ටමකත් තමයි තිබෙන්නේ. ඉතින් ඒ නිසා අපි දෙයක් පිළිගන්න ඕනෑ කොහොමද? යම් කිසි ඇත්තක් පිළිගන්න ඕනෑත් කරුණු මත; වැරැද්දක් පිළිගන්න ඕනෑත් කරුණු මත. ගරු කථානායකතුමනි, අපි සත්‍යයට යන්න ඕනෑ කරුණු තුළින්.

ඩෙං ෂියාඕපිංගේ කාලයටත් කලින් ඉඳලා චීනයේ තිබෙන ප්‍රසිද්ධ කියමනක් තිබෙනවා. එතුමා නිසා තමයි ඒක ප්‍රසිද්ධ වුණේ. ඒ මොකක්ද? "සත්‍යය වෙත කරුණු තුළින් යන්න" - "Seek truth from facts" - කියන එක. ඒ සමාජ විද්‍යාඥයන්ගේ සංගමයේ සමීක්ෂණයේ විපක්ෂය සම්බන්ධව තිබුණේ මොකක්ද? සුළි කුණාටුව කාලයේදී විපක්ෂයේ කාර්යභාරය පිළිබඳව ජනතාවගෙන් සියයට 24යි යම් කිසි ප්‍රසාද මට්ටමක ඉන්නේ. සියයට 76කටම ඒ ගැන ප්‍රසාදයක් නැහැ. පාර්ලිමේන්තුව තිබෙනවා. මේකේ මයික් තිබෙනවා. ඉතින් ඕනෑ දෙයක් කියන්න පුළුවන්. මොකද, නඩු යන්නේ නැහැ. මෙතැන මේ සර්කස් එක දිනුවාට වැඩක් නැහැ. මොකද, එළියේ තමයි ඇත්ත මැච් එක තිබෙන්නේ. ඒ සමීක්ෂණය අනුව සියයට 24කගේ විතරයි ප්‍රසාදයක් තිබෙන්නේ. සියයට 76කගේ අප්‍රසාදයට ලක් වෙලා ඉන්නවා. ඒ නිසා අපට අපේ හෘදය සාක්ෂියත්, අපේ භාවිතාවත් මිනිසුන්ගේ මුහුණුවලිනුත්, මිනිසුන්ගේ ජීවිතවලිනුත් තේරෙනවා. අද මේ පාර්ලිමේන්තුවේ, ප්‍රාදේශීය සභාවල සිටින තරුණ, අලුත් මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන්, ඒ වාගේම මන්ත්‍රීකම් නැති අයත් කොයි තරම් නම් කැප වෙනවාද කියන එක අපි දන්නවා.

ගරු කථානායකතුමනි, ඇත්තටම මේ රට සතුව තිබෙන මේ ශක්තිය, මේ වටිනාකම ලෝකයට කියන්නේ නැත්තේ ඇයි කියන එක ලොකු ප්‍රශ්නයක්. අපිට දේශපාලන වාසියක් නැහැ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ Resident Coordinator මාර්ක්-ඇන්ඩ්‍රේ ෆ්‍රැන්චේ මහතා මීට මාසයකට විතර කලින් "X" ගිණුමේ හෝ මාධ්‍යයට ප්‍රසිද්ධියේ කර තිබුණු ප්‍රකාශයක් මම දැක්කා. ඒ මොකක්ද? එතුමා කියා තිබුණා, සමහර විට එතුමාගේ රටටත් වඩා මේ ආපදා සහන කටයුතු ලංකාවේ කෙරුණා කියලා. සමාජ විද්‍යාඥයන්ගේ සංගමයෙන් කියනවා, එක්සත් ජාතීන් කියනවා. ලෝකයේ ගොඩක් රටවල නායක නායිකාවන් කියනවා. කියන්න බැරි වෙලා තිබෙන්නේ කාටද? අපි පිළිගන්න ඕනෑ මේ අය කියන දෙයද, අර අය කියන දෙයද? ඒකයි මම කියන්නේ. දැන් බොරු

[ගරු බිමල් රත්නායක මහතා]

කියලා අපිව වට්ටන්න හිතනවා නම්, මේ වාගේ කරුණු කියලා අපිව වට්ටන්න හිතනවා නම්, අපි වැටෙන්නේ නැහැ කියන එකයි අපට කියන්න තිබෙන්නේ. අපිව වට්ටන්න නම්, ඔයගොල්ලන් මුලින්ම වට්ට ගන්න ඕනෑ ජනතාවයි. ඔයගොල්ලන් හිතනවා, ජනතාවට බොරු තොගයක් කීම හරහා, අතිවිශාල බොරු තොගයක් පැතිරවීම හරහා ජනතාව ඔයගොල්ලන්ට හසු වෙයි කියලා.

තව සිදුවීමක් මම දැක්කා. ඒ, රාජාංගනයේද, කොහේද කියලා මට හරියට මතක නැහැ. කොහොම හරි, ඒ පැත්තේ වෙච්ච දෙයක්. ජනාධිපතිතුමා දුන් චෙක් එකක් return වෙලා කියලා කිව්වා. එතකොට ඉතින් විපක්ෂයේ - සජබයේ, පොහොට්ටුවේ - සිටින අයට මාර තොවිලේ. පුදුම ආශාවක්. ලංකාව World Cup එක දිනුවාටත් වඩා ඒ අයට සතුටුයි, අර චෙක් එක return වෙච්ච එක ගැන. එහෙම තමයි ඒගොල්ලන්ගේ සතුට තිබුණේ. ඒගොල්ලන් හිතුවා, දැන් බඩු හරි; දැන් සතියක් මේකෙන් යන්න පුළුවන් කියලා. නමුත් මොකක්ද වුණේ? දැන් චෙක් කීයක් return වෙලාද? අරගෙන එන්නකෝ ඒ චෙක්. අරගෙන ඇවිත් ඒවා හැන්සාඩගත කරන්නකෝ. පාර්ලිමේන්තුවේ හැන්සාඩගත කරන්න පුළුවන් නේ. මම ඕනෑම කෙනෙකුට අභියෝග කරනවා, return වෙච්ච චෙක් හැන්සාඩගත කරන්න කියලා. ඉතින් නානවා. දැන් ආයෙත් ගමට යන්න බැහැ නේ. මොකද, මම දැක්කා ඒ අම්මා voice-cut එකක් දීලා තිබුණා, "මාව අල්ලාගෙන නිකම් voice-cut එකක් ගත්තා" කියලා. ගරු කථානායකතුමනි, අපි කථා කරන්නේ එක පැත්තකින් shock වෙච්ච මිනිස්සු එක්ක. අනෙක් පැත්තෙන්, අපි කවුරුත් මේ චෙක් සහ අරවා මේවා ගැන සියයට 100ක් දන්නේ නැහැ. දෙන උපදෙස් ඔක්කෝම මතක තියා ගන්න බැහැ, මිනිස්සුන්ට. ඒ මනුස්සයාත් ඒ චෙක් එක bank කරන්න ගිහින්. හැබැයි, අනුරාධපුරය ඇතුළු මුළු ලංකාවේම එම ආපදාවට මුහුණ දුන් දිස්ත්‍රික්කවල දිසාපතිවරුන්ට කියා තිබෙනවා, එම චෙක් deposit කරන්න කලින් තමන් සතුව ඉඩමක් තිබෙනවාද කියලා ඒ ජනතාව පෙන්වන්න ඕනෑ කියලා. මොකද, ඔබතුමාත් දන්නවා, ජනාධිපතිතුමා කිව්වා අපි ලක්ෂ 50ක් දෙනවා කියලා. වතුර වුට්ටක් ආවත් අපි ලක්ෂ 5ක් හෝ දෙන්න කැමැතියි. හැබැයි, ඒකට තමන් කාමරයක් හරි හදා ගන්න ඕනෑ. ගංවතුරින් කැඩුණේ නැති වුණාට කමක් නැහැ. ටොයිලට් එක හරි අලුතින් හදා ගන්න ඕනෑ. මිනිස්සු මේ හරහා යම් කිසි අමතර දෙයක් හදා ගත්තාට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒක ඒ ගෙදර වෙනුවෙන් වෙන් කරන්න ඕනෑ. ඒක අරගෙන ගිහිල්ලා වෙන දෙයක් කරනවාද කියලා බලන්න ඕනෑ නේ. මොකද, රටේ සල්ලි නේ දෙන්නේ. මම හිතන විධියට ඒ අම්මාත් චෙක් එක තැන්පත් කරන්න බැංකුවට යන්න ඇති. නමුත් බැංකුවෙන් කියන්න ඇති, තවම මේකට දිසාපති කාර්යාලයෙන් අනුමැතිය ඇවිල්ලා නැහැ කියලා. මේ අය ඒක අල්ලාගෙන දිව්වා. අඩු ගණනේ සතියක් වලංගු වෙන දෙයක් කියන්නකෝ, අප්පා. බොරුවක් වුණත් කමක් නැහැ, සතියක් හරි වලංගු වෙන එකක් කියන්න එපා යැ. අභියෝග කරනවා, සතියක් තිබෙන බොරුවක් කියන්න කියලා.

ගරු කථානායකතුමනි, අපි විපක්ෂයේ කාර්යභාරය හරියට කරපු නිසා නේ, 3දෙනා 159දෙනෙක් වෙලා ආවේ. ඇත්තටම අපි විපක්ෂයක් විධියට seriously මහන්සි වුණා. අපි පාඩම් කළා, අපි තර්ක කළා, අපි කමිටුවලට ගියා. අපි හැම තැනටම ගියා. අපේ හිටපු මන්ත්‍රීවරුන් කිසිම කෙනෙක් වල්පල් කථා කළේ නැහැ. මෙතැන අපි 3දෙනාද, 6දෙනාද, 10දෙනාද සිටියේ, අපි සියලු දෙනාම උපරිම වශයෙන් මහන්සි වෙලා තිබෙනවා. මෙගොල්ලන්ගේත් ඉන්නේ ඉතින් 3දෙනා, 6දෙනා, 10දෙනා, 15දෙනා වාගේ තමයි. අපි හිතුවා මේ අය යම් කිසි විධියකට ඔළුව වෙහෙසලා, කල්පනා කරලා, පාඩම් කරලා, දත්ත එකතු කරලා දෙන උත්තර තියේවි කියලා. ගරු කථානායකතුමනි, මෙතුමන්ලා අපට කර තිබෙන්නේ මොකක්ද? සහමුලින්ම මඩ ගොඩක ඉන්නවා වාගේ තමයි මේ පාර්ලිමේන්තුවට ආවාට පසුව අපට දැනෙන්නේ. අපේ ඔළු කනවා. මට ඕකට කියන ඉංග්‍රීසි වචනය මෙතැන කියන්නත් බැහැ හොඳ නැති නිසා; unparliamentary නිසා. කුණුහරුපම කියනවා. මොකක්ද, මේ? අගමැතිතුමියට කුණුහරුප කියනවා. ඔබතුමාට කුණුහරුප කියනවා. ඔබතුමාගේ ලේකම්තුමාට කුණුහරුප කියනවා. ඇත්තටම මෙතුමන්ලා විපක්ෂයක් වශයෙන් ලංකාවට කරන්න යන්නේ මොකක්ද? මට හිතෙනවා, මේ ඔක්කෝම දැන් Epstein filesවල ඉන්නවාද කියලා. ඒ කියන්නේ ලිංගික ඇරියස් තිබෙන්නේ. කුණුහරුප හැරෙන්න වෙන කිසි දෙයක් දන්නේ නැහැ. කාන්තාවක් දැක්කොත් හිතනවා ඒ ගැහැනු කෙනා ඉන්නේ තමන් එක්ක මොකක් හරි කරන්න කියලා. යහළුවෝ දෙදෙනෙක්; පිරිමි ළමයි දෙදෙනෙක් අතින් අල්ලා ගෙන ගියත් හිතනවා, ඒ දෙදෙනා යන්නේ අහවල් වැඩේට කියලා. මේ මොන රෝගයක්ද, විපක්ෂයේ ඔබතුමන්ලාට හැදිලා තිබෙන්නේ? ඔබතුමන්ලා පත් වෙලා ඇවිල්ලා තිබෙන්නේ ලංකාවේ මිනිසුන්ගේ ඡන්දවලින්. ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා, ලංකාවට ගරුත්වය ඉෂ්ට කරන්න. ගරු කථානායකතුමනි, ඇත්තටම කිව්වොත්, මෙතැන ඉන්න සමහර මන්ත්‍රීවරියන්ට සමහර මන්ත්‍රීවරුන්ට එරෙහිව points of Order හෝ මොන යම් හෝ තර්කයක් ගෙනෙනකොට අවංකව භය හිතෙනවා, ඔවුන් මොන විධියේ කුණුහරුපයකින් මේ මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට ගහලා දායිද කියලා. මේ සියලුදෙනාගේ මන්ත්‍රීකම් අස්සේ මහත්වරු, නෝනලා, දරුවෝ, අම්මලා හා තාත්තලා ඉන්නවා. අපි ජීවත් වෙන්නේ ඔවුන් එක්ක. අපි මෙච්චර කුණුහරුප අහලා නැහැ. මම නම් 7 වසරේදීවත්, 8 වසරේදීවත් මෙහෙම දේවල් අහලා නැහැ. අපි කුණුහරුප කියන්න practise කරන කාලයක් තිබෙනවා නේ, ඉස්කෝලේ යන කාලයේ. ඒ, හැම දෙයක්ම කුතුහලයෙන් හොයන කාලය. ඒ කාලයේදීවත් මෙහෙම දේවල් අහලා නැහැ නේ. ඇත්තටම ඔබතුමන්ලා අපේ ඔළු නාස්ති කරන්න එපා. අපරාදේ කියලා හිතෙනවා මේවා කියන්නේ. මොකද, මේ ගැන කථා කරලා වැඩක් නැහැ. එම නිසා මම මේ විවාදය වෙන පැත්තකට ගන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අපේ අධිකරණ ඇමතිතුමාත් සභාවේ ඉන්නවා. අධිකරණය ගැන මම තව ටිකකින් කියන්නම්. මූලික වශයෙන් ගත්තොත්, දැන් රටේ මොකක්ද වෙලා තිබෙන්නේ? අපි හදිසි නීතිය කිසිම ආකාරයකින්, ප්‍රජාතන්ත්‍ර විරෝධී කිසිම කටයුත්තකට පාවිච්චි කරලා නැහැ.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මම ගෝලීය ශ්‍රේණිගත කිරීම්වලට අදාළ ලේඛන දෙකක් **සභාගත*** කරනවා.

මේ එක් ලේඛනයක සඳහන් වනවා, "Sri Lanka's global standing in democracy and the rule of law has seen a notable upward shift as of 2025-2026" යනුවෙන්. මොකක්ද වෙලා තිබෙන්නේ? "While the country still faces structural challenges, recent reports highlight it as an "exception" to the global trend of democratic backsliding" යන්නෙන් මොකක්ද කියන්නේ? මම ඒකට දත්ත කියන්නම්. ලෝකයම ප්‍රජාතන්ත්‍රවාදී පාලනය හා සම්බන්ධ ශ්‍රේණිගත කිරීම්වලදී - democracy rankingsවලින් - පහළට යනවා; declining. හැබැයි, ලංකාව exception එකක්. එහෙම නම් මොකක්ද වෙලා

---

*** පුස්තකාලයේ තබා ඇත.**

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

තිබෙන්නේ? Democracy පැත්තෙන් ගත්තොත්, 2024ට වඩා 2025දී අපේ global rank එක 58 වන තැනට ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ අපි ස්ථාන 15ක් උඩට ඇවිල්ලා තිබෙනවා, democracy පැත්තෙන්. එතකොට හදිසි නීතිය කොහොමද යොදාගෙන තිබෙන්නේ? ඒකයි කියන්නේ, කරුණු තුළින් කථා කරන්න කියලා. ඒ කාරණයත් එක්කම කියනවා, "Sri Lanka climbed 15 places compared to the previous year. It is now ranked among the top 25 per cent of countries in categories like Civic Engagement and Electoral Participation" කියලා.

ඊට පස්සේ, rule of law බලමු. අපි rule of lawවලින් global rank එකේ රටවල් 143කින් 74 වන ස්ථානයේ ඉන්නවා. South Asiaවල අපි දෙවැනි ස්ථානයේ ඉන්නවා. අපි fundamental rightsවලින් ලෝකයේ 64 වන ස්ථානයේ ඉන්නවා. අපි absence of corruptionවල 78 වන ස්ථානයේ ඉන්නවා. අපි order and security සම්බන්ධයෙන් 86 වන ස්ථානයේ ඉන්නවා. ඒ සියල්ලගෙන්ම අපි කලින්ට වඩා ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා.

ඊට පස්සේ, judicial independence. ඒ යටතේ කියනවා, "International Property Rights Index (2025): Ranks Sri Lanka’s judicial independence at 59th globally" යනුවෙන්; අපි ඒකේ 59 වන ස්ථානයේ ඉන්නේ. දැන් පහළට ගිහිල්ලාද? මේ තත්ත්වයට ඇවිත් තිබෙන්නේ හදිසි නීතිය යොදාගෙනද? ඒක කියන්නේ මෙතුමන්ලා විතරක් නොවෙයි. එළියෙත් ඉන්නවා, යූටියුබ් එකෙන්ම ජීවත්වන පිරිසක්. ඒ, කියන්න දෙයක් නැති වුණාම අනාථ වෙලා නොයෙක් දේවල් කියන අය.

ඊට පසුව ගනිමු, WJP Index එක. ඒකේ මොකක්ද කියන්නේ? ගරු කථානායකතුමනි, මේ ඔක්කෝම ගත්තාම අපි හැම පැත්තෙන්ම ඉදිරියට ඇවිත් තිබෙනවා. මේ බලන්න, "In the last World Economic Forum (WEF) Global Competitiveness Report, which ranked this sub-indicator, Sri Lanka ranked 68th out of 141" යනුවෙන් සඳහන් වනවා. ඊළඟට democracy පැත්තෙන් ගනිමු. ප්‍රධාන source එක International IDEA කියලා කවුරුත් දන්නවා. ඒකට අනුව අපි රටවල් 173කින් 58 වන ස්ථානයේ ඉන්නවා. Rule of law සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන ආයතනය WJP Index එක. WJP Index එක අනුව එහිදී අපි රටවල් 143කින් 74 වන ස්ථානයේ ඉන්නවා; අපි සියයට 1.1ක් උඩට ඇවිල්ලා තිබුණා. IPRI එක අනුව judicial independence පැත්තෙන් අපි රටවල් 126කින් 59 වන ස්ථානයේ ඉන්නේ. ඊළඟට, civil liberties ගනිමු. Freedom House එකට අනුව එහිදී අපි ලකුණු 100න් 58ක් ලබා ගන්නවා. මේ ආයතන පිළිබඳව, ලකුණු දීමේ ක්‍රම පිළිබඳව වාද කරන්න පුළුවන්. නමුත්, ඒවා අපට වඩා මෙතුමන්ලා තමයි පසුගිය කාලයේ කර ගහගෙන ගියේ. නමුත්, ඒවායෙනුත් අපි ඉස්සරහට ගිහින් තිබෙනවා; අපි මේගොල්ලන්ගේ ගේම් එකෙනුත් මේගොල්ලන්ට වඩා ඉස්සරහට ගිහින් තිබෙනවා. ඒවා මතු කර කර හිටියේ මේගොල්ලන් නේ. අපි දන්නවා, සමහර සංවිධාන ප්‍රජාතන්ත්‍රවාදය සහ අනෙක් කාරණා ගැන බලන්නේ අමුතුම විධියකට බව. ගරු කථානායකතුමනි, එහෙම තිබියදීත් අපි ඒ හැම දෙයකින්ම රටක් වශයෙන් ඉදිරියට ගිහින් තිබෙනවා, අවුරුද්දයි මාස දෙකක් ඇතුළතදී.

මම rule of lawවලට අදාළව අවසාන කරුණ කියන්නම්. Specially ගත්තොත්, Rule of Law Index එකේ මොකක්ද කියන්නේ? " 'Freedom of opinion and expression' declined in 73 per cent of countries, but not in Sri Lanka. 'Freedom of assembly and association' declined in 72 per cent of countries, but not in Sri Lanka. 'Civic participation' declined in 71 per cent of countries, but not in Sri Lanka.", මේකෙන් මොකක්ද කියන්නේ? ලෝකයේ රටවලින් සියයට 73ක් කියන්නේ රටවල් 125ක් විතර, ගරු කථානායකතුමනි. රටවල් 125කම freedom of opinion and expression කියන එක decline වෙනවා. හැබැයි, not in Sri Lanka. අපි ඉස්සරහට යනවා; උඩට යනවා. සියයට 72ක් රටවල freedom of assembly and association අඩු වෙමින් තිබෙනවා. අපි ඉදිරියට යනවා; වැඩි වෙනවා. මේ බලන්න, "Civil justice weakened in 68 per cent of countries, but not in Sri Lanka" යනුවෙන් කියනවා. මම දැන් මේක සම්බන්ධ කරනවා, කලින් මන්ත්‍රීවරයෙක් කිව්ව කාරණයකට.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, text එක පිළිබඳව. අපි ලියන දේ සහ ඒ ලියන දේ අතර ඇත්තටම තිබෙනවා, deconstruction of text. ඒ ගැන ගොඩක් ලියවිලා තිබෙනවා. Marxismවලටත් ඇවිල්ලා, ඊට පසුවත් විවිධ උගතුන් ඒ ගැන ලියලා තිබෙනවා. ඕක ටිකක් වෙන විධියකටත් කියන්න පුළුවන්. ලංකාවේ කියමනක් තිබෙනවා, "කියන්නා කෙසේ කීවත් අසන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතුයි" කියලා. ඒකත් ටිකක් ඔය කිට්ටුවෙන් යනවා. දැන් text එක බැලුවාම මොකුත් අවුලක් පෙනෙන්නේ නැහැ. හැබැයි, කියන එක අපි කෑලි කෑලිවලට වෙන් කරලා බැලුවාම අපට පෙනෙනවා, ඒ තුළ හංගපු ලොකු දෙයක් තිබෙනවා කියලා. මොකක්ද මේ තිබෙන්නේ? ඔය සම්බන්ධව ෂේක්ස්පියර්ගේ කියමන් පවා තිබෙනවා. මට ඒවා කියන්න වෙලාවක් නැහැ, මට මේ ගැන කියවද්දී ඒවාත් හමු වුණා. ඔය double meaning කියන්නේත් ටිකක් මේ වාගේයි. තේරෙන්න කිව්වොත්, ඇත්තටම double meaning.

දැන් මෙතැනදී විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, පාස්කු ප්‍රහාරය ගැන. පාස්කු ප්‍රහාරය ගැන එතුමා කථා කරන විධියේ පෙනුම ගත්තොත්, එහි තිබෙන්නේ මොකක්ද? පාස්කු ප්‍රහාරය පිළිබඳව පරීක්ෂණ කරන්න ඕනෑ, අපරාධකරුවන්ට දඬුවම් දෙන්න ඕනෑ කියන එක. ඒක තමයි පෙනෙන text එක. එතුමා කියපු කරුණු මොනවාද? මම key words ගත්තොත්, ඒ key words මොනවාද? Key words තමයි, කැලෑ උසාවියකින් තමයි දැන් මේක කරන්නේ; ඇමති බංගලාවක තමයි නඩු අහන්නේ කියන එක. ඒ වාගේම කියනවා, සාක්ෂිකරුවන්ට එන්න බැරි වෙන්න, නීතිඥයින්ට සූදානම් වෙන්න බැරි වෙන්න දිනපතා නඩු අහනවා කියලා. මොකක්ද මේ කියන්නේ? "දිනපතා නඩු අහනවා, කැලෑ උසාවියක අහනවා, ඇමති කෙනෙකුගේ ගෙදර අහන්නේ" කියලා කියනකොට නිකම් විජිත ඇමතිතුමාගේ හෝ මගේ ගෙදර අහන්නේ කියලා හිතෙන්න පුළුවන්. මොකද, අපි නේ ඇමතිවරු. ඊට පස්සේ කියනවා, ප්‍රධාන සැකකරුවා නැතිවයි නඩුව අහන්නේ කියලා.

මම ඉස්සෙල්ලාම මේ කාරණය දැනගන්න කැමැතියි, අපේ අධිකරණ ඇමතිතුමාගෙන්. ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලනවා, මගේ වෙලාවෙන් තත්පර 30ක් අපේ අධිකරණ ඇමතිතුමාට දෙන්න කියලා. ගරු අධිකරණ ඇමතිතුමනි, ඇත්තටම දිනපතා නඩු අහන එක වැරදිද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, අපරාධ නඩු විධාන සංග්‍රහය අනුව දිනපතා නඩු අහන එක තමයි රීතිය; ක්‍රමය. දිනයක් ගන්න එක තමයි ව්‍යතිරේකය. ගරු කථානායකතුමනි, ඒ වාගේම මම කියන්නට ඕනෑ, නීතිඥවරු පෙනී සිටින්නේ විවෘත අධිකරණයක කියලා. ඇමති බංගලාවක් කිව්වාට මේවා රජයේ දේපළ. අපි බලයට ආ පසු, අපි දීපු පොරොන්දුවක් තමයි නඩු වේගවත් කරන එක. නඩු වේගවත් කරන්න අපට අලුතින් බිල්ඩින් හදන්න බැහැ.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

ඒ සඳහා රජයේ දේපළ කිහිපයක් යොදා ගන්නවා. අපි බලයට ආ පසු උසාවි කිහිපයක් විවෘත කර තිබෙනවා. තව උසාවි 5ක් හෝ 6ක් විවෘත කරනවා. අපි නඩු අහන එක වේගවත් කරනවා. ඒක තමයි අපේ පොරොන්දුව. අද ඒ මන්ත්‍රීවරයා කථා කළේ යුක්තිය වෙනුවෙන් නොවෙයි, අපරාධකාරයා වෙනුවෙන් කියලායි මම නම් හිතන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

හරි. ගරු කථානායකතුමනි, මම දැන් කියන්නම් මොකක්ද වෙන දේ කියලා. Text එක ඇත් කරලා බැලුවාම, text එක deconstruct කරලා බැලුවාම මොකක්ද මේ කියන්නේ? අපි හිතමු, මේ නඩුවේ අපරාධකාරයෝ ඔප්පු වුණා කියලා. අපරාධකාරයෝ අහු වෙනවා. එතකොට නඩුව අහලා තිබෙන්නේ කැලෑ උසාවියක. ගරු කථානායකතුමනි, ඔබතුමා බලන්න, ඒකට තමයි *ex parte* ක්‍රමයට නඩු අහනවා කියන්නේ. හොරු එන්නේ නැත්නම්, අල්ලන්න බැරි නම්, *ex parte* ක්‍රමයට නඩු අහලා දඬුවම් කරනවා. ඒක ලෙහෙසියි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

192න් යන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඒක තමයි *ex parte* ක්‍රමය. හොරා හැංගිලා ඉන්නවා නම් හොරාට දඬුවම් දෙනවා. මම කියන්නේ මේකයි. මම මේ මුළු රටටම, ජාතියටම කියන්නේ, දැන් පාස්කු ප්‍රහාරයේ අපරාධකරුවන් ආරක්ෂා කරන, ඒ මිනී මරු දේශපාලන මතවාදය තමයි අද මේ පක්ෂය දරන්නේ කියන එකයි. ඒක තමයි ඇත්ත. *[බාධා කිරීම්]* නැහැ, නැහැ. මම අභියෝග කරනවා, මේ රටේ නීතිඥවරුන්ට, මේ රටේ උගතුන්ට, පාස්කු වින්දිතයන්ට, අතිගරු කාදිනල්තුමාට. අපි මහන්සි වෙනවා, පරීක්ෂණ කරලා මේක හොයාගන්න. මේ ගැන හොයන එක සම්බන්ධයෙන් අපිට කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත්, මේ තිබෙන්නේ මොකක්ද, ගරු කථානායකතුමනි? මේ text එක deconstruct කරලා බලන්න intention එක්ක. අරමුණ බලන්න. මොකක්ද මේකේ කියන්නේ? දැන් මේ ප්‍රශ්නය මොකක්ද? පුළුවන් නම් මේක අගය කරන්න එපායැ. ඔයගොල්ලන්ගේ අගය කිරීමෙන් අපට සත පහක වැඩක් නැහැ. අපේ රටේ මිනිස්සු අපිව අගය කළාම ඇති. නමුත්, අවංකව ගත්තොත් ඇමතිවරුන්ට ඉන්න තිබෙන bungalows උසාවි බවට පත් කරලා, ඒ උසාවිවල දිනපතා නඩු අහන එක පාස්කු ප්‍රහාරයේ වින්දිතයන් වෙනුවෙන් කරන හොඳ දෙයක්ද, නරක දෙයක්ද? ඒක පාස්කු ප්‍රහාරයේ වින්දිතයන් වෙනුවෙන් කරන හොඳ දෙයක්ද, නරක දෙයක්ද? නැත්නම් පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් නඩු අහන එක වෙන්න ඕනෑ මෙහෙමද? පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් නඩු අහන එක සාමාන්‍යයෙන් අලුත්කඩේ මහාධිකරණයක මාස තුනෙන් තුනට දින දෙමින් යන එකද වෙන්න ඕනෑ? ගරු කථානායකතුමනි, මට ඇත්තටම ඒ පොස්පරස් සුවඳ දැනෙනවා. ඒ යක්ෂයාගේ ගඳ මෙතැන දැනෙනවා. මම අහන්නේ මේකයි. පාස්කු ප්‍රහාරය කළේ කවුද? ඒකේ මහ මොළකරුවා, ඒකේ දේශපාලන වුවමනාව කවුද කියන එක දන්නවා. ඒක රාජපක්ෂලා කළේ කියලා දන්නවා. *[බාධා කිරීමක්]*

මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ කථාව අහගෙන ඉන්න. මට ඔබතුමා එක්ක මුකුත් කථාවක්, සංවාදයක් නැහැ. මම රටේ ජනතාවට කථා කරන්නේ. ඒ නිසා මම කියන්නේ මේකයි. මම දිගටම මේක දැක්කා. මම මේ කාරණය දිගටම notice කරලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි. මම පසුගිය වතාවේ හදිසි නීතිය පිළිබඳ විවාදයකදීත් කිව්වේ මොකක්ද? පසුගිය වතාවේ හදිසි නීතිය පිළිබඳ විවාදයේදීත් මේ පක්ෂය ගැහුවේ කාටද? ශානි අබේසේකර, රවි සෙනෙවිරත්න ඇතුළු සියලු පරීක්ෂකයන්ට තමයි එදාත් පහර ගැහුවේ. ඒ කියන්නේ, දැන් මොකක්ද මේ තිබෙන්නේ? දැන් මිනීමරුවාගේ සාක්කුවේ ඉඳගෙන මෙතැන කථා කරන පිරිසක් බිහි වෙලා ඉන්නවා. මම සරලම ප්‍රශ්නයක් අහන්නම්කෝ. දැන් ලංකාවේ මේ පාස්කු නඩු අහන්නේ ඇමති බංගලාවක කියලා news එකක් internationally ගියාට පසුව ඒ ගැන නොදන්නේ කවුද? ඒකේ අරමුණ මොකක්ද? ඒකේ අරමුණ මොකක්ද කියන්න, ගරු කථානායකතුමනි? ජාත්‍යන්තර මාධ්‍යයෙන් කවුරුවත් ඇවිල්ලා අහනවාද, මේ bungalows කලින් තිබුණේ ඇමතිවරුන්ට, ඒවා රජයට පවරාගෙන දැන් ඒවායේ අලුත් උසාවි දාලා තිබෙනවාද කියලා? එහෙම අහන්නේ නැහැ. මොකද, විපක්ෂය කියන දෙයත් අහනවා නේ. මේ පාර්ලිමේන්තුවට පත් වෙලා ආපු මිනිස්සුන්ට ගරුත්වයක් නැති වුණාට, ලෝකයෙන් මේ පාර්ලිමේන්තුවට ගරුත්වයක් තිබෙනවා නේ. MP කියලා නේ ලෝකයට යන්නේ. *[බාධා කිරීමක්]* මල්ලේ පොල් කියලා කියන්නත් පුළුවන්. නමුත්, ලෝකය දන්නේ "MP" කිව්වාම, "Member of Parliament" කියලා නේ. *[බාධා කිරීමක්]* නැහැ, මම කියන්නේ මේකයි. ඒ නිසා අද මොකක්ද වෙලා තිබෙන්නේ? කොච්චර අසරණ වෙලා ද කියනවා නම්, කොච්චර අනාථ වෙලා තිබෙනවා ද කියනවා නම්, අද පාස්කු ප්‍රහාරයේ මිනීමරුවන් වෙනුවෙන් පෙනී ඉන්න මට්ටමට වැටිලා තිබෙනවා. *[බාධා කිරීමක්]* මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමා මට බාධා කරන්න එපා. එහෙම වුණොත් මට බාධා කළ එකට විරුද්ධව මම යෝජනාවක් ගෙනෙනවා. ඒ නිසා කරුණාකරලා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා තමන්ගේ මන්ත්‍රීවරු පාලනය කර ගන්න. ඉස්සරහ seat එකටත් ගෙන්වාගෙන වාඩි කරවාගෙන නේ ඉන්නේ. හොඳද? මම මොකක්ද කළේ? හංගාගෙන හිටපු රෙද්ද ඇරලා text එක කඩලා මම පෙන්නුවා. දැන් බඩු මාට්ටු වෙලා තිබෙන්නේ. දැන් text එක deconstruct කළාට පස්සේ පෙනෙනවා, මිනීමරු වුවමනාව. ගරු කථානායකතුමනි, මම ඒක කිව්වේ මොකද දන්නවාද? දැන් ඒ ඇති; අදට ඇති; සති ගණනකට ඇති වෙයි මම හිතන්නේ. *[බාධා කිරීමක්]* තුවාලවලට බෙහෙත් දමා ගන්න. තවම පාර්ලිමේන්තුවේ medical centre එක ඇරලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමනි, කරුණාකර මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාට කියන්න මට බාධා කරන්න එපා කියලා. මොකද, ඉස්සරහට ඇවිල්ලා කෑ ගහන්න එපා. *[බාධා කිරීමක්]* එක්කෝ ඔබතුමාගේ සීට් එකට ඔබතුමා යන්න. නැත්නම් ඔබතුමා මගේ කථාවට බාධා නොකර ඉන්න. ගරු කථානායකතුමනි, මම මෙන්න මේ කාරණයත් කියන්න කැමතියි. *[බාධා කිරීමක්]* හරි, හරි.

ගරු කථානායකතුමනි, මුළු ලෝකයේම, globally, democracy rankingsවලින්, rule of law rankingsවලින්, judicial independence rankingsවලින් කියන ඒ හැම දෙයකින්ම අපි ලෝක පරිමාණයන්ගෙන් ඉහළට ඇවිල්ලා තිබෙන වෙලාවක මොකක්ද මේ කියන්නේ? අපිට කියනවා, කැලෑ උසාවි කියලා. ඒක තමයි මම කිව්වේ, මේවා ඝාතකයාගේ වචන කියලා. එම නිසා අපිට ඒ ගැන මීට වඩා කියන්න දෙයක් නැහැ. ඒ වාගේම ගරු කථානායකතුමනි, මේ හදිසි නීතිය පිළිබඳ විවාදයේදී මේකත් දේශපාලන වශයෙන් කියන්න මම හිතුවා. මොකද, සාමාන්‍යයෙන් හදිසි නීතිය පිළිබඳ විවාද හැමදාම දේශපාලන

විවාදයක්. සාමාන්‍යයෙන් සමාජයේදී, පාසලේදී, ගෙදරදී වුණත් අපේ වැරැද්දක් කිව්වාම ඒ වැරැද්ද හදා ගන්න අපි උත්සාහ කරන බව ඔබතුමා දන්නවා. සාමාන්‍යයෙන් අපි එහෙම නේ. අපේ වැරැද්දක් දැකලා කිව්වොත් ඒ වැරැද්ද හදා ගන්න අපි උත්සාහ කරනවා. ඒක දේශපාලනයේදීත් එහෙමයි. සාමාන්‍යයෙන් 1950 ගණන්වල, 1960 ගණන්වල එක පක්ෂයක් ගොඩක් වැරදි කළාම අනෙක් පක්ෂය මොකද කරන්නේ? ඒ පක්ෂයේ වැරදි හදාගෙන, අලුත් හොඳ දේවල් එකතු කරගෙන තමයි අනික් පක්ෂයේ අය ආණ්ඩුවට එන්නේ. මම හිතන්නේ 1960, 1965, 1970 වාගේ වෙනකම් ලංකාවේ එහෙම තමයි වුණේ. මට ඒ ගැන මතක නැහැ, මම ඉපදිලා නැති නිසා. නමුත් අපි දකිනවා, 1980න්, 1990න් පසුව වෙච්ච දෙයක්. 1980න්, 1990න් පසුව වෙච්ච දේ මොකක්ද? කෙළින්ම මම ඒ ගැන කියන්නම්, වැඩි වෙලාවක් ඒ වෙනුවෙන් ගන්න බැරි නිසා. දැන් මොකක්ද තිබෙන දේශපාලන උපාය මාර්ගය? දැන් තිබෙන දේශපාලන උපාය මාර්ගය තමයි, ඒගොල්ලන් හොරු, ඒගොල්ලන් හොරකම් කරලා කියන එක. කියන්නත් කනගාටුයි, අදත් කෙහෙළිය රඹුක්වැල්ලගේ දුවක් arrest කරලා රුපියල් මිලියන 300ක් වංචා කරලා. රාජපක්ෂලාගේ පවුල ගත්තොත්, අම්මත් යනවා, පුතත් යනවා, ආච්චිත් යනවා, බාප්පලා ඔක්කෝම යනවා. ලොකු තාත්තාගේ පුතාවත් ගත්තාද කොහේද.

ගරු කථානායකතුමනි, මම කියන්නේ මේකයි. විවිධ රටවල දේශපාලනඥයෝ වංචා කරලා තිබෙනවා. හැබැයි, මේක cancer එකක් වාගේ නේ. වචනය කියන්න හොඳ නැහැ, එතකොට ඒක promote කරන නිසා. අවංකවම මම කළ වැරැද්දක් නිසා - හොරකම් කරලා - මගේ දරුවෙකුට හිරේ යන්න වුණොත් මම කරන දේ කියන්නේ නැහැ, එතකොට ඒක promote කරන නිසා. මොකක්ද මේ? මට නම් ඔරොත්තු දෙන්නේ නැහැ, ඒ වාගේ දේවල්. මම දන්නේ නැහැ, රඹුක්වැල්ල මහත්තයාගේ දුවලා, අරගොල්ලන්, මේගොල්ලන් ගැන. නමුත් ඒ කවුරු හරි දරුවෙක් නේ. මම දන්නේ නැහැ, ඒ අයගේ වයස ගැනවත්. මට ඒවායෙන් වැඩකුත් නැහැ. මුළු පවුලම හිරේ යනවා. අද යනවා; හෙට යනවා; ආයෙත් මාසයකින් යනවා. ඒ කියන්නේ, මේක හොර ගුහාවක්, cancer එකක් වාගේ පැතුරුණු.

දැන් විපක්ෂයේ පක්ෂ මොකක්ද කරන්න ඕනෑ? ඒගොල්ලන් අපි වාගේම කරන්න ඕනෑ මොකක්ද? අපි මොකක්ද කළේ? අපි රටට කිව්වා, ඒගොල්ලන් දූෂණ කටයුතු කරනවා, ඥාති සංග්‍රහ කරනවා, අකාර්යක්ෂමයි, බොරු කියනවා කියලා. කොච්චර මුල් ගල් තියලා පැළ කරලා තිබෙනවාද? මම ඒවා ගැනත් කියන්නම්, වෙලාව තිබුණොත්. ඒගොල්ලන්ගේ තිබුණේ බොරු දේශපාලනය, රැවටීමේ දේශපාලනය, ඥාති සංග්‍රහය, දූෂණය, තාත්තාගෙන් පුතාට දේශපාලනය ගෙනෙන එක, ගේම් ගහන එක, අපරාධ කරන එක; ඒක තමයි ඒගොල්ලන්ගේ දේශපාලනය. ජනතා විමුක්ති පෙරමුණ සහ ජාතික ජන බලවේගය විධියට අපි මොකක්ද කළේ? වකරම්, බඩු බෙදලා නොවෙයි, අපි ජනතාව අතරට ගිහිල්ලා මාස ගාණක්, අවුරුදු ගාණක් තිස්සේ ජීවිතවලින් පෙන්වුවා, අපි ඊට වඩා හොඳයි කියලා. මම ඒක තේරෙන භාෂාවෙන් කිව්වේ. අපි ඒක ජීවිතවලින් පෙන්නුවා. එතකොට මිනිස්සු අපිව වැළඳ ගත්තා. ඒ නිසා නේ 3ක් හිටපු අපි 159ක් වුණේ. දැන් ඔබතුමන්ලා මොකක්ද කරන්න ඕනෑ? 1960-70 ගණන්වල ඔබතුමන්ලාගේ පරණ පක්ෂ කළ විධියට නම් ඔබතුමන්ලා try කරන්න ඕනෑ මොකක්ද? අපිට වඩා අදූෂිත වෙන්න, අවංක වෙන්න, නිවැරදි වෙන්න, ඥාති සංග්‍රහ කිසිසේත් නොකර ඉන්න. දැන් ඒගොල්ලන් මොකක්ද කරන්නේ? ගරු කථානායකතුමනි, ඒගොල්ලන් ඒ වෙනුවෙන් try කරනවා. හැබැයි, කවදාවත් ඒවා කරන්න බැහැ. රාජපක්ෂලාට, සජබයට, අරවාට මේවාට එහෙම කරන්න බැහැ. ඒ නිසා ඒගොල්ලන්ගේ එකම try එක මොකක්ද? ඒගොල්ලන්ගේ එකම උත්සාහය තමයි, මාධ්‍ය බලඇණියත් පාවිච්චි කරලා ඒගොල්ලන් හොරු නිසා අපිත් හොරු කියලා පෙන්වන එක; ඒගොල්ලන් ඥාති සංග්‍රහ කරන නිසා අපිත් ඥාති සංග්‍රහ කරනවා කියලා පෙන්වන එක; ඒගොල්ලන් බොරු කියන නිසා අපිත් බොරු කියනවා කියලා පෙන්වන එක; ඒගොල්ලන් ජනතාව රවටන නිසා අපිත් රවටනවා කියලා කියන එක.

ගරු කථානායකතුමනි, මම අද උදේ ගරු ජනාධිපතිතුමාත් එක්ක මහනුවර ගියා, මහයියාව උමං මාර්ගය බලන්න. අපි අලුතෙන් උමඟක් හදනවා, එතැන ඇති වන දැවැන්ත රථ වාහන තදබදයට උත්තරයක් විධියට. මම එතැනට ගියාම දැනගත්තේ මොකක්ද දන්නවාද? මම මේ කාරණය අවංකව කියන්නේ. RDA එකේ ඉහළ මට්ටමේ ඉන්න ඉංජිනේරුවෝ වගකීමෙන් කිව්වේ මොකක්ද? 2016 වාගේ කාලයේ Chinese company එකකින් ඒ පාර හරියට හදනවා. පාර හැදුවාම ඒකේ ඉතුරුවක් වෙනවා, රුපියල් මිලියන 550ක්. රුපියල් මිලියන 550ක ඉතුරුවක් ආවට පසුව ඒ savingsවලින් මේ tunnel එක හදන්න RDA එක යෝජනා කරනවා. සල්ලි ඉතුරු වෙනවා. එම නිසා ඒ මුදලෙන් මේ tunnel එක හදන්න යෝජනා කරනවා. එතකොට මොකක්ද වෙන්නේ? ඒ කාලයේ හිටපු මහාමාර්ග ඇමති Hunan Construction Engineering Group Corporation - HUNAN - කියන Chinese company එකට මොකක්ද කියන්නේ? එතුමා කියනවා, ඒක අනුමත කරලා දෙන්නම්, මට රුපියල් මිලියන 50ක් දෙන්න කියලා. ඕනෑ නම් 2016 වසරේ ගැසට් අරගෙන බලන්න, ඒ කාලයේ හිටපු මහාමාර්ග ඇමති කවුද කියලා. Chinese company එක අහනවා, ඔයාට රුපියල් මිලියන 50ක් දෙන්න අපට පිස්සුද කියලා. එතුමා දැන් නුවර දිස්ත්‍රික්කයේ මන්ත්‍රී. ඉතුරු වෙච්ච සල්ලිවලින් එතැන තිබෙන tunnel එක වෙනුවට අලුත් එකක් හදන්න RDA එකෙන් යෝජනාවක් එනවා. Chinese company එකට කියනවා, රුපියල් මිලියන 50ක් දෙන්න කියලා. Chinese company එක ඒක ප්‍රතික්ෂේප කරනවා. අවුරුදු 10කට පසුව අද අපි ඒකට මුල්ගල තියලායි ආවේ. අපි ඒක හදනවා. ඒ සඳහා රටේ මුදල් වියදම් කර තිබෙන්නේ. ඕක තමයි මේගොල්ලන්ගේ ඇත්ත කථාව. මේගොල්ලන්ට වුවමනාව තිබෙන්නේ මොකක්ද? මේගොල්ලන් උත්සාහ කරන්නේ නැහැ නිවැරදි වෙන්න. මේගොල්ලන් හදන්නේ, එයාලා මඩ නාගෙන ඉන්න නිසා අපේ ඇඟෙත් මඩ ගාවන්න. රටේ ජනතාවටත් පොඩි confusion එකක් තිබෙන්න පුළුවන්. රටේ ජනතාව හිතාගෙන හිටියේ දේශපාලනඥයන් කියන්නේ, ඔක්කොම හොරු, පවුලට සලකන කට්ටිය, තමන්ගේ ගෝල බාලයන්ට තනතුරු දෙන කට්ටිය, බොරු කියන කට්ටිය, බොරු මුල් ගල් තියන කට්ටිය කියලා නේ. ඒ නිසා ජනතාව හිතනවා, අපේ කණ්ඩායම තුළත් එහෙම අය ඉන්න පුළුවන් කියලා. මොකද, දේශපාලනඥයන් කියන්නේ එක category එකක් නේ.

මේගොල්ලන්ගේ උපාය මාර්ගය මොකක්ද? අද හිරේ ඉන්න, නුවර පැත්තේ හිටපු ඇමති කෙනෙක් මීට අවුරුදු ගණනකට කලින්, 2015 - 2016 වාගේ කාලයේ, -දෙන්නෙක් ඉන්නේ. යාළුවෝ දෙන්නා වාගේ උසාවියෙන් එළියට එන්නේ- රූපවාහිනී විවාදයකදී අපට මඩ ගැහුවා. අපි පඩි ගන්නේ නැහැ කියලා පඩි ගන්නවා, අපට දෙබිඩි ජීවිතයක් තිබෙනවා, අපි හොරකම් කරනවා කියලා තමයි මුළු විවාදයේදීම එතුමා කියන්නේ. ඉතින් මම interval එකේදී ඇහුවා, ඇයි එහෙම බොරු කියන්නේ කියලා. එයා කියපු දේ ඒ වචනයෙන්ම කියනවා නම්, "අපි වාගේම තමයි උඹලාත් කියන එක තමයි අපේ project එක" කිව්වා. ඒක තමයි මේ line එක; ඒක තමයි මේ try එක. ඒක තමයි, ගරු කථානායකතුමනි, ඔබතුමාට අද එල්ල කරන්නේත්.

මේ පාර්ලිමේන්තුවේ ගසා කාපු, වීස් ටින් පිටින් ගෙදර ගෙනියපු, තෙල් බීපු කථානායකලා රොත්තක් සිටියදී ඒ ගැන එක

[ගරු බිමල් රත්නායක මහතා]

වචනයක් කථා කරන්නේ නැතුව දැන් ඔබතුමාව target කරනවා. මොකටද? මේගොල්ලන්ගේ කථානායකලා එහෙම නේ. එක කථානායකවරයෙකුගේ - චමල් රාජපක්ෂ මහත්තයාගේ - පුතෙක් නේ ළඟදී අත්අඩංගුවට ගත්තේ. SriLankan Airlines එකේ Board papers මම කියවා තිබෙනවා. SriLankan Airlines එකේ Board එක රැස් කරන්නේ කථානායක නිල නිවසේ. ඒකේදී තමයි ඔය ගේම් එක ගහන්න එක තීන්දුවක් ගෙන තිබෙන්නේ. එහෙම තමයි චමල් රාජපක්ෂලා කථානායකකම් කළේ. මහින්ද යාපා කටයුතු කරපු විධිය Audit Reportsවල තිබෙනවා. ඔබතුමාගේ වාර්තාවල නොවෙයි ගරු කථානායකතුමනි, Audit Reportsවල තිබෙනවා. අපි ඒවා සභාගත කර තිබෙනවා. ඊට කලින් කට්ටියත් එහෙමයි. ජීවතුන් අතර නැති නිසා මම ඒ ගැන කියන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ laptops උස්සාගෙන ගිය කථානායකලා මේගොල්ලන්ගේ දෙපැත්තේම ඉන්නවා. පුත්තු, දුවරු, කොහෙන් හරි ගැව්ලා තිබෙන අය ඉන්නවා නම් ඒ අයත් trips එක්ක ගෙන යනවා. අපි ලජ්ජා වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි, හිටපු කථානායකලාත් එක්ක සමහර රට සංචාර ගිහිල්ලා. පෞද්ගලිකව ගිහිපු ඒවා නොවෙයි. මම එක අත්දැකීමක් කියන්නම්. ධම්මික දසනායක මහත්තයා මහ ලේකම් වශයෙන් හිටපු කාලයේ අපි Commonwealth Parliamentary Association conference එකකට ගියා, දිල්ලිවල. මුළු delegation එකේම රෙදි නැති වුණා, අපේ කථානායකලා කරන දේවල් එක්ක. ඒ නිසා මේගොල්ලන් හිතනවා, ගරු කථානායකතුමනි, ඔබතුමාත් එහෙමයි කියලා. ඔබතුමා මේගොල්ලන්ට කරුණාවන්ත වෙන්න; සමාව දෙන්න. මේගොල්ලන් දන්නේ නැහැ. අරපිරිමැස්මෙන්, අවංකව වැඩ කරන කථානායකලා මේගොල්ලන්ට ඉඳලා නැති තරම් මම හිතන විධියට. ඔක්කොමලා නොවෙයි. හිටපු කථානායකලා අතර හොඳ එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා වෙන්න පුළුවන්. එහෙම හිටියත් එක්ක. මම මේ ආසන්න වශයෙන් මතක් වෙන දෙතුන් දෙනා ගැන කියන්නේ.

මේ පාර්ලිමේන්තුවේ laptops අරගෙන ගිය ඒවා තවම තිබෙනවා. ලජ්ජයි. මේගොල්ලන්ගේ නායකයින් එහෙම අය. ඒ නිසා මේගොල්ලන්ට දැන් නිවැරදි වෙන්න බැහැ. ඒ නිසා මේගොල්ලන් හදන්නේ මොකක් කරන්නද? ඔබතුමාත් එහෙමයි, ඔබතුමාගේ ලේකම්තුමාත් එහෙමයි, අපිත් එහෙමයි, අපේ ජනාධිපතිතුමාත් එහෙමයි, අගමැතිතුමියත් එහෙමයි කියලා කියන්නයි. අපි ඒ වාගේ දේශපාලන හිඟන්නෝ නොවෙයි. අපට ආත්ම ගරුත්වයක් තිබෙනවා. අපි මේ දේශපාලනය තෝරාගෙන තිබෙන්නේ හම්බ කරගෙන කන්න නොවෙයි, එය අපේ ජීවිත අභිලාෂය නිසා. හොරකම් කරන්න ඕනෑ නම් වෙන ඕනෑ දෙයක් කරන්න පුළුවන්. මේක අපේ ජීවිත අභිලාෂය. හොරකම් කරන්න තේරෙන්නේ නැති නිසා හොරකම් නොකර ඉන්නවා නොවෙයි. කරනවා නම්, මෙතැන ඉන්න ගණනක්, ඉලක්කමක් හදන්න බැරි කට්ටියට වඩා ඒක අපට පුළුවන්.

දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? මේ අයගේ strategy එක මොකක්ද? මම මේ රටේ ජනතාවටත් එක්කයි මේ කියන්නේ. මේගොල්ලන්ගේ උපාය මාර්ගය තමයි තමන් හොරු නිසා තමන්ගේ ගණනට ආණ්ඩුවත් දමාගන්න එක. ඒක නේ ගරු කථානායකතුමනි ලේසි. ඒ කියන්නේ, ඇත්ත values වලින්, ඇත්ත තරගයකින් යමක් පරාජයට පත් කරන්න බැරි නම්, මොකක්ද කරන්නේ? කරන දේ තමයි, තමන්ගේ ප්‍රතිවාදියා වචනවලින් පහත් කොට තමන්ගේ ගණනට දමා ගැනීම.

මම ඒකයි කියන්නේ. ඒක මේ රටේ ජනතාවට කරන අගෞරවයක්. මොකද, එතුමන්ලාත් පාර්ලිමේන්තු ඇවිල්ලා තිබෙන්නේ ඡන්දයකින් නිසා.

ගරු කථානායකතුමනි, දැනටමත් මම ලොකු වෙලාවක් අරගෙන තිබෙන නිසා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ උපාය මාර්ගය ගැනයි මම කිව්වේ. අපි රටේ ජනතාවටත් කියනවා මෙය. මෙතැන උපාය මාර්ගය මොකක්ද, තිබෙන්නේ? මේ විපක්ෂයේ ආණ්ඩු කරපු කට්ටිය - විපක්ෂයේ හැම කෙනාටම මේක අදාළ නැහැ - අද හොරු බවට ඔප්පු වෙලා තිබෙන්නේ. ඒගොල්ලෝ සම්පත් ගසා කාලා ඒකට පුරුදු වෙලා තිබෙන්නේ. ඒගොල්ලෝ ඥාති සංග්‍රහ කරලා පුරුදු වෙලා තිබෙන්නේ. තමන්ගේ ආසනයේ හදන tunnel එකෙන් මිලියන 50ක් ඉල්ලුවා කියලා මේ අද උදේ මට කිව්වේ. ඒ වාගේ අය තමයි මෙතැන විපක්ෂයේ ඉන්නේ. විශේෂයෙන් රට පාලනය කරපු කණ්ඩායම් දෙක. එතැන එක මන්ත්‍රීවරයෙක් දෙන්නෙක් එහෙම නැති අයත් ඇති. නමුත් සමස්තය ගැන; බහුතරය ගැන මම කිව්වේ. ඒ නිසා ඒගොල්ලෝ හදනවා, අපිවත් එහෙම අය කියලා ලෝකෙට පෙන්වන්න. සොරි! ඒක වෙන්නේ නැහැ. ඔයගොල්ලෝ අවුරුදු 100ක් try කළත් ඒක වෙන්නේ නැහැ. අපි ඕනෑම ඍතුවක - in all seasons - අදූෂිතව, අවංකව වැඩ කරන්න පුළුවන් කියලා පෙන්වපු පක්ෂයක්; හිරගෙදර සිට ජනාධිපති මන්දිරය දක්වා. ඒ නිසා රටේ ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ, අද ආණ්ඩුව පිළිබඳව කියන බොරු තොරතුරු මත කටයුතු කරන්න එපා කියලායි.

ඊයේ අගමැතිතුමියගෙන් අහනවා, අපි ජපුර Faculty of Dental Sciences වහනවාද කියලා. අපි නොමිලයේ අධ්‍යාපනය රැකීම වෙනුවෙන් ගිවිස ගත්ත දේශපාලන ව්‍යාපාරයක්, පාර්ලිමේන්තුවට එන්නේ නැතුවත්. අපේ කාලයේදී faculties හදනවා මිසක් faculties වැහෙන්නේ නැහැ. ඒගොල්ලෝ තමයි එහෙම කළේ.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් තව කරුණක් දෙකක් ඉක්මනින් කියන්න ඕනෑ. එකක් තමයි, විපක්ෂයට මම කියන්න කැමැතියි, දැන්වත් නිවැරදි වෙන්න උත්සාහ කරන්න කියලා. අපට වඩා ඉස්සරහට ගිහිල්ලා බලය ගන්න. අපට වඩා ගුණගරුකකම් වර්ධනය කරගෙන බලය ගන්න. ඒක තමයි මේ මාතෘ භූමියට ඕනෑ. එහෙම වෙන්න. ඒකට උත්සාහ කරන්න. ඔයගොල්ලන්ගේ එක්කෙනෙක් දෙන්නෙක් එහෙම පුළුවන් අය ඇති.

දැන් මේගොල්ලන් කියන්නේ මොකක්ද? නිදහස් උළෙල ඇතුළේ අපේ ජනාධිපතිතුමාගේ photo එකයි, සජිත් ප්‍රේමදාස මහත්තයාගේ photo එකයි, තව තව අයගේ photosයි දාලා අපේ ජනාධිපතිතුමාගේ photo එක ගත්තාම, පෞරුෂය මදි ලු; අරකද මේකද කියලා කියනවා. මොන මිනිස්සු ද මේ, ගරු කථානායකතුමනි? මොන මිනිස්සු ද? අපි අවංකවම ගත්තොත්, මේ රටේ ජන නායකයෙක් පත් වුණාට පස්සේ, ඡන්දයෙන් පත් වුණාට පස්සේ, අපි සාමාන්‍යයෙන් ගරු කරනවා. අපි විපක්ෂ නායකතුමාගේ ඇඟේ හැඩයක් ගැන කථා කරන්නේ නැහැ නේ. එතුමා විපක්ෂ නායක. ඒ, ජනතාවගේ ඡන්දය නිසා. මොකක්ද, මේ වෙලා තිබෙන්නේ? මම දැක්කා, එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් දාලා තිබෙනවා. අපට එහෙම පෞරුෂය පිළිබඳ කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි හොඳට මේ දේශපාලන ව්‍යාපාරය තුළ ගොඩනැඟිලා තිබෙන්නේ. ඒ නිසා තමයි අද අනුර දිසානායක සහෝදරයා ලෝකය පුරාම ජනාධිපති වශයෙන් යන්නේ, ඒ වාගේම තමයි අපේ අගමැතිතුමියත්, මොන glamour එකක්ද, ඕනෑම event එකක. මොන glamour එකක්ද? Glamour එක එන්නේ නිකම් ඇඳුමෙන් විතරක් නොවෙයි, content එකෙන්. Content එකෙන් එන්නේ. ජනාධිපතිතුමා, අගමැතිතුමිය. ඒ නිසා ඒක පිළිගන්න. ඒකට ලජ්ජා වෙන්න එපා. ඔයගොල්ලෝ ඒ හීනමානය ඇති කර ගන්න එපා.

දැන් මොකක්ද කියන්නේ? නිදහස් උළෙල අභිමානවත් මදි කියන එක තමයි මේගොල්ලන්ගේ අර මෝඩ ෆේස්බුක් බලකාය තීන්දු කරපු strategy එක. දැන් ඒකට බොරු කථා කියනවා. ජනාධිපතිතුමා ඒකට ආව විධිය වැරදියි; අගමැතිතුමියගේ සාරිය වැරදියි; බැහැපු විධිය වැරදියි; photo එක ගහපු විධිය වැරදියි; පුටුව හොඳ නැහැ කියනවා. ගරු කථානායකතුමනි, පුටුවෙන් පෞරුෂය හදාගන්න ඕනෑ කවුද? පඹයෝ නේ. තමන්ට දෙයක් නැත්නම් තමයි පුටුව, ඇඳුම, sunglasses ඕනෑ වෙන්නේ, නේද? අපි සාමාන්‍ය වාහනවල යන්නේ ඇයි? අපි වාහනයෙන් පෞරුෂය හදා ගන්නේ නැහැ. අපට පෞරුෂයක් තිබෙනවා. අපි කථා කරන දේ දන්නවා. අපි කරන දේ දන්නවා. ඒ නිසා අපට පුටුවෙන්වත්, ඇඳුමෙන්වත්, වාහනයෙන්වත් පෞරුෂය හදා ගන්න ඕනෑ නැහැ. ආරක්ෂිතව යන්න තිබෙන වාහනයක් තිබුණාම ඇති. නමුත් මේගොල්ලෝ පෞරුෂය හදා ගත්තේ කොහොමද? මම ඉස්සරත් කියලාත් තිබෙනවා. යුද්ධ කාලයේ මම කියලා තිබෙනවා, පොහොට්ටුවේ සමහර ඇමතිවරු මුලතිව්වලට පයින් ඇවිදගෙන ගියත්, එල්ටීටීඊ නායකයාගේ ගෙදර ළඟට ගියත් මොකුත් කරන්නේ නැහැ. හැබැයි, මේ අය ගම වටේ යන්නෙත් STF jeep දෙක තුනක් දාගෙන. අපට එහෙම අඩුවක් නැහැ. ඒකයි මම කියන්නේ. මේගොල්ලන්ගේ තිබෙන්නේ ඒක. ඔයගොල්ලන්ට තිබෙන්නේ අන්න ඒ වාගේ ප්‍රශ්න; ඔයගොල්ලන්ට තිබෙන්නේ, පෞරුෂ ප්‍රශ්නයක්. ඔයගොල්ලෝ මානසික වශයෙන් ලෙඩ වෙයි, මන්ත්‍රීතුමා. ඔච්චර ඉරිසියා කරන්න එපා. ඔයගොල්ලන්ගේ දේශපාලන DNA එක වෙනස් කර ගන්න. කවදාවත් ඔයගොල්ලන්ට අලුත් පරම්පරාව දිනන්න බැහැ, ඔය මජර දේශපාලන වැඩවලින්. සතුරාට ගරු කරන්න පුරුදු වෙන්න.

නජිත් ඉන්දික මන්ත්‍රීතුමා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ගැන අද ඉතාම පැහැදීමෙන්, ඉතාම හොඳින් කථා කළා, එතුමාගේ ගුණගරුකකම ගැන කියමින්. අපට එහෙම පෞරුෂයක් තිබෙනවා. මොකද, හොඳ කෙනෙකු අගය කරන්න පුළුවන් හොඳ කෙනෙකුට විතරයි. හොඳ කෙනෙකු අගය කරන්න පුළුවන් හොඳ කෙනෙකුට විතරයි! මට ඒ වචනය ඉංග්‍රීසියෙන් කිව්වොත් තමයි, phrase එක හොඳට එන්නේ. "මොළය කනවා" කියන්නේ. අද වෙලා තිබෙන්නේ ඒක. අපරාදේ අපේ කාලය නාස්ති කරනවා. මේක මෝඩ මැටි ගුහාවක් බවට පත් කරලා තිබෙනවා; මඩ ගොඩක් බවට පත් කරලා තිබෙනවා. කිසි දෙයක් පාඩම් කරලා ඇවිල්ලා කථා කරන එක තේරුමක් නැති කරලා තිබෙනවා. මොන තරම් දේශපාලන මැටිහාවයක් ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවේ ඇති කරනවාද? අපි ඔබතුමන්ලාට කියන්නේ මේකයි. ඔබතුමන්ලා එහෙම වුණාට අපි එහෙම වෙන්නේ නැහැ, මන්ත්‍රීකම් තිබුණත් නැතත්.

නිදහස් උළෙල ගැනත් කිව්වා නේ. රාජපක්ෂ පවුලම හිරේ යන්න ඉන්නේ. පට්ට හොරු. අද මෙතැනට ඇවිල්ලා දෙවිවරු වාගේ කථා කළා. රාජපක්ෂලා කියන්නේ කවුද? මේ මාතෘ භූමිය බංකොලොත් කරලා, හොරකම් කරලා, ජාතිය දීනභාවයට පත් කරපු දේශපාලන අපරාධකාරයෝ. ආර්ථික ඝාතකයෝ කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වැරැදිකරුවන් වෙච්ච දෙන්නෙක් ඉන්නවා, රාජපක්ෂ පවුලේ. දෙන්නෙක් ද, තුන්දෙනෙක් ද? මට මතක විධියට දෙන්නෙක් ඉන්නවා. ආර්ථික අපරාධකාරයෝ. අද බැසිල් රාජපක්ෂ නඩුවට එන්නේ නැහැ. ඉතින් නඩුවට ඇවිල්ලා පුළුවන් නේ, ඔප්පු කරන්න. මොකද, අපි global rankingsවලත්, judicial independence පැත්තෙනුත් උඩට ගිහිල්ලා තිබෙන්නේ. ඉතින්, බාප්පාව එක්කගෙන එන්න එපා යැ, නඩුවට. නඩුවෙන් හැංගෙනවා, බොරු කියනවා, හොරකම් කරනවා. රට බංකොලොත් කළා. එහෙම කරලා ලංකාවේ අභිමානය ගැන කථා කරනවා. ලංකාවේ අභිමානය sunglassවලින් තමයි ඒ ගොල්ලන් ගෙනැල්ලා තිබෙන්නේ. අභිමානය මනින්නේ ලෝකය ඉස්සරහා ජාත්‍යන්තර වශයෙන් ලංකාවට තිබෙන තැන අනුවයි. මම ඒ ගැන පෙන්නුවේ. හදිසි නීති විවාදය නිසා ඒ ගොඩක් දේවල් කියන්න ඕනෑ නැහැ. මේ කියපු democracy පැත්තෙන්, rule of law පැත්තෙන්, judicial independence පැත්තෙන් වර්ධනයක් තිබෙනවා. මේවා තමයි ලංකාවේ අභිමානය වර්ධනය කරන විධි. ආර්ථික වශයෙන් වන වර්ධනය, වෙනමයි.

මා කලින් කියපු අය දේශපාලන අපරාධකරුවෝ. බොහෝ දුරට පාස්කු ඉරුදින ප්‍රහාරයේ ඝාතකයන්ගේ මහ මොළකරුවෝ. ඒකයි අපි ඔබතුමන්ලාට කියන්නේ. මෙන්න මේ දේශපාලන අපරාධකරුවෝ අද channelsවල හයිය අරගෙන මෙතැන බොරු හදනවා. පොල් වතුවල චූටි ගස් පහක් විතර තිබෙන තැනකට ගිහිල්ලා රැස්වීමක් කරලා ඒක crop කරලා, crop කරලා දාලා පෙන්වනවා, අම්මෝ! 10,000ක් විතර ඉන්නවා කියලා. අපි නාමල් රාජපක්ෂ ඇතුළු ඔය බයි ටොයි ඔක්කොම නඩයට කියනවා, මාර්තු 08වැනි දාට බලාගෙන ඉන්න කියලා. දිනය වෙන් කර ගන්න; මාර්තු 08වැනි දා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම විපක්ෂයේ සමහර අය කියනවා, හමුදාවේ අයට අපි ගරු කරන්නේ නැති ලු. අපි දන්නවා ත්‍රිවිධ හමුදාව, පොලීසිය මේ රට වෙනුවෙන්, මේ රටේ සාමාන්‍ය ජනතාව වෙනුවෙන් කරන ලද දායකත්වය ගැන. 'දිට්වා" සුළි කුණාටුව අවස්ථාවේදීත් ඔවුන් විශාල වශයෙන් කැප කිරීම් කළා. ඒ වාගේම අපි අහන්න කැමැතියි, ජෙනරාල් ෆොන්සේකාව ඇදගෙන ගිහිල්ලා හිරේ දැම්මේ කවුද කියලා. ඔය ඒගොල්ලන්ම අගය කරන මහා ලොකු හමුදා නායකයන් කී දෙනෙකු රට දාලා ගියාද? මා හිතන්නේ, ඊට පස්සේ හිටපු මහේෂ් සේනානායක කියන හමුදාපතිතුමා ඇතුළු අයත් රට පැනලා හිටියේ. එතුමා සජබ යෙන්ද කොහේද ඡන්දය ඉල්ලුවා. ඒකෙන් හෝ කොහෙන් හෝ එතුමා ඡන්දය ඉල්ලන්න හැදුවා; හරි, ඉල්ලුවා. මට ඒක මතක නැහැ. ඒගොල්ලන් රට පැනලායි හිටියේ. එහෙම තමයි රාජපක්ෂලා හමුදාවේ අයට සැලකුවේ. රාජපක්ෂලා බලයේ හිටපු කාලයේ Navy එකේ band එක මට හම්බ වුණා. ඒගොල්ලන්ගේ rugger matches බලන්න යන්න ඕනෑ Navy එකේ ළමයි, නැත්නම් Air Force එකේ නිලධාරින්; සොල්දාදුවන්. එදා හමුදාව තමන්ගේ ජඩ වැඩවලට පාවිච්චි කරලා තිබුණා. ඒ වාගේම, ත්‍රිවිධ හමුදාව ලෝකය ඉස්සරහ අපකීර්තියට පත් කළේ කවුද? යුද්ධයෙන් පස්සේත් එහෙම කළේ කවුද? එල්ටීටීඊ එකත් විශාල ප්‍රශ්නයක් ලංකාවට හදලා තිබුණා.

යුද්ධය අවසන් කළා කියමුකෝ. 2009 වර්ෂයෙන් පස්සේ -අද - හමුදාවට විරුද්ධව තිබෙන ප්‍රධාන චෝදනා මොනවාද? යුද්ධය කාලය තුළ වෙච්ච ඒවාට වඩා තිබෙන්නේ යුද්ධයෙන් පස්සේ වෙච්ච ඒවා. ත්‍රිකුණාමලයේ දරු පැටවු 11දෙනෙකු උස්සාගෙන ගිහිල්ලා මැරුවේ කොහොමද, යුද්ධයෙන් පස්සේ Rajapaksa projectsවලට? තාජුඩීන්ට මොකද වුණේ? අද හමුදාවේ නම් කියැවෙන්නේ මොනවාටද? රාජපක්ෂලාගේ කුණු, මිනීමරු projectsවලට ගිහිල්ලා. ඒක තමයි ඇත්ත. අපේ හමුදාව සම්බන්ධයෙන් යුද්ධය අතරතුර වෙච්ච දේවලට වඩා අද අන්තර්ජාතිකව - UN එක හමුවට - එන චෝදනා මොනවාද කියලා විදේශ කටයුතු ඇමතිතුමා දන්නවා. UN එක හමුවට අද වැඩිපුරම එන්නේ මොනවාද? යුද්ධයෙන් පසුව කරපු අපරාධ ගැන චෝදනායි. දෙපැත්තක් ගහ ගත්තු නිසා යුද්ධය අතරතුර එවැනි දේවල් වුණා කියමුකෝ. ත්‍රිවිධ හමුදාවේ ගරුත්වය විනාශ කළේ රාජපක්ෂලාගේ දූෂ්ට, කාලකණ්ණි projectsවලට හමුදාව යොදා ගෙනයි. "ත්‍රිපොලි" ගැන මතකද? මොනවාද, ඒගොල්ලෝ කළේ? ඒගොල්ලෝ කළේ යුද්ධය නොවෙයි, යුද්ධයෙන් පස්සේ ප්‍රතිවිරුද්ධ දේශපාලන මතධාරින් ඝාතනය කරපු එකයි; උස්සපු එකයි. සුදු වෑන් සංස්කෘතිය පටන් ගත්තේත් කවුද? උතුරේ සුදු වෑන් හැම දාම තිබෙන්න ඇති. ඊටත් කලින් දකුණේත් තිබුණා. හැබැයි, 2009න් පස්සේ තමයි කොළඹට සුදු වෑන් ගෙනාවේ.

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු කථානායකතුමනි, අද අන්තර්ජාතික වශයෙන් ත්‍රිවිධ හමුදාවට මොකක් හරි කැලලක් ඇති කරලා තිබුණා නම්, ත්‍රිවිධ හමුදාවේ සමහර නායකයන්ට ලෝකය ඉස්සරහට යන්න බැරි වෙලා තිබෙනවා නම් ඒ විශේෂයෙන් මේ යුද්ධයෙන් පස්සේ වෙච්ච දේවල් නිසායි. යුද්ධයේදී වෙච්ච අපරාධ ටික- දෙමළ මිනිසුන්ගේ රත්තරන් ටික හොරකම් කළා. දුන්නාද? අපි බලයට ආවාට පසුව තමයි ඒවා ගැන දැනගත්තේ. අපේ ගරු ජනාධිපතිතුමා සහභාගි වූ ආරක්ෂක කවුන්සලයේ රැස්වීමකදී උතුරේ ජනතාවගේ රත්තරන් බඩු ටොන් ගණනක් තිබෙනවා කියලා දැන ගත්තා. ඒවා, ඉතිරි වෙච්ච ප්‍රමාණය. අනෙක් ටික රාජපක්ෂලාගේ ගෝල බාලයෝ ගහ ගන්න ඇති. ඒ ඉතිරි ටික ආපසු දෙන්න ඕනෑ. අප ආණ්ඩුවක් වශයෙන් බලය ගන්න ඉස්සෙල්ලා රනිල් වික්‍රමසිංහගේ බලය පැවැති කාලයේ සුමන්තිරන් මහත්මයා හිටියා නේ, *de facto* අගමැති වාගේ. සුමන්තිරන් මහත්මයා තමයි ඒ කාලයේ මෙතැන *de facto* අගමැති; second Prime Minister වාගේ හිටියේ. ඒ level එකේ හිටියේ. හැබැයි, අඩුම ගණනේ ඒ රත්තරන් බඩු ටික ඒ ජනතාවට ආපහු දෙන වැඩේවත් කරවා ගත්තාද? අප බලයට ආවාට පසුව තමයි ඒවා පෙන්නුවේ. අද ඒවා රාජසන්තක කරලා තිබෙනවා. අපි ඒවා ගැන රස පරීක්ෂක හරහා සමීක්ෂණ කරනවා. එහෙම කරලා අපි ඒවා දෙන්න පුළුවන් හැම කෙනාටම දෙනවා; උපරිම වශයෙන් දෙනවා. රස පරීක්ෂක වාර්තා ආවාට පස්සේ ඒවා දෙනවා. රස පරීක්ෂක වාර්තාවලින් සම්මත කර ගන්න බැරි වුණොත්, අපි ඒවා උතුරු, නැඟෙනහිර සංවර්ධන අරමුදලක් හදලා ඒකට දමනවා. ඒ කියන්නේ, ඒ සල්ලිත්, ඊට අමතරව තවත් සල්ලිත් දාලා වෙනම development fund එකක් හදනවා. ඒ බව ගරු ජනාධිපතිතුමා කියලා තිබෙනවා. ඒක තනිකරම උතුරේ සහ නැගෙනහිර ජනතාවගේ සංවර්ධන කටයුතු සඳහා පමණයි. එහෙම නේ කරන්න තිබුණේ, රාජපක්ෂලාට, සජබයට, රනිල්ලාට. මේ ආණ්ඩුව -අපි- දේශපාලන වශයෙන් ජාතික සමගිය තිබෙන, සමාජ සමගිය තිබෙන රටක් හදා ගෙන යනවා. ඒ නිසා ඒ කරන දේවල අඩුපාඩුකම් තිබෙනවා නම් ඒවා ගැන කිව්වාට ප්‍රශ්නයක් නැහැ. ඒවා පිළිගන්න අපි ලැහැස්තියි. නමුත්, විපක්ෂය සහමුලින්ම ද්වේශයෙන් කථා කරන්නේ. අද පාස්කු ඉරුදින ප්‍රහාරයේ මිනීමරුවන් වෙනුවෙන් කථා කරන මට්ටමට, ඒ ගැන පරීක්ෂණ කරන උසාවි 'කැලෑ උසාවිය' කියලා නම් කරන මට්ටමට විපක්ෂයේ ඔබතුමන්ලා දේශපාලන වශයෙන් දණ ගස්වපු එක ගැන අපේ මාතෘ භූමියේ ජනතාවට ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 80, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය අනුමත කිරීමට සභාව එකඟද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, හදිසි නීතිය පිළිබඳ විවාදයේදී අපේ ගරු මන්ත්‍රීවරුන් අදහස් ප්‍රකාශ කළ විධියටම, හදිසි නීතිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවක් ඇති බව අපි විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා අපගේ විරුද්ධත්වය සටහන් කර ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I call for a Division, Sir.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

න්‍යාය පත්‍රයේ විෂය අංක 80, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය, සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරුන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරුන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරුන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි තහවුරු කර ගන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද?

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ වෙනත් ගරු මන්ත්‍රීවරු සිටිනවාද?

මගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 105; විරුද්ධව 02; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 105; எதிராக 02; விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 105; Noes 02; Abstain 0*

| | |
|---|---|
| G 002. Sunil Handunnetti | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 020. Kumara Jayakody | Yes |
| G 023. Upali Pannilage | Yes |
| G 024. Susil Ranasinghe | Yes |
| G 025. Nihal Galappaththi | Yes |
| G 026. Nihal Abeysinghe | Yes |
| G 027. Namal Karunaratne | Yes |
| G 029. Gamagedara Dissanayake | Yes |
| G 030. R.M. Jayawardhana | Yes |
| G 031. Sunil Watagala | Yes |
| G 033. Mahinda Jayasinghe | Yes |
| G 034. Chathuranga Abeysinghe | Yes |
| G 035. Eranga Gunasekara | Yes |
| G 040. Anton Jayakody | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 042. Sundaralingam Pradeep | Yes |
| G 043. Ruwan Ranasinghe | Yes |
| G 044. Muneer Mulaffer | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 051. Janitha Ruwan Kodithuwakku | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 053. Sugath Thilakaratne | Yes |
| G 054. Kaushalya Ariyarathne | Yes |
| G 057. Dinindu Saman | Yes |
| G 058. Nishantha Jayaweera | Yes |
| G 059. Ashoka Ranwala | Yes |
| G 060. Lakshman Nipuna Arachchi | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Najith Indika | Yes |
| G 063. Lakmali Hemachandra | Yes |
| G 064. Samanmali Gunasingha | Yes |
| G 070. Sagarika Athauda | Yes |
| G 071. Roshan Akmeemana | Yes |
| G 072. U. P. Abeywickrama | Yes |
| G 073. L.M. Abeywickrama | Yes |
| G 074. M.K.M. Aslam | Yes |
| G 075. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 076. Oshani Umanga | Yes |
| G 077. Krishnan Kalaichelvi | Yes |
| G 080. Chaminda Lalith Kumara | Yes |
| G 082. Nilanthi Kottahachchi | Yes |
| G 083. M.A.C.S. Chathuri Gangani | Yes |
| G 084. Lasith Bhashana Gamage | Yes |
| G 086. Nilusha Lakmali Gamage | Yes |
| G 088. Ajith Gihan | Yes |
| G 089. Jagath Gunawardana | Yes |
| G 090. Aboobucker Athambawa | Yes |
| G 091. Ruwanthilaka Jayakody | Yes |
| G 092. Thushari Jayasingha | Yes |
| G 093. T.K. Jayasundara | Yes |
| G 094. Mayilvaganam Jegatheeswaran | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Anushka Thilakarathne | Yes |
| G 099. Chandana Thennakoon | Yes |
| G 103. Susantha Dodawatta | Yes |
| G 104. Susantha Kumara Nawarathna | Yes |
| G 105. Sena Nanayakkara | Yes |
| G 106. Aruna Panagoda | Yes |
| G 107. Nimal Palihena | Yes |
| G 108. Nishantha Perera | Yes |
| G 109. Stepni Fernando | Yes |
| G 110. Kanthasamy Prabu | Yes |

| | |
|---|---|
| G 111. Lal Premanath | Yes |
| G 112. Nanda Bandara | Yes |
| G 113. Padmasiri Bandara | Yes |
| G 114. Ravindra Bandara | Yes |
| G 115. Sudath Balagalla | Yes |
| G 116. Sri Bavanandarajah | Yes |
| O 014. Amirthanathan Adaikkalanathan | No |
| O 015. G.G. Ponnambalam | No |
| O 066. Wijesiri Basnayake | Yes |
| O 067. S. Sandaruwan Madarasinghe | Yes |
| O 068. Prageeth Madhuranga | Yes |
| O 070. Ruwan Mapalagama | Yes |
| O 071. Nandana Millagala | Yes |
| O 081. Danushka Ranganath | Yes |
| O 082. Sanjeewa Ranasingha | Yes |
| O 083. Sunil Rathnasiri | Yes |
| O 084. Manjula Sugath Rathnayaka | Yes |
| O 089. Deepthi Wasalage | Yes |
| O 090. Kanchana Welipitiya | Yes |
| O 091. R. G. Wijerathna | Yes |
| O 092. Nishantha Samaraweera | Yes |
| O 093. Priyantha Wijerathna | Yes |
| O 094. Ruwan Wijeweera | Yes |
| O 095. Darmapriya Wijesinghe | Yes |
| O 099. Thilina Samarakoon | Yes |
| O 101. Dewananda Suraweera | Yes |
| O 102. Chandana Sooriyaarachchi | Yes |
| O 103. G.D. Sooriyabandara | Yes |
| O 105. Janaka Senarathna | Yes |
| O 106. Chandima Hettiaratchi | Yes |
| O 107. Champika Hettiarachchi | Yes |
| O 108. Dinesh Hemantha | Yes |
| O 109. Geetha Herath | Yes |
| O 111. Muhammad Faizal | Yes |
| O 112. Ashoka Gunasena | Yes |
| O 113. Nandana Pathmakumara | Yes |
| O 115. Samantha Ranasingha | Yes |

Electronic Voting Results:

**Participants:**

| | |
|---|---|
| Present | 107 |

**Votes:**

| | |
|---|---|
| Yes | 105 |
| No | 02 |
| Abstain | 0 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 105යි; නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව පක්ෂව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 106යි.

විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි; ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 0යි.

ඒ අනුව, න්‍යාය පත්‍රයේ විෂය අංක 80, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය, වැඩි ඡන්ද 104කින් සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 81, අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම. ගරු සභානායකතුමා.

## අත්‍යවශ්‍ය මහජන සේවා පනත: යෝජනා සම්මතය
## அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்: தீர்மானம்
## ESSENTIAL PUBLIC SERVICES ACT: RESOLUTION

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2026 ජනවාරි 28 දිනැති අංක 2473/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2026.02.03 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.29ට, 2026 පෙබරවාරි 17වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.29க்கு, 2026 பெப்ருவரி 17, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.29 p.m. until 9.30 a.m. on Tuesday, 17th February, 2026.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

## 2015 සැප්තැම්බර් මස පත් කරන ලද නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යවරයා: නිල වාහන
## 2015 செப்ரெம்பரில் நியமிக்கப்பட்ட நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்: உத்தியோகபூர்வ வாகனங்கள்
## MINISTER OF CITY PLANNING AND WATER SUPPLY APPOINTED IN SEPTEMBER, 2015: OFFICIAL VEHICLES

1588/2025

**1. ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් සිට පත් කරන ලද නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) எட்டாவது பாராளுமன்றத்தில் 2015 செப்ரெம்பர் மாதத்திலிருந்து நியமிக்கப்பட்ட நகரத் திட்ட மிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சருக்கு, அப்போதைய அரசாங்கத்தால் ஒதுக்கப்பட்ட உத்தியோகபூர்வ வாகனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அந்த உத்தியோகபூர்வ வாகனங்களின் பதிவு இலக்கம், வகை மற்றும் மாதிரி வெவ்வேறாக யாது என்பதையும்;

(iii) குறித்த உத்தியோகபூர்வ வாகனங்கள் ஒதுக்கப்பட்டிருந்த காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனம் ஒவ்வொன்றுக்கும் வழங்கப்பட்டிருந்த மாதாந்த எரிபொருளின் அளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) சம்பந்தப்பட்ட அமைச்சர், நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர் பதவியை வகித்த காலப்பகுதியில், அத்தகைய உத்தியோகபூர்வ வாகனங்களுக்காக மாதாந்தம் பயன்படுத்திய எரிபொருள் லீட்டர் அளவு மற்றும் செலவு, உத்தியோகபூர்வ வாகனம் ஒவ்வொன்றின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of official vehicles allocated by the then Government to the Minister of City Planning and Water Supply appointed from September, 2015 in the Eighth Parliament;

(ii) registration number, type and model of the said official vehicles, separately; and

(iii) duration for which those official vehicles were allocated?

(b) Will she also inform this House the -

(i) monthly fuel entitlement for each of the said official vehicles, separately; and

(ii) amount of fuel spent monthly in litres and expenditure incurred on that for each of those official vehicles, separately, during the period when the said Minister held the office of Minister of City Planning and Water Supply?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

(අ) (i) නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය සතුව ඇති ගොනුවල අන්තර්ගත තොරතුරුවලට අනුව මෙම කාලයට අදාළව නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යවරයාට නිල රථ 2ක් වෙන් කර ඇත.

(ii)

| අනු අංකය | වාහන ලියාපදිංචි අංකය | වර්ගය | මාදිලිය |
|---|---|---|---|
| 01 | KS 3117 | කාර් | නිසාන් ටීනා |
| 02 | PE 1449 | ඩබල් කැබ් | ටොයොටා හයිලක්ස් |

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

(iii) 2015.09.21 දින සිට ඉදිරියට අමාත්‍යවරයා සඳහා නිල රථ වෙන් කර ඇත.

(ආ) (i) ජනාධිපති චක්‍රලේඛ සීඒ/1/17/1 දරන 2010.05.14 දිනැති චක්‍රලේඛය අනුව අමාත්‍යවරයා බස්නාහිර පළාතෙන් පිටත බැවින් කාර් රථය සඳහා මාසිකව පෙට්‍රල් ලීටර් 750ක දීමනාවක් සහ ඩබල් කැබ් රථය සඳහා ඩීසල් ලීටර් 600ක දීමනාවක් හිමිව ඇත. විස්තර **ඇමුණුම*** මඟින් දක්වා ඇත.

(ii) නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශයේ ගිණුම් අංශයේ වැටුප් ලෙජරයට අනුව ලබා දුන් තොරතුරු අනුව 2015 සහ 2018 වර්ෂවල ඉන්ධන ලීටර් සඳහා ගිය වියදම පහත පරිදි දැක්විය හැකි අතර 2016, 2017 වර්ෂවලට අදාළව ඉන්ධන ප්‍රමාණය සහ ඉන්ධන ලීටර් සඳහා ගිය වියදම ද, 2015, 2018 වර්ෂවලට අදාළ ඉන්ධන ප්‍රමාණය සම්බන්ධ තොරතුරු ද ගිණුම් අංශය සතුව නොමැති බව දැනුම් දී ඇත.

**2015 - (වියදම රුපියල්වලින්)**

| ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|
| 346,050.00 | 201,750.00 | 201,750.00 |

**2018 - (වියදම රුපියල්වලින්)**

| ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි |
|---|---|---|---|---|---|
| 201,750.00 | 201,750.00 | 201,750.00 | 201,750.00 | 201,750.00 | 233,550.00 |

| ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|
| 250,350.00 | 250,350.00 | 250,350.00 | 259,350.00 | - | - |

(ඇ) අදාළ නොවේ.

(அ) (i) இந்த அமைச்சின் கோப்புகளிலுள்ள தகவல்களின்படி, இந்தக் காலத்துக்குரிய வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சருக்கு 2 உத்தியோகபூர்வ வாகனங்கள் ஒதுக்கப்பட்டுள்ளன.

(ii)

| தொடர் இல. | வாகனப் பதிவு இல. | வகை | மாதிரி |
|---|---|---|---|
| 01. | KS 3117 | கார் | நிஸான் டினா |
| 02. | PE 1449 | டபல் கெப் | டொயோட்டா ஹைலக்ஸ் |

(iii) 21.09.2015 முதல் அமைச்சருக்கு உத்தியோகபூர்வ வாகனங்கள் ஒதுக்கப்பட்டுள்ளன.

(ஆ) (i) சனாதிபதி சுற்றறிக்கை சிஏ/1/17/1 கொண்ட 2010.05.14ஆம் திகதிய சுற்றறிக்கைக்கு அமைய, அமைச்சர் மேல் மாகாணத்துக்கு வெளியே இருப்பதால், அவரது காருக்கு 740 லீற்றர் பெற்றோல் கொடுப்பனவு மற்றும் டபல்கெப் வண்டி தொடர்பாக 600 லீற்றர் டீசலும் மாதாந்தக் கொடுப்பனவாகப் பெற உரிமை உண்டு. ***இணைப்பில்** காட்டப்பட்டுள்ளது.

(ii) இந்த அமைச்சின் கணக்குப் பிரிவின் சம்பளப் பேரேட்டுக்கு அமைய வழங்கப்பட்ட தகவல்களின் அடிப்படையில், 2015 மற்றும் 2018ஆம் ஆண்டுகளின் எரிபொருள் லீற்றருக்கான செலவினம் பின்வருமாறு காட்டப்படுகிறது.

2016 மற்றும் 2017ஆம் ஆண்டுகளுக்கான எரிபொருள் அளவு மற்றும் எரிபொருள் லீற்றருக்கான செலவினங்களும் 2015 மற்றும் 2018ஆம் ஆண்டுகளுக்கான எரிபொருளின் அளவுக்கான தகவல்களும் கணக்குப் பிரிவிடம் இல்லை என்று தெரிவிக்கப்பட்டுள்ளது.

**2015 - (செலவு ரூபாயில்)**

| ஒக்ரோபர் | நவம்பர் | டிசம்பர் |
|---|---|---|
| 346,050.00 | 201,750.00 | 201,750.00 |

**2018 - (செலவு ரூபாயில்)**

| சனவரி | பெப்ருவரி | மார்ச் | ஏப்பிரல் | மே | யூன் |
|---|---|---|---|---|---|
| 201,750.00 | 201,750.00 | 201,750.00 | 201,750.00 | 201,750.00 | 233,550.00 |

| யூலை | ஓகஸ்ட் | செப்ரெம்பர் | ஒக்ரோபர் | நவம்பர் | டிசம்பர் |
|---|---|---|---|---|---|
| 250,350.00 | 250,350.00 | 250,350.00 | 259,350.00 | - | - |

(இ) ஏற்புடையதன்று.

(a) (i) According to the information contained in the files in the possession of the Ministry of Housing, Construction and Water Supply, two (02) official vehicles were allocated to the Minister of City Planning and Water Supply during this period.

(ii)

| S/No. | Vehicle Registration No. | Type | Model |
|---|---|---|---|
| 01 | KS 3117 | Car | Nissan Teana |
| 02 | PE 1449 | Double Cab | Toyota Hilux |

(iii) Official vehicles had been assigned to the Minister from 21.09.2015 onwards.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(b) (i) As per President Circular No. CA/1/17/1 dated 14.05.2010, the Minister was entitled to a monthly allowance of 750 litres of petrol for his car and 600 litres of diesel for his Double Cab, as he was stationed outside the Western Province. It is indicated in Annex*.

(ii) According to the information provided in accordance with the salary ledger of the Accounts Division of the Ministry of Housing, Construction and Water Supply, the expenditure on fuel for the years 2015 and 2018 can be shown as follows, and it has been informed that the Accounts Division does not possess information on the quantity of fuel consumed in litres or the expenditure on fuel for the years 2016 and 2017, nor on the quantity of fuel consumed for the years 2015 and 2018.

**2015 - (Cost in Rupees)**

| October | November | December |
|---|---|---|
| 346,050.00 | 201,750.00 | 201,750.00 |

**2018 - (Cost in Rupees)**

| January | February | March | April | May | June |
|---|---|---|---|---|---|
| 201,750.00 | 201,750.00 | 201,750.00 | 201,750.00 | 201,750.00 | 233,550.00 |

| July | August | September | October | November | December |
|---|---|---|---|---|---|
| 250,350.00 | 250,350.00 | 250,350.00 | 259,350.00 | - | - |

(c ) Not relevant.

## 2015 සැප්තැම්බර් මස පත් කරන ලද කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා: නිල වාහන
## 2015 செப்ரெம்பரில் நியமிக்கப்பட்ட கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்: உத்தியோகபூர்வ வாகனங்கள்
## MINISTER OF INDUSTRY AND COMMERCE APPOINTED IN SEPTEMBER, 2015: OFFICIAL VEHICLES

1594/2025

**2.** ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් සිට පත් කරන ලද කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

\` යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේ දී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) எட்டாவது பாராளுமன்றத்தில் 2015 செப்ரெம்பர் மாதத்திலிருந்து நியமிக்கப்பட்ட கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சருக்கு, அப்போதைய அரசாங்கத்தால் ஒதுக்கப்பட்ட உத்தியோகபூர்வ வாகனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அந்த உத்தியோகபூர்வ வாகனங்களின் பதிவு இலக்கம், வகை மற்றும் மாதிரி வெவ்வேறாக யாது என்பதையும்;

(iii) குறித்த உத்தியோகபூர்வ வாகனங்கள் ஒதுக்கப் பட்டிருந்த காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனம் ஒவ்வொன்றுக்கும் வழங்கப்பட்டிருந்த மாதாந்த எரிபொருளின் அளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) சம்பந்தப்பட்ட அமைச்சர், கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர் பதவியை வகித்த காலப்பகுதியில், அத்தகைய உத்தியோக பூர்வ வாகனங்களுக்காக மாதாந்தம் பயன் படுத்திய எரிபொருள் லீட்டர் அளவு மற்றும் செலவு, உத்தியோகபூர்வ வாகனம் ஒவ்வொன்றின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of official vehicles allocated by the then Government to the Minister of Industry and Commerce appointed from September, 2015 in the Eighth Parliament;

(ii) registration number, type and model of the said official vehicles, separately; and

(iii) duration for which those official vehicles were allocated?

(b) Will she also inform this House the -

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සුජීව දිසානායක මහතා]

(i) monthly fuel entitlement for each of the said official vehicles, separately; and

(ii) amount of fuel spent monthly in litres and expenditure incurred on that for each of those official vehicles, separately, during the period when the said Minister held the office of Minister of Industry and Commerce?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

(අ) (i) 03කි.

(ii)

| අනු අංකය | ලියාපදිංචි අංකය | වර්ගය | මාදිලිය |
|---|---|---|---|
| 01 | KY-3709 | Land Rover | Discovery |
| 02 | KY-3713 | Land Rover | Discovery |
| 03 | PF-6284 | Toyota | Hilux |

(iii) 2015.09.09 දින සිට 2018.10.26 දක්වා

(ආ) (i)

| අනු අංකය | ලියාපදිංචි අංකය | ඉන්ධන වර්ගය | හිමි ඉන්ධන ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | KY-3709 | ඩීසල් | ලීටර් 600 (පළාතෙන් පිට) |
| 02 | KY-3713 | ඩීසල් | ලීටර් 600 (පළාතෙන් පිට |
| 03 | PF-6284 | ඩීසල් | ලීටර් 600 (පළාතෙන් පිට |

(ii) **ඇමුණුම*** මඟින් දක්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

(அ) (i) 03.

(ii)

| தொடர் இலக்கம் | பதிவு இலக்கம் | வகை | மாதிரி |
|---|---|---|---|
| 01. | KY-3709 | Land Rover | Discovery |
| 02. | KY-3713 | Land Rover | Discovery |
| 03. | PF-6284 | Toyota | Hilux |

(iii) 2015.09.09 திகதி முதல் 2018.10.26 வரை

(ஆ) (i)

| தொடர் இலக்கம் | பதிவு இலக்கம் | எரிபொருள் வகை | எரிபொருள் அளவு |
|---|---|---|---|
| 01. | KY-3709 | டீசல் | 600 லீற்றர் (மாகாணத்துக்கு வெளியே) |
| 02. | KY-3713 | டீசல் | 600 லீற்றர் (மாகாணத்துக்கு வெளியே) |
| 03. | PF-6284 | டீசல் | 600 லீற்றர் (மாகாணத்துக்கு வெளியே) |

(ii) ***இணைப்பில்** குறிப்பிடப்பட்டுள்ளது

(இ) ஏற்புடையதன்று.

(a) (i) The number of vehicles is three.

(ii)

| Serial Number | Registration Number | Type | Model |
|---|---|---|---|
| 01 | KY-3709 | Land Rover | Discovery |
| 02 | KY-3713 | Land Rover | Discovery |
| 03 | PF-6284 | Toyota | Hilux |

(iii) From 09.09.2015 to 26.10.2018

(b) (i)

| Serial Number | Registered number | Fuel Type | Entitled fuel quantity |
|---|---|---|---|
| 01 | KY-3709 | Diesel | Litres 600 (outside the province) |
| 02 | KY-3713 | Diesel | Litres 600 (outside the province) |
| 03 | PF-6284 | Diesel | Litres 600 (outside the province) |

(ii) It is indicated in Annex*.

(c ) Not applicable.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## 2018.11.09 දින පත් කරන ලද නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යවරයා: නිල වාහන

2018.11.09ஆம் திகதி நியமிக்கப்பட்ட நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்: உத்தியோகபூர்வ வாகனங்கள்

MINISTER OF CITY PLANNING AND WATER SUPPLY APPOINTED ON 09.11.2018: OFFICIAL VEHICLES

1601/2025

**3. ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2018 නොවැම්බර් 09 දින සිට පත් කරන ලද නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) எட்டாவது பாராளுமன்றத்தில் 2018 நவம்பர் 09ஆம் திகதியிலிருந்து நியமிக்கப்பட்ட நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சருக்கு, அப்போதைய அரசாங்கத்தால் ஒதுக்கப்பட்ட உத்தியோகபூர்வ வாகனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அந்த உத்தியோகபூர்வ வாகனங்களின் பதிவு இலக்கம், வகை மற்றும் மாதிரி வெவ்வேறாக யாது என்பதையும்;

(iii) குறித்த உத்தியோகபூர்வ வாகனங்கள் ஒதுக்கப் பட்டிருந்த காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனம் ஒவ்வொன்றுக்கும் வழங்கப்பட்டிருந்த மாதாந்த எரிபொருளின் அளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) சம்பந்தப்பட்ட அமைச்சர், நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர் பதவியை வகித்த காலப்பகுதியில், அத்தகைய உத்தியோகபூர்வ வாகனங்களுக்காக மாதாந்தம் பயன்படுத்திய எரிபொருள் லீட்டர் அளவு மற்றும் செலவு, உத்தியோகபூர்வ வாகனம் ஒவ்வொன்றின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of official vehicles allocated by the then Government to the Minister of City Planning and Water Supply appointed from 09th November, 2018 in the Eighth Parliament;

(ii) registration number, type and model of the said official vehicles, separately; and

(iii) duration for which those official vehicles were allocated?

(b) Will she also inform this House the -

(i) monthly fuel entitlement for each of the said official vehicles, separately; and

(ii) amount of fuel spent monthly in litres and expenditure incurred on that for each of those official vehicles, separately, during the period when the said Minister held the office of Minister of City Planning and Water Supply?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

(අ) (i) නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශයේ ගිණුම් අංශයෙන් ලබා දී ඇති තොරතුරු අනුව නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යවරයා වෙත 2018 නොවැම්බර් මස සහ දෙසැම්බර් මස ඉන්ධන දීමනාව ගෙවා නැත. එමෙන්ම ප්‍රවාහන අංශය සතුව ඇති ගොනු පරීක්ෂා කිරීමේදී මෙම කාලයට අදාළව නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යවරයාට නිල රථ වෙන් කිරීමට අදාළව තොරතුරු නොමැති බැවින් මෙම කාල සීමාවේදී අමාත්‍යවරයාට නිල රථ වෙන් කිරීමක් සිදු කර නොමැත.

(ii) මෙම කාල සීමාවේදී නිල රථ වෙන් කිරීමක් සිදු කර නොමැති නිසා මෙම ප්‍රශ්නය අදාළ නොවේ.

(iii) 2018.10.29 දින සිට 2018.12.15 දින දක්වා නිල රථ වෙන් කිරීමක් සිදුකොට නොමැත.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

(ආ) (i) මෙම කාල සීමාවේදී ඉන්ධන දීමනාව ගෙවා නොමැත.

(ii) අදාළ අමාත්‍යවරයාට නිල රථ වෙන් කිරීමක් සිදුකොට නොමැති නිසා මෙම ප්‍රශ්නය අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

(அ) (i) இந்த வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சின் கணக்குப் பிரிவால் வழங்கப்பட்டுள்ள தகவல்களின்படி, நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சருக்கு 2018ஆம் ஆண்டு நவம்பர் மாதம் மற்றும் டிசம்பர் மாதத்துக்கான எரிபொருள் கொடுப்பனவு வழங்கப்படவில்லை. அதேபோன்று, போக்கு வரத்துப் பிரிவிலுள்ள கோப்புகளைப் பார்வை யிடும்போது, இக்காலப் பகுதிக்குரிய வகையில் நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சருக்கு உத்தியோகபூர்வ வாகனங்கள் ஒதுக்கப்பட்டமை தொடர்பான எந்தவித தகவல் களும் இல்லாததால், அக்கால எல்லைக்குள் அமைச்சருக்கு உத்தியோகபூர்வ வாகன ஒதுக்கீடு மேற்கொள்ளப்படவில்லை.

(ii) இக்காலப்பகுதியில் உத்தியோகபூர்வ வாகனம் ஒதுக்கப்படாத காரணத்தால் இக்கேள்வி பொருந்தாது.

(iii) 2018.10.29 முதல் 2018.12.15 வரை உத்தியோக பூர்வ வாகன ஒதுக்கீடு எதுவும் செய்யப் படவில்லை.

(ஆ) (i) கணக்குப் பிரிவிலிருந்து பெறப்பட்ட தகவல் களுக்கமைய, இக்காலப்பகுதியில் எரிபொருள் கொடுப்பனவு செலுத்தப்படவில்லை.

(ii) சம்பந்தப்பட்ட அமைச்சருக்கு உத்தியோகபூர்வ வாகனம் ஒதுக்கப்படாத காரணத்தால் இக்கேள்வி பொருந்தாது.

(இ) ஏற்புடையதன்று.

(a) (i) According to the information provided by the Accounts Division of the Ministry of Housing, Construction and Water Supply, the Minister of City Planning and Water Supply had not been paid the fuel allowance for November and December, 2018. Also, when examining the files held by the Transport Division, there is no information regarding the allocation of official vehicles to the Minister of City Planning and Water Supply for this period and therefore, no official vehicles had been assigned to the Minister during this period.

(ii) This question is not applicable, as no official vehicle was assigned during this period.

(iii) No official vehicle was assigned from 29.10.2018 to 15.12.2018.

(b) (i) No fuel allowance was paid during this period.

(ii) This question is not applicable, as no official vehicle was assigned to the relevant Minister.

(c) Not applicable.

## 2015 සැප්තැම්බර් මස පත් කරන ලද ජාතික සංවාද පිළිබඳ අමාත්‍යවරයා: නිල වාහන

## 2015 செப்ரெம்பரிலிருந்து நியமனம் பெற்ற தேசிய கலந்துரையாடல்கள் பற்றிய அமைச்சர்: உத்தியோகபூர்வ வாகனங்கள்

## MINISTER OF NATIONAL DIALOGUE APPOINTED IN SEPTEMBER, 2015: OFFICIAL VEHICLES

1614/2025

**4.** ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් සිට පත් කරන ලද ජාතික සංවාද පිළිබඳ අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා ජාතික සංවාද පිළිබඳ අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) எட்டாவது பாராளுமன்றத்தில் 2015 செப்ரெம்பர் மாதத்திலிருந்து நியமிக்கப்பட்ட தேசிய கலந்துரையாடல்கள் பற்றிய அமைச்சருக்கு, அப்போதைய அரசாங்கத்தால் ஒதுக்கப்பட்ட உத்தியோகபூர்வ வாகனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அந்த உத்தியோகபூர்வ வாகனங்களின் பதிவு இலக்கம், வகை மற்றும் மாதிரி வெவ்வேறாக யாது என்பதையும்;

(iii) குறித்த உத்தியோகபூர்வ வாகனங்கள் ஒதுக்கப் பட்டிருந்த காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனம் ஒவ்வொன்றுக்கும் வழங்கப்பட்டிருந்த மாதாந்த எரிபொருளின் அளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) சம்பந்தப்பட்ட அமைச்சர், தேசிய கலந்துரையாடல்கள் பற்றிய அமைச்சர் பதவியை வகித்த காலப்பகுதியில், அத்தகைய உத்தியோகபூர்வ வாகனங்களுக்காக மாதாந்தம் பயன்படுத்திய எரிபொருள் லீற்றர் அளவு மற்றும் செலவு, உத்தியோகபூர்வ வாகனம் ஒவ்வொன்றின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -
 (i) number of official vehicles allocated by the then Government to the Minister of National Dialogue appointed from September, 2015 in the Eighth Parliament;
 (ii) registration number, type and model of the said official vehicles, separately; and
 (iii) duration for which those official vehicles were allocated?
(b) Will she also inform this House the -
 (i) monthly fuel entitlement for each of the said official vehicles, separately; and
 (ii) amount of fuel spent monthly in litres and expenditure incurred on that for each of those official vehicles, separately, during the period when the said Minister held the office of Minister of National Dialogue?
(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

(අ) (i) නිල වාහන 03කි.
 2017 දෙසැම්බර්, 2018 ජනවාරි සහ 2019 ජනවාරි වාහන 4ක් භාවිත කර ඇත.
 (ii) අමාත්‍යවරයා වෙත අනුයුක්ත කර තිබූ නිල රථ පිළිබඳ විස්
 තර ඇමුණුම 01* හි දක්වා ඇත.
 (iii) 2015.09.14 සිට 2019.11.20 දක්වා
(ආ) (i) පෙට්‍රල් වාහනයක් සඳහා - ලීටර් 750
 ඩීසල් වාහනයක් සඳහා - ලීටර් 600
 (ii) අදාළ කාල සීමාව තුළ නිල වාහන වෙනුවෙන් මාසිකව වැය කරන ලද ලීටර් ප්‍රමාණය සහ වියදම ඇමුණුම 02* හි දක්වා ඇත.
 අමාත්‍යවරයා වෙත වෙන් කරන ලද නිල වාහන අලුත්වැඩියාවන් සඳහා යොමු කර ඇති මාසයන්හි ඒ වෙනුවට වෙනත් වාහනයක් ලබා දී ඇති බව නිරීක්ෂණය විය.
(ඇ) අදාළ නොවේ.

(அ) (i) 03 உத்தியோகபூர்வ வாகனங்கள்
 2017 டிசம்பர், 2018 சனவரி மற்றும் 2019 சனவரியில் 4 வாகனங்கள் பாவிக்கப்பட்டுள்ளன.
 (ii) அமைச்சருக்கு இணைக்கப்பட்டுள்ள உத்தியோகபூர்வ வாகனங்கள் தொடர்பான விபரம் ***இணைப்பு 1இல்** கொடுக்கப்பட்டுள்ளது.
 (iii) 2015.09.14ஆம் திகதி தொடக்கம் 2019.11.20 ஆம் திகதி வரை
(ஆ) (i) பெற்றோல் வாகனமொன்றுக்கு - 750 லீற்றர்
 டீசல் வாகனமொன்றுக்கு - 600 லீற்றர்
 (ii) தொடர்புபட்ட கால வரையறையினுள் உத்தியோகபூர்வ வாகனங்களுக்கான மாதாந்த லீற்றர்களின் அளவும் செலவும் ***இணைப்பு 2இல்** கொடுக்கப்பட்டுள்ளது.
 அமைச்சருக்கு ஒதுக்கப்பட்ட உத்தியோகபூர்வ வாகனங்களைப் பழுதுபார்ப்பதற்காக அனுப்பப்பட்ட மாதங்களில் அதற்குப் பதிலாக மற்றுமொரு வாகனம் வழங்கப்பட்டுள்ளது அவதானிக்கப்பட்டது.
(இ) ஏற்புடையதன்று.

(a) (i) Three official vehicles.
 Four vehicles were used in December, 2017, January, 2018 and January, 2019.
 (ii) Details of the official vehicles attached to the Minister are given in Annex* 01.
 (iii) From 14.09.2015 to 20.11.2019.
(b) (i) In cases of a petrol vehicle - 750 litres
 In cases of a diesel vehicle - 600 litres
 (ii) The monthly quantity of litres and expenditure spent on official vehicles during the period under review are given in Annex* 02.
 It was observed that in months in which the official vehicles allocated to the Minister were referred for repairs, an alternative vehicle was provided instead.
(c) Not relevant.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 5වන ප්‍රශ්නයට - 1630/2025 - පිළිතුර දීමට අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்களால் கேட்கப் பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 5ஆம் இலக்க வினாவுக்கு -1630/2025- விடையளிப்பதற்கு, நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்கள் மூன்று வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Harshana Nanayakkara, Minister of Justice and National Integration has requested for three weeks' time to reply to Question No. 5 - 1630/2025 - raised by the Hon. Ajith P. Perera appearing in today’s Order Paper.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.